
කොවිඩ් ව්‍යාප්තිය





The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
தினமின

ශ්‍රී බුධ වර්‍ෂ 2564ක් වූ අධි වප් පුර ජලවක ලත් කුජ දින | කාණ්ඩය 111 | පත්‍රය 262 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 ඔක්තෝබර් 20 අඟහරුවාදා





සතියේ තුනපහ මඩිස්සලේ
අද පත්‍රය සමග

# බදියුදීන් රිමාන්ඩ්

සුභාෂිණී සේනානායක

ඉකුත් ජනාධිපතිවරණ සමයේ බස්රථ 222ක් මඟින් තම ඡන්ද කොට්ඨාසය වන සිලාවතුරට අවතැන් පුද්ගලයන් 12620ක් ගෙනයෑම සඳහා රජයේ මුදල් රුපියල් ලක්ෂ 95කට වැඩි මුදලක් ගෙවමින් අවභාවිත කළ බව කියන සිද්ධියට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් අත්අඩංගුවට ගත් පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් මහතා සහ ව්‍යාපෘති අධ්‍යක්ෂක සම්සුඩීන් මොහොමඩ් යාසින් යන

පිට 06


රිෂාඩ් බදියුදීන් ඊයේ (19) බන්ධනාගාරය වෙත රැගෙන ගිය අයුරු

## පාස්කු දා ප්‍රහාරයට කලින්
## 15,000කට ආසන්න පිරිසක් ඒ ගැන දැන සිටියා

### රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන කොමිසමට කියයි

සුභාෂිණී සේනානායක

සහරාන් හෂීම් බෝම්බ ප්‍රහාරයන් සැලසුම් කර තිබූ බවට ලද බුද්ධි තොරතුර සම්බන්ධයෙන් පසුගිය වසරේ අප්‍රේල් 11 වෙනිදා වනවිට 15,000කට ආසන්න පිරිසක් දැනුවත් වී සිටි බව රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ නිලන්ත ජයවර්ධන මහතා ඊයේ (19) පාස්කු කොමිසම හමුවේ කියා සිටියේය.

පිට 06

## සිසුන්ට සෞඛ්‍යාරක්ෂාව නැත්නම් 1988ට කියන්න

පිට 06

## රටට ගැළපෙන නව ව්‍යවස්ථාවක් අවශ්‍යයි

### මල්වතු අස්ගිරි උභය මහා විහාරීය ලේඛකාධිකාරි නාහිමි දෙනම පවසති

අසේල කුරුළුවංශ

දීර්ඝ කාලයක් පවත්වාගෙන යා හැකි රටට ගැළපෙන නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව තිබෙන බව මල්වතු අස්ගිරි උභය මහා විහාරීය ලේඛකාධිකාරී නාහිමිවරු දෙනම පවසති.

මේ වන විට විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධව රටේ කතිකාවක් ගොඩනැගී තිබෙන බවත් මේ ඔස්සේ රටේ අභිවෘද්ධියට හේතු වන ව්‍යවස්ථා සංශෝධනයකට කඩිනමින් එළඹීම කාලෝචිත අවශ්‍යතාවක් බවත් උන් වහන්සේ දෙනම කීහ.

පිට 06

## බදියුදීන්ට එරෙහිව තවත් සිද්ධීන් 10ක් ගැන විමර්ශන ඇරැඹෙයි

කුමුදු හෙට්ටිආරච්චි

පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන්ට එරෙහිව තවත් සිද්ධීන් 10කට අධික සංඛ්‍යාවක් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර ඇති බවත් එම විමර්ශන පිළිබඳ සවිස්තරාත්මක විස්තර නීතිපතිවරයා විසින් ඊයේ (19) වැඩබලන පොලිස්පතිවරයාට

පිට 06

## රිෂාඩ්ට රැකවරණය දුන් පුද්ගලයන් ගැන අධිකරණයට වාර්තාවක් දෙන්න නීතිපතිගෙන් උපදෙස්

පිට 06

## 20ට තවත් සංශෝධන 3ක්
### කැබිනට් මණ්ඩලය තීරණය කරයි

ධනුෂ්ක ගොඩකුඹුර

විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට තවත් සංශෝධන තුනක් ඉදිරිපත් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේදී ඊයේ (19) රැස්වූ කැබිනට් මණ්ඩලය තීරණය කර තිබේ.

පිට 06

## මිනුවන්ගොඩ කොවිඩ් පොකුර 2,162ක් දක්වා ඉහළට

නුවන් කොඩිකාර

නව කොරෝනා ආසාදිතයන් 87ක් ඊයේ (19) දිනයේ වාර්තා වීමත් සමඟ මිනුවන්ගොඩ කොවිඩ් පොකුර 2,162ක් දක්වා ඉහළ ගොස් ඇතැයි යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා පවසයි.

ඊයේ දිනයේ වාර්තා වූ ආසාදිතයන් 47 දෙනාගෙන් 4 දෙනෙක් නිරෝධායන මධ්‍යස්ථානවල සිටි අය වන අතර සෙසු 43 දෙනා මිනුවන්ගොඩ ඇඟලුම් කම්හලේ ආශ්‍රිතයින් වන බව හමුදාපතිවරයා පැවසීය.

පිට 06

## අඩු ආදායම් ලාභීන්ට රැකියා ලබාදීම
## අභ්‍යාසලාභීන් 34,818 කට පත්වීම්

නුවන් කොඩිකාර

සමාජයේ පහළම ආදායම් කාණ්ඩයට අයත් පවුල් අතරින් තෝරාගත් ලක්ෂයක් දෙනා රැකියා නියුක්ත කිරීමේ වැඩසටනේ ප්‍රථම අදියර යටතේ අභ්‍යාසලාභීන් 34,818 කට පත්වීම් ලිපි ප්‍රදානය ඊයේ (19) ඇරඹිණි.

එම පත්වීම් ලාභීන්ට ඔවුන්ගේ නිපුණතාව සහ අභිමතය අනුව හඳුනාගත් ක්ෂේත්‍ර 25ක් යටතේ මාස 06ක විධිමත් පුහුණුවක් ඔවුන්ට ලැබෙන අතර පුහුණු කාලය තුළ අභ්‍යාසලාභියකුට රුපියල් 22,500ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

පිට 06

## කාදිනල් හිමිට අපහාස වන වීඩියෝව මුදා හැරී කත රිමාන්ඩ්

සිරංජනි කුමාරි

කතෝලික සභාවේ ප්‍රධානියා වන අතිඋතුම් මැල්කම් කාදිනල් හිමියන්ට අපහාස වන ආකාරයේ වීඩියෝ පටයක් අන්තර්ජාලයට මුදා හැරීමේ චෝදනාව මත රහස් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ කාන්තාව ජාතික මානසික සෞඛ්‍ය ආයතනය වෙත ඉදිරිපත් කිරීමට නියම කළ කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් මොහොමඩ් මිහාර් මහතා ඇය ලබන මස 2 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට නියෝග කළේය.

සැකකාරිය අධිකරණයට ඉදිරිපත් කරමින් පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මාධව තේන්නකෝන් මහතා පැවසුවේ ආගමිකයන් අතර සංහිඳියාව බිඳලන පරිදි වීඩියෝවක් ඇය විසින් අන්තර්ජාලයට මුදා හැර ඇති බවය.

පිට 06

## රනිල්ගේ බලපෑම මත මගේ පාස්පෝට් එක තහනම් කළා

### උදයංග වීරතුංග කොමිසමට කියයි

රෝෂන් තුෂාර

හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ හා යහපාලන අමාත්‍ය මණ්ඩලයේ බලපෑම මත සිය විදේශ ගමන් බලපත්‍රය තහනම් කිරීමට පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය ක්‍රියා කළ බව රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග මහතා දේශපාලන පළි ගැනීම් පිළිබඳ විමර්ශන කොමිසම හමුවේ සාක්ෂි දෙමින් පැවසුවේය.

පිට 06




## රටට තිබෙන ඇත්ත අනතුර ගැන අවදියෙන් සිට එය පරාජය කරන්න

ජවිපෙ ප්‍රචාරක ලේකම් විජිත් සිල්වා

පිට 06


## අනාරක්ෂිත වළක දිය නෑ එකම පවුලේ දරු තිදෙනා දියේ ගිලී මරුට

පිට 06



## 800 චිත්‍රපටයේ රඟපාන්න එපා
### මුරලිදරන් විජේ සේදුපතිට කියයි

පිට 06






**උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය,**
**ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

# කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය

## සංරචකය 1 : කෘෂිකර්ම අගයදාම සංවර්ධන වැඩසහන

# පුරප්පාඩු

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ශ්‍රී ලාංකික "ව්‍යුහාත්මක වෙනස්වීම්" සහ "ජීවන තත්වය නගාසිටුවීම්" සහ "සමාජ අන්තර්ග්‍රහණය" යන ක්ෂේත්‍ර දෙකෙහි දේශීය හවුල්කාරිත්වය මුලෝපයක් සඳහා ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධනය අරමුදල එකග වී ඇති අතර, ඉහත කී මුලෝපයික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ව්‍යාපෘතියේ සංරචකය/ වාණිජමය සහ අපනයන අභිමුඛ කෘෂිකර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීමට ඉහළ අගයක කෘෂිකර්මික නිෂ්පාදන සහ අගය එකතුකිරීම සඳහා ගොවි නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යාපාර වෙතින් ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ පොළබවා ගැනීමට, ගැලපුම ප්‍රදාන, තාක්ෂණික සහාය ආධාර, වාණිජ බැංකු ක්ෂේත්‍රයට සම්බන්ධ කිරීම සහ පාර්ශ්වික ණය ඇපකරය (PCG) තුලින් හැකියාව දෙන පරිසරයක්, දිරිගැන්වීම් සහ එවැනි ආයෝජන සඳහා මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය ලබාදීමට අපේක්ෂා කරයි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව වසර 5 ක් වන අතර 2017 දී ආරම්භ විය. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 102.73.

උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියේ පවතින පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් පළපුරුදු යෝග්‍යතා පූර්ණ ශ්‍රී ලාංකීය පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද :**

### අගයදාම විශේෂඥ (Value Chain Specialist) (PS - 3) තනතුරු 1 (කොළඹ)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකම් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

**සමග**

කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 12 (දෙළහක) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

**හෝ**

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

**සමග**

කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 9 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

**හෝ**

03. රජයේ දීප ව්‍යාප්ත සේවයේ 1 වන පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම

**සමග**

10 වන පන්තියේ තනතුරක අඩුම තරමින් වසර 04 ක නිලධාරියෙකු වීම.

**වයස් සීමාව :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 65 ට අඩු විය යුතුය.

### ගැලපුම් ප්‍රදාන (Matching Grant) කළමනාකරු - තනතුරු 01 (වවුනියාව)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 08 (අටක) පශ්චාත් යෝග්‍යතා (සුදුසුකම් ලැබීමෙන් පසු ලත්) පළපුරුද්ද

**හෝ**

02. රජයේ දීප ව්‍යාප්ත සේවයේ III / II පන්තියත් හෝ ඉහළ පන්තියක නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරි වරයෙකු / වීම

**සමග**

III/II පන්තියේ තනතුරක අඩුම තරමින් වසර 08 (අටක) පළපුරුද්ද.

වවුනියාවේ, ස්ථානගත කරනු ලබන පැවරුම්ලාභී කළමනාකරු / හට දෙමළ භාෂාව පිළිබඳ ලිඛිත සහ කථන සන්නිවේදන කුසලතාව තිබිය යුතුය.

**වයස් සීමාව :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට, වයස අවුරුදු 65 ට (හැට පහට) අඩු විය යුතුය.

### සංඛ්‍යා ලේඛනඥ (Statistician) (PS - 4) - තනතුරු 01 (කොළඹ)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයකින් ලබාගත් එහි ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර 08 (අටක) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද

**හෝ**

02. රජයේ දීප ව්‍යාප්ත සේවයේ III / II පන්තියේ හෝ ඉහළ පන්තියක නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම

**සමග**

III/II පන්තියේ තනතුරක අඩුම තරමින් වසර 08 (අටක) පළපුරුද්ද.

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 65 (හැටපහට) අඩු විය යුතුය.

### ව්‍යාපෘති ලේකම් (Project Secretary) (PS - 6) - තනතුරු 01 යි (කොළඹ)

01. අ.පොස. (සා/පෙ) විභාගය – ඉංග්‍රීසි භාෂාව සහ සිංහල / දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ 3 ක් සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම

**සමග**

පිළිගත් ආයතනයක ලේකම් පාඨමාලාවක් හදරා තිබීම හෝ වරලත් ලේකම් විභාග හදරා තිබීම

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ අඩුම තරමින් වසර පහක (05) ක පළපුරුද්ද

**හෝ**

02. අදාළ ක්ෂේත්‍රයේ වසර 04 ක පළපුරුද්ද සහිත වරලත් ලේකම්වරයෙකු / වරියක වීම

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 65 ට අඩු විය යුතුය.

### වැඩසටහන් සහකාර (Programme Assistant) - තනතුරු 04 (කොළඹ, වවුනියාව සහ අම්පාර)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කළමනාකරණ මූල්‍ය කටයුතු /කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

**හෝ**

02. අදාළ ක්ෂේත්‍රය සඳහා තාක්ෂණික / වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය කුසලතා (සුදුසුකම්) 7 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා / නිපුණතා සහතිකයක් ලබා තිබීම

**සහ**

සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 2 ක (දෙකක) පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**වයස් සීමාව :** අවුරුදු 24 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු වන අතර, එය අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට බලපැවැත්වෙන පරිදි විය යුතුය.

### කළමනාකරණ සහකාර (Management Assistant) - තනතුරු 01- (කොළඹ)

01. අ.පො.ස. (සා.පෙ.) එකම වතාවකදී සිංහල / දෙමළ භාෂාව ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (04) ක් සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම

**සහ**

02. අ.පො.ස උ.පෙ. විභාග සියලු විෂයන් සහ (සාමාන්‍ය දැනීම පත්‍රය හැර) එක් වරකදී සමත්වී තිබීම. පැරණි විෂය නිර්දේශයේ එක්වර විෂයන් තුනක් සමත්වී තිබීම.

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙකක (02) සුදුසුකම් ලැබීමෙන් පසු ලත් පළපුරුද්ද

**වයස් සීමාව :** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය**

සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තු ගතකරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ වලට කැඳවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

**වැටුප :**

වැටුප්, 2019.03.15 වන දින අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම්ව ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) මනා චරිත ස්වභාවයකින් හා යහපත් කායික, මානසික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

(ඇ) ඉංග්‍රීසි භාෂාවෙන් මනා (කථන හා ලිඛිත) සන්නිවේදන කුසලතා සහිත වීම කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් / මනාපයක් දක්වනු ලැබේ.

(ඇ) උසස් පරිගණක සාක්ෂරතාව (දැනුම) පිළිබඳ ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**රැකියාවේ නියුක්ත වීමේ කොන්දේසි :**

(අ) පත්වීම්, කොන්ත්‍රාත් පදනම මත මූලික වශයෙන් එක් වසරක (01) කාලසීමාවක් සඳහා වනු ඇති අතර, සාර්ථක හා සතුටුදායක කාර්ය සාධනය හා ව්‍යාපෘතින් කාල සීමාව / පරිච්ඡේදය මත පදනම්ව සේවාව දීර්ඝ කරනු ලැබීමට සලකා බැලේ.

### රියදුරන් (Driver) : තනතුරු 03 (කොළඹ)

**01. අධ්‍යාපන සුදුසුකම් :**

අ.පො.ස. (සා/පෙ) විභාගය, දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල / දෙමළ භාෂාව ඇතුළුව, අඩුම තරමින් සම්මාන සාමාර්ථ දෙකක් (02) ක්ද සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම.

**02. වෘත්තීය සුදුසුකම් :**

2.1 (බඳවා ගැනීමේ දින සිට අඩුම තරමින් වසර තුනකට පෙරාතුව ලබාගත් නව ක්‍රමය හෝ පැරණි ක්‍රමය යටතේ B පන්තියෙහි රියදුරු බලපත්‍රයක් හෝ C පන්තිය සහ C 1 පන්තිය හි වාහන සඳහා වන රියැදුරු බලපත්‍රයක් සහිතව) CWT 24 ට අඩු තාරබර සහිත ස්ටේෂන් වැගන් සහ පෞද්ගලික / කුලී මෝටර් රථ (කාර් රථ) පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරනු ලැබූ වලංගු රියදුරු බලපත්‍රයක් සහිත වීම.

02. මාර්ග නීති සංග්‍රහය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබිය යුතුය.

03. මෝටර් රථවාහන රියදුරෙකු ලෙස වසර තුනක (03) පළපුරුද්ද තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය)

04. **කායික යෝග්‍යතාව :**

අවම උස අඩි 5 ක් (පහක්) විය යුතුය.

මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුවන අතර, දිවා සහ රාත්‍රී පැවරෙන රාජකාරි ඉටු කිරීම සඳහා මනා ඇස් පෙනීමකින් හා ශරීර සුවතාවෙන් යුක්ත විය යුතුය. (මේ බව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ නිසි සහතිකයකින් සනාථ කළ යුතුය)

05. **වෙනත් සුදුසුකම් :**

5.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

5.2 අයදුම්කරු අනර්ඝ හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

5.3 නිවේදනයේ / ගැසට් පත්‍ර නිවේදනයේ දක්වා ඇති නියමිත දිනට 2 සහ 3 හි සඳහන් තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය වන ආකාරයට සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

06. **වයස :**

6.1 අවම වයස් සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

6.2 උපරිම වයස් සීමාව : වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**සැ. යු.** මෙම උපරිම වයස් සීමාව රාජ්‍ය සේවයේ දැනටමත් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන අයවලුන් හට බලපානු නොලැබේ.

**අයදුම්පත් :**

සියලුම අයදුම්කරුවන් විසින් ස්වකීය ජීව දත්ත තොරතුරු ප්‍රකාශ (CV) සහිත අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපින ද සමග අදාළ සහතික පත්‍රවල පිටපත් ද සහිතව 2020 නොවැම්බර් මස 03 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමුකළ යුතුය. රජයේ සේවයේ / අර්ධ රාජ්‍ය සේවාවන්හි දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වන්නේය.

අයදුම් කරන තනතුර අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ පැහැදිලිව සටහන් කළ යුතුය.

**ලේකම්,**
**උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**
**කෘෂිකර්ම ආංශ නවීකරණ ව්‍යාපෘතිය (ASMP),**
**16 වන මහල "සුහුරුපාය", බත්තරමුල්ල.**
**2020 ඔක්තෝම්බර් 20 වන දින.**

# පංචිකාවත්තේ නෙවිල් පිස්තෝලයක් සමඟ දැලේ

**රක්ෂණ ශ්‍රියන්ත**

පංචිකාවත්තේ නෙවිල් නොහොත් ජෙයරාජ් නෙවිල් නැමැති සැකකරු කොළඹ මධ්‍යම කොට්ඨාසයේ අපරාධ විමර්ශන ඒකකය මගින් කරන ලද වැටලීමකදී ඊයේ (19) කොළඹ ජම්පටා වීදියේ මහල් නිවාස සංකීර්ණයකදී අත්අඩංගුවට ගෙන තිබේ.

මොහු භාරයේ තිබී බ්‍රවුනින් වර්ගයේ පිස්තෝලයක්, එම මැගසින් දෙකක් සහ උණ්ඩ 10ක් සහ ගංජා කිලෝ ග්‍රෑම් දෙකක් ද සොයාගෙන ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පවසයි.

මෙම සැකකරු කොම්පඤ්ඤවීදිය පොලිසිය වෙත ඉදිරිපත් කර ඇති අතර කොළඹ මධ්‍යම කොට්ඨාසයේ අපරාධ විමර්ශන ඒකකය මගින් වැඩිදුර විමර්ශන සිදු කරයි.

සැකකරු දින හතක රැඳවුම් නියෝග ලබා ගෙන ප්‍රශ්න කිරීමට නියමිතව ඇත.

# නීති විරෝධී මත්පැන් නිෂ්පාදනාගාරයක් පවත්වාගෙන ගිය චීනුන් 3කට ඇප

**සුභාෂිණී සේනානායක**

කොල්ලුපිටියේ පවත්වාගෙන ගිය බව කියන නීති විරෝධී මත්පැන් නිෂ්පාදනාගාරය තුළ දී අත්අඩංගුවට ගත් චීන ජාතිකයන් තිදෙනා දැඩි ඇප කොන්දේසි මත මුදා හැරීමට කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (19) නියෝග කළේය.

කොල්ලුපිටිය පොලිසිය අත්අඩංගුවට ගත් තිදෙනා අද අධිකරණයට ඉදිරිපත් කළ අතර පළමු සැකකාර චීන ජාතිකයා වරද පිළිගැනීමෙන් අනතුරුව රුපියල් 28000ක් දඩ මුදලක් මත ඔහු මුදා හැරිණි.

චීන කාන්තාවන් දෙදෙනා වරද පිළි නොගැනීම නිසා මහේස්ත්‍රාත්වරයා ඔවුන් රුපියල් 25000 මුදල් ඇප සහ රුපියල් ලක්ෂ පහක බැගින් වූ ශරීර ඇප මත මුදා හැරියේය.

නීති විරෝධී මත්පැන් පෙරන උපකරණ ළඟ තබා ගැනීම, මත්පැන් ලීටර් 40 ක්, නීති විරෝධී දුම්වැටි 920ක් සන්තකයේ තබා ගැනීම, මත්පැන් නිෂ්පාදනය යන චෝදනා යටතේ සැකකරුවන් තිදෙනාට නඩු ගොනු කර තිබිණි. ලබන වසරේ පෙබරවාරි 10 වැනි දා නැවත නඩුව විභාගයට ගැනීමට නියමිතය.




## 42 වන ඔබ්සවර් - මොබිටෙල්

### වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව - 2020

ඔබේ ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයාට / ක්‍රීඩිකාවට මනාපය පළ කර ඔහුව / ඇයව වසරේ ඔබ්සවර් - මොබිටෙල් වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව කිරුළ දක්වා රැගෙන යන්න.

☐ **වඩාත්ම ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/2020 වයස අවු. 19 න් පහළ "පළමු, දෙවන සහ තෙවන කාණ්ඩ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩකයින්, මනාප ලැබීමට සුදුසු වේ.

☐ **වඩාත් ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව 2020**

ශ්‍රී ලංකා පාසල් ක්‍රිකට් සංගමය මගින් පවත්වනු ලබන 2019/20 වයස අවු. 19 න් පහළ "සමස්ත ලංකා අංශයේ" අන්තර් පාඨශාලයීය තරඟාවලීන්හි දී තරග වදින ක්‍රිකට් ක්‍රීඩිකාවන් මනාප ලැබීමට සුදුසු වේ.

ඔබේ ක්‍රීඩකයා : ....................

අංශය: පළමු කාණ්ඩය ☐ දෙවන කාණ්ඩය ☐ තෙවන කාණ්ඩය ☐

සමස්ත ලංකා ක්‍රීඩිකාව: ....................

**(එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ)**

පාසල : ....................

ඔබේ නම : ....................

ලිපිනය : ....................

ජංගම දුරකථන අංකය : ....................

SUNDAY OBSERVER

vote.schoolcricketer.lk වෙත පිවිසීමෙන්ද ඔබගේ මනාපය ප්‍රකාශ කළ හැක.

**කූපන්පත් එවා සතිපතා ත්‍යාග දිනාගන්න.**

**ප්‍රථම ත්‍යාගය** : Mobitel 4G Wi-Fi router **දෙවන ත්‍යාගය** : රු. 2,500/-
**තෙවන ත්‍යාගය** : රු. 1,500/- **හතරවන ත්‍යාගය** : රු. 1,000/-

42 වන ජනප්‍රියතම පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා / ක්‍රීඩිකාව නම් කිරීමේ තරඟාවලිය දැන් ආරම්භ කර ඇත. සම්පූර්ණ කරනලද ඉහත කූපනය ක්‍රීඩා සංස්කාරක, සන්ඩේ ඔබ්සවර්, ලේක්හවුස්, කොළඹ 10 වෙත තැපැල් කරන්න.

**කොන්දේසි :**

1) එක් කූපනයක් එක් ක්‍රීඩකයෙකුට / ක්‍රීඩිකාවකට පමණක් වලංගු වේ.
2) ලේක්හවුස් හෝ මොබිටෙල් ආයතනයේ සේවක / සේවිකාවන්ගේ දූ දරුවන්ට තරගයට සහභාගි විය නොහැක.
3) ජයග්‍රහණය කරනු ලබන අයට මුදල් / කුසලාන හා සහතිකපත් හිමි වේ. සෑම කූපනයකම එක් ක්‍රීඩකයෙකු පමණක් නම් කළ හැකි අතර, එය එක් තරඟ වාරයක් සඳහා පමණක් වලංගු වේ. තරඟාවලියේ අවසාන තීරණය සන්ඩේ ඔබ්සවර් ක්‍රීඩා සංස්කාරක සතු වේ.

**දිනය** 2020-10-24 **අංකය** 33



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2020 ඔක්තෝබර් 20 අඟහරුවාදා

# රිෂාඩ් නාටකය!

රිෂාඩ් පිළිබඳ නාටකයේ පළමු කොටස නිමා විය. එහි දෙවන කොටස ආරම්භ කිරීමට කාලය පැමිණ තිබේ. දක්ෂ නාට්‍යකරුවන් ඇති සමගි ජන බලවේගයට හෝ ජනතා විමුක්ති පෙරමුණට හෝ එම කලා මෙහෙවර ඉටු කළ හැකිය. අනුර කුමාර වුව පිටපත් රචනයට දක්ෂයෙකි. නාට්‍යයෙහි පළමු කොටස හැඳින්වූයේ 'රිෂාඩ් අපේ ගෙදර නෑ' යනුවෙනි. එය වේදිකාගත කිරීම සඳහා අනුර විසින් සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කරන ලදි. ජාතියට යථාර්ථය පෙන්වා දීම සඳහා ඔහු දරන පරිශ්‍රමය අගය කළ යුතුය. විශේෂයෙන් ජාතියට විහිළු සැපයීම සඳහා මෙබඳු නාට්‍යකරුවන් අවශ්‍ය වේ. එබැවින් ඔහු ලවාම නාට්‍යයේ දෙවන පිටපත රචනා කර ගැනීම ඉතා සුදුසුය.

විකාරරූපී නාට්‍ය කලාවේ සමාරම්භකයකු වූ ඉයුජින් අයනෙස්කෝ වරක් කියා සිටියේ සමාජ පැවැත්මේ පිළිවෙළ හෙවත් ඕඩරය කැඩී ගිය කල මිනිසුන් පිස්සු කෙළින්න පටන් ගන්නා බවය. බොරු කීම, අනුමාන කිරීම, සැක සිතීම, අසත්‍ය ප්‍රබන්ධ ගෙතීම පිස්සු කෙළීමට අයත් ලක්ෂණ ලෙස පෙන්වා දිය හැකිය. විකාරරූපී නාට්‍ය කලාව බිහි වූයේ දෙවන ලෝක යුද්ධයේ පශ්චාද් අත්දැකීම් සමඟය. එකල යුරෝපයේ ආර්ථිකය බිඳ වැටිණි; සදාචාරය බිඳ වැටිණි; ආත්මාර්ථය මතු විය. සාමූහිකත්වය නැති විය. කොවිඩ් ලෝක වසංගතය ඔස්සේ යළිත් එබඳු යුගයක් මතු වෙමින් පවතී. මේ කාලය තුළ වැඩියෙන්ම පිස්සු නටන්නේත්, වැඩියෙන්ම බොරු කියන්නේත්, වැඩියෙන්ම ප්‍රබන්ධ ගොතන්නේත් දේශපාලකයන්යැයි කිව හැකිය.

රිෂාඩ්, ආණ්ඩුව හා විස්ස යා කොට අපූරු ප්‍රබන්ධයක් ගොතන්නට විපක්ෂය සමත් විය. එය කොතරම් ද යත්: ආණ්ඩුවට ඡන්දය දුන් ජනතාව පවා සැක සංකා ඇති කර ගත්හ. ඉහත ප්‍රබන්ධයෙන් කියවුණේ ආණ්ඩුව විස්ස සම්මත කර ගැනීම සඳහා රිෂාඩ් පාවිච්චි කරන බවය. රිෂාඩ්ට නීතියෙන් බලපෑම් කිරීම හා රිෂාඩ් සඟවා තැබීම යන දෙකම ආණ්ඩුවේ වැඩ ලෙස පෙන්වා දීමට ඔවුහු සමත් වූහ. රිෂාඩ්ගේ අතුරුදන් වීම ඉහත ප්‍රබන්ධය සමඟ හොඳින්ම ගැළපිණි. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් ඇති ආණ්ඩුවක් පනතක් සම්මත කර ගැනීම සඳහා රිෂාඩ් පසුපස යා යුතු ද? අවශ්‍ය නම් විපක්ෂයෙන් හතර පස්දෙනකු ආණ්ඩුවට ගැනීම අපහසු නැත.

රිෂාඩ් අත්අඩංගුවට ගනු ලබන්නේ දෙහිවල සුඛෝපභෝගී තට්ටු නිවාසයක තුන්වන මහලේ නිවෙසක සිටියදීය. එම මහල් නිවාස පද්ධතියේ අයිතිකරුවා රිෂාඩ්ට අවශ්‍ය රැකවරණය සපයා දී ඇත. අයිතිකරුවා ඔහුගේ මිත්‍රයකු වන්නට පුළුවන; ඥාතියකු වන්නට ද පුළුවන. රිෂාඩ් යනු භාණ්ඩයක් නොවේ. ඔහු මනුෂ්‍යයෙකි. එබැවින් වෙස් වළාගෙන හෝ සැඟවී සිටීමේ හැකියාව ඔහුට තිබේ. ඔහු ඇල්ලීම පොලීසියට භාර රාජකාරියකි. ඔහු අපරාධ සිදු කර ඇත් නම් ඊට දඬුවම් දීම නීතියට අයත් කාරණයකි. යහපත් ආණ්ඩුවක් අධිකරණයට බලපෑම් කරන්නේ නැත; පොලීසියට ඇඟිලි ගසන්නේ ද නැත.

කෙනකුට චෝදනා නගන්න පහසුය. එහෙත් ඔහුට නීතියෙන් දඬුවම් ලබා දීම පහසු නැත. ඒ සඳහා ක්‍රියාදාමයක් අනුගමනය කරන්න සිදු වේ. ඒ සඳහා කාලයක් ගත කරන්නත් සිදු වේ. ඕනෑම පුද්ගලයකු අත්අඩංගුවට ගෙන දඬුවම් දීමේ ක්‍රමය ඒකාධිපති පාලකයන් විසින් අනුගමනය කරනු ලැබේ. එහෙත් නීතියේ ආධිපත්‍යය පවත්වාගෙන යන රාජ්‍යයකට එය කළ නොහැකිය. රිෂාඩ් සම්බන්ධ ආණ්ඩුවේ මතය වූයේ එය නීතිය මඟින් ඉටු විය යුතුය යන්නය. රජය අධිකරණයට බලපෑම් නොකරන බව ද පොලීසියට ඇඟිලි ගැසීම් නොකරන බව ද ජනාධිපතිවරයා වරින් වර කියා තිබේ. රිෂාඩ් සම්බන්ධයෙන් අනවශ්‍ය කලබලයක් ඇති කරන්න ආණ්ඩුව උත්සාහ කළේ නැත.

රිෂාඩ්ට මෙන්ම ඔහුගේ සහෝදරයාට ද එල්ල වී ඇති චෝදනා බරපතළය. ඉස්ලාම් අන්තවාදය පෝෂණය කිරීම, පාස්කු ප්‍රහාරයට නියමින් හෝ අනියමින් හෝ සහයෝගය දැක්වීම, වනාන්තර හෙළි කිරීම, පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීම, ජාතිවාදය හා ආගම්වාදය ඉස්මතු වන සේ ක්‍රියා කිරීම, රාජ්‍ය දේපොළ අවභාවිත කිරීම මේ චෝදනා අතර පවතී. රිෂාඩ් හා ඔහුගේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැඩි කෝපයක් සිංහල ප්‍රජාව අතර පවතී. ඔහු රටේ බලවත්ම පුද්ගලයකු බවට පත්ව සිටියේ යහපාලන ආණ්ඩු සමයේය. එකල රිෂාඩ් සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් වුවත් ආණ්ඩුව ඒ ගැන විමර්ශන සිදු කළේ නැත. යහපාලන ආණ්ඩුවට තීරණාත්මක බලපෑමක් කිරීමේ හැකියාව ද රිෂාඩ් සතු විය. වත්මන් ආණ්ඩුව ඔහු පිළිබඳ විමර්ශනයක් ආරම්භ කිරීම සාධනීය ලක්ෂණයකි.

රිෂාඩ් අත්අඩංගුවට ගනු ලබන්නේ පොදු දේපොළ අවභාවිත කිරීමේ නීති ප්‍රතිපාදනවලට අනුවය. එය රිෂාඩ් සම්බන්ධයෙන් ඇති එක් චෝදනාවක් පමණි. මේ සඳහා වන විමර්ශන හා නඩු පැවරීම් එකින් එක පෙළගැසී එන්නට පුළුවන. රිෂාඩ් පිළිබඳ මහජන කෝපය සාධාරණ විය හැකිය. එහෙත් නීතිය ක්‍රියාත්මක කිරීම යනු හැඟුම්බර දෙයක් නොවේ. ඇතැම් සංවිධාන මෙන්ම ඇතැම් නායකයන් ද රිෂාඩ් වහාම අත්අඩංගුවට ගෙන දඬුවම් දීමක් අපේක්ෂා කරන බව පැහැදිලිය. එය පමා වන විට ආණ්ඩුවට ඇඟිල්ල දිගු කිරීමට ද ආණ්ඩුව කෙරෙහි කලකිරීම් ඇති කර ගැනීමට ද ඔවුහු පෙලඹෙති. එහෙත් මෙය හැඟීමෙන් නොව, බුද්ධියෙන් විමසා බැලිය යුතු සංසිද්ධියකි.

රිෂාඩ් අධිකරණයට ඉදිරිපත් කළ පසු ඔහුට ඇප ලැබෙන්න පුළුවන. එය නීතියේ ස්වභාවයයි. චූදිතයකුට දඬුවම් දීමේ හැකියාවක් නැත. චූදිතයා නීතිය ඉදිරිපිට වරදකරුවකු වූ පසු දඬුවම් දිය හැකිය. සමහරුන්ට එතෙක් ඉවසා සිටින්න බැරිය. ආණ්ඩුවකට ඒ සම්බන්ධයෙන් කළ හැකි දෙයක් නැත.




| | |
|---|---|
| උසස්පෙළට දෙන්නට තිබූ ප්‍රශ්න | පත්තර |
| හොරෙන්ම එළියට පැනලා සොයයි | උත්තර |
| ඇහැට පේන දේත් යද්දි තතු වහන් | කර |
| නොපෙනෙන වයිරසයක් ගැන මොන | කතන්දර |



# සේවකයාත් - වැඩබිමත් රකින
# සියයට දෙසීයක වගකීම

කලින් කලට මතුවන නොයෙක් ආකාරයේ අභියෝගවලට සෑම රටක්ම මුහුණ දෙන්නේ තම තමන්ගේ ශක්ති පමණින්ය. මේ මොහොතේ මුළු ලෝකයට ම බලපා ඇති පොදු තත්ත්වයක් වන කෝවිඩ් 19 වසංගතයට ද ඒ ඒ රටවල් තම තමන්ගේ ආර්ථික සමාජයීය සහ දේශපාලන න්‍යාය පත්‍රයන්ට සමපාත වන පරිදි මුහුණ දෙමින් සිටී. විශේෂයෙන් තම ආර්ථික ශක්තිය මත පිහිටා මෙම වසංගතයට එරෙහිව කටයුතු කරන ධනවත් රටවල් මෙන්ම නොදියුණු රටවල්ද තමන්ගේ ආර්ථිකය කඩා වැටීමකින් තොරව පවත්වා ගෙන යන්නේ කෙසේ ද යන්න පිළිබඳව මේ වන විටත් ස්ථිර දැක්මක් හා වැඩපිළිවෙළක් සකසා ගෙන අවසන්ය.



**ආචාර්ය එස්.කේ. ගමගේ**
**පීඨාධිපති, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය**

කොරෝනා වසංගත ව්‍යාප්තිය ඇරැඹී මාස ගණනාවක් ඉක්ම ගොස් ඇතිව ද තවමත් මේ වසංගත තත්ත්වය සියයට සියයක් ම මුලිනුපුටා යන තත්ත්වයක් කවදා කිනම් මොහොතකදි උදාවේ දැයි නිශ්චිත කළ නොහැකි මට්ටමක් තුළ ලොව සෑම රටක්ම ඒ සඳහා මුහුණදීමට අවශ්‍ය යන්ත්‍රණයන් සකසා ගෙන හමාරය. අපි ද මේ මොහොතේ කොරෝනා දෙවැනි රැල්ලකට මුහුණ දෙමින් සිටිමු. මෙය කොරෝනා අවසාන රැල්ල යැයි නිගමනය කිරීම උගහට නිසා අපි ද ජාතියක් වශයෙන් නැඟී සිටීමට අවශ්‍ය ස්ථිර ආර්ථික අඩිතාලමක් සකසා ගත යුතුව ඇත. මෙහිදී විශේෂයෙන් රාජ්‍ය යාන්ත්‍රණය මෙන්ම ජාතික ආර්ථිකයේ සුවිශේෂ බරක් උසුලා ගෙන සිටින පෞද්ගලික අංශය ද කොරෝනා අභියෝගයට මුහුණ දෙමින් එකම මාර්ගයක් ඔස්සේ ඉදිරියට යා යුතුය.

## සෞඛ්‍ය සුභසාධනය

දේශීය ආර්ථිකය පණ ගැන්වීම සඳහා මහා පරිමාණ ව්‍යාපාරික සමාගම්, මූල්‍ය ආයතන, බැංකු, රක්ෂණ මෙන්ම මධ්‍ය පරිමාණ, සුළු පරිමාණ, ස්වයං රැකියා ආදි විවිධ ක්ෂේත්‍ර දායක වෙයි. අප තවදුරටත් ඉදිරියට යා යුත්තේ කොරෝනා සමඟ බවට මුළු ලෝකයම දැනුම්වත් වී ඇති අවදියක අප ද එම අනතුරට යටත්ව කටයුතු කළ යුතුව තිබේ.

කොරෝනා සහ ජාතික ආර්ථික විශ්ලේෂණය ගැඹුරින් සාකච්ඡා කිරීමට හේතු කාරණා දැඩිව මතු වූයේ ඉකුත් දා මතු වුණු කොරෝනා පොකුර රැකියා දහස් ගණනක් බිහි කර ඇති ඇඟලුම් කර්මාන්ත ශාලාවකින් මතු වූ නිසාය. අපට මෙහිලා වැදගත් වන්නේ එම සමාගමේ නාමය හෝ අනන්‍යතාව නොවේ. දේශීය ආර්ථිකයේ හදගැස්ම ලෙස හඳුන්වන ඇඟලුම් ක්ෂේත්‍රය සේම එවැනිම රටට විදේශ විනිමය උත්පාදනය කරන මහා පරිමාණ සමාගම් ලෝකය පුරා පැතිර යන සෞඛ්‍ය තර්ජනයක් හමුවේ තම පැවැත්ම ස්ථාවර කර ගන්නේ කෙසේ ද? සහ ඇති වුණු තත්ත්වයට හේතු වූ කාරණා මොනවාද යන්න හඳුනා ගෙන වැරදි නිවැරදි කර ගෙන ඉදිරියට යෑමයි.

ලෝකයේ සෑම රටක්ම මේ වන විට සිය ආර්ථිකයට සිදු විය හැකි බලපෑම අවම කර ගැනීම සඳහා කොරෝනා ව්‍යාප්තිය පාලනයට සහ පොදුවේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය සහතික කිරීමට අතිවිශාල බරපැනක් දරමින් සිටී. මෙය ආර්ථික විශ්ලේෂකයන් හඳුන්වන්නේ පවතින තත්ත්වය හමුවේ අත්‍යවශයෙන් ම සිදු විය යුතුම පිළිවෙත බවයි. මේ පාඩම යම් තරමකින් හෝ ගිලිහුණු බැවින් ඇඟලුම් කර්මාන්ත ශාලාවකින් කොරෝනා දෙවැනි අවදානමකට අප මුහුණ පෑමට සිදු වූ බව රහසක් නොවේ. අවදානමක් ඇස් මානයේ තිබියදී එය නොසලකා හරිමින් කටයුතු කිරීමේ ආදීනවය පිළිබඳ මීට වඩා උදාහරණයක් සෙවීමට අපි වෙහෙස විය යුතු නැත.

බ්‍රැන්ඩික්ස් පොකුරින් මතු වුණු කොරෝනා රෝගීන් තම ආයතනයේ විශාල පිරිසක් කිසියම් රෝග තත්ත්වයකින් පෙළෙන බව දැන දැනත් තම සේවය ලබා ගත්තේ යැයි පාලනාධිකාරියට චෝදනා නගන බව මාධ්‍යයට අනාවරණය විය. මේ චෝදනාව සත්‍ය හෝ අසත්‍ය මුත් දැන් එයට පිළියම් සෙවීම හෝ නිවැරැදි කිරීමට යෑම උගහට කරුණකි. නමුත් මෙවැනි තත්ත්වයක් යළි මතු නොවීමට කළ යුත්තේ කුමක්ද යන්න සෑම ව්‍යාපාර ක්ෂේත්‍රයක්ම දැනුම්වත් ව ස්ව සේවකයන්ගේ ආරක්ෂාව සහතික කර ගත යුතුව ඇත.

විශාල ශ්‍රමික පිරිසක් සේවයේ යොදවන ආයතනයක් මේ කොරෝනා වසංගතයට මුහුණ දෙන්නේ කෙසේ ද? ඒ සඳහා පළමුව තම සේවකයින්ගේ සෞඛ්‍යමය සුබසාධානය උපරිමයෙන්ම තහවුරු කළ යුතුය. අඩුම තරමින් මුව ආවරණ දීම, නිල ඇඳුමක් දීම, හැකි උපරිමයෙන් දුරස්ථකරණය පවත්වා ගෙන යමින් සේවය ලබා ගැනීමට සුදුසු යන්ත්‍රණයක් සකස් කිරීම, සෞඛ්‍ය නීති රීතින්ට යටත්ව සේවකයන්ගේ නවාතැන් පහසුකම් නංවාලීම, සේවකයන් ප්‍රවාහනයේ දී සුදුසු ක්‍රමවිධි අනුගමනය පමණක්ම නොව විදෙස් රටවල්වලින් සම්පත් ලබා ගන්නේ නම් රටේ බල පවත්වන නිරෝධායන නීති රීතීන්ට යටත්ව කටයුතු කිරීම ආදි සියල්ල කෙරෙහි දැඩිව සැලකිල්ලට ගත යුතුය. මේවා ලඝු කොට නොසැලකිය යුතුය. සේවකයන්ගේ සෞඛ්‍ය සුභසාධනයට දැරිය යුතු පිරිවැය කොපමණ විය හැකි වුවත් කොරෝනා හමුවේ තම සමාගම ව්‍යාපාරය යම් හෙයකින් කඩා වැටුණොත් දැරීමට සිදු වන පාඩුව ඊට වඩා සිය ගුණයකින් වැඩි විය හැකි යැයි අවබෝධ කර ගෙන ක්‍රියා කළ යුතුය.

කොළඹ, ගම්පහ කලාපය යනු දැවැන්ත කර්මාන්ත පුරයකි. සිය දහස් ගණනකට රැකියා සපයන මේ ඇඟලුම් ක්ෂේත්‍රයේ යම් බිඳ වැටීමක් සිදු වුව හොත් මේ දහස් ගණනකට රැකියා අහිමි වනු ඇත. එමෙන්ම සේවකයන් රැකියාවට ඒම ප්‍රතික්ෂේප කළ හොත් එම දැවැන්ත සමාගම් ද එක රැයින් කඩා වැටෙනු ඇත. සේවක පඩි නඩි ගෙවීම, ණය ශේෂ පියවීම වැනි අර්බුද ගණනාවක් මතු වනු ඇත. එමෙන්ම සේවා වියුක්තිය හමුවේ රජය ද අපහසුතාට ලක් වනු ඇත. මේ සියලු කාරණා මනා ලෙස කළමනාකරණය කර ගනිමින් තම සමාගම්, ආයතන පවත්වා ගෙන යෑමට පාලනාධිකාරිය වග බලා ගත යුතුය.

> කොරෝනා වසංගතයත් සමඟ ඇති විය හැකි ආර්ථික අවපාතය වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය ද ව්‍යාපාරික ක්ෂේත්‍රයට යම් සහන සලසා දී තිබේ. ණය සහන සැලසීම ඉන් එකකි. ඒ වගේම ඉදිරියේදිත් කොරෝනා නොව වෙනත් ස්වරූපවලින් විවිධ වසංගත රෝග පැමිණීමට බැරිකමක් නැත.

## නව වෙළෙඳපොළ

කොවිඩ් 19 වසංගතය ලෝකයට කියා දි ඇති පණිවිඩය නම් අන් සියල්ලටම සෞඛ්‍ය සුරක්ෂිතාව ප්‍රමුඛ විය යුතු බවයි. බ්‍රැන්ඩික්ස් කොරෝනා පොකුරත් සමඟ මතු වන වැදගත්ම කාරණය ද ඉදිරියටත් කොරෝනා පාලනය කරමින් සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය තහවුරු කිරීමට සියයට සියයක් නොව දෙසීයක් සැලකිලිමත් විය යුතු බවයි. මෙය සේවකයන් දෙතුන් දෙනකුගේ ශ්‍රමය ලබා ගන්නා වෙළෙඳ ආයතනයකට වුවත් පොදු වූ කාරණයකි. සේවක අභිප්‍රේරණය යනු ආර්ථික විද්‍යාවේ සුවිශේෂ න්‍යායකි. මේ න්‍යාය පවත්වා ගෙන යෑමට යම් ආයතනයක් අසමත් වුව හොත් එතැන අර්බුදයක් සහ කීර්ති නාමයට පවා කැළලක් ඇති වීම නොවැළැක්විය හැකිය.

මේ වන විට මෙම වසංගතය හේතුවෙන් ලෝක වෙළෙඳපොළේ ඉල්ලුම සහ සැපයුමේ හැසිරීම යම් තරමකට හෝ වෙනස් වී ඇත. එමෙන්ම නිෂ්පාදන සහ සේවා ආනයන අපනයන රටාව ද යම් තරමකින් හෝ චංචලනයකට ලක් ව ඇත. මේ තත්ත්වයන් හරිහැටි අවබෝධ කර ගැනීම ව්‍යාපාරික ක්ෂේත්‍රයට ඉතා වැදගත්ය. සමාගමක, ව්‍යාපාරික ආයතනයක නිෂ්පාදනය කුමක් වුවත් මේ මොහොතේ කොරෝනා වසංගතය විසින් මේ සියල්ල පාලනයකට නතු කර ගෙන ඇත. එය එසේ වුවත් පොදුවේ රටේ ආර්ථිකය ජය ගැනීම සඳහාත් පෞද්ගලිකව තම තමන්ගේ ලාභ ලැබීමේ ඉලක්ක කරා යෑම සදහාත් සුදුසු යන්ත්‍රණයක් සකසා ගත යුතුය. උදාහරණයක් ලෙස අපේ නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය ආනයනික වෙළෙඳපොළ ඇහිරී ඇත්නම් ආදේශක අමුද්‍රව්‍යවලින් එම අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමට පවා අපට සිදු වනු ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට මේ තත්ත්වය ආශිර්වාදයක් කර ගනිමින් දේශීය වෙළෙඳපොළ ජය ගැනීමට මංපෙත් විවර කර ගත හැකිය. මීට හොඳම මාතෘකාව මතු කළේ කහ හිඟයයි. ඉන්දියාවේ කහ ආනයනය කරමින් යැපුම් මානසිකත්වයෙන් ම කටයුතු කළ අපට කෙරෝනා තත්ත්වයත් සමඟ ආනයනික සීමා හේතුවෙන් දැඩි කහ හිඟයක් මතු විය. එහෙත් දැන් රට තුළ කහ වගා කර තව මාස දෙක තුනකින් දේශීය වෙළෙඳපොළට එම නිෂ්පාදන පැමිණෙනු ඇත. ඒත් සමගම දේශීය ව්‍යාපාරිකයාට ඒ තුළින් තම ව්‍යාපාරය නව මුහුණුවරකින් ඉදිරියට ගෙන යා හැක.

කොරෝනා වසංගතයත් සමඟ ඇති විය හැකි ආර්ථිකමය අවපාතය වළක්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය ද ව්‍යාපාරික ක්ෂේත්‍රයට යම් සහන සලසා දී තිබේ. ණය සහන ඉන් එකකි. ඒ වගේම ඉදිරියේදිත් කොරෝනා නොව වෙනත් ස්වරූපවලින් විවිධ වසංගත රෝග පැමිණීමට බැරිකමක් නැත. සමාජ දුරස්ථකරණය ගැන වැඩියෙන්ම දැනෙන්නට වූයේ කොරෝනා බියත් සමඟ වුවත් ඉදිරියටත් මේ සියයට සියයක් ම සෞඛ්‍යාරක්ෂාව සුරක්ෂිත කරන සමාජ දුරස්ථකරණයට යෑමට අපට සිදු වනු ඇත. එහෙත් විශාල පිරිසක් සේවය කරන රැකියා ස්ථානවල අද ව්‍යවහාරයේ පවතින අයුරින් මීටරයක දුර කෙසේ නම් පවත්වා ගෙන යා හැකි ද? රටේ ප්‍රධාන නගරවලට කෙන්ද්‍ර වී ඇති රැකියා ස්ථානවල මේ තත්ත්වය පවත්වා ගෙන යෑම ප්‍රායෝගික නැත. මේ ගැටලු විසැඳීම සඳහා රජයට මැදිහත් වීමට සිදු වනු ඇත. ඒ සඳහා ප්‍රධාන නගරවලින් බැහැරට මහා පරිමාණ කර්මාන්ත ශාලා රැගෙන යෑමට අවශ්‍ය ඉඩම් සොයා දීම කළ හැකිය. රජයේ සම්පත් ප්‍රශස්ත ලෙස පරිහරණය අවශ්‍ය වන්නේ මෙවැනි අභියෝග ජය ගැනීම සඳහාය. එයින් ග්‍රාමීය රැකියා ප්‍රශ්නයට ද විසැඳුමක් වනු ඇත. දැනටමත් කොළඹ, ගම්පහ, කටුනායක, බියගම ආදි රැකියා පුරවරවල සේවය කරන්නේ ග්‍රාමීය ශ්‍රමික ප්‍රජාවයි. ඇතැම් මහා පරිමාණ ව්‍යාපාරික සමාගම් විශේෂයෙන් ඇඟලුම් කම්හල් දැනටමත් තම ශාඛා, වැඩ බිම් ගමට ගෙන ගොස් ඇත. මෙය වඩාත් සාධනීය විකල්පයකි. අද ලංකාවේ ප්‍රවාහන සහ මහා මාර්ග ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන දියුණුවත් සමඟ ඒ සඳහා කිසිදු බාධාවක් ද නැත. මේවා දිගු කාලීන විසැඳුම් ලෙස අද සිටම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවේශයක් ගත යුතුය.

## සාමූහික වගකීම

කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් විදේශීය වෙළෙඳපොළේ හැසිරීම අවතක්සේරුවට ලක් කළ නොහැකිය. අපනයනය ක්ෂේත්‍රයේ ව්‍යාපාරිකයන් මේ බව බුද්ධිමත්ව අවබෝධ කර ගත යුතුය. කොරෝනා හේතුවෙන් බොහෝ යුරෝපා සහ ආසියාතික රටවල් පවා භාණ්ඩ ආනයනයේදී පෙරටත් වඩා සෞඛ්‍යාරක්ෂිත බව ගැන සැලකිලිමත්වීම අලුත් ප්‍රවේශයකි. විශේෂයෙන් ආහාර නිෂ්පාදන අපනයනික වෙළෙඳපොළ තුළ සියයට සියයක්ම තත්ත්වය හා ප්‍රමිතිය බැලීමට ඇතැම් රටවල් පෙලඹී ඇත. මේ නිසා අපේ නිෂ්පාදන අන්තර්ජාතික වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේදී අපද පෙරට වඩා තත්ත්වය හා ප්‍රමිතිය ගැන සිතා බැලිය යුතුය.

මහා පරිමාණ ව්‍යාපාරිකයා සේම ගමේ සිල්ලර වෙළෙන්දා ද දේශීය ආර්ථිකයේ පුරුකකි. ව්‍යාපාරික ක්ෂේත්‍රය යන පුළුල් වපසරිය තුළ මේ සියලු පාර්ශ්වයන් සිටිනු ඇත. අද ගමේ කඩපොළ ද කොරෝනා බලපෑමට ලක් වී ඇත. මේ බලපෑම කෙසේ වුවත් අපට තව කාලයක් මේ ආකාරයෙන්ම ගත කළ යුතුව ඇත. මේ නිසා මුඛ ආවරණයක් පැලඳ ගෙන කඩයට පැමිණෙන ලෙස සිය පාරිභෝගිකයන්ට දැනුම් දෙන අතර තුර ජල කරාමයක් වෙළෙඳසල ඉදිරිපිට ස්ථාපිත කර විෂබීජහරණය සඳහා අත පය සෝදා ගෙන ඇතුළු වන ලෙස දැනුම්වත් කිරීමේ සිට සියල්ල කොරෝනා ආර්ථික අර්බුදයෙන් නැඟී සිටීම සඳහා පිටුවහලක් වනු ඇත.

කොවිඩ් 19 වසංගතයෙන් ජාතික ආර්ථිකයට විය හැකි බලපෑම ජය ගැනීමට නම් සියලු පාර්ශ්වයන් සාමූහිකව කටයුතු කළ යුතුය. එයින් විනිර්මුක්තව, හුදෙකලාව කටයුතු කිරීමට හැකියාවක් නැත. පවතින තත්ත්වයට අනුවර්තනය වීම පැවැත්ම තීරණය කිරීමේ සොබා දහමේ නියමයයි. මේ නියමයට ව්‍යාපාර ක්ෂේත්‍රය ද අනුගත විය යුතුය.

**සකුන්තලා ජයසිංහ**







# මිග් ගනුදෙනුවේ ඇත්ත කතාව



## මිග් යානාවේ නැඟී කළ දේශපාලන දඩයම උදයංග හෙළි කරයි

රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග පසුගිය යහපාලන කාලය පුරා කතාබහට ලක් වූ අයෙකි. ඊට ඈඳුණු මිග් යානා ගනුදෙනුව ද මෙරට ජනතාවට නොරහසකි. මාධ්‍යයේ ද, පාර්ලිමේන්තුවේ ද, කැබිනට්ටුවේ ද කතා වූයේ උදයංග ගැනය. මෙයට හේතුව සරලව කිව හොත් කෙක්කෙන් බැරි වූ දේ කොක්කෙන් හරි කීරිමට ඔවුන්ට අවශ්‍ය වූ නිසාය.

මිග් යානා ගනුදෙනුව සිදු වූයේ 2006 වසරේදීය. 2000 වසරේ දී මෙරට රජය මිල දී ගත් යානාවලට වඩා වැඩි මුදලක් ලබා දී මිග් යානා හතක් මිල දී ගනිමින් ලංකා රජයට පාඩු කළේ යැයි මුලින්ම ඇඟිල්ල දිගු වන්නේ හිටපු ආරක්ෂක ලේකම් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙතය. සන්ඩේ ලීඩර් පුවත්පත ලිපියක් පළ කරමින් මිග් ගනුදෙනුව පිළිබඳව ගෝඨාභය රාජපක්ෂ මහතා වැරදිකරු කිරීමට උත්සාහ දැරුවත් එම උත්සාහය පල රහිත වන්නේ මිග් ගනුදෙනුව මෙරට සිදු වූ විනිවිද ගනුදෙනුවක් ලෙසට රාජපක්ෂ මහතා විසින් අධිකරණයේදී ඔප්පු කිරීම හේතුවෙනි. ඒ විතරක් නොව අදාළ පුවත්පතට රුපියල් මිලියන සීයක වන්දියක් ගෙවීමට ද අධිකරණය නියෝග කරන්නේය. ගල්කිස්ස අධිකරණය මේ නියෝගය ලබා දෙන්නේ ද යහපාලන රජය පත් වීමෙන් පසුව (2015) වීම තවත් විශේෂ සිද්ධියක් වන්නේය.

යහපාලන ආණ්ඩුව බලයට පත් වීමෙන් පසුව ගෝඨාභය රාජපක්ෂ මහතා කොටු කර ගැනීමේ මෙහෙයුම යළි කරළියට එන්නේය. ඊට තෝරා ගන්නේ උදයංග වීරතුංග නම් රුසියාවේ හිටපු තානාපතිවරයාය. ඔහු රාජපක්ෂ මහතාගේ පුංචි අම්මාගේ පුතාය. මැදමුලන විද්‍යාලයෙන් හා කොළඹ නාලන්දා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබන වීරතුංග මහතා රුසියාවට පා තබන්නේ 1985 වසරේදීය. අධ්‍යාපනය නිමා කිරීමෙන් පසුව ව්‍යාපාර කටයුතුවල නිරත වන වීරතුංග මහතා විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මහතාගේ සමයේදී ශ්‍රී ලංකා ඔනරලි කවුන්සල්වරයා බවට පත්වීම් ලබන්නේ එතෙක් පැවැති තානාපති අඩුපාඩුවක් සම්පූර්ණ කරමින්ය. 1992 යුක්රේන් ප්‍රාන්ත රාජ්‍යයක් ලෙස සිදු වූ පරිවර්තනයෙන් පසු ඔහු සතු භාෂා නිපුණතාවයත්, දීර්ඝ කාලීන පදිංචියත් හේතු කොට තානාපතිවරයකු ලෙස 2006 ජූලි 17 දින සිට පත්වන්නේය. මිග් යානා ගනුදෙනුව සිදු වීමට පෙර ශ්‍රී ලංකා රජය ඈන්ටනෝ 32 වර්ගයේ ගුවන් යානා 08ක් මිල දී ගන්නේ ද යුක්රේන් රාජ්‍යයෙනි. එහිදී ද ශ්‍රී ලංකා රජයට පහසුකම් සපයන්නා ලෙස ක්‍රියා කර ඇත්තේ වීරතුංග මහතාය. එම දීර්ඝ කාලීන සබඳකම් හා හමුදාවන් අතර සම්බන්ධීකරණය හේතුවෙන් දේශ හිතෛෂී මිතුරකු ලෙස හෙතෙම ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයාට සහාය වන්නේය. ඒ තානාපතිවරයකු ලෙස නොවන බව හෙතෙම සඳහන් කරන්නේය.

වීරතුංග මහතා තානාපති ලෙස වැඩ බාර ගැනීමට පෙර මිග් ගනුදෙනුවට ශ්‍රී ලංකා රජය අස්සන් කර ඇති බවත්, ශ්‍රී ලාංකික පුරවැසියකු ලෙස තමන් යුක්රේන් රාජ්‍යයේ සබඳකම් මත අදාළ ගනුදෙනුවේ පහසුකම් සපයන්නා ලෙස පමණක් කටයුතු කළ බවත් වීරතුංග මහතා පසුගියදා දිවුරුම් පිට ප්‍රකාශ කළේ දේශපාලන පළි ගැනීම් පිළිබඳ විමර්ශන ජනාධිපති කොමිසම හමුවේදීය. රටට හිතැතිව කටයුතු කළ තමන් දේශපාලන ඉලක්කයක් කර ගනිමින් යහපාලන ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලය ක්‍රියා කළ ආකාරයත්, කැබිනට් මණ්ඩලය පත් කළ දූෂණ විරෝධී කමිටුව දේශපාලන පළිගැනීම් කළ ආකාරයත් හෙතෙම අනාවරණය කළේය.

ශ්‍රී ලංකා රජය 2000දී මිල දී ගත් මිග් ගුවන් යානා සහ 2006 දී මිල දී ගත් ගුවන් යානා 7 අතර වෙනස ඔහු මනාව කොමිසමට සාක්ෂි සහිතව ඉදිරිපත් කළේය.

මිග් ගනුදෙනුව හේතුවෙන් තමාව කොටු කර ගැනීමට ගත් උත්සාහය දේශපාලන පළි ගැනීමක් පමණක් බව ඔප්පු කිරීමට හිටපු අගමැතිවරයා පමණක් නොව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ද කොමිසමට කැඳවීමට හෙතෙම තීරණය කළේය.

දේශපාලන පළි ගැනීමක් කළ බවට සනාථ කිරීමට මිග් ගනුදෙනුව සිදු වූ අයුරු හා විමර්ශන කළ අයුරු මෙසේ කොමිසමට සඳහන් කර සිටියේය.

### ගල්කිස්ස අධිකරණයෙන් දියාරු වූ පැමිණිල්ල නැවතත් කරළියට

"ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් ගුවන් යානා මිල දී ගැනීමේදී මූල්‍යමය අක්‍රමිකතාවක් සිදු වී ඇති බවට මාධ්‍යවේදී ඉක්බාල් අතාස් යන අය කර ඇති පැමිණිල්ලක් අනුව 2015 මාර්තු 26 දින මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනු කළා. පසුව 2016/10/20 දින අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 63(1) (අ) උප වගන්තිය යටතේ වරෙන්තු නිකුත් කළා. මෙලෙස මට එරෙහිව වරෙන්තු ලබා ගැනීම බොරු සාක්ෂි ඉදිරිපත් කර සම්පූර්ණයෙන් අධිකරණය නොමග යවා කටයුතු කිරීමක් වෙනවා. අසත්‍ය කරුණු කොටුව මහේස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කර තිබුණා.

ශ්‍රී ලංකා රජය 2000 වර්ෂයේ මැයි මාසයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් 27 ගුවන් යානා 04 ක් සිංගප්පූරු සමාගමක් වන D.S ALLIANCE නමැති සමාගම මගින් ඇමරිකානු ඩොලර් මිලියන 1.75 බැගින් ද තවත් යානා 03 ක් ඇමරිකානු ඩොලර් මිලියන 1.60 බැගින් ද මිල දී ගන්නවා. එම ගුවන් යානා 1982, 1983 හා 1984 වසරවල නිෂ්පාදිත ඒවා බව පැමිණිලි කර ඇත. 2006 වසරේ දී නැවතත් 1980 හා 1983 වසරවල නිෂ්පාදිත එම වර්ගයේ යානා 04ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් ඇමරිකානු ඩොලර් මිලියන 2.462 බැගින් මිල දී ගෙන ඇති බවත්, ඒ අනුව එකම කාලයේ නිෂ්පාදිත යානා මිල දී ගැනීම සඳහා 2000 වසරේ ගෙවූ මිලට වඩා අධික මිලක් 2006 වසරේ දී ගෙවා ඇති බවත් සඳහන් කරමින් මෙම පැමිණිල්ල කර තිබුණා. අදාළ ගනුදෙනුව ශ්‍රී ලංකා රජය සහ යුක්රේන රජය අතර සිදුවන්නක් බව පෙන්වා දී තිබුණ ද 2006 වර්ෂයේදී සිදුවූ ගනුදෙනුවෙහිදී මුදල් ගෙවනු ලැබ ඇත්තේ එංගලන්තයේ (BELLIMISSA HOLDINGS LTD) බෙලිමීසා නමැති සමාගමක් වෙත බව මාධ්‍යවේදී ඉක්බාල් අතාස් විසින් දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලයට 2015.03.05 දින පැමිණිල්ලෙන් සඳහන් කර තිබුණා."

### යහපාලන ආණ්ඩුවේ දෙවැනි පැමිණිල්ල

පසුව එම දූෂණ විරෝධී කමිටුවේ ක්ෂණික ප්‍රතිචාර කමිටු සම්බන්ධීකාරක ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර කුමාර දිසානායක සහ එහි අධ්‍යක්ෂ ආනන්ද විජේපාල විසින් පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය වෙත පිටු 35 විස්තර වාර්තාවක් සහ පිටු 278 ඇමිණු ගොනුවක් ඉදිරිපත් කරමින් පැමිණිල්ල ඉදිරිපත් කර තිබුණා. මුදල් විශුද්ධිකරණ පනත යටතේ විමර්ශන කරන ලෙස නියෝජ්‍ය පොලිස්පති රවී වෛද්‍යාලංකාර මහතා වෙත ලිඛිතව පැමිණිලි කළා. වර්තමාන ජනාධිපතිවරයාගේ දේශපාලන ගමන නතර කිරීමේ මුල් පියවරක් ලෙස මා මේ පැමිණිල්ල දකිනවා. අසත්‍ය කරුණු පදනම් කර ගත් මෙම පැමිණිල්ල ද්වේෂ සහගතයි. මට අදාළ වන මෙම පැමිණිල්ල යහපාලන ආණ්ඩුව පත් වූ පසුව දූෂණ විරෝධී කමිටුව මගින් ඉදිරිපත් කළ 02 පැමිණිල්ල ලෙස සටහන් වෙනවා. ඒ වගේම යහපාලන ආණ්ඩුව විසින් අධිකරණයට ඉදිරිපත් කළ 05 පැමිණිල්ල වෙනවා. රනිල් වික්‍රමසිංහ මහතා 2015 ජනවාරි 21 ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවේ සටහන් වන විදිහට 15 දෙනකුට වත් නඩු පැවරීම අරමුණව තිබුණා. එම පහළොස් දෙනා අතර 11 වැනියා ලෙස මා සටහන් කිරීම දේශපාලන පළි ගැනීමක් ලෙස පෙන්වා දිය හැකියි. දූෂණ විරෝධී කමිටුවට පැමිණිලි ඉදිරිපත් කිරීමේ නීතිමය හැකියාවක් නොතිබූ බව මේ කොමිසමේ සාක්ෂි දුන් හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා පිළිගෙන තිබෙනවා. ඒ වගේම මාගේ පාස්පෝට් එක තහනම් කිරීම පිළිබඳව යහපාලන කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා කළ බව ද පිළිගන්නවා. මේ අනුව බලන කොට ස්වාමීනී මට එරෙහි පැමිණිල්ල සම්පූර්ණයෙන් නීතියට පටහැණි බව පේනවා.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා UKRINMASH නමැති සමාගම අතර 2006/07/26 දින SLAF/2006/07/AIR දරණ ගිවිසුම UKRINMASH සමාගමෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ G.A. STUDENIKI විසින් එම සමාගමේ අධ්‍යක්ෂ PEREGUDOVගේ ඇටෝර්නි බලපත්‍රයක් මත ගිවිසුම අත්සන් කර තිබෙනවා. එසේ නමුත් පසුගිය වසර 05 තුළ අදාළ ඇටෝර්නි බලපත්‍රය අධිකරණයට ඉදිරිපත් කිරීමට පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය කටයුතු කළේ නැහැ. ඒ තුළින් මා කෙරෙහි වැරදි චිත්‍රයක් අධිකරණයට ඉදිරිපත් කළා.

මිග් ගනුදෙනුවට අදාළ මුල් ලිපිය ඉදිරිපත්ව ඇත්තේ 2006 ජනවාරි 25 වන දිනයි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එවක හමුදාපතිවරයා විසින් එවක ආරක්ෂක ලේකම්වරයා වෙත දන්වා ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් යානා මිලදී ගැනීමේ අවශ්‍යතාවක් ඇති බවත්, ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙසත්ය. ඒ අනුව මෙම ගනුදෙනුව සඳහා මුල පුරා ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින්ම බවත් අදාළ ගනුදෙනුව මාගේ මූලිකත්වයෙන් අරඹන ලද්දක් නොවන බවත් මෙම ලිපි මගින් පැහැදිලි වෙනවා.

ඉන්පසුව යුක්‍රේනයේ UKRINMASH නමැති සමාගමෙහි නියෝජිතයකු 2006/02/06 දින ආරක්ෂක අමාත්‍යාංශයේ හා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරීන් මුණ ගැසී ඇති අතර පසුව ලිපියක් මගින් මිග් ගුවන් යානා හතරක් අලෙවි කිරීම හා තවත් මිග් යානා හතරක් ඕවර්හොල් කිරීම සඳහා වන ලිපියක් ඉදිරිපත් කර ඇති අතර එම ලිපිය මගින් එම සේවා සඳහා ඇමරිකානු ඩොලර් 14,280,000/-ක මිලක් ඉදිරිපත් කර තිබෙනවා. එම ලිපියේ අවසාන පිටුවෙහි සඳහන් කර ඇත්තේ එකී අර්පනය FINANCIAR කෙනෙක් සමඟ එක්ව ඉදිරිපත් කරනු ලබන බවත් එම FINANCIARගේ නම ගිවිසුම අස්සන් කිරීමට දින තුනකට පෙර දැනුම් දෙන බව ගුවන් හමුදාපති වෙත දැනුම් දීමට කටයුතු කරන බවයි. ඒ අනුව එකී FINANCIARගේ මැදිහත්වීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය සහ ගුවන් හමුදාව මුල සිටම දැනුම්වත් කර ඇති බව පෙනී යනවා.

ඉන්පසු ජාතික ප්‍රසම්පාදන ඒජන්සියේ සභාපතිවරයා තාක්ෂනික හා මූල්‍ය ඇගයීම් කමිටුවක් (TEC) ගුවන් හමුදාපතිවරයාගේ සභාපතීත්වයෙන් හා නිලධාරින් හය දෙනෙක්ගෙන් යුත් තාක්ෂණික හා මූල්‍ය ඇගයීම් කමිටුවක් පත් කර තිබෙනවා. ඒ අනුව ගුවන් හමුදාපතිවරයා ප්‍රධාන තාකෂණ ඇගයීම් කමිටුව ස්වකීය නිර්දේශ මගින් UKRINMASH සමාගමෙන් අදාළ යානා මිල දී ගන්නා ලෙසට ද ගෙවිය යුතු මිල ගණන් දන්වා, ඊට අනුමැතිය දෙන ලෙසට ආරක්ෂක ලේකම්වරයාට දන්වා තිබෙනවා. එසේම ජාතිය ගොඩනැගීමේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, ආරක්ෂක ලේකම්රයා ඇතුළු නිලධාරීන් තිදෙනකුගෙන් සමන්විත කැබිනට් මණ්ඩලය මගින් පත් කර තිබූ ප්‍රසම්පාදන කමිටුවක් විසින් තාක්ෂණික ඇගයීම් කමිටුවේ යථෝක්ත නිර්දේශ හා ගුවන් හමුදාපතිවරයාගේ ඉල්ලීම සලකා බැලීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ 2006/05/05 දින ඉදිරිපත් කර ඇත. පසුව යානා මිල දී ගැනීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් සිදු කර බව ගුවන් හමුදාපතිවරයා ආරක්ෂක ලේකම්වරයා වෙත දන්වනු ලැබ තිබෙනවා. ඒ අනුව ගනුදෙනුවට අදාළ ක්‍රියාපටිපාටිය සිදු කරන ලද්දේ මා විසින් නොවන බව පැහැදිලි සාක්ෂි තිබෙනවා. එහෙත් පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය දිගින් දිගටම මෙම චෝදනා මට එල්ල කිරීම දේශපාලන පළි ගැනීමක් වෙනවා.

මිග් ගනුදෙනුවට අදාළව 2006/06/09 දින ගුවන් හමුදාපතිවරයා THE LETTER OF GUARANTEE යන ශීර්ෂය සහිත ලිපියක් "UKRINMASH" සමාගමෙහි අධ්‍යක්ෂ PEREGUDOV යන අයට යොමු කර තිබෙනවා. එමගින් ශ්‍රී ලංකා රජයේ ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් අදාළ යානා මිල දී ගැනීම හා ඕවර්හෝල් කිරීම UKRINMASH හරහා කරවා ගැනීමට අපේක්ෂා කරනු ලබන බවට සහතිකර ඇති බව සඳහන් වෙනවා. ඒ අනුව ඔහු තවදුරටත් දන්වා ඇත්තේ, අදාළ යානා හදිසියේ මිල දී ගැනීමට අවශ්‍යතාව ඇති බැවින් විධිමත් ගිවිසුමක් අස්සන් කිරීමට පෙරම අදාළ යානා ඕවර්හෝල් කිරීමේ කටයුතු අරඹන ලෙසයි. ඒ අනුව ගුවන් හමුදාවේ ඉංජිනේරුවරයකු ඇතුළු ගුවන් හමුදා නිලධාරීන් පිරිසක් යුක්රේනියාවේ අදාළ කර්මාන්ත ශාලාවට සේවය කිරීම සඳහා පිටත් වී ඇති බව ද මෙහි සටහන් වෙනවා. මම යුකේරනයේ ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස සේවය ආරම්භ කළේ 2006/07/17 සිට මිග් ගනුදෙනුවට අදාළ ගිවිසුමට ශ්‍රී ලංකා රජය 2006 ජූලි 04 දින අස්සන් තබා තිබෙනවා.


මේ අනුව මම රුසියානු සමූහාණ්ඩුවේ ශ්‍රී ලාංකා තානාපතිවරයා ලෙස පත් කරනු ලැබීමට මසකටත් පෙර මෙම මිග් යානා මිල දී ගැනීම හා ඕවර්හෝල් කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහමුලින්ම අවසන් වී තිබෙනවා. අදාළ ඕවර්හෝල් කටයුතු අරඹන ලෙස මෙකී UKRINMASH සමාගම වෙත නිල වශයෙන් ගුවන් හමුදාපති විසින් දන්වා අවසන් කොට තිබූ බව පැහැදිලි වෙනවා. එපමණක් නොව ගුවන් හමුදාවේ ඉංජිනේරුවරයකු ඇතුළු ගුවන් හමුදා නිලධාරීන් පිරිසක් මිග්යානා අලුත්වැඩියා කරන කර්මාන්ත ශාලාවට ගිවිසුමට අදාළව සේවය කිරීම සඳහා යුක්රේනයේ ලුවෝෆ් නගරයට පිටත් වී ඇති අතර 2006 ජූලි 15 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉහත කී BELLIMISSAHOLDINGS සමාගම වෙත ENDUSER සහතිකය දෙකක් නිකුත් කර ඇති බව සනාථ කරන සාක්ෂි තිබෙනවා. එසේම අදාළ ඇණවුම තහවුරු කරමින් 2006/07/15 දින ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ORDER CONFIRMATION එකක් ඉහත කී UKRINMASH සමාගම වෙත යවා ඇති අතර එහි පැහැදිලිව දක්වා ඇත්තේ මෙම ගනුදෙනුවට අදාළ ගෙවීම් BELLIMISSA සමාගම වෙත කරනු ලබන බවයි.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව BELLIMISSA සමාගම සහ UKRINMASH සමාගම අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුම 2006/07/26 දින ගුවන් හමුදාපතිවරයා විසින් අස්සන් තබනු ලබන්නේ ඉන් අනතුරුවයි. ඉන්පසුව එම ගනුදෙනුවට අදාළ ඉන්වොයිසිය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ඒවා ඇති අතර ගුවන් හමුදාව විසින් BELLIMISSA සමාගම නමට මහජන බැංකුව හරහා ඩොලර් 13,976,000 වටිනාකමකට ණයවර ලිපියක් නිකුත් කිරීමෙන් බව සඳහන්. ඒ අනුව පැහැදිලි වන්නේ ගිවිසුමට අදාළ මුදල යට කී BELLIMISSA HOLDINGS LTD සමාගම වෙත ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකා ගුවන් හමුදාපතිවරයාගේ සම්පූර්ණ අනුදැනුම මත බවයි.

**රෝෂන් තුෂාර**

ඉතිරි කොටස හෙට පත්‍රයේ

(මිග් යානයේ ඡායාරූපය නිරූපණයක් පමණි)



| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා | ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 - 10 - 13 | 2020 - 09 - 21 | 2020 - 09 - 08 | 2020 - 09 - 27 | 2020 - 07 - 31 | 2020 - 09- 09 | 2020 - 09 - 09 | 2020 - 09- 27 | 2020 - 09-30 | 2020 - 09 - 09 | 2020 - 09 - 28 | 2020 - 07 - 30 |
| දිනුම් වාරය - 2569 | දිනුම් වාරය - 1537 | දිනුම් වාරය - 2916 | දිනුම් වාරය - 630 | දිනුම් වාරය - 354 | දිනුම් වාරය - 1688 | දිනුම් වාරය - 3366 | දිනුම් වාරය - 1228 | දිනුම් වාරය - 1059 | දිනුම් වාරය - 1036 | දිනුම් වාරය - 1617 | දිනුම් වාරය - 013 |
| 13 21 44 54 | 01 33 37 57 | 21 37 45 59 | 11 21 45 64 | 22 23 40 | 07 31 35 43 | 31 34 60 64 | 11 27 35 42 | 0 0 2 7 9 6 | 07 12 39 48 | 37 46 48 58 | 04 12 33 63 |
| අක්ෂරය G | සුපිරි අංකය -01 | ලග්නය-මිතුන විශේෂිත අංක රු 500 ත්‍යාග සඳහා-9609 | ඉංග්‍රීසි අක්ෂරය- E | දෛව අංකය - 02 අක්ෂරය- L | අක්ෂරය-A | අක්ෂරය - D | අක්ෂරය - Q විශේෂ අංකය -5767 | අක්ෂරය -H | අක්ෂරය - K රු 500 ත්‍යාග සඳහා-2169 | අක්ෂරය - G | අක්ෂරය - U |

# 800 චිත්‍රපටයේ රඟපාන්න එපා

## මුරලිදරන් විජේ සේදුපතිගෙන් ඉල්ලයි

තම ජීවිත කතාව ආශ්‍රයෙන් නිර්මාණය කෙරෙන 800 චිත්‍රපටයට රංගනයෙන් දායකත්වය ලබා නොදෙන ලෙස මෙරට ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩක මුත්තයියා මුරලිදරන් කොලිවුඩ් සුපිරි නළුවකු වන විජේ සේදුපතිගෙන් ඉල්ලයි.

චිත්‍රපටයට මේ වන විට එල්ලවන විරෝධය හේතුවෙන් මෙම ඉල්ලීම කරන බව මුත්තයියා මුරලිදරන් පවසයි. චිත්‍රපටයේ රඟපෑමෙන් සේදුපතිට ඉදිරියේදී විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවිය හැකිබවද පැවසූ මුරලිදරන් මෙම චිත්‍රපටයේ නිල වීඩියෝව නිකුත් වීමත් සමග දකුණු ඉන්දියානුවන්ගෙන් දැඩි විරෝධයක් පළ විය. දමිළ ජනතාව ඝාතනය කළ රටක ක්‍රීඩකයකු වෙනුවෙන් සිනමා පටයක් සෑදීමට ඔවුන් විරෝධය පළ කරන බව ප්‍රකාශ කළා. මෙම තත්ත්වයට ලිපියක් මගින් පසුගියදා ප්‍රතිචාර දැක්වූ මුත්තයියා මුරලිදරන් තවත් ලිපියක් මගින් තම චරිතයට පණ පොවන විජේ සේදුපතිට අනතුරු ඇඟවීමක් සිදු කළා. ඉදිරි පරපුරට මේ චිත්‍රපටය ආත්ම විශ්වාසයක් බවට පත් වෙයි කියා තමා මෙයට කැමැති වූ බවත් තමන් පිළිබඳ වැරදි අදහසක සිටින කණ්ඩායමක් කොලිවුඩ් නළු විජේ සේදුපතිව විවෙචනය කරන බවත් එම ලිපියේ දැක්වේ. තමන් නිසා දකුණු ඉන්දියාවේ සිටින දක්ෂ නළුවෙක් විවිධ දුෂ්කරතාවලට ලක් වෙනවා දැකීමට තමන් කැමැති නොවන බවද ලිපිය මගින් ප්‍රකාශ කරන මුත්තයියා මුරලිදරන් එම නිසා මේ චිත්‍රපටයෙන් ඉල්ලා අස්වන ලෙස ඉල්ලා සිටින බවද ප්‍රකාශ කරයි. මෙම ලිපියට පිළිතුරු සපයමින් විජේ සේදුපති තම ටුවිටර් ගිණුමේ සඳහන් කරන්නේ ආයුබෝවන් ස්තූතියි යනුවෙනි.

# රිෂාඩ්ට රැකවරණය දුන් පුද්ගලයන් ගැන අධිකරණයට වාර්තාවක් දෙන්න

## නීතිපතිගෙන් උපදෙස්

**කුමුදු හෙට්ටිආරච්චි**

පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන් සැඟව සිටීමට රැකවරණය හා ආධාර අනුබල දුන් පුද්ගලයන් සම්බන්ධයෙන් වහා විමර්ශනයක් කර අධිකරණයට කරුණු වාර්තා කරන ලෙස නීතිපතිවරයා ඊයේ(19) වැඩබලන පොලිස්පතිවරයා ට උපදෙස් ලබා දුන් බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනී රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙණෙවිය පැවසුවාය .

මාධ්‍ය සාකච්ඡා පවත්වා ඔහු සැඟව සිටි බව ප්‍රකාශ කළ පුද්ගලයන් සම්බන්ධයෙන් ද විමර්ශනයක් සිදු කරන ලෙස නීතිපතිවරයා වැඩබලන පොලිස්පතිවරයා ට උපදෙස් ලබාදී ඇත.

ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 209,220, වගන්ති යටතේ නීතියට අවශ්‍ය පුද්ගලයකුට සැඟව සිටීමට ආධාර අනුබල හා රැකවරණය දෙන අයට එරෙහිව පැහැදිලිවම චෝදනා ඉදිරිපත් කළ හැකි බවද නීතිපතිවරයා වැඩබලන පොලිස්පතිවරයා වෙත උපදෙස් දෙමින් දන්වා ඇත.

# සිසුන්ට සෞඛ්‍යාරක්ෂාව නැත්නම් 1988ට කියන්න

කවර හෝ හේතුවක් මත කිසියම් විභාග මධ්‍යස්ථානයක දරුවන්ගේ සෞඛ්‍යාරක්ෂාව තහවුරු නොවන අයුරින්, වගකීම් විරහිතව කටයුතු කරන්නේ නම් හෝ අවශ්‍ය සෞඛ්‍යාරක්ෂිත පහසුකම් ලැබී නැත්නම් වහාම අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්ෂණික ඇමතුම් අංකය වන 1988ට ඒ බව දැනුම් දෙන ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය දැනුම් දෙයි.

මේ මස 12 වැනි දින සිට ආරම්භ කෙරුණු මෙවර අ.පො.ස. උසස් පෙළ විභාගය නොවැම්බර් 06 වැනි දින තෙක් විභාග මධ්‍යස්ථාන 2648 ක දී පැවැත්වේ.

අයදුම්කරුවන් 362,824ක් මෙවර විභාගය සඳහා අයදුම් කර ඇති අතර, දරුවන්ගේ සෞඛ්‍යාරක්ෂාව සම්බන්ධයෙන් පූ ර් ණ අවධානය යොමුකරමින් විභාග කටයුතු සිදුකිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගෙන ඇතැයි ද එම අමාත්‍යාංශය සඳහන් කරයි.

එමෙන් ම, විභාගයට පෙනී සිටින සියලු දරුවන්ගේ පූ ර් ණ සෞඛ්‍යාරක්ෂාව තහවුරු කරමින් විභාග මධ්‍යස්ථාන පරිශ්‍රයන්හි විෂබීජහරණ කටයුතු සහ අවශ්‍ය සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට ඒ ඒ විභාග මධ්‍යස්ථානවලට අදාළ විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති හෝ ජ්‍යේෂ්ඨ ගුරුවරයකු අතිරේක ශාලාධිපති (ස්ථානභාර) ලෙස පත් කර ඇතැයි ද අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි.

## අනාරක්ෂිත වළක දිය නෑ

# එකම පවුලේ දරු තිදෙනා දියේ ගිලී මරුට

**සිගිරිය විශේෂ**

ගලේවෙල රන්වැඩියාව ප්‍රදේශයේ පිහිටි කොස්පොත ඇළේ කපා ඇති අනාරක්ෂිත වළක දියනෑම සඳහා ගිය එකම පවුලේ අක්කා නගෝ මල්ලි තිදෙනා ඊයේ (19) දින දහවල් දියේ ගිලී මියගොස් ඇතැයි ගලේවෙල පොලිසිය කියයි.

මෙසේ මියගොස් ඇත්තේ ගලේවෙල රන්වැඩියාව ප්‍රදේශයේම පදිංචි රන්වැඩියාව මුස්ලිම් විදුහලේ ඉගෙනුම ලබන මරුසුක් මරුවා (15) මරුසුක් පාතිමා මරියා (12) මරුසුක්අබ්දුල් රහුමාන් (7) යන එකම පවුලේ සහෝදර සහෝදරියන් බව පොලිසිය කියයි.

රන්වැඩියාව ප්‍රදේශයේ මේ දිනවල ඇළවල ජලය නොමැතිවීම නිසා මෙම ඇළේ හාරා ඇති වළට දිය නෑම සඳහා දිනපතා ම ජනතාව ගමන් කරන බව ප්‍රදේශවාසීහු කියති.

මෙදින ද මෙම දරුවන් තිදෙනා තනිවම නිවසින් උදෑසන දිය නෑම සඳහා ගොස් බව පොලිසිය කියයි. පසුව නිවසට නොපැමිණීම නිසා නිවැසියන් ප්‍රදේශවාසීන් මෙම දරුවන් තිදෙනා සොයා බලා තිබේ. එහෙත් ඔවුන් දිය නෑ ස්ථානයේ ඔවුන්ගේ පාවහන් හා රෙදි දැක ප්‍රදේශවාසීන් සැකසිති මෙම වළේ ජලය මෝටර් මගින් ඉවත් කොට සෙවීමේ කටයුතු ආරම්භ කොට තිබිණි,

පැය කිහිපයක් පමණ ජලය ඉවත් කොට පරීක්ෂාකර බැලීමේදී දරුවන් තිදෙනාගේ ම මළ සිරුරු හමුවී ඇතැයි ගලේවෙල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රුක්ශාන්ත පෙරේරා මහතා පැවසීය.

පසුව මළ සිරුරු ගලේවෙල ප්‍රාදේශීය රෝහලට රැගෙනවිත් තිබිණි.

මෙම පවුලේ තවත් එක් දියණියක් සිටින බවත් මව පියා සහ ඥාතීන් කියා සිටියේ වෙනත් දිනවලද මෙම ස්ථානයට දරුවන් තිදෙනා තනිවම දියනෑම සඳහා පිටව යන බවය.

ප්‍රදේශවාසීන් දැඩි ලෙස චෝදනාත්මක මුඛයෙන් කියා සිටියේ වයඹ ඇළ ව්‍යාපෘතිය නිසා තම ගම්මාන මැදින් විශාල ඇළක් කැපීම හේතුවෙන් තම ගෙවතුවල ඇති සියලුම ළිං සහ ඇළවල් සිඳී යෑම නිසා ජල හිඟයකට තම ගම්මානයේ ජනතාව මුහුණ පා ඇති බවය . මේ හේතුව නිසා දියනෑමට ජලය සොයාගෙන විශාල දුරක් ගමන් කරන බවත් මේ හේතුව නිසා අනාරක්ෂිත ස්ථානවලට දියනෑමට දරුවන් යොමු වී ඇති බව ද ඔවුහු චෝදනා කරති.

මියගිය දරුවන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය ගලේවෙල රෝහලේදී පැවැත්වීමට නියමිතව තිබිණි, සිද්ධිය සම්බන්ධයෙන් ගලේවෙල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක රුක්ශාන්ත පෙරේරා මහතාගේ උපදෙස් පරිදි උප පොලිස් පරීක්ෂක ගාමිණී සරත්චන්ද්‍ර මහතා සහ පොලිස් කොස්තාපල් 57079 සුමිත් යන පිරිස විසින් පවත්වනු ලබති.

# රටට තිබෙන ඇත්ත අනතුර ගැන අවදියෙන් සිට එය පරාජය කරන්න

## ජවිපෙ ප්‍රචාරක ලේකම් ටිල්වින් සිල්වා

**නදී මාණික්කගේ**

ජනතා විරෝධයන් පාලනය කිරීමේ උත්සාහයක් 20 වැනි සංශෝධනය තුළ ඇති බවත් කොරෝනා තර්ජනය මධ්‍යයේ වුවද මෙම බරපතළ තත්ත්වය ජනතාව හමුවේ පැහැදිලි කර වටහා දීමට උත්සාහ කරන බවත් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් ටිල්වින් සිල්වා මහතා පෙරේදා (11) පැලවත්ත පක්ෂ මූලස්ථානයේ පැවැති මාධ්‍ය හමුවේදී පැවසුවේය.

එක පුද්ගලයකුගේ සහ පවුලක තනි බලය වෙනුවෙන් රටක් පාවාදී ඒකාධිපතිත්වයක් පැටවීමට දරන උත්සාහය අපේ රටේ ජනතාවගේ මැදිහත් වීමෙන් පරාජය කිරීමට හැකියැයි විශ්වාස කරන බවත්

ඉන්දියාව, චීනය, ඇමරිකාව, ඉල්ලන ඕනෑ දෙයක් ලබාදී බලය ගැනීමටත් රට පාවාදී බලය රැකගැනීමටත් ක්‍රියාකරද්දී ඇතිවන ජනතා විරෝධය පාලනය කරන්න කරන උත්සාහයක් 20 වැනි සංශෝධනය තුළ ඇති බැවින් ඒ පිළිබඳ ජනතාව දැනුවත් කළ යුතු බවත් පැවසීය.

ගෝඨාභය රාජපක්ෂ මහතා ඇතුළු පිරිස උත්සාහ කරන්නේ පාර්ලිමේන්තුවට, ජනතාවගේ මුදල්වලට, ඇමැති මණ්ඩලයට, අධිකරණයට හෝ ජනතාවට වග නොකියන තනි පුද්ගලයකුගේ ඒකාධිපති පාලනයක් හදාගැනීමට බවත් ණය උගුලක හිරවෙලා ඉන් නිදහස් වීමට සම්පත් විකිණීමට අවශ්‍ය වුවද ජනතාවගෙන් හෝ පාර්ලිමේන්තුවේ අවසරයකින් ඒවා කිරීමට නොහැකි බැවින් තමන් කැමැති ගිවිසුමක් අත්සන් කිරීම සඳහා තනි බලයක් ලබා ගැනීමට, මුදල් විගණනය නොකිරීමට 20 වැනි සංශෝධනය ගෙන එන බවත් කියා සිටියේය.

# පොහොර හිඟය අවම කිරීමට පියවර ගන්නවා

## පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ

**නුවන් හෙට්ටිආරච්චි**

ඉන්දියාව හ චීනය වැඩි වශයෙන් පොහොර මිල දී ගැනීම නිසා රටේ පොහොර හිඟයක් පැවතිය ද නොවැම්බර් මාසයේ මුල් සතිය තුළ එම පොහොර හිඟය අවම කිරීමට හැකියාව පවතින බව පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ මහේෂ් ගම්මන්පිල මහතා පවසයි.

රටේ සහ ලෝකයේ පවතින වසංගත තත්ත්වය හේතුවෙන් මෙම පොහොර හිඟය ඇති වී ඇති බවත් පොහොර ගෙන්වීමට මුහුදු ප්‍රවාහන සේවය ක්‍රමවත් අයුරින් සිදු නොවන් බවත් සඳහන් කරන ඒ මහතා නොවැම්බර් මුල් සතිය තුළ හිඟව ඇති පොහොර ප්‍රමාණය ලැබීමට නියමිත බවත් දිනමිණට පැවසීය.

පොහොර හිඟය හේතුවෙන් ගොවියාට අපහසුතා රැසකට මුහුණ දෙන අතර එම අපහසුතා කලමණාකරනය කරමින් විසඳුම් ලබා දීමට නොවැම්බර් මාසය තුළ හැකියව පවතින බවද ගම්මන්පිල මහතා සඳහන් කරයි.

# තිබ්බොටුවාව සණස සමිතියෙන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක්

**විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ**

අකුරැස්ස, සීමා රහිත තිබ්බොටුවාව සණස සමිතිය විසින් සිය සාමාජිකයන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීය. සකසුරුවම් මාසය පිළිබඳ සහ ග්‍රාමීය ජනතාවට සණස ව්‍යාපාරය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහනේ ප්‍රධාන අරමුණ වී තිබුණි.

1 පිටුවෙන් ...

## බදියුදීන් රිමාන්ඩ් ...

දෙදෙනා ලබන 27 වන දා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (19) නියෝග කළේය.

රිෂාඩ් බදියුදීන් මහතා සහ යාසීන් මහතා වෙනුවෙන් ජනාධිපති නීතිඥ අනුජ් ප්‍රේමරත්න, තවරාසා මහත්වරුන් ඇතුළු නීතිඥ මඩුල්ලක් ඇප ඉල්ලා සිටි අතර ඇප සම්බන්ධයෙන් ලිඛිත දේශන ලබන 23ට පෙර අධිකරණයට ඉදිරිපත් කරන ලෙස නියම කළ මහේස්ත්‍රාත්වරයා ඇප සම්බන්ධ නියෝගය 27 දින ප්‍රකාශයට පත්කරන ලෙස දැනුම් දුන්නේය.

රිෂාඩ් බදියුදීන් මහතා නීතියට ඉහළින් සිටින චණ්ඩියෙක් වැනි පුද්ගලයෙක් බවත් ඔහු දින හයක් තිස්සේ නීතියේ රැහැනින් පලා යන සාමාන්‍ය රස්තියාදුකාරයෙක් ලෙස ක්‍රියාකර ඇති බවත් ඔහුට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බව පැවැසීම ලැජ්ජා සහගත යැයිද රජයේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා කියා සිටියේය.

ඔහුට එරෙහිව ද්වේශ සහගත ලෙස කටයුතු කර නැති බව කියා සිටි දිලීප පීරිස් මහතා ඔහු ස්වෙච්ඡාවෙන් අධිකරණයට ඉදිරිපත් නොවූ බවත් මහජන මුදල් විශාල ලෙස වියදම් කරමින් මහත් පරිශ්‍රමයක් දරා අත්අඩංගුවට ගත් බවත් කියා සිටියේය. රිෂාඩ් බදියුදීන් මහතා සම්බන්ධයෙන් ඔප්පු 77කට අදාළව අක්කර 3000ක් මිලදී ගැනීම, ආනන්ද සාගර හිමියන් සිදුකළ විල්පත්තු වනෝද්‍යානය විනාශ කිරීමේ පැමිණිල්ල, සතොස වාහන අවභාවිතය, මන්නාරම ලක්ෂ 370ක පල්ලි නේවාසික ගොඩනැගිලි ඉදිකිරීම, ඔහුගේ බිරිඳ වන කිදෙල් මොහොමඩ් අයේෂා යන අය රාජ්‍ය බැංකුවකින් ලක්ෂ 550ක ණය මුදලක් ගෙන මාස තුනක් තුළ පියවීම, පුත්තලම අක්කර ගණනාවක් මිලට ගැනීම, සාජා රටින් නිවාස 5000ක් ඉදිකිරීමට ලක්ෂ ගණනින් මුදල් ලැබීම වගේම මන්නාරම අධිකරණයට ගල් ගැසීම වැනි කාරණා ගණනාවක් සම්බන්ධයෙන් නඩු පවතින බව කියා සිටි දිලීප පීරිස් මහතා මෙම සියලු ගනු-දෙනුවලට අදාළව මුදල් විශුද්ධිකරණ පනත යටතේ සොයා බලන ලෙස නීතිපතිවරයා මේ වන විටත් උපදෙස් ලබාදී ඇති බවත් ඒ සම්බන්ධයෙන් විමර්ශන සිදුකරමින් පවතින බවත් කියා සිටියේය.

සැකකරු පුත්තලම සිට මන්නාරම සිලාවතුර දක්වා බස් රථ 222ක් මගින් පුද්ගලයන් 11600ක් ලංගම බස් රථ මගින් ප්‍රවාහනය කිරීමට අවතැන් වූ ජනතාව වෙනුවෙන් ඇති ව්‍යාපෘතියක් මගින් රුපියල් ලක්ෂ 952560ක් රජයේ මුදලින් ගෙවා දින 6කට පසු මුදල් ලැබුණු ක්‍රමවේදයක් නොමැතිව පියවා ඇති බවත් ජාතික මැතිවරණයකදී ඡන්දදායකයින් ප්‍රවාහනය කරමින් බස් රථ 222ක් පෙරහරක් ලෙස ධාවනය කරවමින් පරිසරයට සමාජීය ජන විඥානයට යම් පණිවිඩයක් ලබාදී ඇති බවත් දිලීප පීරිස් මහතා අධිකරණයට දැනුම් දුන්නේය.

එමෙන්ම ඔහුට එරෙහිව පොදු දේපළ පනත යටතේ මෙන්ම ජනාධිපතිවරයා පත් කිරීමේ පනත යටතේ ද චෝදනා ගොනු කර ඇති බව දිලීප පීරිස් මහතා අධිකරණයට දන්වා සිටියේය. රිෂාඩ් බදුයිදීන් මහතාට සැඟවී සිටීමට ආධාර උපකාර කළ බව කියන විශේෂඥ වෛද්‍යවරිය ඇයගේ ස්වාමිපුරුෂයා ඇතුළු සැකකරුවන් 6 දෙනෙකු රහස් පොලිසිය විසින් අධිකරණයට ඉදිරිපත් කළ අතර ඔවුන් 6 දෙනාද ලබන27 දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස මහේස්ත්‍රාත් වරයා නියෝග කළේය.

## රටට ගැළපෙන ...

ව්‍යවස්ථාව යනු මූලික නීතිය බැවින් එය රටේ සියලු ජනතාවට එකලෙස බලපාන බවත් මේ නිසා කුමන හෝ සංශෝධනයක් කරන්නේ නම් රටත් ජනතාවත් ගැන සිතා එය කළ යුතුව තිබෙන බවත් ලේඛකාධිකාරී නාහිමිවරු දෙනම ප්‍රකාශ කරති.

විසිවන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් අගමැතිවරයා ඉදිරිපත් කළ කමිටුවේ නිර්දේශ මෙන්ම මහ සංඝරත්නය හා ජනතාව දක්වන අදහස් සම්බන්ධයෙන් ආණ්ඩුව අවධානය යොමුකළ යුතුව තිබෙන බව අස්ගිරි පාර්ශ්වයේ ලේඛකාධිකාරී පූජ්‍ය මැදගම ධම්මානන්ද නාහිමියෝ කීහ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කළ යුත්තේ තුන්කල් බලා බවත් එසේ කළහොත් එය මහජන සුබසිද්ධියට හා රටේ දියුණුවට හේතුවනු ඇති බවත් මල්වතු පාර්ශ්වයේ ලේඛකාධිකාරී පූජ්‍ය පහමුණේ සුමංගල නාහිමියෝ පැවසූහ.

## බදියුදීන්ට එරෙහිව ...

ලබාදුන් බවත් නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිනී රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය පැවසුවාය. එම විමර්ශන සිදුකෙරෙනුයේ නැවත පදිංචි කිරීම භාර අමාත්‍යවරයාව සිටියදී අවතැන් වූ පුද්ගලයින් ලංගම බස්රථ 222 කින් පසුගිය ජනාධිපකිවරණය දින මන්නාරමේ සිට ශිලාවතුර ප්‍රසේශය ට ප්‍රවාහනය කිරීමෙන් රජයට රුපියල් මිලියන 9.5 පාඩුවක් සිදු කිරීමේ සිද්ධියට අමතරව බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිළධරිණිය පැවසුවාය .

එම සියලුම විමර්ශනයන් මුදල් විශුද්ධීකරණය වැළැක්වීමේ පනත පදනම්කරගෙන සිදුකරන ලෙසට නීතිපතිවරයා රහස් පොලිසියේ ඉහළ නිළධාරීන් කැදවා ඊයේ (19) උපදෙස් ලබාදීමක් සිදුකළ බවද රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය වැඩිදුරටත් පැවසුවාය .

## 20ට තවත් ...

අමාත්‍ය මණ්ඩලයේ සීමාව සහ විගණන කොමිසම සම්බන්ධයෙන් දහනම වැනි සංශෝධනයේ සඳහන් කරුණු වෙනස් නොකිරීමට කැබිනට් මණ්ඩලය තීරණය කළ බව රජයේ ආරංචි මාර්ග ප්‍රකාශ කළේය.

එසේම ජාතික ආරක්ෂාව සහ ආපදා තත්ත්වයන් හැරුණු කොට වෙනත් අවස්ථාවලදී හදිසි පනත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සීමා කිරීමටත් කැබිනට් මණ්ඩලය තීරණය කළ බවත් එම ආරංචි මාර්ග පැවසීය.

මෙම සංශෝධන විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ විවාදය අවසන් වීමෙන් පසුව කාරක සභා අවස්ථාවේදී සම්මත කර ගැනීමට නියමිත බවත් එම ආරංචි මාර්ග ප්‍රකාශ කළේය. කැබිනට් මණ්ඩල හමුවෙන් පසු ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ හමුවක්ද ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වා තිබේ.

## පාස්කු දා ප්‍රහාරයට කලින් ...

ඒ මහතා මේ කරුණු කියා සිටියේ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනීසිටින ජනාධිපති නීතිඥවරයාට නිලන්ත ජයවර්ධන මහතාගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදු කළ අවස්ථාවේදී වන අතර අප්‍රෙල් 21 ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කෙරෙන ජනාධිපති කොමිසම හමුවේ රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා ඊයේ සාක්ෂි ලබා දුන්නේ 24 වෙනි දිනටය.

අපි නිතරම කිව්වා සහරාන්ගේ නම. උදාහරණයක් ගන්නම්. සිම්යොන් කියන පුද්ගලය අපරාධයක් කරන්න යනකොට සිම්යොන් ගහන්න යන බැංකු තියෙනවා. ඒ මේ බැංකුව. මේ බැංකුව කියන එකයි, සිම්යොන් ළග තියෙන්නේ ගල්කටස් එකක්ද.. ටී56ක් ද කියන එකයි. නෙවෙයි ඔලුවට ගන්න ඕනේ. සිම්යොන්ව හොයාගෙන අත්අඩංගුවට ගන්න එකයි වැදගත්. ඒකයි අපි සහරාන් ඉන්න තැන් ගැන කියනකොට සහරාන්. සහරාන්. සහරාන්. කියලා නම හැමතිස්සේම කිව්වේ. අපි ප්ලෑන් කළේ Master Mind Arrest කරන්න. මේ තොරතුර ගැන අප්‍රේල් 11 වෙනිදා වෙනකොට මේ රටේ 15,000ක් විතර දැනගෙන හිටියා. යනුවෙන් හිටපු රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂවරයා කොමිසම හමුවේ කියා සිටියේය.

ඔබ බොහොම බරපතළ ප්‍රකාශයක් කළා අප්‍රේල් 11 වෙනකොට මේ ගැන 15,000ක් විතර දෙනා දැනගෙන හිටියා කියලා. වගකීමෙන් ද ඒක කිව්වේ යනුවෙන් මෙහිදි ජනාධිපති කොමිසමේ අභියාචනාධිකරණ විනිසුරුවරයා එහිදි විමසා සිටි අවස්ථාවේ නිලන්ත ජයවර්ධන මහතා කියා සිටියේ, ඔව් ස්වාමීනි. පොලිස්පති මේ කොමිසමේදි කිව්වා ඔහු මේ බුද්ධි තොරතුර රේන්ජ් හතරකට දුන්නා කියලා. එතනම බස්නාහිර පළාතේ නිලධාරීන් 8,000ක් විතර ඉන්නවා. STF එකේ 5,000කට මෙහා ඉන්නවා. ඊළඟට ස්වාමීනි 20 වෙනිදා තානාපති කාර්‍යාලවලින් දැනගෙන හිටියා. මොකද මගෙන් ඇහුවා මේ තොරතුරට සම්බන්ධ එක තානාපති කාර්‍යාලයක් 'මේ අපි එවපු එක නේද share වෙන්නේ' කියලා. ඉතින් ස්වාමීනි එතකොට කීයක්ද. සහරානුත් දැනගෙන්න ඉන්න ඇති. අර පාර්ලිමේන්තුවෙ 225 දෙනාට යොමුකරලා තිබුණා. ඒගොල්ලන් නම් කියනවනේ දන්නෑ කියලා. නමුත් ඒ අයගේ ආරක්ෂක අංශ දැනගෙන හිටියා. මෙහෙම බැලුවම 10,000ක් නෙවෙයි 15,000ක් විතර මේක දැනගෙන හිටියා ස්වාමීනි. එතකොට ඒ අය දැනගෙන ලංකාවේ තීරණ ගන්න ඕනේ සියලු දෙනා දන්නෑ. ඕකනේ දැන් කියන්නේ. මේ රටේ මිනිස්සු මැරුණ එකේ මං වගකීම භාර ගන්නේ අප්‍රේල් 07 වෙනිදා වෙනකල් විතරයි. ඔය විදෙස් බුද්ධි සේවයට සහරාන් ගැන ඔක්කොම තොරතුරු දුන්නෙත් අපි. මටත් වඩා මේ අය ගැන මගේ නිලධාරින් තොරතුරු රැස්කරපු නිසා මම මගේ නිලධාරින් ගෙන්නලා විදෙස් බුද්ධි සේවා දැනුම්වත් කළා. රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ වුණ මම එතනදී translator වුණා. මේ රටේ වෙලා තියෙන්නේ විදෙස් රටකින් ආවොත් ඒක ලොකුයි. අපි කිව්වොත් පොඩියි. අනික අපි සහරාන් ගැන කියලා තිබුණේ 2016 ඉඳලා. මට තොරතුරු ලැබුණේ ප්‍රහාරය ගැන අප්‍රේල් 4. මං ඒක 5 වෙනිදා ලිඛිතව ගෙන්න ගත්තා.

## රනිල්ගේ බලපෑම මත ...

කැබිනට් මණ්ඩල සාකච්ඡාවෙන් දින 03කට පසුව පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය අධිකරණය නොමග යවමින් තහනම් නියෝගය ලබාගත් බවත් එසේ බොරු තොරතුරු මත විදේශ ගමන් බලපත්‍රය තහනම් කිරීම ජාත්‍යන්තර නීතිය පවා උල්ලංඝනය කිරීමක් බව වීරතුංග මහතා පෙන්වා දුන්නේය.

විදේශ ගමන් බලපත්‍රය තහනම් කිරීම පිළිබඳ යහපාලන කැබිනට් මණ්ඩලයේ සාකච්ඡාවට ලක් වූ බව හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ද කොමිසම හමුවේ සාක්ෂි ලබා දෙමින් පිළිගෙන ඇති බව සඳහන් කළේය.

තානාපති ධුරයේ කටයුතු නොකරන අවස්ථාවල කිසිඳු ආකාරයකින් රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍රයක් භාවිතා නොකළ බව වීරතුංග මහතා පෙන්වා දුන්නේය.

කොමිසමේ සභාපති - ගමන් බලපත්‍රය අවලංගු කරන බවට දැන්වීමක් ලැබුණා ද?

සාක්ෂිකරු - නැත ස්වාමීනි.

කොමිසම - ගමන් බලපත්‍රය අවලංගු කළ හැකි ද?

සාක්ෂිකරු - බැහැ ස්වාමීනි. වලංගු කාලය සාමාන්‍යයෙන් අවුරුදු දහයයි.

කොමිසම - රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් අවලංගු කළ හැකි බව මා දන්නා තරමින් කොහොමත් සඳහන් වී නෑ. ලංකාවෙත් නෑ. ලෝකයෙත් නෑ. ආගමන විගමන චක්‍රලේඛයක් නම් තිබෙනවා.

සාක්ෂිකරු - තනතුරක් හිමි නැතුව රාජ්‍ය තාන්ත්‍රික බලපත්‍ර කවුරුන් විසින් භාවිතා කළ ද ප්‍රශ්න එනවා.

කොමිසම - නමුත් පාවිච්චි කළ බවට නඩු දාන්න බෑ.

සාක්ෂිකරු - ඔව් ස්වාමීනි. මාගේ බලපත්‍රය අවලංගු කරන්න යැයි පැවසුවේ රනිල් වික්‍රමසිංහ මහතායි.

## මිනුවන්ගොඩ කොවිඩ් ...

ගම්පහ නගරයේ උසස්පෙළ විභාගය පැවැත්වෙන පාසලක සිසුවියකට, ගාල්ල, කරන්දෙණිය ප්‍රදේශයේ පදිංචි කොළඹ නැව් තටාංගනයේ සේවකයෙකුට හා කොළඹ, පිටකොටුව 4 වන හරස් විදියේ පිහිටි ව්‍යාපාරික ස්ථානයක සේවකයන් සිව්දෙනෙකුට කොරෝනා ආසාදනය වී ඇතැයි තහවුරු කර ගෙන තිබේ.

එම සිසුවිය විභාගයට පෙනී සිටී ශාලාවේ සිටී සිසුවියන් 160 දෙනෙකු වෙනුවෙන් විශේෂ ශාලාවක ඊයේ (19) සිට විභාගයට පෙනී සිටීමට ලබාදීමට අධ්‍යාපන බලධාරීන් පියවර තිබේ.

මිනුවන්ගොඩ බැන්ඩ්‍රික්ස් ඇඟලුම් කම්හලට නුදුරු ප්‍රදේශයක පදිංචි මෙම සිසුවියට ඇතිවූ රෝග තත්ත්වයක් මත පී.සී.ආර් පරීක්ෂණයට භාජනය කර ඇති අතර එහි වාර්තාව අනුව ඇය කොවිඩ් - 19 ආසාදිත බව තහවුරු වී තිබිණි.

පසුව සෞඛ්‍ය අංශ මගින් ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සහ කලාප අධ්‍යාපන කාර්යාලය දැනුවත් කිරීමට පියවර ගැනීමෙන් පසු

සිසුවිය විභාගයට පෙනී සිටි ශාලාවේ සිටි සිසුවියන් වෙනුවෙන් මෙලෙස වෙනත් විභාග මධ්‍යස්ථානයක් ලබා දීමට පියවර ගනු ලැබූ බව ගම්පහ කලාපය බාර අධ්‍යාපන අධ්‍යක්ෂ එස් .කේ .මල්ලවආරච්චි මහතා පැවසීය.

## කාදිනල් හිමිට අපහාස ...

රටේ අති උතුම් ආගමික නායකයෙකු වන මැල්කම් කාදිනල්තුමාවෙත ද්වේශ සහගත මෙන්ම තර්ජනාත්මක ප්‍රකාශ මෙහි අන්තර්ගත බවය.

පාප්වහන්සේගේ තනතුරට සමීපතයකු වන මෙම කාදිනල් තුමාවෙත අපහාස කිරීම මොහුට පමණක් සීමා කරුණක් නොවන බවත් එම ආගම අදහන සෑම කතෝලිකයකුටම බලපාන කරුණක් බව සඳහන් කළ සොලිසටර් ජනරාල්වරයා සැකකාරිය දණ්ඩ නීති සංග්‍රහයේ 291 වගන්තිය යටතේ දැනටමත් වරදක් කර ඇති බව සඳහන් කෙළේය.

අංකල් , ඩාලිං හා කතෝලික ආගම බෞද්ධාගමට පවා දීම යන වචන මගින් ආගමික හැඟීම් ඇවිස්සෙන බව සඳහන් කළ මාධව තෙන්නකෝන් මහතා සැකකාරිය අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ජාතික මානසික සෞඛ්‍ය ආයතන අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරමින් වෛද්‍ය කණ්ඩායමක් මගින් වෛද්‍ය වාර්තාවක් කැඳවීමට නියෝගයක් නිකුත් කරන ලෙස අධිකරණයෙන් නියෝගයක් ඉල්ලා සිටියේය.

මෙහිදී කාදිනල් හිමිගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ අබේනායක මහතා සඳහන් කරනු ලැබුවේ පාස්කු ප්‍රහාරයේ දී ඉදිරියට පැමිණි කාදිනල් තුමා ජනයාගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි බවත් මෙම සිද්ධිය පසුපස කවරකු හෝ කණ්ඩායමක් සිටී ද යන්න විමසිය යුතු බවය.

මෙම තැනැත්තිය මීට පෙර සිංගප්පූරුවේ බෞද්ධ ආගමිකයකුට අපහාස කර මාස තුනක සිරදඬුවම් නියම කර එරටෙන් පිටුවහල් කර ඇති බවට තොරතුරු ලැබී ඇති බව සඳහන් කළේය.

සැකකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා පැවසුවේ ඇය සිංහල බෞද්ධ කාන්තාවක් බවත් ඇය විසින් සිදු කළ මෙම ප්‍රකාශ මගින් යම් වරදක් සිදු වී ඇත්නම් කාදිනල් තුමාගෙන් සමාව ගැනීමට ද සූදානම් බවය.

කොරෝනා අවධියක ඇය රක්ෂිත බන්ධනාගාරගත කිරීම සුදුසු නොවන බවට නීතිඥවරයා අධිකරණය හමුවේ සඳහන් කෙළේය.

## අඩු ආදායම් ලාභීන්ට ...

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය පුහුණු වැඩසටහන භාරව සිටින අතර පුහුණුව සාර්ථකව නිම කරන අභ්‍යාසලාභීනට NVQ III ශ්‍රේණියේ සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ. රැකියා ලක්ෂයේ වැඩසටහන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් "දිළිඳුබවින් තොර ශ්‍රී ලංකාවක්" බිහි කිරීමේ සංකල්පය අනුව සැලසුම් කරනු ලැබූවකි. එය බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

අඩු ආදායම්ලාභීන්ගේ ආදායම නැංවීම, සමාජ සංරක්ෂණය තහවුරු කොට දිළිඳුකම පිටුදැකීම ආදායම් විෂමතා හැකිතරම් සමනය කොට ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් ගොඩනැගීම ඉන් අපේක්ෂා කෙරේ.

හය මාසික පුහුණුවෙන් පසු අභ්‍යාසලාභීන් PL-01 ශ්‍රේණියේ ස්ථිර පත්වීම් ප්‍රදානය කොට අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ රජයට අනුබද්ධ ආයතනවල පුරප්පාඩු තනතුරුවල කාර්යයන් ඉටු කිරීම සඳහා යොමු කරනු ලැබේ. බඳවාගනු ලබන පිරිස් රජයේ ගොවිපොළවල සහ අතහැර දමා ඇති වගා කළ හැකි ඉඩම්වල නවීන කෘෂි තාක්ෂණය උපයෝගි කර ගනිමින් එළවළු සහ පළතුරු නිෂ්පාදන කටයුතුවලට මෙන්ම වන ජීවී හා වන සංරක්ෂණ, වාරිමාර්ග ගොවිජන සේවා, කෘෂි සේවා මධ්‍යස්ථාන, ග්‍රාමීය රෝහල්, පාසල් සම්බන්ධ කටයුතු සඳහා ද යොදවනු ඇත.

# ශ්‍රී ලංකා - ඔස්ට්‍රේලියා සංචාරක කටයුතු සාකච්ඡාවට

**මහින්ද අලුත්ගෙදර**

කෝවිඩ් පාලනය කිරීමත් සමඟ ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ලොව පුරා ප්‍රචලිත කිරීමට පියවර ගන්නා බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා අවධාරණය කරයි.

දැනටමත් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාකාරී වැඩපිළිවෙළ සකස් කර ඇති බවද ඒ මහතා පෙන්වා දෙයි.

මෙරට ඔස්ට්‍රේලියාවේ මහ කොමසාරිස් ඩේවිඩ් හෝලි මහතා සමඟ සංචාරක අමාත්‍යංශයේ දී පැවති සාකච්ඡාවේ දී ඇමතිවරයා මේ බව සඳහන් කළේය.

සංචාරකයන් මිලියන 07ක් වාර්ෂිකව මෙරටට ගෙන්වා ගැනීමටත් ඉන් වාර්ෂිකව ඇමරිකානු ඩොලර් බිලියන 10ක් ජාතික ආර්ථිකයට එක් කිරීමත් රජයේ ඉලක්කය වූ බව මෙහිදී පෙන්වා දුන් ඇමති ප්‍රසන්න රණතුංග මහතා කොවිඩ් වසංගතය හමුවේ වුවද එම ඉලක්කය රජය තවමත් අතහැර නැතැයි ද පැවසීය. මේ අතර ඒ මහතා පෙන්වා දුන්නේ කොවිඩ් හමුවේ වුවද එම ඉලක්කය සපුරා ගැනීමට අපේක්ෂා කරන බවයි.

ඔස්ට්‍රේලියානු සංචාරකයන් මෙන්ම එරට ආයෝජකයන් ද ශ්‍රී ලංකාවට පැමිණීමට හා ආයෝජනයට වැඩි කැමත්තක් දක්වන බව පැවසූ මෙරට ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස්වරයා මෙරට සංචාරක හා අයෝජන ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා ඔස්ට්‍රේලියානු රජයේ පූර්ණ සහාය ලබාදෙන බවට ද සහතික විය.



ඔස්ට්‍රේලියානු රජයේ මැදිහත් වීමෙන් නැගෙනහිර පළාතේ මේ වනවිට ක්‍රියාත්මක ව්‍යවසාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉදිරි වසරේ දි ඔස්ට්‍රේලියානු ඩොලර් මිලියන 25ක් වෙන් කිරීමට අපේක්ෂා කරන බවද මෙරට ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස්වරයා මෙහිදී සඳහන් කළේය. ප්‍රදේශයේ කාන්තාවන්, තරුණ තරුණියන් වෙනුවෙන් මෙමඟින් විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බවද ඔහු කීවේය.

සංචාරක අමාත්‍යංශයේ ලේකම් එස්.හෙට්ටිආරච්චි, රාජ්‍ය අමාත්‍යංශයේ ලේකම් මාධව දේවසුරේන්ද්‍ර, ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ දෙවන ලේකම් ඩැන්ලේ කැෂේන්, ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරී සිවසුදාන් රමනාදන් මහත්වරුද මෙම සාකච්ඡාවට එක්ව සිටියහ.

# විස්සේ ගැටලු සලකා බලන්නැයි හිමිවරුන් රැසකගේ අස්සනින් ජනපතිට ලිපියක්

**උපාලි කරුණාරත්න සහ අනුර ප්‍රේමලාල්**

20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන ගැටලුකාරී කරුණු සම්බන්ධයෙන් ඇල්ලේ ගුණවංශ හිමි, මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි, බෙංගමුවේ නාලක හිමි, ඉදුරාගාරේ ධම්මරතන හිමි, මල්වානේ චන්ද්‍රරතන හිමි, කපුගොල්ලෑවේ ආනන්ද කිත්ති හිමිවරුන්ගේ අත්සනින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ලිපියක් යවා තිබේ.

එම ලිපියේ මෙසේ සඳහන් වේ.

ශ්‍රී ලංකාවේ ජනතාව ඔබතුමාගෙන් අපේක්ෂා කරන ලද්දේ බුද්ධ ශාසනය, ජාතික උරුමය, සිංහල ජාතිය, හෙළ සංස්කෘතිය හා දේශීය සම්පත් ඇතුළු සමස්ත රටත්, ජනතා පරමාධිපත්‍යයත් ආරක්ෂා කර ගනිමින් රටත් ජනතාවත් සෞභාගය වෙත ගෙන යන ගමනට නායකත්වය ලබා දීම යි. එකී අපේක්ෂාව ඇතිව භික්ෂූන් වහන්සේලා පෙරටුකොට ගත් ජාතික සංවිධාන විසින් දේශප්‍රේමී ජනතාව ඔබතුමා වටා එක් සේසත් කරවීය. ඔබතුමාගේත්, ඔබතුමාගේ නායකත්වය පිළිගන්නා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණු ආණ්ඩුවේත් ජයග්‍රහණයට වගකිව යුතු සැබෑ බලවේගය වූයේ එකී ජාතික සංවිධාන විසින් ජනගත කර බල ගන්වන ලද දේශප්‍රේමී ජාතික චින්තනයයි.

20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එනු ලබන්නේ ශක්තිමත් ආණ්ඩුවක් බිහි කිරීමේ අරමුණින් බව කියවේ. ප්‍රජාතන්ත්‍රවාදී යාන්ත්‍රයණයක් තුළ ක්‍රියාත්මක වන ශක්තිමත් රාජ්‍යයක් ස්ථාපිත කිරීමේ ව්‍යවස්ථාවක් ජනතාවගේ සැබෑ බලාපොරොත්තුව යි. එහෙත් 20න් බිහි කරනුයේ අත්තනෝමතික ලෙස විධායකය මෙහෙයවිය හැකි වූත්, ව්‍යවස්ථාදායකය හා අධිකරණය තම අණසකට යටත් කරන්නට තරම් බලයක් සහිත ජනාධිපතිවරයෙකු හා දුබල අමාත්‍ය මණ්ඩලයකි. සමස්තයක් ලෙස 20න් නීතියේ පාලනයක් නොමැති අස්ථාවර රාජ්‍ය යාන්ත්‍රණයක් බිහි වීමට බොහෝ ඉඩකඩ පවතී.

20 සකසා තිබෙන්නේ ජනාධිපතිතුමාගේ ජයග්‍රහණය පසුපස සිටි ජාතික බලවේග හා ජනතා අපේක්ෂාවන් සම්පූර්ණයෙන් ම නොසලකා හරිමිනි. ව්‍යවස්ථා කෙටුම්පත සකස් කිරීම සම්බන්ධ අවම දැනුමක් වත් නොමැත්තෙකු ගේ කතෘත්වයක් පෙන්වන මෙම කෙටුම්පත දැනටමත් ජනතාවගේ අප්‍රසාදයට ලක් ව තිබේ. එය දේශපාලන මෙන් ම සමාජමය අර්බුදයක ඇරඹුමකි. ඔබතුමාත්, ආණ්ඩුවත් කෙරෙහි ජනතාව තබා ඇති විශ්වාසය පළුදු කිරීමේ කූට අරමුණින් යුතුව රටත් ජාතියත් පාවා දීමට ක්‍රියා කරන කුමන්ත්‍රණකරුවන් ගේ අදිසි හස්තයක් මෙම ක්‍රියාදාමය පිටුපස තිබේ දැයි ද සැක මතු වේ.

එබැවින් ජනතාවගේ අපේක්ෂාවන් යටපත් වන අයුරින් එම කෙටුම්පතේ ඇතුළත් කර තිබෙන සංශෝධනයන් ගණනාවක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමුකර සිටිමු.

මෙම ආණ්ඩුව පත් වීමේ දී ජනතාවට දුන් පොරොන්දුව වූයේ අලුත් ව්‍යවස්ථාවකි. ජනතාවගේ අපේක්ෂාව වූයේ ද එයයි.

මේ වන විටත් රට තුළ ආන්දෝලනයට ලක් ව තිබෙන 20 වැනි සංශෝධනය ඉදිරිපත් කර තිබෙන ආකාරයෙන් සම්මත කර ගැනීම සම්බන්ධයෙන් නැවත සිතා බැලිය යුතු ව ඇති බවද එම ලිපියේ සඳහන් වේ.

# කටුනායක වෙළෙඳ කලාපය වසා දැමීමේ අවශ්‍යතාවක් තවම නෑ

## ඇමැති ප්‍රසන්න රණතුංග

**මහින්ද අලුත්ගෙදර**

කටුනායක වෙළෙඳ කලාපය වසා දැමීමේ අවශ්‍යතාවක් තවමත් මතුව නැතැයි සංචාරක ඇමති ප්‍රසන්න රණතුංග මහතා අවධාරණය කරයි.

සෞඛ්‍ය අංශ නිර්දේශ මත මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බවද ඒ මහතා පෙන්වා දෙයි.

කටුනායක නිදහස් වෙළඳ කලාපයේ පෙරේදා (18) දිනය තුළ සේවක සේවිකාවන් පන්දහකට (5,000) ආසන්න සංඛ්‍යවක් පී.සී. ආර් පරීක්ෂණවලට ලක්කර තිබෙන අතර නිදහස් වෙළෙඳ කලාපයේ කෝවිඩ් 19 රෝග කාරකය ශරීර ගත වී ඇති බවට ඊයේ (19) උදෑසන වනවිට තහවුරු වූ පිරිස 216කි.

එහි සේවය කරනු ලබන සේවක සේවිකාවන් ගණන 32,000 කට අධික වන අතර තවදුරටත් එම සේවක සේවිකාවන්ට පී.සී.ආර් පරීක්ෂණ සිදු කෙරෙන බවද ඇමැතිවරයා සදහන් කරයි.

# සියලුම සත්ත්ව එන්නත් මෙරටම නිෂ්පාදනයට පියවර



**නදී මාණික්කගේ**

ලංකාවට අවශ්‍ය සියලුම සත්ත්ව එන්නත් මෙරටදීම නිෂ්පාදනය කිරීමට කෘෂිකර්ම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා පියවර ගෙන ඇත.

ඒ අනුව පොල්ගොල්ල සත්ව විෂාණු රසායනාගාරයේ දැනට වසරකදී නිෂ්පාදනය කරනු ලබන එන්නත් 2,50,000ක ප්‍රමාණය ලක්ෂ දහය දක්වා ඉදිරියේදී වැඩිකරනු ලැබේ. පසුගියදා මෙරට සත්ත්ව නිෂ්පාදන ක්ෂේත්‍රයේ සුවිශේෂී කාර්ය භාරයක් ඉටුකරන පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරයේ ක්ෂේත්‍ර චාරිකාවක් සඳහා සහභාගි වීමේදී අමාත්‍යවරයා මෙම තීරණය ගෙන තිබේ. මෙම ආයතනය සංවර්ධනය කර වසරකට එන්නත් ලක්ෂ 10ක් දක්වා නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා අවශ්‍ය කරන නවීන උපකරණ ලබා දීමටද එහිදී එකඟත්වය පළ විය. මෙමඟින් ආනයනය කරනු ලබන එන්නත් අඩුකර, අපනයනය ඉහළ දැමීමට සැලසුම් කෙරේ.

එම ආයතනයේ දැනට භාවිත කරන පැරණි උපකරණ සහ උපාංග කඩිනමින් ඉවත් කර ඒ වෙනුවට නවීන උපකරණ ලබා දීමටද මෙහිදී නිලධාරීන්ට උපදෙස් දෙනු ලැබිණි.

මෙම අවස්ථාව සඳහා පශු සම්පත් මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ සත්ත්ව විෂාණු රසායනාගාරයේ නිලධාරීහු එක් වූහ.

# විසි වන සංශෝධනයට අවධානය යොමු කරන්නැයි ඕමල්පේ සෝභිත නාහිමියෝ ජනපතිගෙන් ඉල්ලති

**උපාලි කරුණාරත්න**

විසිවන සංශෝධය පිළිබඳව පවතින විවිධ අදහස් සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විශේෂ අවධානය යොමුකළ යුතු බව හෙළ බොදු සවිය ප්‍රධාන අනුශාසක ඕමල්පේ සෝභිත නාහිමියෝ ජනාධිපතිවරයාට ලිපියක් යවමින් පවසති.

එහි වැඩිදුරටත් මෙසේද සඳහන් වේ.

දැනට ගැසට් කර ප්‍රකාශයට පත්කර ඇති 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මෙම 21, 22 දිනවල පාර්ලිමේන්තු විවාදයට යොමු කිරීමට නියමිතය. ඒ සම්බන්ධයෙන් ශාසනික හා සමාජ මෙහෙවරේ විවිධාකාරයෙන් කැපවී සිටින භික්ෂූන් වහන්සේලාගේ අප්‍රසාදය මේ වන විටත් පළ වි තිබේ. එමෙන්ම අගරදගුරු මණ්ඩලයේද සිවිල් සංවිධානවලද විරෝධය පළ වී ඇත. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ජන නායකයා වශයෙන් එකී අදහස් උදහස් පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

එනිසා ඔබතුමා කෙරෙහි තබන ලද විශ්වාසය පළුදු නොවන පරිදී මහා සංඝරත්නයේ අනුශාසනා හා අදහස් පිළිබඳව විශේෂ අවධානයෙන් යුතුව ක්‍රියා කිරීමට අප්‍රමාදව පියවර ගැනීම ඔබතුමන් ප්‍රධාන රජයේත්, රටේත් ජනතාවගේත් යහපත පිණිස ම හේතුවන බව දන්වා සිටිමු.

# පෞද්ගලික ආයතන මගින් පාරිභෝගික දත්ත රැස් කිරීම තොරතුරු තාක්ෂණ සංගමයේ අවධානයට

**සුභාෂිණී සේනානායක**

COVID-19 වයිරස තත්ත්වය යළි මතුවීම හේතුවෙන් බොහෝ වෙළඳ ව්‍යාපාර මගින් එම වෙළඳ ව්‍යාපාර සඳහා පිවිසෙන පාරිභෝගිකයන්ගේ දත්ත රැස් කිරීමක් සිදු කරනු ලබන බවත් එම දත්ත වල ආරක්ෂාව හා පාරිභෝගිකයන්ගේ පෞද්ගලිකත්වය සම්බන්ධයෙනුත් ගැටලු පවතින බව ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමය පවසයි.

විශේෂයෙන්ම මෙම පෞද්ගලික දත්ත රැස්කිරීමේදී එම දත්ත භාවිතා කිරීමට එම ව්‍යාපාරය කටයුතු කරන ආකාරය සහ එම දත්ත වෙනත් පාර්ශවයන්ගෙන් ආරක්ෂා කරන ආකාරය සම්බන්ධයෙන් දත්ත ලබාදෙන්නා දැනුවත් කිරීමට කිසිදු වැඩපිළිවෙලක් යොදා නොමැති බවක් තම සංගමයට දැන ගැනීමට හැකිවී ඇති බවත් ඔවුහු කියා සිටි.

දත්ත ආරක්ෂණ පනතක් නොමැති, ව්‍යවස්ථාව මගින් පෞද්ගලිකත්වයට ඇති අයිතිය මූලික මානව අයිතිවාසිකමක් ලෙස හඳුනා නොගත් අවස්ථාවක මෙසේ විශාල වශයෙන් COVID-19 වයිරස තත්ත්වයට මුවාවී යම් යම් පාර්ශව විසින් සිදු කරගෙන යනු ලබන දත්ත එක් රැස් කිරීමේ ක්‍රියාවලිය ඉතාමත් භයානක තත්ත්වයක් බව අප ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමය ලෙස දකින්නෙමු. මෙම පාර්ශව විසින් රැස් කරගනු ලබන පෞද්ගලික දත්ත අනතුරේ වැටුනහොත් ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ලබාගැනීම සඳහා අවශ්‍ය නීති ප්‍රතිපාදන නොමැති බැවින් මහජනයා තවත් ගැටලුවකට මුහුණපෑ හැකිය. මේ හේතුවෙන් 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය මගින් පෞද්ගලිකත්වයට ඇති අයිතිය මූලික මානව හිමිකමක් ලෙස පිළිගැනීමට රජයේ අවධානය වහාම යොමුවිය යුතු යැයිද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමය ලෙස රජයට අවධාරණය කරයි

# මුතුරාජවෙල රැකගැනීමට කඩිනමින් ඉඩම් මැන ගැසට් කළ යුතුයි



## ඇමැති මහින්ද අමරවීර

**අමෝදා ජයමහ**

මුතුරාජවෙල අභයභූමිය විනාශ මුඛයෙන් ගලවා ගැනීමට නම් කඩිනමින් ඊට අයත් ඉඩම් ප්‍රමාණය මැන ගැසට් පත්‍රයකින් ප්‍රකාශ කළ යුතුව ඇතැයි පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතා අවධාරණය කළේ ය.

ඇතැම් ව්‍යාපාරිකයන් හා ප්‍රදේශවාසීන් විසින් හිතුමනාපෙට මුතුරාජවෙල ගොඩ කිරීම නිසා මේ වනවිට දැවැන්ත පාරිසරික ගැටලු ගණනාවක් උද්ගත වෙමින් තිබෙන බව මුතුරාජවෙල සුරැකීමේ පරිසර සංවිධාන විසින් පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතාට පැමිණිලි කර තිබේ.

පරිසර සංවිධාන විසින් ඇමතිවරයාට යොමු කරන ලද මෙම පැමිණිලි සියැසින් නිරීක්ෂණය සඳහා ඊයේ (18) අදාල වගකිව යුතු නිලධාරීන් සියලු දෙනා සමග මුතුරාජවෙළ තෙත්බිම පරීක්ෂාවට ලක් කළ අතර මුතුරාජවෙළ අභයභූමිය විනාශ මුඛයෙන් ගලවා ගැනීමට නම් කඩිනමින් ඊට අයත් ඉඩම් ප්‍රමාණය මැන ගැසට් පත්‍රයකින් ප්‍රකාශ කළ යුතුව ඇතැයි ඒ මහතා අවධාරණය කළේ ය. එක්තරා ව්‍යාපාරිකයකු විසින් අනවසරයෙන් මුතුරාජවෙල තෙත් බිම අවට ඉඩම් පර්චස් 126,000ක් බලහත්කාරයෙන් අල්ලාගෙන සිටින අතර ඔහු විසින් කිලෝමීටර් 10ක පමණ පිහිටි ඉඩම් පෞද්ගලික ඉඩමක් ඇතුල්වීම තහනම් යනුවෙන් දැන්වීම් පුවරු සවිකර ඇති බව පරිසරවේදීහු මෙම නිරීක්ෂණ චාරිකාව අතරතුර දී අමාත්‍යවරයාට පෙන්වා දුන්හ.

මීට අමතරව ඌරු කොටු වලින් බැහැර කරන අප ජලය හා වෙනත් අපවිත්‍ර ද්‍රව්‍ය ද මුතුරාජවළ තෙත් බිමට පොම්ප කරන අතර තවත් කර්මාන්ත ශාලාවකින් බැහැර කරන උණු කළ යකඩ, තඹ, පිත්තල අපද්‍රව්‍ය සියල්ලම ටොන් ගණනින් මුතුරාජවෙළට බැහැර කර ගොඩ කරන ආකාරය අමාත්‍යවරයා නිරීක්ෂණය කළේ ය.

මෙම මානව ක්‍රියාකාරකම් වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමේ දී බලපා ඇති ප්‍රධාන ගැටළුව වන්නේ මෙතෙක් මුතුරාජවෙළ අභය භූමියට අයත් බිම් ප්‍රමාණය කෙතෙක් දැයි මැන ගැසට් මගින් ප්‍රකාශයට පත් කර නො තිබීමය. එම නිසා වහාම මුතුරාජවෙළ තෙත් අභයභූමියට අයත් ඉඩම් මැන ඒවා ගැසට් කිරීමට පියවර ගන්නා ලෙස ජා ඇළ ප්‍රාදේශීය ලේකම්වරියට අමාත්‍යවරයා විසින් උපදෙස් දුන්නේ ය.

අභයභූමියට අයත් ඉඩම් හඳුනා ගැනීමෙන් අනතුරුව එම සීමාව තුළ කිසියම් පුද්ගලයෙක් අනවසර ඉදි කිරීම් හෝ ගොඩ කර අත්පත් කර ගෙන ඇත්නම් ඊට එරෙහිව තරාතිරම නො බලා නීතිමය වශයෙන් දඬුවම් කිරීමට පියවර ගන්නා බව අමාත්‍යවරයා ප්‍රකාශ කළේ ය.

එමෙන්ම දැනට අප රටේ ඇති සියලුම අභයභූමිවල මෙම තත්ත්වය පවතින්නේ නම් ඒ සම්බන්ධව කටයුතු කිරීමට තමන් පියවර ගන්නා බවත් අමාත්‍යවරයා සඳහන් කළේ ය.

තෙත්බිම පරීක්ෂාවට ලක් කළ අතර එහිදී පෙනී ගිය කාරණය වුයේ මුතුරාජවෙළ අවට දැවැන්ත පරිසර විනාශයක් ඇතැම් ව්‍යාපාරිකයින් විසින් හා ප්‍රදේශවාසීන් විසින් සිදු කරමින් තිබෙන බවය.

මෙම නිරීක්ෂණ චාරිකාවට අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාංසිහ මහතා මෙන්ම ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, වනජීවී නිලධාරීන්, ගම්පහ පරිසර නිලධාරි හා ජා ඇළ ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරිහු විශාල පිරිසක් සහභාගි වූහ.

# ඩයලොග් සහ ආසිආටා ඩිජිටල් ලැබ්ස් විශිෂ්ටතා සම්මාන දිනයි

**සුභාෂිණී සේනානායක**

ඩයලොග් සහ ආසිආටා ඩිජිටල් ලැබ්ස් ශ්‍රී ලංකා 2020 TM Forum විශිෂ්ටතා සම්මානය හිමිකර ගෙන තිබේ. ආසිආටා බර්හාඩ් සමූහයේ ඩිජිටල් නවෝත්පාදන සහ මෘදුකාංග සංවර්ධන ඒකකය වන ආසිආටා ඩිජිටල් ලැබ්ස් සහ ශ්‍රී ලංකාවේ ඩයලොග් ආසිආටා පීඑල්සී සමාගම ඒකාබද්ධව,මෙම විශිෂ්ටතා සම්මානය හිමිකර ගැනීමට සමත්ව තිබේ.

මෙම සම්මාන උලෙළේදී අන්තර්ජාතික සන්නිවේදන සේවා සම්පාදකයන්, විසඳුම් නිර්මාණකරුවන් සහ නවෝත්පාදකයන් විසින් ඩිජිටල්කරණයේදී අත්කරගන්නා සුවිශේෂී ජයග්‍රහණ ඇගයීමට ලක් කරයි.

ඩයලොග් සමාගම සහ ආසිආටා ඩිජිටල් ලැබ්ස් සමඟ Vodafone UK Infosys සමාගම පාරිභෝගික අත්දැකීම් හා විශ්වසනීයත්වය යන අංශය සඳහා ඒකාබද්ධ ජයග්‍රාහකයන් වශයෙන් නම් කරන ලද අතර, සම්මානය සඳහා නම්කරන ලද ඩිජිටල්කරණයේ ජාත්‍යන්තර ප්‍රමුඛයන් වන Orange Polska SA, Vlocity, Matrixx Software & Salesforce, China Unicom, Three Ireland & Amdocs යන සමාගම් අභිබවා යාමට ද හැකිවිය. පාරිභෝගික අත්දැකීම් හා විශ්වසනීයත්වය වෙනුවෙන් පිරිනමන සම්මාන කාණ්ඩ ය ටතේ, වඩා විශිෂ්ට පාරිභෝගික අත්දැකීමක් ලබාදෙමින්විශ්වසනීයත්වය හා පක්ෂපාතීත්වය ගොඩනගා ගනිමින්, ව්‍යාපාරයේ දියුණුව සනාථ කිරීම සඳහා සංකීර්ණ ඩිජිටල්සේවා නිර්මාණය කරමින් කළමනාකරණය කරන සමාගම් හඳුනාගනිමින්, සම්මානය සඳහා නිර්දේශ කරනු ලැබ තිබුණි.

# ගම්පහ ප්‍රදේශ කිහිපයක දැඩි ගමනාගමන තහංචි

**රක්ෂණ ශ්‍රියන්ත**

ගම්පහ ප්‍රදේශයේ යක්කල, නිට්ටඹුව යන පොලිස් වසම් ආශ්‍රිතව නුවර පාරේ සහ, එසේම මීගමුව පාරේ කඳාන, සීදූව සහ ජා ඇළ පොලිස් බල ප්‍රදේශ ආශ්‍රිත ප්‍රධාන මාර්ගයේත් වාහන ගමනාගමනයේදී දැඩි ලෙස සීමා ක්‍රියාත්මක කරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පවසයි.

එසේ වුවුද උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසු දරුවන්ට එම රෙගුලාසි කිසි සේත් බල නොපැවැත්වෙන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටී.

නුවර දෙසට මෙන්ම කොළඹ දෙසට නුවර පාරේ වාහන ගමන් කළ හැකි අතර නමුත් කිසිදු හේතුවක් නිසා එම වාහන යක්කල පොලිස් බල ප්‍රදේශය තුළත්, වේයන්ගොඩ පොලිස් බල ප්‍රදේශයට අයත් කොටසකුත්, වීරගුල පොලිස් බල ප්‍රදේශයට සහ නිට්ටඹුව පොලිස් බල ප්‍රදේශයට කොටසකුත් අයිතිවෙන අතර එම මාර්ගයේ කිසිම ස්ථානයක වාහන නැවැත්වීමට මගීන් නැංවීම බැස්සවීම කළ නොහැකි බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පවසයි.

එසේම එසේම මීගමුව පාරේ කඳාන, සීදූව සහ ජා ඇළ පොලිස් බල ප්‍රදේශ ආශ්‍රිත ප්‍රධාන මාර්ගයේත් වාහන නැවැත්වීම මගීන් නංවා ගැනීම හෝ බැස්සවීම තහනම් බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පවසයි. එසේ නංවා ගැනීම හෝ බැස්සවීම කළ හැක්කේ උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට පමණක් බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

# විසි වැනි සංශෝධනයෙන් ජනාධිපතිවරයාට කිසිසේත්ම අනිසි බලයක් ලැබෙන්නේ නෑ

## රාජ්‍ය අමාත්‍ය සරත් වීරසේකර

**අමෝදා ජයමහ**

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒමට පෙර ජනාධිපතිවරයා සතු වූ බලතල නැවත බලාත්මක කරනවා මිස වත්මන් ජනාධිපතිවරයා හට වෙනත් ආකාරයක අනිසි බලයක් කිසිසේත්ම ලබා නොදෙන බව පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය සරත් වීරසේකර මහතා පැවැසුවේ ය.

දහනවවැනි ව්‍යවස්ථාව හරහා වත්මන් ජනාධිපතිවරයාට අහිමිව ඇති 1978 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ශ්‍රී ලංකාව තුළ බලයේ සිටි සියලු ජනාධිපතිවරුන් හට හිමිව තිබූ බලය ගෝඨාභය රාජපක්ෂ මහතා හට නැවත ලබා දීම පමණක් මේ සංශෝධනය හරහා සිදුවන බව ද ඒ මහතා අවධාරණය කළේ ය. වියත් මග ප්‍රධාන කාර්යාලයේදි ඊයේ (19) මාධ්‍ය වෙත අදහස් දක්වමින් අමාත්‍යවරයා මේ බව පැවැසුවේ ය.

එහි දි වැඩිදුරටත් අදහස් දැක් වූ අමාත්‍යවරයා මෙසේ ද කීය.

විසිවැනි සංශෝධනය හරහා සිදු කරනුයේම දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීමයි. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ගුණාත්මක කරුණු අප විසිවැනි ව්‍යවස්ථාවට අන්තර්ගත තර තිබෙනවා. ද්විත්ව පුරවැසි භාවය දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයට පෙර තිබුණේ නෑ. ඒ නිසාම ද්විත්ව පුරවැසි භාවය විසිවැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් අහෝසි කර ඇති බව ජනතාව දැනගන්නා විට ඔවුන් අනිසි කැලැඹීමක් ඔවුන්ගේ නො දැනුවත් භාවය නිසා ඇති කර ගන්නවා. විගණන සමාගම් කියන විෂය මෙම ව්‍යවස්ථාව තුළ නෑ. නමුත් පෙර තිබූ ව්‍යවස්ථාවට මෙය ඇතුළත් කර තිබුණා.විසිවැනි සංශෝධනයෙන් එය ඉවත් කරන බව ජනතාව දැනුවත් වූ විට අනිසි ලෙස කලබලයට පත් වී තිබෙනවා. දහනවවැනි ව්‍යවස්ථා සංශෝධනයට පෙර තිබූ ව්‍යවස්ථාවම අංශු මාත්‍රයකින් හෝ වෙනස් වීමක් සිදු නො කර විසිවැනි සංශෝධනය ලෙස ගෙන එන්නේ. දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා ද්විත්ව පුරවැසි භාවය ගෙන ආවේ රටට හිතකර ප්‍රතිඵල අත්කර දිමට නොවේ.එය සිදු කළේ පවුලක් ඉලක්ක කර ගනිමිනුයි.ද්විත්ව පුරවැසිභාවය පිටරටකින් ලබා දෙන්නක් නොවේ.පිටරටක පුරවැසි භාවය අපට හිමි වු විට අප හට අපගේ උපන් මව්බිමේ පුරවැසි භාවය නීතිමය වශයෙන් අහෝසි වෙනවා. එසේ වූ විට අප විසින් අපගේ උපන් රටේ රාජ්‍ය නායකයා හට ඉල්ලීමක් සිදු කරමින් නැවත මවු රටේ පුරවැසිභාවය ලබා ගත යුතුයි.දහනවයට පෙර මෙම ද්විත්ව පුරවැසිභාවය හිමි අයකුට සිය මවු රටෙහි තනතුරක් දැරීමට කිසිඳු අවහිරයක් තිබුණේ නෑ.දහනවවැනි ව්‍යවස්ථා සංශෝධනය හරහා සිදු කළේම ජනාධිපතිවරයාගේ බලය දියාරු කිරීම පමණයි. ඒ දියාරු කළ බලය වත්මන් ජනාධිපතිවරයාට ලබා දීමට නම් මේ විසිවැනි ව්‍යවස්ථා සංශෝධනය ගෙන ආ යුතුමයි.හැටනව ලක්ෂයක ජනතාවගේ පරමාධිපත්‍යන් ජනාධිපතිවරයා හට ඉටු කිරීමට නම් පළමුව මේ දහනව වැනි ව්‍යවස්ථා බන්ධනය බල රහිත කළ යුතුයි. එය එසේ සිදු නොවුණ හොත් සිදු වන්නේ ජනතා පරමාධිපත්‍යට ද්‍රෝහී වීමයි. මෙම සාකච්ඡාවට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සභාපති උදය ශ්‍රී කාරියවසම් මහතා, නීතිඥ රාජා ගුණරත්න යන මහත්වරු ද මෙම මාධ්‍ය සාකච්ඡාවට පැමිණ සිටියහ.

ඡායාරූපය - රුවන් ද සිල්වා



# 20 සම්මත කර ගන්න 2/3ක බහුතර බලයක් ලබාගත හැකියි



## අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස්

**චන්දිමා කරුණාරත්න**

20 වැනි ව්‍යවස්ථා සංශෝධනය දෙවැනි වර කියැවීමේ දී තුනෙන් දෙකක බහුතර බලයක් ලබාගත හැකි යැයි දැඩි ලෙස විශ්වාස කරන බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සභාපති, අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී.එල්.පීරිස් මහතා පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ බත්තරමුල්ල ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ මාධ්‍ය මධ්‍යස්ථානයේදී ඊයේ (19) පැවැති මාධ්‍ය හමුවට සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද කීවේ ය.

20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් ආණ්ඩුව ඉදිරිපත් කළ සංශෝධනවලට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණය යම්කිසි සංශෝධනයක් නිර්දේශ කරනවානම්, එය ආණ්ඩුවේ යෝජිත සංශෝධනයක් ලෙස කමිටු අදියරේ දී ඉදිරිපත් කිරීමට සූදානම්.

හෙට දින පාර්ලිමේන්තුව රැස් වෙනවා. එහිදී කතානායකවරයා 20 වැනි සංශෝධනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දැනුම් දෙනවා. ඉන් පසුව පක්ෂ නායකයන්ගේ තීරණය අනුව බදාදා (21) හා බ්‍රහස්පතින්දා(22) දිනවලදී 20 වැනි සංශෝධනය විවාදයට භාජනය වෙනවා. වැඩිපුර පැය දහයක් මේ සඳහා වෙන්කර දීමට ආණ්ඩුව එකඟ වී තිබෙනවා. බදාදා හා බ්‍රහස්පතින්දා දවස් දෙකේ දී උදේ වාචික ප්‍රශ්නවලට පිළිතුරු සැපැයීම සඳහා වෙන්කර තිබෙන පැයක කාලයක් විවාදයට යොදවනවා. වාචික ප්‍රශ්න නැහැ. ඒවාගේම ඒ දවස් දෙකේදීම දිවා ආහාරයට විවේකය අහෝසි කර තිබෙනවා. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු සාමාන්‍යයෙන් සවස 4.30ට අහෝසි වෙනවා. නමුත් මේ දවස් දෙකේදීම පාර්ලිමේන්තු වැඩ කටයුතු සවස 7.30 දක්වා වැඩිපුර පැය තුනක් යෙදීමට ආණ්ඩුව එකඟ වී තිබෙනවා. ඒ ආකාරයට බදාදා හා බ්‍රහස්පතින්දා පැය පහ බැගින් පැය දහය සැලසුම් කර තිබෙනවා. බ්‍රහස්පතින්දා සවස 7.30ට අවසන් ඡන්දය මේ සම්බන්ධයෙන් ගැනීමට බලාපොරොත්තු වෙනවා.

20වන සංශෝධනයේ බලාපොරොත්තුව වන්නේ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉවත් කර දැමීමයි. 19 වැනි සංශෝධනය සඳහා එදා යහපාලන ආණ්ඩුව ලබාදුන්නේ දවස් දෙකක විවාදයක්. ඒ ක්‍රමවේදයම අනුගමනය කරමින් , ඉතාම සාධාරණ ආකාරයට 20 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් දවස් දෙකක විවාදයක් පැවැත්වීමට ආණ්ඩුව තීරණය කළා. නමුත් එය සාමාන්‍ය ක්‍රමවේදයෙන් බැහැරව වැඩිපුර පැය දහයක් මේ විවාදය සඳහා ලබාදී තිබෙනවා. 20වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් දෙවැනි වර කියැවීමේදී තුනෙන් දෙකක බහුතරයක් ගන්න පුළුවන් කියා ආණ්ඩුව දැඩි ලෙස විශ්වාස කරනවා. කමිටු අදියරෙන් පසුව , තුන්වැනි වර කියැවීමේදී ද තුනෙන් දෙකක බලයක් ආණ්ඩුව පැහැදිලිවම ගන්න පුළුවන් කියා විශ්වාස කරනවා. ඉන්පසුව ජනමත විචාරනයක් අවශ්‍ය නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය යම් කිසි සංශෝධනයක් යෝජනා කර තිබේ නම් ඒ සංශෝධනවලට ආණ්ඩුව එකඟ වෙනවා. ආණ්ඩුව ඉදිරිපත් කළ සංශෝධනවලට අමතරව ශ්‍රේෂ්ඨාධිකරණය යම්කිසි සංශෝධනයක් නිර්දේශ කරනවා නම් එයත් ආණ්ඩුව යෝජිත සංශෝධනයක් විදිහට කමිටු අදියරේදී ඉදිරිපත් කිරීමට සූදානම්.

මේ සම්බන්ධව අදහස් දක්වන්න බලාපොරොත්තු වෙනවා. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට තිබෙන බලය ඉන් එක් කාරණාවක් . මේ සම්බන්ධයෙන් වර්තමානයේ තිබෙන තත්ත්වය ඉතාම අසතුටුදායකයි. අද ක්‍රියාත්මක වන 19වැනි සංශෝධනය අනුව පාර්ලිමේන්තුව රැස්වූ විට , පළමු රැස්වීමෙන් පසුව අවුරුදු හතරහමාරක් යන තුරු ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හරින්න බැහැ. ඒ වගන්තිය නිසා මේ රටට කොතරම් විනාශයක් වුණා ද කියන දේ පැහැදිලියි.

2019 නොවැම්බර් 16 වැනි දා ජනාධිපතිවරණය තිබුණා. ජනාධිපතිවරයා ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා දිවුරුම් දුන්නා. ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ඕනෑම රටක ඉන්පසුව සිදුවන්නේ පරණ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමයි. පසුව ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්ති පිළිගනිමින් අලුත් පාර්ලිමේන්තුවක් පත්කර දෙන්නැයි කියන ආයාචනය අභිනව ජනාධිපතිවරයා සිදු කරනවා. නමුත් 19වැනි සංශෝධනය නිසා එහෙම කරන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ බාධකය නොතිබුණා නම් 2020 ජනවාරි වන විට පාර්ලිමේන්තු මැතිවරණය පැවැත් වෙනවා. එය කරන්න බැරි වීමේ ප්‍රතිඵලයක් ලෙස සම්පූර්ණ අවුරුද්දක් නාස්ති වුණා. ගෝඨාභය රාජපක්ෂ මහතාගේ අවුරුදු 5න් අවුරුද්දක් දැනටම ඉවර වුණා. ඒ නිසා අපි එය වෙනස් කළ යුතු යි. 19වැනි සංශෝධනයට පෙර තිබූ තත්ත්වය වන්නේ පාර්ලිමේන්තු මැතිවරණයකින් පසුව, අවුරුද්දක් ගත වූ විට ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන්. 1978 සිට තිබූ නීති තත්ත්වය එයයි. නමුත් 20 වැනි සංශෝධනය සම්බන්ධව කමිටු අදියරේදී සංශෝධනයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ජනාධිපතිවරයාට පුළුවන් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න ,නමුත් එක අවුරුද්දක් කෙටි වැඩියි කියා අපි විශ්වාස කරනවා. ජනාධිපතිවරයා අවුරුදු පහකට පත් කළාසේම පාර්ලිමේන්තුවත් පත් කරන්නේ අවුරුදු පහකටයි. එනිසා අවුරුද්දකින් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීම උචිත නැහැයි කියා අපි විශ්වාස කරනවා. ඒ නිසා පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයාට භාවිතා කරන්න පුළුවන් වන්නේ අවුරුදු දෙකහමාරක් අවසන් වූ පසුවයි.

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සම්පූර්ණ මුක්තිය ජනාධිපතිවරයාට හිමි වෙනවා. 19වැනි සංශෝධනය යටතේ මුක්තියේ ක්ෂේත්‍රය සීමා වෙනවා. මානව හිමිකම් නඩුවක් ජනාධිපතිවරයාට ගේන්න හැකියාව තිබුණා. 20 වැනි සංශෝධනයෙන් අපි ඒ තත්ත්වය වෙනස් කළා. 1978 සිට 2015 දක්වා තිබූ තත්ත්වයට , ජනාධිපතිවරයාට මුක්තිය ලබා දෙන බව 20 වැනි සංශෝධනයෙන් අන්තර් ගත කර තිබෙනවා. ජනාධිපතිවරයා බලයේ සිටින කාලයේ දී උසාවි කටයුතු සඳහා කාලය වෙනස් කරන්න බැහැ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කිසිසේත්ම නීති විරෝධී දෙයක් කරන් නැති බව අපි පැහැදිලිව කියනවා. මානව හිමිකම් පිළිබඳ නඩු ගෙන එන්න පුළුවන් කියා සංශෝධනයක් කමිටු අදියරේදී ඉදිරිපත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

1978 සිට 2015 දී 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන තෙක් අවුරුදු 37 ක් පුරාවට ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට කිසිදු බාධාවක් තිබුණේ නැහැ. මේ ප්‍රශ්නය ඉදිරිපත් වුණේ පුද්ගල කේන්ද්‍රීය ප්‍රශ්න නිසයි. මේ සම්බන්ධයෙන් නීතිමය ගැටලුවක් තිබෙනවා. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 26 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා පුරවැසියන් එකම කොටසක් ලෙස සලකන බව සඳහන් වෙනවා. ඒ පුරවැසියන් අතර විභේදන දක්වන්න බැහැ කියා එහි සඳහන් වෙනවා. ඡන්දය ඉල්ලීමේ මිනුම් දණ්ඩ වන්නේ ඡන්දය දීමේ හැකියාවයි. ඒ නිසා ද්විත්ව පුරවැසිභාවය කියන පදනම මත ශ්‍රී ලංකා පුරවැසියෙක්ට අයිති සියලුම අයිතිවාසිකම් කප්පාදු කරන්න බැහැ. සමස්ථයක් ලෙස ඒවා භුක්ති විඳීමේ අයිතිය ලැබෙනවා.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ප්‍රධාන ලේකම් , පාර්ලිමේන්තු මන්ත්‍රී සාගර කාරියවසම් මහතා -

සමාජ මාධ්‍ය යොදා ගනිමින් දැඩි බොරු චෝදනා සහ බොරු මතයන් සමාජය තුළ වපුරවමින් කටයුතු කිරීමෙන් 2015 වසර වනවිට ආර්ථික වර්ධන වේගය සියයට 7.8ට තිබූ මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව පෙරළා දැමුවා. එවකට පැවැති ආණ්ඩුව කෙරෙහි වැරදි මතයක් ජනතාව තුළ ඇති කිරීමට මෙය ඉතා සූක්ෂමව සිදු කළා.

නැවත ඒ පරණ ක්‍රියාවලිය සමාජ මාධ්‍ය තුළ ඉස්මතු වී වැරදි මත පතුරුවන්න හදනවා. පසුගිය දිනවලදී රිෂාඩ් බදියුදීන් මහතා අත්අඩංගුවට ගැනීමේ ප්‍රමාදයක් තිබුණා. මොකද ඔහු සැඟ වී සිටියා. ඒ සම්බන්ධයෙන් පවා ආණ්ඩුව චෝදනා කරන තත්ත්වයට පත්වුණා. අද ඔහු අත්අඩංගුවට ගත් බව දන්වා තිබෙනවා. සමාජ මාධ්‍ය හරහා මේ ආණ්ඩුව එරෙහිව බොරු ප්‍රචාර ගෙන ගිය පුද්ගලයන්ට පැහැදිලි පිළිතුරක් ලබා දී තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී ඔහුව අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම සම්බන්ධව පොලීසියට ස්තූතිවන්ත වෙනවා.

මේ ආණ්ඩුව අපේ ජනතාව පත් කළේ විශාල බලාපොරොත්තු රැසක් සමඟින්. ඒ පැතුම් ඉටු කරනවා. ඒවාට පටහැනිව අපි යන්නේ නැහැ. කියන දේ අපි වගකිව යුතු ආණ්ඩුවක් විදිහට අපි ජනතාවට ප්‍රකශ කරනවා. අපි අවුරුදු පහක් ගෙවුනාට පසුව නැවත අපි ජනතාව ඉදිරියට එන්න අවශ්‍යයි කියන දේ මොකද අපි හොඳින් දන්නවා. ඒ නිසා අපි ජනතා සිතුම් පැතුම් ඉටු කරන ආණ්ඩුවක් මිසක් ඒවා ඉවත දමන ආණ්ඩුවක් නොවන බව ඒ සහතිකය අපි ලබා දෙනවා.

# ජාතික සඳුන් උයනේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කෙරේ



**චන්දිමා කරුණාරත්න**

බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර 'ජාතික සඳුන් උයන' ඉදිකිරීම් කටයුතු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ උපදෙස් පරිදි කඩිනම් කෙරේ.

මෙහි පළමු අදියර සඳහා වැය කෙරෙන මුදල රුපියල් මිලියන 132කි. නාගරික සංවර්ධන අධිකාරිය මෙහි පිරිවැය දරන අතර නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස් පරිදි ඉදිකිරීම් සිදු කරන්නේ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවයි. සඳුන් ගස් දහසක් සෙවණේ ඉදි කරන ප්‍රථම විවේක මධ්‍යස්ථානයක් ලෙස මෙය හැඳින්විය හැකිය.

බත්තරමුල්ල, අපේ ගම පරිශ්‍රයට යාබදව පාර්ලිමේන්තු සංකීර්ණයට ආසන්නයේ ශ්‍රී ලංකා ජපන් මිත්‍රත්ව පාර අසලින් අක්කර 09කින් යුත් භූමි ප්‍රමාණයක මේ ජාතික සඳුන් උයන ඉදි කෙරේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් අනුව පසුගිය ජුනි මස 06 වැනිදා එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කෙරිණි. සඳුන් ගස් දහස සිටුවීමේ කටයුතු ලබන සතියේදී ආරම්භ කිරීමට නියමිත අතර මේ උයනෙහි පොකුණු 11ක් ඉදිකිරීමේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතී. එමෙන්ම විශාල පොකුණු දෙකක් මැදි වන ආකාරයෙන් එළමහන් රංග පීඨයක් ද ඉදි කෙරේ. විශාල ජල තටාක 2කට මැදි වන සේ මෙවැනි එළිමහන් රංග පීඨයක් ඉදිකිරීම ද නව අත්දැකීමක් වනු ඇත.

මේ එළිමහන් රංග පීඨයේදී නාට්‍ය දර්ශන, ප්‍රසංග ඉදිරිපත් කිරීම, පොත්පත් දොරට වැඩීමේ උත්සව ඇතුළු තවත් උත්සව පැවැත්වීමට ද හැකියාව පවතී. ව්‍යායාම් සිදු කිරීම, යෝගී ව්‍යායාම් වැඩසටහන් පැවැත්වීම, විවිධ භාවනා වැඩසටහන් පැවැත්වීම ආදිය සිදු කිරීමට හැකි වන පරිදි මේ ජාතික සඳුන් උයන නිර්මාණය කර ඇත.

ආහාරපාන ලබාගැනීමට අවන්හල් ද, රථගාල් පහසුකම් ද මෙහි ඇති අතර ඇතුළුවීමට කිසිදු මුදලක් අය නොකෙරේ.

නාගරික සංවර්ධන හා නිවාස ඇමැති, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති, වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, වරලත් නගර නිර්මාණ ශිල්පි ප්‍රසාද් රණවීර සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති විශ්‍රාමික මේජර් ජනරාල් එම්. ආර්. ඩබ්ලිව්. ද සොයිසා මහත්වරුන්ගේ අධීක්ෂණයෙන් මෙහි ඉදිකිරීම් කටයුතු සිදු කෙරේ.

# කම්කරු දෙපාර්තමේන්තුවට නව මුහුණුවරක් දිය යුතුව තිබෙනවා

## ඇමැති නිමල් සිරිපාල ද සිල්වා

**අනුර ප්‍රේමලාල්**

කම්කරු දෙපාර්තමේන්තුවට නව මුහුණුවරක් දී ලංකාවේ සියලුම කම්කරු කාර්යාල වහාම ප්‍රතිසංවිධානය කළ යුතු යැයි කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ඊයේ (19) නව කම්කරු කොමසාරිස් ජනරාල් ලෙස ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා වැඩ බාර ගැනීමේ උත්සවයට සහභාගි වෙමින්ය.

මෙවර වැඩ භාරගනු ලැබුවේ 23 වැනි කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙයි.

එහි දි තවදුරටත් අදහස් දැක් වූ ඇමැතිවරයා මෙසේද පැවසීය.



නව කම්කරු කොමසාරිස් ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා සුබමොහොතින් කම්කරු ඇමැති ඉදිරියේ වැඩභාරගත් අයුරු මෙහි දැක්වේ. අමාත්‍යාංශ ලේකම් මාපා පතිරණ මහතා ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක් වුහ.

විශේෂයෙන් එම කාර්යාලවල පවිත්‍රතාවය සහ කාර්යක්ෂමතාවය ඉහළින්ම පවත්වා ගෙන යෑම මූලිකව සැලකිය යුතුයි. එසේම කම්කරු කාර්යාලවල ගොඩ ගැසී ඇති ලිපිගොනු අදාළ තීන්දු කඩිනමින් අරගෙන අවසන් කළ යුතුයි.එසේ ගොඩ ගැසී ඇති නඩු සංඛ්‍යාව 16000ක් පමණ වෙනවා.මෙම නඩු කම්කරු විනිශ්චය සභාවලින් විසඳීම සඳහා වන නව නීති සංශෝධන ගෙන ඒමට කැබිනට් මණ්ඩල අනුමත කර තිබෙනවා.ඒ අනුව එම EPF/ETF නඩු මාස දහ අටක් තුළ අවසන් කළ හැකියි.

මේ සඳහා දෙපාර්තමේන්තුවේ ඵලදායිතාවය ඉහල නැංවිය යුතු වෙනවා. එසේම ඉන්දියාව,බංගලිදේශය,ඇතුළු විදෙස් රටවල කර්මාන්ත ශාලා ආශ්‍රිතව සේවය කරන ලාංකික සේවකයන්ගේ EPF/ETFදායක මුදල් දිගු කලක් ඒ රටවල බැංකුවල රැඳී තිබීම වලක්වමින් ,එම මුදල් ලංකාවට කඩිනමින් ගෙන්වා ගත යුතුව ඇති බැවිනි,ඒ සඳහා නව අණ පනත් කඩිනමින් ගෙන ඒමට අවශ්‍ය මූලික කටයුතු යොද තිබෙනවා.

නව කොමසාරිස් ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතා-

කම්කරුවන්ට උපරිම සේවය සලසමින් කම්කරු සාමය අරක්ෂා කිරීම සිය තනතුරේ වගකීම වෙනවා.එසේම අවශ්‍ය නව නීති සංශෝධන ගෙන එමින් කම්කරුවන්ට සහ සේව්‍ය පක්ෂයට සාධාරණය ඉටු කරමින් මේ රටේ ආර්ථික සංවර්ධනයට ඉහළම දායකත්වය ලබාදීම සිය ඉලක්කයයි.

මෙම අවස්ථාවට අමාත්‍යාංශයේ ලේකම් මාපා පතිරණ මහතා ඇතුළු නිලධාරී මහත්ම මහත්මිහු එක්ව සිටියහ.

# ප්‍රතිපත්තියක් ලෙස 20ට පක්ෂ වුවත් බරපතළ සංශෝධන කිහිපයක් සිදු කළ යුතුයි

## පිවිතුරු හෙළ උරුමය ජනපතිට ලිපියක් යවමින් කියයි

**උපාලි කරුණාරත්න**

ප්‍රතිපත්තියක් ලෙස විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂ වූවත් එහි බරපතල සංශෝධන කිහිපයක් සිදු කළ යුතු බව පිවිතුරු හෙළ උරුමය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාට ලිපියක් යවමින් කියා සිටී.

පිවිතුරු හෙළ උරුමයේ ප්‍රධාන ලේකම් උපුල් විජේසේකර මහතාගේ අත්සනින් නිකුත් කර ඇති එම ලිපියේ වැඩිදුරටත් මෙසේ සඳහන් වේ.

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ මෙම 21 වැනි සහ 22 වැනි දිනයන්හි පාර්ලිමේන්තුවේ දී විවාද කර ඡන්දය විමසීමට නියමිතයි.19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ජනාධිපතිට ජනතාව ලබා දෙන විධායක බලයෙන් සැලකිය යුතු කොටසක් අගමැතිට සහ කතානායකගේ සභාපතිත්වයෙන් යුත් ව්‍යවස්ථාදායක සභාවට ලබා දීමෙන් හිස් තුනක පක්ෂියකු බඳු රාජ්‍යයක් නිර්මාණය වී ඇත. පසුගිය ආණ්ඩුව අසාර්ථක වීමට බල පෑ ප්‍රධානතම කරුණ වූයේ එයයි. පසුගිය මැතිවරණයේ දී 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වෙනස් කළ හැකි ජනවරමක් අප ඉල්ලා සිටියේ එබැවිනි. ඒ අනුව ප්‍රතිපත්තියක් ලෙස අප විසි වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පක්ෂ නමුත් එහි බරපතල සංශෝධන කිහිපයකට ලක් කළ යුතු බව පක්ෂයේ ස්ථාවරයයි. විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ නිර්ණය ප්‍රසිද්ධ කිරීමට නියමිතය. එබැවින් 20 වැනි සංශෝධනයේ අඩංගු කරුණුවල දේශපාලන සහ සමාජ බලපෑම පිළිබඳ සංවාදය තව දුරටත් ඉදිරියට ගෙන යා යුතු බව අපගේ අදහසයි.

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු කරුණු පිළිබඳ පක්ෂයේ ස්ථාවරය පක්ෂයේ නායක බලශක්ති ඇමැති නීතිඥ උදය ගම්මන්පිල මහතා ඇමති මණ්ඩලයේ දී ද ඔබතුමා සමඟ පෞද්ගලිකව ද විසිවැනි සංශෝධනය පිළිබඳ අගමැතිතුමා පත් කළ කමිටුවේ සාමාජිකයකු ලෙස එහි දී ද දැන් වූ බව පක්ෂයට වාර්තා කර ඇත. නීතිපතිතුමා හරහා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරමින් කමිටු අවස්ථාවේ කරන බවට දක්වා ඇති සංශෝධනවලින් නොවිසඳුණු ජාතික ආරක්ෂාවට මෙන්ම ජනතාවගේ අයිතිවාසිකම් වලට ද බලපාන ප්‍රධාන කරුණු පිළිබඳ පක්ෂයේ මතය අපි මතු දක්වා සිටිමු.

1. හදිසි පනත් සම්මත කිරීම

ගැසට් මඟින් පනත් කෙටුම්පත් ප්‍රසිද්ධ නොකර හදිසි පනත් සම්මත කිරීමට විධිවිධාන යෝජනා කිරීම මහජනතාවට එකී පනත් කෙටුම්පත් පිළිබඳ අදහස් දැක්වීමට අවස්ථාව අහිමි කිරීමක් පමණක් නොව එහි අඩංගු ව්‍යවස්ථා විරෝධි විධිවිධාන ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කිරීමට ද අවස්ථාව අහිමි කිරීමකි. ජේ .ආර්. ජයර්වධන ජනපතිතුමා 1987 දී දැවැන්ත ජනතා විරෝධයක් මැද 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ ද චන්ද්‍රිකා ජනාධිපතිතුමිය 2000 දී පෙඩරල් ව්‍යවස්ථාව ගෙන ආවේ ද මෙම වගන්තියට මුවා වෙමිනි. ජාතියට තීරණාත්මක පනත් කෙටුම්පත් හදිසි පනත් ලෙස ගෙනැවිත් ජනතාවට ඒ පිළිබඳ අදහස් දැක්වීමට ඇති අවස්ථාව අහිමි කිරීමේ අප්‍රසන්න ඉතිහාසයක් ඇති බව මෙහි දී සිහිපත් කළ යුතුය.

2. රාජ්‍ය සමාගම් විගණනය කිරීමට විගණකාධිපති සතු බලතල අහෝසි කිරීම

ශ්‍රී ලන්කන් එයාර් ලයින්ස් සමාගම අවස්ථා ගණනාවක දී එයාර් බස් මිළ දී ගැනීමේ දී ප්‍රකෝටි ගණනක වංචාවක් සිදු වී ඇති බව කෝප් කමිටුව ඉදිරියේ හෙළිදරව් වූයේ විගණකාධිපතිගේ විගණනය මඟිනි. එබැවින් මහජන මුදල් 50%ට වඩා යොදවා ඇති ඕනෑම ආයතනයක් විගණනය කිරීමේ බලය විගණකාධිපති සතු විය යුතුය. එය කොමිෂන් සභා සම්බන්ධයෙන් ද අදාළය.

3. ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ ජනාධිපති වීමට අවස්ථාව සැලසීම

ඔස්ට්‍රේලියාවේ ජනගහනයෙන් 97%ක් සැකසී ඇත්තේ පසුගිය වසර 200 තුල එරටට සංක්‍රමණය වුණු ජනතාවගෙනි. නමුත් එරට පවා ද්විත්ව පුරවැසියන්ට දේශපාලන තනතුරු දැරීමට අවස්ථාවක් ලබා නොදෙයි. ලොව බොහෝ රටවල ද එම නීතිමය සීමාව දැකිය හැක. එකී නීතිය පසුගිය ආණ්ඩුව ගෙන ආවේ රාජපක්ෂ පවුල ඉලක්ක කරගෙන ද්වේශ සහගත චේතනාවෙන් වුවද එය සාධනීය පියවරක් ලෙස අපි දකිමු. යම් ජනාධිපතිවරයෙකුගේ හෝ ඇමැතිවරයෙකුගේ පක්ෂපාතීත්වය රටවල් දෙකක් අතර බෙදී ඇත්නම් එකී රට සමඟ ගනුදෙනු කිරීමේ දී ඔහු ශ්‍රී ලංකාව වෙනුවෙන් අවංකව පෙනී සිටීදැයි යන සාධාරණ සැකයක් ජනතාවට ඇති වනු ඇත.

4. ඇමැතිවරුන් ගණනට ඇති සීමාව ඉවත් කිරීම

නිදහසින් පසු ක්‍රමයෙන් ඇමැතිවරුන් ගණන වැඩි වී අවසානයේ දී ඇමතිවරු ගණන 94 දක්වා ඉහළ නැගුණු බව ඔබතුමා ද දනියි. මේ පිළිබඳ සමාජයේ මතු වුණු දැවැන්ත විරෝධය හේතුවෙන් 19 වැනි සංශෝධනය මඟින් ඇමැති මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව 30කට ද සහ ඇමැති මණ්ඩල සාමාජිකයන් නොවන ඇමැතිවරුන් සහ නියෝජ්‍ය ඇමැතිවරුන් ගණන 40කට ද සීමා කරන ලදී. එකී සීමාව ඉවත් කිරීම මඟින් මහජන මුදල් නාස්තියක් මෙන්ම තමන්ව ඇමැති මණ්ඩලයට පත් කරන මෙන් ඇමැති මණ්ඩලයේ නොසිටින මැති ඇමැතිවරුන්ගෙන් ඔබතුමාට පීඩනයක් ඇති කිරීම ද සිදුවිය හැක.

ඔබතුමාට ඇමැතිවරුන් 30ක් පත් කිරීමට අවස්ථාව තිබිය දී පළමු අවස්ථාවේ දී ඇමැති මණ්ඩලය 16කට ද දෙවැනි අවස්ථාවේ 28කට ද සීමා කිරීමෙන් ජාතියට මහඟු ආදර්ශයක් ලබා දී ඇත. නමුත් මෙකී ව්‍යවස්ථාමය විධිවිධාන ඔබතුමාගේ කාලයෙන් අවසන් නොවේ. ඔස්ට්‍රේලියානු ව්‍යවස්ථාව වසර 119ක් ද අමෙරිකානු එක්සත් ජනපද ව්‍යවස්ථාව වසර 231ක් ද තිස්සේ පවතින බව මෙහි ලා සිහිපත් කිරීමට කැමැත්තෙමු.

ඉහත කරුණු පිළිබඳ කාරුණික අවධානය යොමු කර 69 ලක්ෂයේ ජන වරමට ගරු කරනු වස් විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වඩාත් ජනතා හිතකාමී කරනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

මෙම ලිපියේ පිටපත් අගමැතිවරයාට, අධිකරණ ඇමැතිවරයාට ද යොමු කළ බව පිවිතුරු හෙළ උරුමය ප්‍රකාශ කරයි.

# තව අවුරුදු දෙකක් කොරෝනා සමඟ ජීවත් වීමට සිදු වෙනවා

## රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංසදයේ සභාපති

**චන්දිමා කරුණාරත්න**

තව අවුරුදු දෙකක් විතර කොරෝනා සමග ජීවත්වීමට සිදුවන බවත් කොරෝනා පාලනය සම්බන්ධව පවතින තත්ත්වයන් තේරුම් ගනිමින් රෝගයට ගොදුරු වීමට අවධානමක් ඇති වයස් කාණ්ඩවල පිරිස් අවධානයෙන් ජීවත් විය යුතු බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංසදයේ සභාපති වෛද්‍ය රුක්ෂාන් බෙල්ලන මහතා දිනමිණට පැවැසී ය.

පී.සී.ආර් පරීක්ෂණ වලින් පොසිටිව් වන සියලුම පිරිස් රෝහල් ගත කිරීම අවශ්‍ය නොමැති නමුත් ඔවුන් නිරෝධායන ක්‍රියාවලියට යටත් කිරීම අත්‍යවශ්‍ය කාරණයක් බවත් ඒ සඳහා ප්‍රදේශයේ ග්‍රාම සේවක , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා ඇතුළුව අදාළ අංශ කාර්යක්ෂමව දායකවීම වැදගත් බවත් කීවේ ය.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස සිටි විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතාගේ තනතුරට සුදුසු පුද්ගලයකු පත් නොකිරීම නිසා කොරෝනා ව්‍යාප්ත වීමට හේතු වූ බවත් කියා සිටියේ ය.

සෞඛ්‍ය අමාත්‍යංශයට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයකු නොමැතිව මාස දෙකක පමණ කාලයක් පැවැතීම මේ ආකාරයට කොරෝනා වසංගතය සමාජය තුළ පැතිරීමට හේතු වූ බවත් පැහැදිලි කළේ ය.

තමන් ඇතුළුව වෛද්‍ය ජයරුවන් බණ්ඩාර , වෛද්‍ය අනිල් ජාසිංහ , වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා , වෛද්‍ය සුනිල් ද අල්විස් වැනි සෞඛ්‍ය අමාත්‍යංශයේ සේවය කරන ඉහළ තනතුරු දරන නිලධාරීන් වත්මන් සෞඛ්‍ය ලේකම්වරයාගේ මූලිකත්වයෙන් යම්කිසි ආකාරයක පලිගැනීමකට ලක්වෙන බවත් එය දේශපාලනිකවද , රාජකාරීමය වශයෙන්ද යන්න නොදන්නා බවත් පෙන්වා දුන්නේ ය.

මෙලෙස පීඩනයට පත්වන සියලු දෙනා 2015-2020 අතර කාලය පුරාවටම අගමැති මහින්ද රාජපක්ෂ මහතා සමඟ සමීපව වැඩ කරමින් එතුමාව බලයට ගෙන ඒමට කටයුතු කළ පිරිසක් බවත් මෙලෙස අදෘශ්‍යමාන ආකාරයට හිරිහැරයට ලක්වන පිරිසගේ නම් ලැයිස්තුවට ඉදිරියේ දී තවත් පිරිස් එකතුවීමට නියමිත යැයි දැනගන්නට ඇති බවත් පැහැදිලි කළේ ය.

# ආණ්ඩු වෙනස රටේ සංවර්ධනයට ජාතික ආරක්ෂාවට බලපෑවේ නෑ

## ● හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන

### රාජ්‍ය සේවයේ වගකීම් ඉටු නොකිරීම් සොයන්න ගියොත් කී දෙනෙක් ඉතිරි වෙයිද දන්නෙ නෑ

### මලල්ගොඩ කමිටු වාර්තාව වෙනස් කරන්න තරම් මා අමනෝඥයෙක් නොවේ

### මා ආරක්ෂක විශේෂඥයෙක් නොවේ: පත් කළ සුදුස්සන් ඔවුන්ගේ රාජකාරිය කර නෑ

### පාස්කු ඉරු දින ප්‍රහාරය ගැන සොයන ජනපති කොමිසම

**සුභාෂිණී සේනානායක**

2018 ඔක්තෝබර් මස සිදු වූ ආණ්ඩු වෙනසෙන් පසුව දේශපාලන මතවාදයක් තිබු බවත්, එය රටේ සංවර්ධනයට සහ ජාතික ආරක්ෂාවට බලපෑවේ නැති බවත් හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පසුගිය 17 වැනිදා පාස්කු කොමිසම හමුවේ සිව් වන දිනටත් සාක්ෂි දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ හිටපු ජනාධිපතිවරයා මෙසේ ද කීය.

මලල්ගොඩ කමිටුවේ නිර්දේශ ඉවත් කරනවා. ප්‍රහාරයේ වගකීම භාරගෙන ඉවත් වෙන්න කියා හිටපු පොලිස්පතිවරයාට කියන්න තරම් මා අමනෝඥයෙක් නොවේ. එසේ කවුරුන් හෝ කියා තිබේ නම් එය සම්පූර්ණ අසත්‍යයක්.

අන්තවාදය සම්බන්ධයෙන් බුද්ධි අංශ වෙතින් ලැබී තිබූ වාර්තා අනුව එය වැළැක්වීමට අවශ්‍ය උපදෙස් සහ නියෝග දුන් බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට හැකියාවක් නෑ. එම සාකච්ඡාවලට අදාළ ලේඛන ජනාධිපති ලේකම් කාර්යාලයේ ඇති බවට මා විශ්වාස කරනවා.

ජනාධිපති ලේකම් කාර්යාලයේ එම ලිපි ලේඛන ඇත්නම් එම කාර්යාලයේ ලිපිගොනු පරීක්ෂා කිරීමට සිදු වෙනවා. මා උපදෙස් සහ නියෝග ලබාදී තිබුණත් පහළ සිටින නිලධාරීන් ඒවා ක්‍රියාත්මක කර නොමැති බව පෙනෙන්නට තිබෙනවා. ප්‍රහාරයට අදාළව ලැබුණු විදේශ බුද්ධි තොරතුර ජනාධිපති ලේකම්වරයාට දැනුම් දිය යුතුව තිබුණා. හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීමේ ලේඛන හදන්නේ ජනාධිපති ලේකම්වරයා. තොරතුරු දැනගත් නිලධාරීන් ඔහුට ඒ බව නොකියු එකත් ප්‍රශ්නයක්.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

තමන් උපදෙස් සහ නියෝග ලබාදී ඇත්නම් ඒවා ක්‍රියාත්මක වීම ගැන නිසි පරිදි පසුවිපරමක් සිදු කළා ද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

මා නිසි පරිදි උපදෙස් දී තිබෙනවා. ඒවා පහළ නිලධාරීන් ක්‍රියාත්මක නොකිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. එසේ ක්‍රියාත්මක වූවා නම් මෙවැනි තත්ත්වයකට මුහුණ දෙන්න වෙන්නේ නෑ.

**කොමිසම:**

එම කාලයේ පැවති දේශපාලන අර්බුදකාරී තත්ත්වය මත නිසි උපදෙස් නොලැබීමෙන් අන්තවාදීන්ට බෝම්බ පුපුරුවා ගැනීමට හැකියාවක් ලැබී තිබෙන බවට ඔබතුමාට යෝජනා කරනවා?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

ඒ වන විට දේශපාලන අර්බුදයක් තිබුණේ නෑ. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසු යළි ආණ්ඩුව පවත්වාගෙන ගියා. දේශපාලන මත ගැටුම් තිබුණත් අමාත්‍යාංශ සහ ආයතනවලට බලපෑමක් තිබුණේ නෑ. එසේ බලපෑවා කියා මා විශ්වාස කරන්නෙත් නෑ. මොකද සෑම සතියකම කැබිනට් මණ්ඩලය රැස් වෙනවා. ආරක්ෂක අමාත්‍යාංශයේ රැස්වීම් තිබෙනවා. විවිධ කොමිටි තිබෙනවා. මේවායේදී සාකච්ඡා කරනවා. අවශ්‍ය කටයුතු කරගෙන ගියා. මෙතැන වෙලා තිබෙන්නේ වෙන දෙයක්. වසර හතරක් ආරක්ෂක මණ්ඩලය උපදෙස් සහ නියෝග දී තිබෙනවා. නමුත් ක්‍රියාත්මකවී නෑ. බුද්ධි අංශ අතරින් විශාල බුද්ධි අංශය තිබෙන්නේ හමුදාවට. 7000ක පමණ විශාල පිරිසක් එහි සිටිනවා. උතුරු නැඟෙනහිර නාවික බුද්ධි අංශය තමා වඩා ශක්තිමත්ව සිටියේ. නමුත් මේ ගැන ඒ අංශවලින්වත් වාර්තා වුණේ නෑ. මඩකලපුව පොලිස් නිලධාරීන්ගේ ඝාතනය ගැන වුණත් සැලකුවේ එය එල්. ටී. ටී. ඊ. වැඩක් විදිහට. පසුව තමයි සහරාන්ගේ කට්ටිය ළඟ තිබී එම නිලධාරීන්ගේ ආයුධ සොයා ගත්තේ.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

කුමන පැහැදිලි කිරීම කළත් මේ කොමිසමට ඉදිරිපත්ව තිබෙන සාක්ෂි අනුව අන්තවාදී කටයුතු සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලයේදී නිසි අවධානයක් යොමු නොකිරීමත්, නිසි පරිදි අධීක්ෂණය නොවීමත් නිසා 21 වැනිදා ප්‍රහාරය සිදුවූ බවට ඒත්තු ගැන්වෙනවා කියලා කිව්වොත්?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

ඒ සාක්ෂි මා ප්‍රතික්ෂේප කරනවා. මා පිළිගන්නේ නෑ. 2019 ජනවාරි සහ පෙබරවාරි මාසවලත් ආරක්ෂක මණ්ඩලය පැවතුණා. ඊට පෙර වසරවලත් ආරක්ෂක මණ්ඩලය රැස් වුණා. ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන් හමු වෙනවා. මා උපදෙස් දී තිබෙනවා. අවශ්‍ය දේ ක්‍රියාත්මක වෙලා නැති එකයි මෙතැන ප්‍රශ්නය. පරීක්ෂණ කරන නිලධාරීන් හරියට එය නොකළා නම් ඒ ඇයි කියන ප්‍රශ්නය තිබෙනවා. අප්‍රේල් මස 16 වැනිදා නැඟෙනහිර පළාතේ මෝටර් සයිකලය පිපිරුනු වෙලාවේ ඒ ගැන හරියට පරීක්ෂණ කරන්න කියලා ජනාධිපති උපදෙස් දෙන්න අවශ්‍ය නෑ. ඒ ප්‍රදේශවල බුද්ධි අංශ තිබෙනවා. ඒ අය මොනවද කළේ කියන ප්‍රශ්නය තිබෙනවා. මේ අංශවල දුර්වලතා රාශියක් තිබිලා.

**කොමිසම:**

එවකට ජනාධිපතිවරයා ලෙස රජයේ ගැටලු සහගත තත්ත්වයක් තිබූ බව දැන සිටියා ද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

2018 ඔක්තෝබර් මස සිදුවූ ආණ්ඩු වෙනස ගැන කවුරුත් දන්නවා. දේශපාලන මතවාදයක් තිබුණා. එය රටේ සංවර්ධනයට සහ ජාතික ආරක්ෂාවට බලපෑවේ නෑ.

**කොමිසම:**

පොලිස්පති ඉවත් කරන්න බැරි වුණා නේද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

ඒක කරන්න බැරි වුණේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රශ්නයක් නිසා. ඒ ගැටලු මාත්, අගමැතිවරයාත්, කථානායකවරයාත් විතරයි දැනගෙන තිබුණේ. පහළ කිසිවෙක් එය දැනගත්තේ නෑ.

**කොමිසම:**

නිලධාරීන් අතර වැඩ කිරීමට බියක් තිබුණා ද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

රටේ විවිධ සිද්ධි දාමයක් තිබුණා. මහනුවර, ගිංතොට සහ යාපනය ආවා සිද්ධිය, පාතාලය අපරාධ මර්දනය, රටේ සංවර්ධනය වගේ කටයුතුවලදී ත්‍රිවිධ හමුදාව පොලිසිය එකාවන්ව වැඩ කළා.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

යම් හදිසි අවස්ථාවක පොලිස්පතිට ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට අණ දෙන්න බෑ නේද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

එහෙමයි.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

හදිසි නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන් ආරක්ෂක ඇමැතිවරයාට නේද? ඔබතුමා විදේශ ගත වෙනවා නම් වැඩබලන ආරක්ෂක ඇමැති කෙනෙක් පත් කරලා ගියා නම් මේ තත්ත්වය වළක්වගන්න තිබුණා නේද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

2019 අප්‍රේල් ප්‍රහාරයට පෙර බුද්ධි අංශ දැනුම්වත් කර තිබෙනවා. මේ සියලු දෙනාගෙන් එක් අයකුට හෝ යුතුකමක් තිබුණා ජනාධිපති ලේකම්ට මේ බව කියන්න. මා පිටරට ඉන්න නිසා නොකිව්වා නම් ඒ අයට උදය සෙනෙවිරත්න මහතාට කියන්න තිබුණා. මොකද මේ අය සමඟ ඒ මහතා බොහෝම හිතවත්. එහෙම කළා නම් ඔහු මේ බව මට කියනවා. හදිසි නීතිය ප්‍රකාශයට පත් කිරීමේ ලේඛන හදන්නේ ජනාධිපති ලේකම්. ඔහුට ඒක නොකිව්ව එකත් ප්‍රශ්නයක්.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ඇයි අප්‍රේල් 26 වැනිදා ප්‍රහාරයෙන් පසු හිටපු දෙවන පුරවැසියා ලෙස හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා රැස්වීමක් කැඳෙව්වාම ඒ රැස්වීමට ආරක්ෂක ලේකම්වරයාට සහ පොලිස්පතිවරයාට යන්න එපා කියලා කිව්වේ?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

ඒ සියලු දෙනාටම එක්වී මේ වැඩ කරන්න කියලයි මා කිව්වේ. ප්‍රහාරයෙන් පසු අගමැතිවරයා එක්ක මා දෙපාරක් කතා කළා. ඒ සෑම වෙලාවකම මා කිව්වේ මා එනකම් අවශ්‍ය වැඩ ටික කරන්න කියලා.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

සහරාන් ඇතුළු පිරිස ප්‍රදේශ රැසක පුහුණුවීම් කළ බව දැන සිටියා ද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

සමහර දේවල් දැනගෙන ඉන්න ඇති. ස්ථාන ගැන වෙන වෙනම මතකයක් නෑ.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

නුවරඑළිය ශාන්තිපුර බ්ලැක්පූල් කඳවුරේ යම් රැස්වීමක් පැවති බවට යම් තොරතුරුකරුවකු දැනුම් දූන්නාම පොලිසිය ක්‍රියාත්මක වී නෑ නේද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

ඔය තොරතුර ගැන මට හරියට මතකයක් නෑ. ඒ අය හරියට වගකීම් ඉෂ්ට කළ යුතුයි. ඒ වගකීම ඒ අය පැහැර හැර තිබෙනවා.

**කොමිසම:**

තමන් දුන් උපදෙස් පිළිනොපැදීම ගැන පසුවිපරමක් කළේ නැද්ද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

පොලිසිය මගේ අතට ඇවිත් මාස 4යි. ඊට පෙර ඇමැතිවරුන් හතරක් හිටියා. මගේ ධුර කාලය අවසන් වන තුරු පොලිසිය මගේ භාරයේ මාස 11ක් විතර තිබුණා. පොලිස් නිලධාරීන්ගේ මාසික රැස්වීම් පටන් ගත්තේ මා. පොලිසියේ විතරක් නොවෙයි රාජ්‍ය සේවයේත් වගකීම් ඉටු නොකිරීම තිබෙනවා. ඒ පිළිබඳව අවශ්‍ය අවවාද සහ උපදෙස් දෙන්න ගියොත් සියයට කීයක් ඉතුරු වෙයිද කියන ප්‍රශ්නය තිබෙනවා.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

සහරාන් ගැන කතා කරන දේ යටගිහින් ආරක්ෂක මණ්ඩලයේ නාමල් කුමාර ගැන වැඩි අවධානයක් දුන්නාද? සහරාන් සහ අන්තවාදය ගැන ආරක්ෂක මණ්ඩලයේ කතා කරනවා වෙනුවට නාමල් කුමාර ගැන කතා කළ බවට කොමිසමට සාක්ෂි ඉදිරිපත් වී තිබෙනවා.

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

නාමල් කුමාර යන අය දන්නේවත් දැකලාවත් නෑ. එම කතාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. ඒ කතාව අසත්‍යයක්. හිටපු පොලිස්පතිවරයා විසින් නාමල් කුමාර සිද්ධියට අදාළව නියෝජ්‍ය පොලිස්පතිවරයා සමඟ කිහිප වතාවක් මා හමුවීමට පැමිණියා. නාමල් කුමාර යන පුද්ගලයා සම්බන්ධයෙන් කිසිදු දිනක ආරක්ෂක මණ්ඩලයේ කතා කර නෑ.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

මත්ද්‍රව්‍ය වැටලීම් සහ මධුෂ් ලංකාවට ගෙන ඒමට ඔය කාලේ වැඩි අවධානයක් යොමු වුණාද? ඒ ගැන ආරක්ෂක මණ්ඩලයේ කතා කළා කියලා කොමිසමට සාක්ෂි ඉදිරිපත් වෙලා තිබෙනවා.

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

මධුෂ් නොවෙයි ප්‍රශ්නය. පාතාලය සහ මත්ද්‍රව්‍යයි. ජාත්‍යන්තර ත්‍රස්තවාදය සහ පාතාලය අතර සම්බන්ධතාවක් තිබෙනවා. මධුෂ් ගැන කතා කළාට ජාතික ආරක්ෂාවට ප්‍රශ්නයක් වුණේ නෑ. ජාතික ආරක්ෂාවට අදාළ කාරණා කතා කරලයි මධුෂ්, පාතාලය, මත්ද්‍රව්‍ය වගේම සිරගෙවල්වල ප්‍රශ්න කතා කළේ.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ප්‍රහාරයේ වගකීමෙන් ඉවත් වෙන්න මලල්ගොඩ කමිටුවේ නිර්දේශ ඉවත් කරගන්නම් කියලා පොලිස්පතිවරයාට කිව්වා?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

සම්පූර්ණ අසත්‍යයක්. මලල්ගොඩ කමිටුවේ විනිසුරු විජිත් මලල්ගොඩ මහතා සොයා ගත්තේ මා නොවෙයි. මා රටේ ඉද්දී ප්‍රහාරය පසුව කමිටුව පත් කරන්න උදය ආර්. සෙනෙවිරත්න මහතා තමයි ඒ මහතා පත් කර ගත්තේ. මේ වගේ වාර්තාවක් වෙනස් කරන්න තරම් මා අමනෝඥයෙක් නොවෙයි. එහෙම කරන්න මට අවශ්‍යතාවක් නෑ. මා කවදාවත් එහෙම කරන්නෙත් නෑ. කවුරු හරි එහෙම කිව්වා නම් එය අසත්‍යයක්.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

මෙවැනි තත්ත්වයක් තම ප්‍රදේශවල ඇති වෙනවා නම් නිසි පියවර ගන්න කියලා ඔබතුමා මුස්ලිම් ඇමැතිවරුන්ට කිව්වා කියලා කිව්වා නේද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

එහෙමයි.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

එවැනි උපදෙසක් නොදුන් බව කබීර් හෂීම් මහතා කීවා.

**මෛත්‍රීපාල සිරිසේන මහතා;**

එහෙම නම් ඒ මහතා ඒ කැබිනට් රැස්වීමට එන්න නැතිව ඇති. මා කිහිප වතාවක්ම කිව්වා.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ඔබතුමා කියන්නේ කබීර් හෂීම් මහතා කිහිප සැරයක්ම කැබිනට් රැස්වීමට ඇවිත් නෑ කියලා ද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

මා නම් එහෙම කිව්වා. ඒ මහතා එහෙම කියන්නේ ඇයි කියලා මා දන්නේ නෑ.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

කබීර් හෂීම් මහතාගේ ලේකම් තම්ලිනී මහතාට වෙඩි තිබ්බාම ඔහුට ආරක්ෂාව ඉල්ලුවා ලැබුණේ නෑ කියලා ඒ මහතා කිව්වා?

**මෛත්‍රීපාල සිරිසේන මහතා;**

ඒ සිද්ධිය වුණාම අවශ්‍ය උපදෙස් දුන්නා. ආරක්ෂාව වැඩි කරන්න කියලා ඉල්ලපු අවස්ථාවේ උපදෙස් දුන්නා.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ඒ කටයුතු නිසියාකාරව සිදු වෙලා නෑ නේද? කොතැනද අඩුපාඩුව වෙලා තිබෙන්නේ?

**මෛත්‍රීපාල සිරිසේන මහතා;**

හොඳින්ම වැඩ කරන අයත් ඉන්නවා. එහෙම නොකරන අයත් ඉන්නවා. මා සෑම අවස්ථාවකදීම අවශ්‍ය උපදෙස් දී තිබෙනවා.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ප්‍රහාරයට සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කළා නේද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

(කළ ප්‍රකාශයට අදාළ සී. ඩී. තැටිය වාදනය කරයි.)

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ආගමික අන්තවාදය ගැන නිසි පරීක්ෂණ නොකිරීමත්, බුද්ධි අංශවල තොරතුරුවලට නිසි අවධානය යොමු නොකිරීමත්, ගත යුතු නිසි ක්‍රියාමාර්ග අනුගමනය නොකිරීමත් නිසා ආගමික අන්තවාදය හිස ඔසවමින් අප්‍රේල් 21 ප්‍රහාරය සිදුවී ඔබගේ රටේ අහිංසක ජනතාවගෙන් කොටසක් ඊට හසුවී මිය ගොස් ඇති බව මා ඔබතුමාට යෝජනා කරනවා.

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

මා ඒ යෝජනාව ප්‍රතික්ෂේප කරනවා. මා අද මේ කොමිසමට සාක්ෂි දෙන්නේ හතර වෙනි දවසට. මා ස්තුතිවන්ත වෙනවා ප්‍රහාරයෙන් පසුව මා පාර්ලිමේන්තුවේ කළ ප්‍රකාශය මේ කොමිසමේ ඇහෙන්නට සැලැස්වීම ගැන. ඒක තමයි මගේ හෘදය සාක්ෂිය. පාස්කු ප්‍රහාරයට පෙරත් මා කටයුතු කළේ ඒ විදිහට. මා දේශපාලනය කළේ රට වෙනුවෙන් සහ රටේ ජනතාව වෙනුවෙන්. වෙනත් අංශවල වගකීම පැහැර හැරීම මගේ ප්‍රශ්නයක් නොවෙයි. මා ආරක්ෂක විශේෂඥයෙක් හෝ බුද්ධි විශේෂඥයෙක් නොවෙයි. ඒ තනතුරුවලට සුදුසු අය අයදුම්පත් කැඳවලා පත් කර තිබෙන්නේ. බඳවා ගත්තාට පසුත් පුහුණුවීම් සඳහා රට රටවලට යවලා පුහුණු කරන්නේ. ඒ නිසා ඔවුන් ඔවුන්ගේ රාජකාරිය ඉටු කළ යුතුයි. නමුත් බුද්ධි අංශ නිසි පරිදි ක්‍රියාත්මක නොවුණේ ඇයි කියන ප්‍රශ්නය තිබෙනවා. අවශ්‍ය උපදෙස් සහ මඟපෙන්වීම ලැබුණා නම් ඇයි ක්‍රියාත්මක නොවුණේ ? මා පුදුමයට පත් වෙනවා. නැඟෙනහිර නාවික බුද්ධි අංශය ශක්තිමත්. ඒත් ඔවුන්ටවත් මේ තොරතුරු ලැබී නෑ. මා ජනාධිපති ලෙස මගේ වගකීම ඉටු කර තිබෙනවා. එතැනින් පහළට වෙලා නෑ. අන්තවාදය මර්දනය කිරීම ගැන ආරක්ෂක මණ්ඩලවල විතරක් නොවෙයි විවෘත සභාවලත් මා ඒ ගැන කතා කර තිබෙනවා. ආරක්ෂක මණ්ඩලයට ක්‍රියාත්මක වෙන්න බෑ. නමුත් අවශ්‍ය උපදෙස් සහ නියෝග එහිදී ලබාදී තිබෙනවා. එතැනින් පහළට ප්‍රාදේශීය නිලධාරීන් ද ඇතුළුව ක්‍රියාත්මක වෙන්නේ. එහි වගකීම ඔවුන් ගත යුතු වෙනවා.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

අන්තවාදීන් සම්බන්ධයෙන් ලද තොරතුරුවලට නිසි අවධානය යොමු නොවූ බවටත්, නිසි අධීක්ෂණය සිදු නොවූ බවටත් සාක්ෂි ඉදිරිපත් වෙනවා.

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

ප්‍රතික්ෂේප කරනවා. ඒ සාක්ෂි මා පිළිගන්නේ නෑ. 2019 ජනවාරි සහ පෙබරවාරි මාසවල ආරක්ෂක මණ්ඩලය රැස් වෙලා තිබෙනවා. හමුදා පොලිසිය ඇතුළු බුද්ධි අංශ වෙනම හමු වෙලා තිබෙනවා. අවශ්‍ය උපදෙස් දී තිබෙනවා. නිසි ක්‍රියාකාරීත්වය තමයි සිදු වෙලා නැත්තේ. පරීක්ෂණ හරි හැටි නිලධාරීන් නොකළේ කියන ප්‍රශ්නය තිබෙනවා. අප්‍රේල් 17 නැඟෙනහිර පළාතේ පිපිරීම සම්බන්ධයෙන් හරිහැටි පරීක්ෂණ සිදු කර නෑ. ඒවාට ජනාධිපති උපදෙස් දෙන්න අවශ්‍ය නෑ. ඒ ප්‍රදේශවල හමුදා බුද්ධි අංශ තිබෙනවා. ඒ වුණත් හරියාකාරව පරීක්ෂණ සිදු වී නෑ.

**කොමිසම:**

ඔබ විදේශගතව සිටින විට ප්‍රවෘත්ති බලනවා ද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

බලනවා. මා මේ සැරේ ගියේ වෛද්‍ය ප්‍රතිකාරවලට. ඉන්දියාවේ තිරුපති පූජාවට ගිහින් සිංගප්පූරුවට ගියා. රෝහල් කටයුතු සමඟ සිටි නිසා පුවත් බලන්න බැරි වුණා.

**කොමිසම:**

තොරතුර ගැන 16 වැනිදා ඔබතුමාව කවුරු හරි දැනුම්වත් කළා ද?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

නෑ, ස්වාමීනි.

**කොමිසම:**

ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසුව අගමැතිවරයා සහ පොලිස්පතිවරයා ආරක්ෂක මණ්ඩලයට සහභාගී වුණේ නැත්තේ ඇයි?

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

කලින් සිටම එහෙමයි සිදු වුණේ. අගමැතිතුමා අවශ්‍ය විටෙක පමණයි ගෙනියන්නේ.

**රජයේ අතිරේක සොලිසිටර් ජනරාල්වරිය:**

ආගමික අන්තවාදයට අදාළ පරීක්ෂණ නිසි පරිදි සිදු නොකිරීමත්, බුද්ධි අංශවලින් ලද තොරතුරුවලට නිසි වැදගත්කමක් ලබා නොදීමත්, නිසි සුපරීක්ෂණ ක්‍රමවේදයක් නොකළ නිසාත් තමයි 21 ප්‍රහාරයෙන් අහිංසක ජීවිත නැති වුණේ කියලා මා ඔබතුමාට යෝජනා කරනවා.

**මෛත්‍රීපාල සිරිසේන මහතා:**

මා නිසි ගෞරවයෙන් එය ප්‍රතික්ෂේප කරනවා. මා කළ පාර්ලිමේන්තු කතාව වාදනය කිරීම ගැන කොමිසමට ස්තූති කරනවා. මා අද හතර වන දිනට කොමිසමට ආවේ. පාර්ලිමේන්තුවේ කතාව කළේ මගේ හෘදය සාක්ෂියට එකඟව. පාස්කු ප්‍රහාරයට පෙරත් ජනපති ලෙස කටයුතු කළේ ඒ ප්‍රතිපත්ති මතයි. වෙනත් අංශවල තිබූ දුර්වලකම් මත සහ වගකීම් පැහැර හැරීම මත මෙය සිදු වුණේ. මා ආරක්ෂක විශේෂඥයෙක් නොවෙයි. බුද්ධි විශේෂඥයෙක් නොවෙයි. පොලිස් හමුදා, බුද්ධි අංශ සියලු දෙනා මේ කාරණයට නිසි වෙලාවට කටයුතු නොකිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. මෙවැනි තත්ත්වයක් තිබුණා නම්, නිසි උපදෙස් දුන්නා නම් ඇයි ඒවා නිසි පරිදි ක්‍රියාත්මක නොකළේ කියන කාරණය තිබෙනවා. නැඟෙනහිර පළාතේ හමුදා බුද්ධි අංශ ශක්තිමත්. ඒ අයගෙන්වත් තොරතුරු ලැබී තිබුණේ නෑ. මා ජනාධිපතිවරයා ලෙස මගේ වගකීම ඉටු කර තිබෙනවා. අන්තවාදය වර්ධනය වීම අයි. එස්. මතවාද ගැන ආරක්ෂක මණ්ඩලයේ විතරක් නොවෙයි බොහෝ තැන්වල මා කතා කර තිබෙනවා. සෑම කෙනෙක්ම අවධියෙන් සිටිය යුතු බව මා කියා තිබෙනවා. සාකච්ඡා කර නියෝග සහ උපදෙස්දීම පමණයි ආරක්ෂක මණ්ඩලයේ සිදු කරන්නේ. ක්ෂේත්‍රයේ සිටින නිලධාරීන් මේවාට ක්‍රියාත්මක විය යුතුයි. පහළ නිලධාරීන්ගේ ක්‍රියාත්මක වීම සිදු වන්නේ නැත්නම් ඉහළ නිලධාරීන් වගකීම ගත යුතුයි.

සාක්ෂිකරුගෙන් වැඩිදුර සාක්ෂි විමසීම මේ මස 22 තෙක් කල් තැබිණි. පළමුව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගෙන් සාක්ෂි විමසීම හිටපු පොලිස්පති පූජිත ජයසුන්දර මහතාගේ නීතිඥවරයා සිදු කිරීමට නියමිතය.

## දෙමහල් නිවෙසක මහා පරිමාණ කසිප්පු ස්කාගාරයක්

**මිහිර විජේසේකර**
**මාරවිල සමූහ**



හලාවත කොළඹ ප්‍රධාන මාර්ගය ආසන්නයේ හත්තිනිය ප්‍රදේශයේ සුවිසල් දෙමහල් නිවෙසක පවත්වාගෙන ගිය මහා පරිමාණ කසිප්පු ස්කාගාරයක් වැටලීමට මාරවිල පොලීසිය සමත් විය.

ගෝඩා බැරල් 09ක්, ගෑස් ළිපක්, දඹ දඟරයක් ඇතුළු කසිප්පු නිෂ්පාදනයට උපයෝගී කර ගන්නා උපකරණ රැසක් සමඟ කසිප්පු ස්කාගාරය පවත්වාගෙන ගිය සැකකරු අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු වෙන්නප්පුව, ලුණුවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මසකට රුපියල් 25,000ක කුලී පදනම මත මේ නිවෙස ලබාගෙන ඇති බව මාරවිල පොලීසිය පවසයි.

මාරවිල පොලිසියේ වැඩබලන ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගාමිණී සිරිවර්ධන මහතාට ලැබුණු තොරතුරක් මත මේ වැටලීම සිදු කර ඇත.

වැඩබලන ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගාමිණී සිරිවර්ධන, සැරයන්වරුන් වන 41246 කමල්, 35604 හේරත්, 59214 රත්නායක, 23358 අනුර, 49437 ජයවර්ධන සහ පොලිස් කොස්තාපල් රියදුරු 80360 සඳුන් ඇතුළු නිලධාරීහු මේ වැටලීම සිදු කළහ.

## බෝර 12 ගිනි අවියක් - උණ්ඩ 02ක් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

විදේශ රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක් සහ එම උණ්ඩ 02ක් සමඟ සැකකරුවකු මහනුවර, හතරලියද්ද, අලුදෙණිය ප්‍රදේශයේ නිවෙසකදී පසුගියදා (17) හතරලියද්ද පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32ක් වූ මහනුවර, අලුදෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

සැකකරු පෙරේදා (18) ගලගෙදර මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. හතරලියද්ද පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරයි.

## ඇඳිරි නීතිය ක්‍රියාත්මක ප්‍රදේශවල අපනයන කර්මාන්තයට විශේෂ බලපත්‍රයක්

**චන්දිමා කරුණාරත්න**

කෝවිඩ් -19 වයිරසය නිසා ඇඳිරි නීතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල අපනයන කර්මාන්තය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීමට විශේෂ බලපත්‍රයක් ලබාදීමට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පියවර ගනී.

අපනයන සමාගම්වලට අදාළ ප්‍රදේශවල පොලිස් ස්ථානවලින් ඇඳිරි නීති බලපත්‍ර ලබාගැනීමට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් නිර්දේශ ලබා දෙන අතර එමගින් ඇඳිරි නීතිය නොමැති ප්‍රදේශවල පිටත සිටින සේවකයන්ට ඔවුන්ගේ කර්මාන්තශාලාවල සේවයේ නිරත වීමට අවස්ථාව හිමි වේ.

ඒත් ගම්පහ, මිනුවන්ගොඩ, වේයන්ගොඩ, දිවුලපිටිය සහ මීරිගම ප්‍රදේශවල සේවකයන්ට සේවයට පැමිණීමට අවසර නැත. කර්මාන්තශාලාවල මෙහෙයුම් දිගටම කරගෙන යා හැක්කේ ඇඳිරි නීතිය නොමැති ප්‍රදේශවල පදිංචි සේවකයන්ට පමණි.

අත්‍යවශ්‍යය අපනයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සහතික කිරීමට නිරෝධායන ඇඳිරි නීතිය බලපවත්වන ප්‍රදේශවලින් පිටත පදිංචි සේවකයන් බලපත්‍ර යටතේ සෞඛ්‍ය ආරක්ෂිතව ප්‍රවාහනය කළ හැකිය.

නිරෝධායන ඇඳිරි නීතිය නොමැති පිටත ප්‍රදේශවල සේවකයන් ඉහත සඳහන් කළ ප්‍රදේශවල පදිංචිකරුවන්ට නිරාවරණය නොකිරීමට අදාළ සමාගම් සියලුම ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

ඇඳිරි නීති බලපත්‍ර ඉල්ලා සිටීමට අදාළ තොරතුරු සහ ආදර්ශ අයදුම්පත අපනයන සංවර්ධන මණ්ඩලයෙහි පහත සඳහන් නිලධාරින්ගෙන් ලබා ගත හැකිය.

කෘෂිකර්ම හා ධීවර අංශය සඳහා අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ, මාලනි බද්දේගමගේ මහත්මිය malani@edb.gov.lk, කාර්මික නිෂ්පාදන අංශය සඳහා හර්ෂ පත්බේරිය මහතා, කාර්මික නිෂ්පාදන අංශය වැඩබලන අධ්‍යක්ෂ hdp@edb.gov.lk, අපනයන සේවා සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන අංශ සඳහා මනෝජා දිසානායක මහත්මිය, වැඩබලන අධ්‍යක්ෂ - අපනයන සේවා manojad@edb.gov.lk සම්බන්ධ වන්න.


මේ සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා 011-2300710 හෝ helpdesk@edb.gov.lk විද්‍යුත් තැපෑලෙන් හෝ අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය වන www.srilankabusiness.com වෙතින් ලබා ගත හැකිය.

## SDB වෙතින් ‘U Pay Millionaire’

U Pay Millionaire තරගාවලිය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ජංගම ගෙවීම් App එකක් වන SDB බැංකුව හඳුන්වා දෙයි.

මෙය දේශීය බැංකුකරණ සහ මූල්‍ය තාක්ෂණික ක්ෂේත්‍රයට ප්‍රථමවරට හඳුන්වා දෙන තරගාවලියකි. ශ්‍රී ලංකාවේ Payment App එකක් වන U Pay විසින් මෙවැනි කාර්යයකට මුලපිරීම රට පුරා ඩිජිටල් සම්බන්ධතා වැඩි කිරීමේ ප්‍රයත්නයක් ලෙස හැඳින්විය හැකිය. ඔක්තෝබර් මස මුල සිට ආරම්භ වී ඇති U Pay Millionaire තරගාවලිය මේ වන විටත් ඉතා විශාල ජනතා ප්‍රතිචාර හිමි කර ගෙන ඇත. මේ තරගාවලිය රුපියල් මිලියනයක සුපිරි ත්‍යාගයකින් සමන්විතය. සුපිරි ත්‍යාගයට අමතරව ජයග්‍රාහකයන් පස්දෙනකුට රුපියල් 100,000 ත්‍යාග, දිනපතා මුදල් සහ වෙනත් ත්‍යාග රැසක් පිරිනැමේ.

තරගාවලියට වෙබ් අඩවියේ සඳහන් දෛනික කාර්ය ලැයිස්තුව සම්පූර්ණ කළ යුතු අතර 076-2411411දුරකතන අංකයට Missed call එකක් ලබාදීමෙන් මේ තරගය පිළිබඳ වැඩි විස්තර ලබා ගත හැකිය.



## ශ්‍රී ලංකා චෙස් ක්‍රීඩා ඉතිහාසයේ ඉදිරි පිම්මක්

# ආසියානු චෙස් තරගාවලියේදී ප්‍රබලයන් පරදා කාන්තා පිල අවසන් වටයට සුදුසුකම් ලබයි


නායිකා සචිනි රණසිංහ


තරුෂි නික්ලේෂා

**ප්‍රින්ස් ගුණසේකර**

කොරෝනා හේතුවෙන් මුල්වරට 'ඔන් ලයින්' ක්‍රමය යටතේ මුල්වරට පැවැති ආසියානු පිරිමි - කාන්තා චෙස් ශූරතාවලියේදී ශ්‍රී ලංකා කාන්තා චෙස් කණ්ඩායම රටවල් 31කින් 7වැනි ස්ථානයට පැමිණ පිළිමලුන් පිටුදැකීමේ අවසන් වටයට පිවිසෙයි. මෙය ශ්‍රී ලංකා චෙස් ක්‍රීඩා ඉතිහාසයේ විශාල ඉදිරි පිම්මක්වන අතර පළමු වරට ආසියානු ඔන් ලයින් චෙස් තරගාවලියක මෙතෙක් වාර්තා කළ හොඳම දක්ෂතාවකි.

නුගේගොඩ දෙල්කඳ චෙස් සම්මේලන මූලස්ථානයේ සිට ඊයේ මූලික වටයේ අවසන් තරග තුනට ඔන් ලයින් ක්‍රමයට තරග කළ ශ්‍රී ලංකා කාන්තා චෙස් පිලේ සියලුම ක්‍රීඩිකාවන් යොවුන් වයසේ පසුවන අය බැවින් ලබන සිකුරාදා පැවැත්වෙන පිළිමලුන් පිටු දැකීමේ අවසන් වටයේදී පෙරළිකාර දස්කම් දක්වනු ඇතැයි ශ්‍රී ලංකා චෙස් සම්මේලනයේ සභාපති ලක්ෂමන් විජේසූරිය මහතා 'දිනමිණ' ට පැවැසීය. එම අර්ධ අවසන් පූර්ව වටයේදී ශ්‍රී ලංකා කාන්තා චෙස් පිලට දෙවැනි ස්ථානයේ සිටින පිලිපීනය සමග ක්‍රීඩා කිරීමට සිදුවේ.

මෙම තරගාවලියේ අර්ධ අවසන් වටයට පැමිණි රටවල් වන්නේ පිළිවෙලින් ඉන්දියාව, පිලිපීනය, ඉරානය, වියට්නාමය, මොන්ගෝලියාව, ඉන්දුනීසියාව, ශ්‍රී ලංකාව හා කිරිගිස්තානය වේ.

ඊයේ දිනයේදී තරගාවලියේ මෙතෙක් ඉදිරියෙන් සිටි ඔස්ට්‍රේලියාව 3-1ක් ලෙස පරාජය කිරීම හේතුවෙන් ඔස්ට්‍රේලියාව 9වැනි ස්ථානයට පත්ව තරගාවලියෙන් ඉවතට විසිවූ අතර ශ්‍රී ලංකා කාන්තා චෙස් පිල ඉදිරියට පැමිණීමේ අවස්ථා විවරකර ගත්තේය. ශ්‍රී ලංකා පිල කිරිගිස්තානය හා සිංගප්පූරුව අතර තරග දෙකම ජය පරාජයෙන් තොරව නිමා කිරීමට සමත්වීමෙන් කිරිගිස්තානය 8වැනි ස්ථානයට ගිය අතර සිංගප්පූරුව 13වැනි ස්ථානයට වැටී තරගාවලියෙන් ඉවතට විසිවිය.

එන්. එස්. ත්‍රී චෙස් කණ්ඩායමේ සචිනි රණසිංහගේ නායකත්වයෙන් ආසියානු තරගාවලියට එක්ව සිටින ශ්‍රී ලංකා කාන්තා චෙස් පිල මේ තරගාවලියේදී ක්වේට්, පලස්තීන, සිරියා හා ඔස්ට්‍රේලියා යන කණ්ඩායම් පරාජයට පත්කළ අතර කසකස්තානය හා ලෙබනන් හමුවේ පරාජයට පත්විය. බංග්ලාදේශය, කිරිගිස්තානය හා සිංගප්පූරුව සමග තරග තියුණු මුහුණුවරකින් ජය පරාජයෙන් තොරව නිමා කළේය.

ශ්‍රී ලංකා කාන්තා චෙස් පිලට වත්මන් ජාතික ශූරී මහනුවර උසස් බාලිකා විදුහලේ නෙත්මි ප්‍රනාන්දු, මිෂෙල් ජාත්‍යන්තර පාසලේ අශ්විනී පවල්චන්ද්‍ර, කොළඹ දේවී බාලිකාවේ 14 හැවිරිදි තරුෂි සංදීපනී හා කොළඹ විශාඛා විදුහලේ තරුෂි නික්ලේෂා ක්‍රීඩා කරති.

මෙම තරගාවලියට එක්වූ ශ්‍රී ලංකා පිරිමි චෙස් කණ්ඩායම රටවල් 38ක් අතුරින් 18 වැනි ස්ථානයට පත්ව තරගාවලියෙන් ඉවතට ගියේය. ශ්‍රී ලංකා පිරිමි චෙස් පිල ටජිකිස්තානය, කිරිගිස්තානය හා බංග්ලාදේශය හමුවේ පරාජයට පත් විය. එම තරගාවලියේ අවසන් වටයට පිවිසි කණ්ඩායම් වන්නේ ඉරානය, පිලිපීනය, මොන්ගෝලියාව, ඔස්ට්‍රේලියාව, ඉන්දුනීසියාව, ඉන්දියාව, කසකස්තානය හා සිංගප්පූරුව වේ.

කොළඹ රාජකීය විදුහලේ මිනුල් දුලුවීරගේ නායකත්වයෙන් සහභාගීවී සිටින ශ්‍රී ලංකා පිරිමි චෙස් කණ්ඩායමට කුරුණෑගල මලියදේව විදුහලේ හර්ෂණ තිලකරත්න, වත්මන් ජාතික ශූර කොළඹ ආනන්ද විදුහලේ රනිදු දිල්ෂාන්, කොළඹ නාලන්දාවේ 14 හැවිරිදි එල්. එම්. සුසාල් ද සිල්වා හා ආනන්ද විදුහලේ දෙනුවන් තීක්ෂණ ඇතුළත්ව සිටිති.


අශ්විනී පවල්චන්ද්‍ර


නෙත්මි ප්‍රනාන්දු


තරුෂි සංදීපනී

## රාජ්‍ය නෙට්බෝල් සම්මේලනයෙන් වැඩසටහන් රැසක්

රාජ්‍ය සේවා නෙට්බෝල් සම්මේලනය කොරෝනා වසංගතය හේතුවෙන් පීඩාවට පත් වූ අයට හා රටට සෙත්පතා විශේෂ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට සූදානම් වෙයි. එහි පළමු පියවර ලෙස මුල්ලේරියාව සුබෝධිරාම විහාරස්ථානයේදී අද සවස 3ට පිරිත් පින්කමක් සංවිධානය කොට ඇත.

# කොරෝනාවෙන් දක්ෂතා අහිමි වූ පාසල් ක්‍රීඩකයන්ට සහන

**ප්‍රින්ස් ගුණසේකර**

කොරෝනා වසංගතය හේතුවෙන් පාසල් දරුවන්ට ඉදිරි විශ්ව විද්‍යාල ප්‍රවේශවලදී ක්‍රීඩා ප්‍රතිඵල මත ලබාදෙන ලකුණු 2020 වසර අත්හැර ලබාදීමට සූදානම් වෙයි. විශ්ව විද්‍යාල ප්‍රවේශයේ ලකුණු ලබාදීමේදී ගෙවීගිය වසර 3ක ක්‍රීඩා ජයග්‍රහණ සලකා බැලන බැවින් 2020 පාසල් ජයග්‍රහණ ලබා නොමැති දරුවන් හා ක්‍රීඩා අමාත්‍යාංශය හෝ ක්‍රීඩා සංගම් ශූරතාවලි ජයග්‍රහණය කළ දරුවන් අතර අසමානතාවක් ඇතිවීමෙන් යම් අසාධාරණයක් සිදුවීම වළක්වාලීමට සියලු අංශවල අවධානය යොමු වී ඇත.

මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හේමන්ත ප්‍රේමතිලක මහතාගෙන් 'දිනමිණ' කළ විමසීමකදී පැවැසුවේ කිසිදු දරුවකුට අසාධාරණයක් නොවන සේ කටයුතු කිරීමට ඉදිරි කටයුතු සිදුකරන බවයි. විශ්ව විද්‍යාල ප්‍රවේශයේදී ලකුණු ලබාදීමේ ක්‍රමවේදය සම්බන්ධව ඉදිරියේදී විශ්ව විද්‍යාල සමග සාකච්ඡා කොට අවශ්‍ය පියවර ගන්නා බව ඒ මහතා සඳහන් කළේය.

මේ අතර කොරෝනා වසංගතය හේතුවෙන් මේ වසරේ පාසල් ක්‍රීඩා තරගවලට සහභාගී නොවූ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තවත් අවස්ථාවක් සැලසීමේ අරමුණින් ලබන වසරේ පාසල් ක්‍රීඩා තරග වයස අවුරුදු 20න් පහළ ලෙස සංශෝධනය කිරීමට යෝජනා ගණනාවක් ක්‍රීඩා සංගම් වෙතින් ක්‍රීඩා අමාත්‍යාංශයට හා අධ්‍යාපන අමාත්‍යාංශයට යොමුව ඇතැයි වාර්තා වේ.

මෙතෙක් පවතින ක්‍රමය අනුව පාසල් ක්‍රීඩා තරග 19න් පහළ වන අතර මේ වසරේ කොරෝනා හේතුවෙන් පාසල් සිසුන්ට එක් අවුරුද්දක කාලයක් සම්පූර්ණයෙන්ම අපතේ ගිය හෙයින් ඔවුන්ට සාධාරණය ඉටු කිරීම මෙම මෙම යෝජනාවේ අරමුණ වේ.



# සී.ආර් ප්‍රබලයෝ 10ක් සී.එච් පිලට පනිති

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා ජාතික රගර් පිලේ නායක ඔමල්ක ගුණරත්න ඇතුළු සී. ආර්. ඇන්ඩ් එෆ්. සී පිලේ ප්‍රබල ක්‍රීඩකයින් 10ක් එළඹෙන තරගවාරයේදී කොළඹ සී. එච් ඇන්ඩ් එෆ්. සී පිලට එක්වෙයි. සී. එච් ඇන්ඩ් එෆ්. සී රගර් පිල නව මුහුණුවරකින් ඉදිරි රගර් තරගවලට පිවිසීමට සැලසුම් කර ඇති හෙයින් හා වෘත්තීමය රගර් ක්‍රීඩාවට පිවිස ඇති හෙයින් විශාල විශ්වාසයකින් යුතුව ප්‍රබල ක්‍රීඩකයින් තම කණ්ඩායමට එක්වෙමින් සිටින බව සී. එච් ඇන්ඩ් එෆ්. සී රගර් කළමනාකාරිනී උදානී එදිරිසිංහ මහත්මිය 'දිනමිණ' ට පැවැසුවාය.

ඉදිරියේදී තවත් රගර් ක්‍රීඩකයන් කිහිප දෙනෙකු තම කණ්ඩායමට එක්වීමට නියමිතව ඇති බවත් ඔවුන් සමග කොන්ත්‍රාත් ගිවිසුම් අස්සන් කිරීම සිදුවනු ඇති බවත් ඇය සඳහන් කළාය. එම කටයුතු තවමත් සාකච්ඡා මට්ටමේ පවතින බව සී. එච් ඇන්ඩ් එෆ්. සී කළමනාකාරිනිය සඳහන් කළාය.

ඉසිපතන විද්‍යාලයෙන් රගර් පිටියට පිවිසි ඔමල්ක ගුණරත්න 2015 දී අංක 8 ස්ථානයේ ක්‍රීඩා කරමින් සිටියදී විදුහලට නායකත්වය දුන් අතර එම වසරේදී අන්තර් පාසල් ත්‍රිත්ව අනු ශූරයන් (සත් සාමාජික, ලීග් තරගාවලිය සහ පිළිමළුන් පිටුදැකීමේ තරගාවලිය) බවට පත්විය. ඔහු 20න් පහළ ජාතික කණ්ඩායම හා සත් සාමාජික කණ්ඩායමේ උප නායකයා ලෙස ද කටයුතු කළ ක්‍රීඩකයෙකි.

සී. ආර්. ඇන්ඩ් එෆ්. සී පිලෙන් කොළඹ සී. එච් ඇන්ඩ් එෆ්. සී පිලට එක්වූ ක්‍රීඩකයින් අතර රාජකීය විදුහලේ ජනිදු දිල්ෂාන්, සාන්ත පීතර විදුහලට ක්‍රීඩා කළ කෙවින් ඩික්සන්, කිංග්ස්වුඩ් විදුහලේ රීසා රෆායිඩීන්, වෙස්ලි විදුහලේ ජොඑල් පෙරේරා, උදාර ගයාන්, මිතිල පෙරේරා, සාන්ත අන්තෝනි විදුහලේ පන්ඩුක අන්ග, ෂෙමාල් වීරසේකර හා කොළඹ සහිරා විදුහලේ වජීඩ් ෆවුමී යන ක්‍රීඩකයෝ වෙති.

මේ අතුරින් ජනිදු දිල්ෂාන් අවසන්වරට පැවැති අන්තර් ක්‍රීඩා සමාජ ඩයලොග් රග්බි ලීග් තරගාවලියේ වැඩිම ලකුණු රැස් කළ ක්‍රීඩකයා බවට පත් විය. එමෙන්ම අනෙකුත් සියලු ක්‍රීඩකයන් පසුගිය තරගවාරයේදී සී. ආර්. ඇන්ඩ් එෆ්. සී පිලට ප්‍රබල දායකත්වයක් ලබාදුන් ක්‍රීඩකයෝ වෙති.

සී. එච්. ඇන්ඩ් එෆ්. සී කණ්ඩායමේ වත්මන් පුහුණුකරු රෝහිත රාජපක්ෂ මහතා තම කණ්ඩායමේ ක්‍රීඩකයින්ට වෘත්තීයමය ගරුත්වයක් ඇති කිරීමේ විශේෂ වැඩ පිළිවෙළක් දියත් කර තිබෙන හෙයින් කණ්ඩායමට විශාල ආකර්ශනයක් එක් වී ඇතැයි සී. එච් ඇන්ඩ් එෆ්.සී රගර් කළමනාකාරිනී උදානී එදිරිසිංහ මහත්මිය සඳහන් කළාය.

සෑම ක්‍රීඩකයෙකුටම තමන්ගේ අනාගතය පිළිබඳ යහපත් විශ්වාසයක් ඇතිවිය යුතු හෙයින් සී. එච්. ඇන්ඩ් එෆ්. සී පිලේ කළමනාකාරීත්වය මුලින්ම එම අනාගත විශ්වාසය තහවුරු කිරීමට කටයුතු යොදා ඇත.

එහි එක් පියවරක් ලෙස රගර් ක්‍රීඩා කරද්දීම එම ක්‍රීඩකයන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම හා වැඩිදුර අධ්‍යාපනය පිළිබඳ විශේෂ වැඩ පිළිවෙළක් යොමු කොට ඇති අතර විශ්ව විද්‍යාල අධ්‍යාපන මට්ටම දක්වා යෑමේ අවස්ථා විවර කර දෙයි.

අනතුරුව හොඳ රැකියාවක් පිළිබඳ අවධානය යොමු කිරීමටත්, ක්‍රීඩකයින්ට රගර් නැතිදා ජීවිතය ගොඩ නගාගත හැකි ආදායම් මාර්ගයක් ඇති කිරීමත් මෙම වැඩ පිළිවෙලේ වැදගත්ම අංගය වේ. රගර් ක්‍රීඩාවේ වෘත්තීය තත්ත්වය ආරක්ෂා කිරීමෙන් ක්‍රීඩකනේට යහපත් හෙට දිනක් උදාකරදීම සී. එච් ඇන්ඩ් එෆ්. සී පිලේ බලාපොරොත්තුව බව කළමනාකාරිනී උදානී එදිරිසිංහ මහත්මිය සඳහන් කළාය.

# තරගයකදී ඉතිහාසගත සුපිරි ඕවර දෙකක්

ඉන්දීය ප්‍රිමියර් ලීග් තරගාවලියේ සුපිරි ඕවර දෙකක් දක්වා ඇදීගිය පළමු තරගය ඉතිහාසයට එක් කරමින් කිංග්ස් පන්ජාබ් සහ මුම්බායි ඉන්දියන්ස් අතර පෙරේදා රාත්‍රී පැවැති තරගයෙන් උණුසුම් ජයක් ලැබීමට පන්ජාබ් ක්‍රීඩකයෝ සමත් වූහ. ඒ අනුව අයිපීඑල් තරග ඉතිහාසයේ දෙවැනි සුපිරි ඕවරයෙන් තරගය ජයගත් පළමු කණ්ඩායම ලෙස පන්ජාබ් පිල වාර්තාපොතට එක් විය.

නියමිත ඕවර 20දී දෙපිලේම ලකුණු සමවීම හේතුවෙන් ලබා දුන් පළමු සුපිරි ඕවරයේදිත් ලකුණු සමවීමෙන් පසු දෙවැනි සුපිරි ඕවරය ලබාදීමට විනිසුරුවරුන් කටයුතු කළහ. එවැනි අවස්ථාවක් වාර්තා වූයේ ඉතිහාසයේ පළමු වරටය.

දෙවැනි සුපිරි ඕවරය යවනු ලැබූ ක්‍රිස් ජෝර්ඩන්ගේ පන්දු හමුවේ වේගවත් පිතිහරඹයක නිරත වූ කීරන් පොලාර්ඩ් අයිපීඑල් වත්මන් ශූරයන් වන මුම්බායි ඉන්දියන්ස් පිලේ ලකුණු සංඛ්‍යාව එක් කඩුල්ලකට 11ක් වශයෙන් සටහන් කළ ද, පන්ජාබ් පිලේ ක්‍රිස් ගේල් විසින් ට්‍රෙන්ට් බෝල්ට් යැවූ පළමු පන්දුවටම දැවැන්ත හයේ පහරක් එල්ල කිරීමට සමත් විය. තවත් පන්දුවකට පසු මයාන්ක් අග්‍රවාල් ඔහුට පිට පිට හතරේ පහර දෙකකින් සංග්‍රහ කරමින් පන්ජාබ් පිලේ ජයග්‍රහණය තහවුරු කළේය.

නියමිත ඕවර 20 තරගයේ කාසියේ වාසිය දිනූ මුම්බායි ඉන්දියන්ස් පිල පළමුව පන්දුවට පහර දී කඩුලු 6කට ලකුණු 176ක් රැස් කළ අතර, පන්ජාබ් පිලට ද රැස් කිරීමට හැකි වූයේ කඩුලු 6කට ලකුණු 176ක් පමණි.



අනතුරුව ලබා දුන් පළමු සුපිරි ඕවරයේදී මුම්බායි පිලට ලකුණු 6ක පහසු ඉලක්කයක් ලබා දුන් ජස්ප්‍රිට් බුම්රා සිය ඕවරයේදී පන්ජාබ් පිල ලකුණු 5කට සීමා කළේ ඕවරයට නියමිත කඩුලු 2ම දවාලමිනි. එහෙත් විස්මිත පන්දු යැවීමක නිරතවූ මොහොමඩ් සාමි මුම්බායි පිලට ලකුණු 5ක් පමණක් ලබා දීමෙන් තරගය දෙපිලේ ලකුණු සංඛ්‍යාව නැවතත් සම විය.

### කොල්කටා - හයිද්‍රාබාද් තරගය සමයි

මේ අතර ලකුණු සමවීමෙන් සුපිරි ඕවරය දක්වා ඇදී ගිය කොල්කටා නයිට් රයිඩර්ස් සහ සන්රයිසස් හයිද්‍රාබාද් අතර පැවැති තරගය සුපිරි ඕවරයෙන් ජයගැනීමට කොල්කටා පිල සමත් විය. කාසියේ වාසිය දිනූ සන්රයිසස් පිලේ ඇරියුමෙන් පළමුව පන්දුවට පහර දුන් කොල්කටා පිල නියමිත ඕවර 20 අවසානයේ කඩුලු 5කට ලකුණු 163ක් රැස් කළ අතර, හයිද්‍රාබාද් පිලට ද නියමිත ඕවර 20 අවසානයේ රැස් කිරීමට හැකිවූයේ කඩුලු 6කට ලකුණු 163ක් පමණි. ඒ අනුව ලබා දුන් සුපිරි ඕවරයේදී හයිද්‍රාබාද් පිලට රැස් කිරීමට හැකි වූයේ ලකුණු 2ක් පමණි. කොල්කටා පිල කිසිවකු නොදැවී ජයග්‍රහණය සපුරා ගත්තේය.

# ටෙනිස් ශූර ජුවාන්ට කොරෝනා

තුන් වතාවක් ග්‍රෑන්ඩ් ස්ලෑම් ශූරතාව දිනාගත්, යුගල ටෙනිස් ශ්‍රේණිගත කිරීම්වල අංක එකේ සිටින කොලොම්බියානු ජාතික ජුවාන් සෙබස්තියන් කබල්ට කොරෝනා වයිරසය ආසාදනය වෙයි.

මෙයට දිනකට පෙර ඒටීපී අවසන් මහා තරගයට සහ ඔහුගේ සගයා වන රොබට් ෆාරා ක්‍රීඩා කළ අතර එම තරගය පරාජයට පත්වීමත් සමග PCR පරීක්ෂණයට මුහුණ දී ඇත. කෙසේ වුවද ඔහුගේ සහයක ක්‍රීඩක රොබට් ෆාරා PCR පරීක්ෂණයේදී කොරෝනා ආසාදනය නොවූ බව තහවුරුවී ඇත.

විම්බල්ඩන් සහ 2019 ඇමෙරිකා විවෘත තරගවලින් ජයගත් කොලොම්බියානු ටෙනිස් ක්‍රීඩකයින් දෙදෙනා පෙරේදා අවසන් මහා තරගයේදී නවසීලන්තයේ මාකස් ඩැනියෙල්ට හා ඔස්ට්‍රියාවේ පිලිප් ඔස්වල්ඩ්ට එරෙහිව 3-6 සහ 4-6 ක් ලෙස පරාජයට පත්විය. කොරෝනා පරීක්ෂණයෙන් ධනාත්මක වූ පසු ඔහු හුදෙකලා වී නිරෝධායනයේ යෙදී සිටී.




# උමාර් විශ්‍රාම යයි


පාකිස්තාන වේග පන්දු යවන ක්‍රීඩක උමාර් ගුල් ක්‍රිකට් ක්‍රීඩාවෙන් විශ්‍රාම යයි. 36 හැවිරිදි ඔහු ටෙස්ට් තරග 47ක්, එක්දින තරග 130ක් සහ විස්සයි 20 තරග 60ක් ක්‍රීඩා කර ඇත. පාකිස්තානය වෙනුවෙන් ආකෘතීන් තුනෙන්ම කඩුලු 427 ක් ලබා ගත් ඔහු 2007 සහ 2009 විස්සයි 20 ලෝක කුසලාන දෙකෙහිම වැඩිම කඩුලු ලබා ගත් ක්‍රීඩකයා වේ.

පාකිස්තාන ජාතික විස්සයි 20 තරගාවලියේ ඔහුගේ කණ්ඩායම වන බාලෝකිස්තාන ක්‍රිකට් පිල ඉවත් කිරීමෙන් පසුව මෙම නිවේදනය නිකුත් විය. උමාර් ගුල් ඉවත්වීමත් සමග ට්විටර් පණිවිඩයක් නිකුත් කර ඇති අතර එහි දැක්වෙන්නේ " ක්‍රිකට් ක්‍රීඩාවේ අනාගතය පිළිබඳ බොහෝ දේ සිතීමෙන් පසුව ඉතා දැඩි තීරණයකට එළැඹීමට කල්පනා කළ බවය. ඒ නිසා "මෙම ජාතික විස්සයි 20 කුසලාන තරගාවලියෙන් පසුව සියලු ආකාර ක්‍රිකට් ක්‍රීඩාවට සමු ගැනීමට මම තීරණය කර ඇත්තෙමි" යනුවෙන් ඔහු ටුවිටර් පණිවිඩයේ දක්වා තිබේ.

" මගේ ක්‍රිකට් ගමනේ කොටසක් වූ සියලුම පුහුණුකරුවන්ට සහ පුද්ගලයන්ට මම ස්තූතිවන්ත වෙමි. ඒ සියල්ල කළ මාධ්‍යයට, මගේ රසිකයන්ට සහ අනුගාමිකයන්ට විශේෂ ස්තූතිය පුද කරමි" උමාර් ගුල් පැවැසීය.


අභීෂ්


චමින්ද


ගයත්‍රි


අමරදාස


තුෂාන්


වසන්ත



මඟතොට මිතුරෝ
e-mail-magathota.dinamina@lakehouse.lk

# දකුණු ලකේ අග නගරේ රෝද තුනේ සිරි

මේ වන විට ලංකාව පුරා සෑම ගමක් නගරයක් අස්සක් මුල්ලක් නෑර ත්‍රිරෝද රථ ලක්ෂ ගණනක් තිබෙන අතර මෙමගින් පවුල් ලක්ෂ ගණනක් ජීවත් කරවති. රැකියා විරහිත භාවයට ද මෙය විශාල පිටුවහලකි.

ත්‍රිරෝද රථවලින් යැපෙන පිරිස අතරට එක් වන කිසිවකුගේ ඇස නොගැටෙන පිරිසක් දෙස අපි අද අපේ අවධානය යොමු කරන්නෙමු. ඒ ත්‍රිරෝද රථවලට අත්‍යවශ්‍ය වන කුෂන් ශීට් කවර හා ආවරණ රෙදි සවි කර හැඩ වැඩ කරන පිරිසක් සහ ත්‍රිරෝද රථ අමතර කොටස් අලෙවි කරන්නන් පිළිබඳවයි. ඔවුන්ගේ දුක සැප ගැටලු ආදිය ගැන ද සොයා බලා බලධාරීන් මෙන්ම ජනතාව ද දැනුවත් කිරීමට අපි අදහස් කළෙමු.

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ ත්‍රිරෝද රථ රෙදි ගැසීමේ ස්ථාන බොහෝ ඇත. ඉන් සමහර ප්‍රදේශ මේ සඳහා මහත් වූ ප්‍රසිද්ධියක් දරන්නේය. ඒ අනුව ත්‍රීවීලර් රෙදි ගැසීම සඳහා ඉතා ප්‍රසිද්ධ ප්‍රදේශ අතර ඉදිරියෙන්ම සිටින්නේ ඇල්පිටිය, බටපොළ සහ කරන්දෙණිය ප්‍රදේශයන්ය.

මෙම ප්‍රදේශ අතරින් කරන්දෙණිය ප්‍රදේශය ත්‍රීවිලර් රෙදි ගැසීම අතින් පමණක් නොව සෑම අතින් ම දක්ෂ ප්‍රවීණ පිරිස් සිටින ප්‍රදේශයකි. කුරුඳු කර්මාන්තයෙන් බහුතරයක් පිරිස ජීවිතය සරි කරගන්නා අතර සුවිශේෂී වූ විවිධ කර්මාන්තවලට හුරු වූ පිරිසක් ද සිටින මෙම ප්‍රදේශයේ පොල්ගසේ හට ගන්නා පොල් ඉරටු, මටුළු, පොල් කටු සහ පොල් ලෙලිවලින් විසිතුරු කැටයම් කරන පිරිසක් ද සිටිති. එමෙන්ම කුරුඳු දැව හා වෙනත් දැව නිර්මාණ හා ගල් කැටයම් ඇතුළු විශේෂ දේ නිපදවීම සඳහා නිපුණතා ඇති පිරිස් බොහෝය.

මනරම් පරිසරයකින් සමන්විත මෙම ප්‍රදේශයෙහි කිසිදු අග හිඟයක් නොමැති පිරිස් වැඩිපුර සිටින අතර විවිධ ප්‍රදේශවලින් සංක්‍රමණය වන ජනතාව ද මේ ප්‍රදේශයට පැමිණ කුරුඳු වැඩ කිරීමෙන් ජීවනෝපාය සරි කර ගන්නා අතර සෑම කර්මාන්තයකින්ම මුදල් ඉපයීමට උපන් හපන්කමක් ඇති පිරිසක් සිටින බව පැහැදිලිය.

එම පිරිස් අතරින් ත්‍රීවිලර් රෙදි ගැසීම පිළිබඳ වැඩකරුවකු පිළිබඳ අපට තොරතුරු හෙළි කරන ලද්දේ සමෘද්ධි මාධ්‍ය සගයකු හා සන්නිවේදකයකු ලෙස කටයුතු කරන වසන්ත කුමාර හෙවත් සාන්ත මහතාය. ඔහු කී මග ඔස්සේ අපව රැගෙන යෑමට කරන්දෙණිය පුවත්පත් අලෙවි නියෝජිත නෙවිල් මහතා ඉදිරිපත් විය.

ඒ අනුව මෙම ත්‍රීවිල් වැඩකරුවා ගැන තොරතුරු හෙළි කර ගැනීමට කරන්දෙණිය බොර කන්දේ පිහිටි ත්‍රීවිලර් රෙදි ගසන එම කුෂන් වර්ක්ස් ආයතනය වෙත සේන්දු වීමු.

මම විදේශගත වෙලා හිටියෙ. ඇවිල්ල මහරගම ආයතනයක පුහුණු වුණා. අ.පො.ස. උසස් පෙළ විභාගය සමත්. වෙන රැකියාවකට යන්න තිබුණත් මේ වැඩේට මම ආස නිසා කරනවා. පුහුණු වෙලා හතේ කණුව ප්‍රදේශයේ වැඩපළක වැඩ කළා. පස්සේ මට හිතුනා මගේම කියල ව්‍යාපාරයක් පටන් ගන්න. මම රට ගිහින් ඉතුරු කරගත් මුදලක් තිබුණා. ඒකෙන් මේකට අවශ්‍ය උපකරණ මිලදී ගෙන මෙම ස්ථානයේ ව්‍යාපාරය පටන් ගත්තා. මේක දිනෙන් දින දියුණු වෙන්න පටන් ගත්තාම මට හරි සතුටුයි.

"කොහොම වුණත් ලයිට් බිල්, වතුර බිල්, කඩ කුලී වගේම අපේ වැටුප ගණන් බලනව නම් අපිට ඇති ලාභයක් නෑ. ඒත් පුරුදු රැකියාව හැර වෙනත් රැකියාවක් අපිට කරන්න බෑ. අපිට දක්ෂතාව තියෙන්නෙ මේ වෙළෙඳාමට පමණයි. ඒ නිසා ලාභ පාඩු නොබලා මේක කරන්න ඕනෑ. අනෙක මෙතන රාත්‍රී වුණත් බඩුවක් ගන්න පුළුවන්. මේක නැත්නම් මිනිස්සුන්ට ගොඩක් දුර ගෙවාගෙන යන්න සිදු වෙනවා."



කොහොම වුණත් දැන් ඇල්පිටිය, අම්බලන්ගොඩ, කහව, කරන්දෙණිය, ඌරගහ වගේ ප්‍රදේශවලිනුත් ඈත පළාත්වලිනුත් අලුතෙන් ත්‍රීවිලර් ගන්න අය විශාල පිරිසක් රෙදි ගහන්න එන්නේ මගේ ළඟට. එකක්වත් මම ආපසු යවන්නේ නෑ. මගේ ගෝලයෝ ඉන්නවා. ඒ වගේම ඥාති හිත මිත්‍රාදීන් ඇවිත් උපකාර කරන වෙලාවල් බොහෝවිට තිබෙනවා. ගෝලයකු වැඩ කරනවා නම් කෑම බීම දීල රුපියල් 1500 ක් ගෙවනවා.

ත්‍රීවීලර් රථයක් අලුතෙන් ගත්ත ගමන් පළමුවෙන්ම කරන්නේ රෙද්ද ගහගන්න එකයි. ඒවායේ රෙදි ගහල තියෙනවා. ඒත් ඒක කොලිටියක් නෑ. කවුරුත් කැමති සීට් ලස්සනට කුෂන් කරල ලස්සනට වාහනය තියාගන්න. ඒ නිසා රෙදි ගසා ගැනීම තමයි පළමුවෙන්ම කරන්නෙ. ඒකෙ ගහල තියෙන රෙද්දත් රු.2000 කට විතර විකුණන්න පුළුවන්.

ත්‍රීවිලර්වලට ගහන විවිධ වර්ගයේ රෙදි තිබෙනවා. ජීප් පුට්, මැට්, සී.සී. එම්බ්‍රෝස්, තායිවාන් වගේ නම්වලින් ඒවා හඳුන්වනවා. වැඩිම මිල ජීප්පුට්. මීටරයක් රු.670ක් වෙනවා. ත්‍රීවිලර් එකකට මීටර් පහක් විතර යනවා. සීට් කවර මහන රෙද්දක් මීටරයක් රුපියල් 400ක් විතර වෙනවා. මේවා කොළඹ සේල් පොළෙන් ගන්න පුළුවන්. මේ රෙදි මිල වැඩියි. අපිට ගෙනැල්ලා තොග තියාගෙන ඉන්න තරම් මුදල් නැහැ. ඒ නිසා ටික ටික රෙදි ගේන්නේ. ත්‍රීවිලර්වල රෙදි ගහල දෙපැත්තෙ විවිධ ෆොටෝ ගහනවා. බුදු රුව, සීවලී හා රතන යන්ත්‍රය සහ දරුවන්ගෙ පින්තූර වගේ දේවල්. කැඩුණු සීට් කවරත් අලුත්වැඩියා කරලා ලස්සනට හදල දෙන්න මට පුළුවන්.

ත්‍රීවීලර් එකක වැඩ ඉවර කළාම රුපියල් 18000ක් විතර ගන්න පුළුවන්. 6000ක් වගෙ ලාභයක් තියෙනවා. මේ ගොඩනැගිල්ලට කුලිය මාසෙකට රුපියල් 10,000ක්. ලයිට්, වතුර ආදිය වෙනම ගෙවනවා. මම ඉන්නේ බදු ගේක. ඒකටත් රුපියල් 5000ක් ගෙවන්න ඕනෑ. එක දරුවෙක් ඉන්නවා.

අපිට ණය මුදලක් ගන්න හරි අමාරුයි. ස්ථිර ආදායම පෙන්නන්න බෑ. පේ ශීට්ම ඉල්ලනවා. මේක බැංකු ගිණුම් දාගෙන කරන්න පුළුවන් රැකියාවක් නෙවෙයි. අඩු පොලියට ණය මුදලක් ලබා ගන්න පහසු ක්‍රමවේදයක් රජයෙන් අපි බලාපොරොත්තු වෙනවා. ණය දෙනව කියල ටීවීවල කිව්වට ගන්න ගියාම ලේසි නෑ.

ඇත්තටම ඉස්සර ආණ්ඩුවලින් උපකරණ ගෙනැත් දුන්නා. ඒත් අවශ්‍ය අයට නෙවෙයි දුන්නේ. දේශපාලන හිතවත්කමට දුන්නේ. ඒව ගෙවල්වල දිරනවා. අපිට උපකරණ ටික හරි දෙන්න කියලයි අපි ඉල්ලන්නෙ.



මේ පළාතෙ දවසේ පොලියට සල්ලි දෙන අය ඉන්නවා. ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන ආයතන වැහි වැහැලා. ඒවායින් ණය ගත්තොත් අපි හම්බකරන සල්ලි ඔක්කොම හූරනවා වගේ තමයි ගන්නේ. නැත්නම් ගෙදරට ඇවිල්ලා දෙන්න පොරකනවා. ඒවා ගත්තාම කොටි වලිගය අල්ල ගත්තා වගෙයි. මගේ යාලුවෝ ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලට නැඹුරු වෙලා අමාරුවේ වැටිලා තියනවා. රජයෙන් පහසු ණය ක්‍රම හදල දෙනවා නම් අපට මෙහෙම ගැටලුවක් නැහැ."යැයි එහි අයිතිකරු අප සමඟ පැවසීය.

ඉන්පසු අප දකුණේ ත්‍රීවිලර් කවර ගැසීමේ තවත් ප්‍රවීණයකු පිළිබඳ ලද තොරතුරු මත ඇල්පිටිය මහගොඩ දූව පාරේ පිහිටි තවත් ආයතනයකට ගියෙමු.

පසුගිය වකවානුවේ ඇල්පිටිය අම්බලන්ගොඩ ප්‍රධාන මාර්ගය අයිනේ ත්‍රිරෝද රථ කුෂන් කවර ගැසීමේ ව්‍යාපාරය පවත්වාගෙන ගිය නමුත් ඔහුට ඉන් ඉවත් වීමට සිදු වී ඇත. ධෛර්යය අත් නොහැර ගත් ඔහු ප්‍රධාන මාර්ගයේ මඳක් ඇතුළත ප්‍රදේශයක පිහිටි නිවෙසක මෙම ව්‍යාපාරය යළිත් අරඹා ඇත. එහෙත් ඔහුගේ දක්ෂතාවය හා ප්‍රසිද්ධිය නිසා ඔහුට ඉන් කිසිදු හානියක් සිදු වී නොමැති බව එහි ගිය අපට දකින්නට ලැබුණි. ත්‍රීවිලර් කවර මැසීම සඳහා ත්‍රීවීලර් අටක් පමණ ඒ වන විටත් එහි තැන තැන ගාල් කර තිබුණි.

මහාමාර්ග දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික රියදුරකු වන ඔහුගේ පියා මෙම ආයතනයට සියලු පහසුකම් සපයා ඇත. පළමුව බටපොළ කුෂන් වර්ක්ස් ආයතනයක පුහුණුව ලබා ඇති ක්‍රිෂාන් තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට දෙවරක් නොසිතා තීරණය කර තිබේ.

"මම ඉතිරි කරගත් මුදල් ටිකක් තිබුණා. බැංකු දෙකකිනුත් ලක්ෂ පහක ණයක් අරගෙන අවශ්‍ය උපකරණ ටිකක් ගත්තා. මහන මැෂිමකුත් තවත් උපකරණ ටිකකුත් ගත්තා. ඒත් මදි. කොම්ප්‍රෙෂර් යන්ත්‍රයක් නැති එක ලොකු අඩුවක්. මා ළඟ කිහිප දෙනෙක් වැඩ කරනවා.

නව රජයෙන් 4%ක පොලියට ණය දෙනවලු, ඒත් ඒව ගන්න ක්‍රමයක් නැහැ. මට මේ මුදල් ටික පියවල ව්‍යාපාරය පටන් ගන්න ණයක් රජයෙන් දෙනවා නම් ලොකු පිනක්.

මට පොඩි දරුවෙක් ඉන්නවා. නිවෙසක් නැහැ. ඉන්න හරි හැටි තැනක් නැහැ. අපි අමාරුවෙන් ජීවත් වෙන්නෙ. ත්‍රීවීලර් එකක රෙදි ගැහුවම රුපියල් විසිදාහක් විතර ගන්නවා. රෙදි මිල වැඩියි. රෙදිවලට ගාන හා සේවකයින්ට ගෙව්වම පොඩි ලාභයක් තමයි තියෙන්නේ. අපට අත දෙන්න රජය ඉදිරිපත් වෙනවා නම් මේ ව්‍යාපාරය දියුණු කරගන්න පුළුවන්."

මෙහි සේවය කරන තරුණියකු වූ චන්දිමාල් පැවසුයේ, "මම මෙහෙ නෙවෙයි. තිස්සමහාරාමෙ. මට අවුරුදු 21යි. මම විවාහ වෙලා ඉන්නේ ඌරගහ කැරෑව උණගස්වල ප්‍රදේශයෙන්. එහේ ඉඳන් තමයි මම වැඩට එන්නේ. අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගෙන තිබෙනවා. මම නාරාහේන්පිට වැඩපොළක පුහුණු වුණා. එහේ රුපියල් 30,000ක් විතර ගෙව්වා. මම මේ රැකියාවෙන් සතුටක් ලබනවා රජයෙන් කුමක් හෝ රැකියාවක් ලබා දෙනවා නම් සතුටුයි."

එම්. ඩබ්ලිව්. චමින්ද කුමාර මහතා ද මෙම වැඩපළේ සේවකයෙකි. ඔහු පැවසුයේ මෙවන් අදහසකි.

"මගේ වයස දැන් අවුරුදු විසි හතරක් වෙනවා. මම සීනිගොඩ වතුගෙදර ප්‍රදේශයේ ඉඳන් තමයි වැඩට එන්නෙ. මම අවිවාහකයි. අ.පො.ස. සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගත්තා. පසුගිය කාලයේ රැකියා ලක්ෂයක් දුන්නා. තාත්තාගේ පෙන්ෂන් එක නිසා ඒකත් මට නැතිව ගියා. මට මෙතැනින් දවසකට රුපියල් එක්දහස් පන්සීයක් විතර ලැබෙනවා. අපි අමාරුවෙන් ජීවත් වෙන්නෙ. මම ඉල්ලන්නේ දෙවන පියවරේදී හරි අප වැන්නවුන්ට රජයේ රැකියාවක් ලබා දෙන ලෙසයි."





කන්දෙගොඩ ප්‍රදේශයේ ත්‍රීවීලර් අමතර කොටස් අලෙවි කරන ආයතනයකට ගොඩවැදුණේ දන්නා හඳුනන මාධ්‍යවේදියකු මුණගැසී මේ පිළිබඳ කතා කර ගන්නටය.

"ඇත්තෙන්ම මම මෙතන වැඩ කරන්නේ මගේ සහෝදරියකට කරන උදව්වක් ලෙසයි. මට වැටුපක් දෙනවා. ඒත් මම ඉන්නේ වැටුපක් බලාගෙනම නොවෙයි. මම වසර තිස් ගණනක් ගුරු සේවය කරල විශ්‍රාම වැටුපක් ලබන කෙනෙක්.

මේ වගේ කඩවලට සේවකයො යොදාගෙන නඩත්තු කරන්න අමාරුයි. අපිට තියෙන්නේ සුළු ලාභයක් පමණයි. ඇතැම් දිනවල වෙළෙඳාම ගොඩක් අඩුයි. කොරෝනාවෙන් හැම පැත්තම වැටුණා. ඒ අනුව ත්‍රීවිලර් රථ අමතර කොටස් වෙළෙඳුන් වන අපිටත් එහෙමයි. මේ වන විට ඉන්දියාවේ මෙම අමතර කොටස් අපනයනය සීමා කරල තියනවා. ඒ කියන්නේ ත්‍රිවීලර් රථ අමතර කොටස් වෙළෙන්දන් ඉල්ලුම් කරන සියල්ල ලැබෙන්නේ නෑ. එහේ රේගුවෙන් නිදහස් කරන්නෙත් නෑ. ඒ නිසා මිලත් වැඩියි. පාට්ස් හිඟයකුත් තියෙනවා. ඒ වගේම තමයි මේ පාට්ස්වල ඔරිජිනල් ඒවා වගේම ඩුබ්ලිකේට් ඒවා තියෙනවා. ඒ දෙකේම කිසිම වෙනසක් නෑ. ත්‍රීවීල් කරුවො ඒව දන්නෙ නෑ.

උදාහරණයක් කියන්නම්. ඔරිජිනල් අවුටරයක් රු.610 ක් වෙනවා. ඒ වගේම කිසිම වෙනසක් නැති පෙට්ටිය සමානවම තව ඩුප්ලිකේට් එකක් තියෙනවා. ඒක රුපියල් 440 යි. අපි හොඳම එක ගෙනැල්ල සුළු ලාභයක් තියාගෙන රුපියල් 610 ට දෙනවා. සමහරු ඩුප්ලිකේට් එක රු.440 ට විකුණන්න පුළුවන් එක අරගෙන රු. 550 කට විතර විකුණනවා. ඊට වඩා ගොඩාක් අඩු මිලකට ඒක දෙන්න පුළුවන්. අපි බාල එක ගන්නෙ නෑ. ඉතින් සමහරු හිතන්නේ අපේ බඩු මිල වැඩියි කියලයි. කොහොම වුණත් දැන් අපි මේ වර්ග දෙකම ගෙනැත් ගනුදෙනුකරුවාට පැහැදිලි කරලා තමයි විකුණන්නේ. සමහරු ඔරිජිනල් ගේන්නෙම නෑ. හැබැයි මේ වර්ගවල වෙනසක් තිබුණත් එතරම් ලොකු වෙනසක් නෑ.

අපි පාරිභෝගිකයා ආකර්ෂණය කර ගත යුතුයි. අපි ලොකු මුදලක බඩු ගන්නවා නම් 5% ක කොමිෂන් එකකුත් දෙනවා. කොහොම වුණත් සමහරු වෙලාවට රුපියල් දහදාහක විතර බඩු ගන්නවා. නම දාහක් ගෙවලා ඉතිරිය පස්සේ දෙන්නම් කියලා යනවා. ආයෙ දකින්න වත් නෑ. ඉතින් පස්සේ කඩෙන් බඩු ගන්න අවශ්‍ය වුණොත් දුරින් ත්‍රීවිලරය නවත්තල බඩු ගන්න කාව හරි කඩේට එවනවා. ඒ තරම් කපටි මිනිස්සු ඉන්නේ. අපිට හුරු නැති කෙනෙක් ආවම අපි විස්තර බලනවා. පස්සේ ත්‍රීවිලර් එකට ගිහින් බැලුවම ණයකාරයෝ තමයි ඇවිත් නවත්තලා තියෙන්නෙ. ඒ වගේ අත්දැකීම් ගොඩක් අපිට තිබෙනවා."

මෙම අලෙවි සලේ හිමිකරු වන එන්. එච්. ඥානසිරි මහතා පැවසුවේ මෙවැන්නකි. "අපි මොනවා කීවත් වැඩක් නෑ. සුළු ව්‍යාපාරිකයා ගැන බලන්න කෙනෙක් නෑ. අපිට ණය මුදලක් ගන්න ගියත් හරිම අමාරුයි. ප්‍රශ්න කෝටියක් අහනවා. ලොකු ලොකු ව්‍යාපාරිකයන්ට කෝටි ගණන් අයිරා පහසුකම් දෙනවා. ඒ අයවත් දන්නෙ නෑ. ඕක තමයි ඇත්ත මහත්තයෝ.

දැන් මඩ කවරයක් ඇවිත් තියෙනවා. ඒකෙ වෙනසක් තිබෙනවා. සවි කරන්න බෑ. ඇත්තෙන්ම ඇතැම් පාර්ට්ස් අද නෑ. අද මෙහේ කෙනෙක් අපි ළඟ නැති කෑල්ලක් මාතර ගිහින් ගෙනාවා. ඒකෙ මුදු දෙකක් අඩුයි. ඉතින් ඒ මනුස්සයා අමාරුවේ. අපි ඒ වගේ දේවල් කවදාවත් කරන්නෙ නෑ. පාරිභෝගිකයා තමයි අපේ සම්පත වෙන්නේ.

කොහොම වුණත් ලයිට් බිල්, වතුර බිල්, කඩ කුලී වගේම අපේ වැටුප ගණන් බලනව නම් අපිට ඇති ලාභයක් නෑ. ඒත් පුරුදු රැකියාව හැර වෙනත් රැකියාවක් අපිට කරන්න බෑ. අපිට දක්ෂතාව තියෙන්නෙ මේ වෙළෙඳාමට පමණයි. ඒ නිසා ලාභ පාඩු නොබලා මේක කරන්න ඕනෑ. අනෙක මෙතන රාත්‍රී වුණත් බඩුවක් ගන්න පුළුවන්. මේක නැත්නම් මිනිස්සුන්ට ගොඩක් දුර ගෙවාගෙන යන්න සිදු වෙනවා."

කෙසේ වුවද අපිට පෙනෙන නොපෙනෙන ගැටලු ත්‍රීවිලර් ක්ෂේත්‍රයේ හැම පුද්ගලයකුටම ඇති බව නම් කිව යුතුමය. ඒ සඳහා පිළියම් සෙවීම සැමගේ වගකීමකි.

සටහන හා ඡායාරූප
ධර්මදාස සිරිවර්ධන
ගාල්ල දිස්ත්‍රික් සංවාරක



LINK - දිනමිණ ත්‍රීවිලර් බොනැන්සා

දිනමිණ පුවත්පත සමග සෑම අඟහරුවාදා දිනකම පළ වන මඟතොට මිතුරෝ විශේෂාංග ලිපිය කියවන ත්‍රීවිලර් මිතුරන් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගැනෙන ජයග්‍රාහකයන් දස දෙනකුට link ටැක්සි මීටර් දහයක් බැගින් දෙමසකට වතාවක් ලබා දීමට link lanka ආයතනය ඉදිරිපත් වී සිටී. ඒ සඳහා ඔබ කළ යුත්තේ සෑම අඟහරුවාදා දිනකම මඟතොට මිතුරෝ පිටුවේ පළ කෙරෙන කූපන්පත පුරවා තැපැල්පතක අලවා link ටැක්සි මීටර් - දිනමිණ, ත්‍රීවීලර් බොනැන්සා, තැ.පෙ.1198, අලෙවි දෙපාර්තමේන්තුව, ඩී.ආර්.විජයවර්ධන මාවත, ලේක්හවුස්, කොළඹ යන ලිපිනයට තැපැල් කිරීමයි. කූපනයේ ඡායා පිටපත් බාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න.

LINK ටැක්සි මීටර්
මෙම කූපනය පුරවා අප වෙත එවා සෑම මසකම පැවැත්වෙන දිනුම් ඇදීමෙන් ලින්ක් ටැක්සි මීටර් දිනාගන්න
නම/Name: ..........
ලිපිනය/Address : ..........
දුරකථන අංකය/Contact Number : ..........
ත්‍රී/රථයේ ලියාපදිංචි අංකය/Reg No Of T/W: ..........
ඔබත් ලින්ක් ටැක්සි මීටරයක් සවි කර හයර් වැඩි කර ගන්න

ඉංගිරිය මධ්‍යම සමූහ - ප්‍රියදර්ශනී කහවල







## ඇමැති විදුර ආදිවාසීන් හමුවී....

ආදිවාසීන් හට පවතින ගැටලු සම්බන්ධයෙන් ආදිවාසී නායක උරුවරිගේ වන්නිල ඇත්තන් සමඟ වූ විශේෂ සාකච්ඡාවක් ජාතික උරුම, ප්‍රසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ආදිවාසී ගම්මානයේදී පැවැත්විණි.

මෙහිදී ආදිවාසී නායකයා සමගින් එක්වූ අනෙකුත් ආදිවාසී සාමාජිකයන්ද ඇමැතිවරයා වෙත තමන් මුහුණදී ඇති ගැටලු සම්බන්ධයෙන් දැනුවත් කරන ලද අතර, ආදිවාසී ජන උරුම කෞතුගාරය වන වරිග මහගෙදර නිරීක්ෂණ චාරිකාවකටද ඇමැති විදුර වික්‍රමනායක මහතා සහභාගිවිය.

ආදිවාසීන් විසින් අමාත්‍යවරයා ඇතුළු පිරිසට සෙත්පතා 'කිරිකොරහ' ශාන්ති කර්මයක්ද පවත්වනු ලැබිණි.

ඩී.එස් ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## දැරියගේ ජීවිතය බේරාගන්න ඕ පොසිටිව් වකුගඩුවක් ඕනෑ



මොනරාගල-ගලබැද්ද කොලොන්වින්න මහගංගොඩ පදිංචි ඩී.එම් ටෙලීෂියා චාමලී (08) දැරිය දරුණු වකුගඩු රෝගයකින් පෙළෙන බව දෙමාපියෝ පවසති.

ඇයට ප්‍රතිකාර කරන පේරාදෙණිය ශික්ෂණ රෝහලේ විශේෂඥ වෛද්‍ය ශෙනාල් තල්ගහගොඩ මහතා පවසා ඇත්තේ කඩිනමින් ඇයට වකුගඩුවක් බද්ධ කළ යුතු බවයි. එබැවින් ඕ පොසිටිව් වර්ගයේ වකුගඩුවක් පරිත්‍යාග කර ඇයගේ ජීවිතය බේරා ගැනීමට උදව් කරන්නැයි දෙමාපියෝ ඉල්ලා සිටිති. අවශ්‍ය විස්තර 0772704371 යන දුරකථන අංකයෙන් ලබාගත හැක.

බොරලැස්ගමුව සමූහ සෙනවිරත්න කහටපිටිය

## මාළු වෙළෙන්දියකට කොරෝනා කරගම්පිටිය ඉරිදාපොළ හදිසියේ වසයි

කෝවිඩ් ආසාදිතව මාළු වෙළදාමේ නියුතුව සිටි කාන්තාවක කරගම්පිටිය ඉරිදා පොළට ද පසුගිය 11 ඉරිදා පැමිණීමත් සමඟ 18 වන දින පැවැත්වීමට තිබූ පොළ නගර සභාව දෙහිවල පොලීසිය සෞඛ්‍ය අංශ ඒකාබද්ධව ගත් තීරණයක් මත වසා දැමීමට කටයුතු කරනු ලැබිණි.

මේ ගැන දෙහිවල පොලිස් ස්ථානාධිපති වරයා විසින් නගර සභා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යලය වෙත ඉදිරිපත් කළ නිර්දේශය නගරාධිපතිවරයා විසින් අනුමත කිරීමෙන් පසු දෙහිවල පොලීසිය නිලධාරීන් සෞඛ්‍ය පරීක්ෂකවරුන් ද ඒකාබද්ධව ඒ වන විටත් නොදැනුවත්කමින් වෙළදාම පිණිස පැමිණ කුඩාරම් ගසා සිටි වෙළදුන් විශාල ප්‍රමාණයක් දැනුවත් කර හරවා යැවීමට ද කටයුතු කරමින් පොළ භූමිය සෞඛ්‍යාරක්ෂිත ක්‍රමයට අනුව හිස් භූමියක් බවට පත්කරනු ද ලැබ ඇත .

ධම්දාස සිරිවර්ධන - ගාල්ල දිස්ත්‍රික් සංචාරක

දිනමිණ දිසත - දස අත ම එක තැන

## කොස්තාපල්ගේ යතුරුපැදියෙන් ගිහින් කතුන්ගේ මාල කඩලා

### හොරා අල්ලන්න යද්දී ගිං ගඟට පනී

ගාල්ල පොලිස් ස්ථානයේ සේවය කරන පොලිස් කොස්තාපල්වරයකුගෙන් සොරකම් කරන ලද යතුරුපැදියකින් තැන තැන යමින් කාන්තාවන්ගේ ගෙන බැඳි රන් මාල කඩමින් මෙම ජාවාරමට අමතරව හෙරොයින් ජාවාරම ද සිදුකළ පුද්ගලයකු මත්කුඩු ග්‍රෑම් 1800 ක් හා රන්මාල දෙකක්, සොරකම් කර ළඟ තබා ගත් යතුරුපැදි දෙකක්, ඇතුළු භාණ්ඩ රැසක් සමග පසුගියදා නාගොඩ ප්‍රදේශයේ දී සැකපිට ප්‍රශ්න කිරීම සඳහා ඇල්පිටිය පොලිසිය මගින් අත්අඩංගුවට ගෙන ඇත.

පොලිස් අත්අඩංගුවට ගැනීමට ගිය අවස්ථාවේදී ඔහු ගිං ගඟට පැන පිහිනා පැනයන්නට උත්සාහ දැරූ බවත් පොලිස් නිලධාරීන් ඔහු පසුපස හඹා පිහිනා ගොස් ඔහු අත්අඩංගුවට ගත් බවත් පොලිස් ආරංචි මාර්ග කියයි.

කතරගම ප්‍රදේශයේදී රන් මාල 36 ක් කඩා ගැනීම සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාරගත වී සිට ඇප මත සිටි අයකු වීම විශේෂත්වයකි.

මොහු බද්දේගම, මීටියාගොඩ,ගාල්ල, නාගොඩ, හික්කඩුව, බද්දේගම, මීටියාගොඩ ඇතුළු පොලිස් ස්ථාන රැසකට අවශ්‍යව සිටි අයෙකි.

මොහු මත්කුඩුවලට ඇබ්බැහි වූ පුද්ගලයකු වන අතර බද්දේගම ප්‍රදේශයේ පදිංචි අයෙකි.

ගාල්ල පොලිසියේ කොස්තාපල්ගෙන් හා කළුතර ප්‍රදේශයේදී සොරකම් කරන ලද යතුරු පැදි දෙකද ද මේ වන විට සොයාගෙන ඇති අතර වැඩිදුර පරීක්ෂණ ආරම්භ කර ඇත.

ඇල්පිටිය පොලිස් අධිකාරී සතිෂ් ගමගේ මහතාගේ උපදෙස් පරිදි ඇල්පිටිය මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක අජිත් දසනායක, අපරාධ අංශාධිපති පොලිස් පරීක්ෂක උදය කුමාර, වැටලීම් අංශයේ ස්ථානාධිපති පොලිස් සැරයන් පුංචිහේවා, (60723) පොලිස් සැරයන්වරුන් වන නිහාල්(17723) රවීන්ද්‍ර (24946)කපිල (59484)අහමඩ් (13140) ඇතුළු කොස්තාපල්වරුන් කණ්ඩායමක් මේ පිළිබඳව ඉදිරි පරීක්ෂණ පවත්වති.

එස්. දියගහගේ - දකුණු පළාත් සංචාරක

## ඉඩම් කාර්යාලය කඩා රු.7000ක් සොරකම් කරලා

ගාල්ල කළුවැල්ල පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩල කාර්යාලය රාත්‍රි කාලයේ බිඳ මුදල් රුපියල් 7000ක් සොරකම් කර ඇතැයි ගාල්ල පොලිසිය පවසයි.

ගේට්ටුවේ ඉබ්බන් කඩා කාර්යාලයේ ඉදිරිපස දොරට හානිකර ජනේලයේ ග්‍රිල් කඩා සී.සී.ටී.වී.කැමරා පද්ධතියේ කොළ අලවා ඇතුළුවී ගිණුම් ලිපිකාරිණියගේ ලාච්චුවේ තිබූ රුපියල් 7000ක් සොරකම් කර ඇති බවට සහකාර අධ්‍යක්ෂවරයා පැමිණිලි කර ඇත.

සැකකරුවන් අත් අඩංගුවට ගැනීම සඳහා අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ඩි.ජී.ආනන්ද මහතා ඇතුළු නිලධාරි කණ්ඩායමක් විසින් පරීක්ෂණ පවත්වාගෙන යනු ලැබේ.

ඩබ්ලිව් රෝහණ - බුලත්කොහුපිටිය සමූහ

## දැරණියගල ප්‍රා.සභාවේ අයවැය සම්මතයි

දැරණිගල ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂය සඳහා වූ අය වැය පසුගියදා (15) පැවැති ඡන්දයේ දී වැඩි ඡන්ද 2 කින් සම්මත විය.අය වැයට පක්ෂව ඡන්ද 11 ක් හා විපක්ෂව ඡන්ද 9 ක් ලැබිණි.දැරණියගල ප්‍රාදේශීය සභාවේ පාලක බලය එක්සත් ජාතික පක්ෂය හිමි කර ගෙන තිබෙයි.පසුගියදා පැවැති මහා සභාවේ දී සභාපති ( එක්සත් ජාතික පක්ෂය) ලක්ෂ්මන් රාජකරුණා මහතා විසින් අය වැය යෝජනාව ගෙන එන ලදී.

අය වැය සඳහා පැවැති ඡන්ද විමසීමේ දී සභාපතිවරයා ඇතුළු එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 8 දෙනාත්,එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු 2 ක් හා ස්වාධීන මන්ත්‍රීවරයා අය වැයට පක්ෂව ඡන්දය ප්‍රකාශය කළහ.විරුද්ධව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මන්ත්‍රීවරු 8 දෙනා හා එක්සත් ජනතා නිදහස් සංධානයේ මන්ත්‍රීවරයා ඡන්දය භාවිතා කළහ.ඒ අනුව 2021 වර්ෂය සදහා වූ අය වැය වැඩි ඡන්ද 2 කින් සම්මත විය.



සීමාරහිත ඉහළ කියාඩුව නිල්වලා සණස සමිතිය නව කාර්යාල ගොඩනැගිල්ලකට සුබ මොහොතින් ගෙවැදුණි. මාතර දිසා සංගමයේ සභාපති එස්. සේනානායක මහතා විසින් නව කාර්යාල ගොඩනැගිල්ල විවෘත කළේය. මාතර දිසා සංගමයේ සාමාන්‍යාධිකාරී අසංක වීරසිංහ මහතා ඇතුළු නිලධාරීහු මෙම අවස්ථාවට එක්වී සිටියහ.

**ඡායාරූප - විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ**

ප්‍රසන්න පත්මසිරි - ඌව පළාත් සමූහ

## බිරිය ඉදිරියේ දියණියට අතවර කරලා

තම බිරිය ඉදිරියේ තම දියණිය අපයෝජනයට ලක්කර බිරියට අතින් පයින් පහරදුන් බව කියන පුද්ගලයකු අත් අඩංගුවට ගත් බව මැදගම පොලීසිය කියයි.

මැදගම තඹාන ගම්මානයේ පදිංචි පුද්ගලයකු මත්පැන් බී 15 දින සවස තම නිවෙසට පැමිණ බිරිය බලා සිටියදී දියණිය අපයෝජනයට ලක්කර පසුව බිරියට අමානුෂික ලෙස පහර දී ප්‍රදේශය මග හැර ගොස් සිටියදී සැකකරු අත් අඩංගුවට ගත් බව පොලීසිය කියයි.

අපයෝජනයට ලක් වූ සැකකරුගේ දියණිය හා බිරිය මොණරාගල සිරිගල රෝහලට ප්‍රතිකාර ගැනීමට ඇතුළත් කර තිබේ. සැකකරු බිබිල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය. මැදගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක පී.මාරසිංහ මහතාගේ උපදෙස් මත නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

රාගම කුසුම් එස්. හැන්නදි

## මහර හිරගෙට උඩින් ආ බෝලයේ දුරකථන බැටරි-චාජර්

යාබද මාර්ගයේ සිට මහර බන්ධනාගාරය තුළට විසිකරන ලද තහනම් ද්‍රව්‍ය සහිත බෝලයකට සමාන පාර්සලයක් අත්අඩංගුවට ගැනීමට පසුගිය 16 වන දින රාත්‍රි සේවයේ නියුතුව සිටි මහර බන්ධනාගාර නිලධාරීන් විසින් සමත්වී ඇත.

එදින රාත්‍රි 09.30 පමණ මහර බන්ධනාගාරයේ සිරමැදිරියක් අසලට මේ බෝලය තුළ ජංගම දුරකථන බැටරි 02 , චාජර් 01 සහ දුම්කොළ සුක්ෂම සඟවා තිබියෙදී සොයා ගැනීමට හැකිවී තිබේ. මේ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ කටයුතු මහර බන්ධනාගාර අධිකාරි ජගත් වීරසිංහ මහතාගේ උපදෙස් මත ප්‍රධාන ජේලර් සුභාෂ් උපුල්දෙණිය මහතා ඇතුළු විනය අංශයේ නිලධාරීන් විසින් සිදු කිරීමට නියමිතව ඇත.

නවරත්න සමරතුංග - දමන විශේෂ

## වැස්ස නෑ! ගොඩ වී වගාවත් ප්‍රමාදයි

මාස් කන්නයේ ගොඩ වී වගාව සඳහා මෝසම් වැසි ප්‍රමාද වීමෙන් අම්පාර දිස්ත්‍රික්කයේ ගොවීන් අසීරුතාවයට පත්ව සිටින බව බව දිස්ත්‍රික් ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති සී.එච්. කුමාර මහතා දිනමිණ ට පැවසීය.

ඒ අනුව වම් ඉවුරේ මාකණ්ඩිය බොක්කබැද්ද බණ්ඩාරදූව සහ ලාතුගල වැනි ගම්වල ගොවීන් වැස්ස බලාපොරොත්තුවෙන් මේ වනවිට බිම් සකස් කරගෙන සිටින නිසා වැස්ස ප්‍රමාදයෙන් ගොවිතැනද ප්‍රමාද යට ලක්වීමේ අවදානමක් පවතින බව දිස්ත්‍රික් ඒකාබද්ධ ගොවි සංවිධානයේ සභාපති වරයා කීය.

මෙවර ඉඟිනියාගල සේනානායක සමුද්‍රය මඟින් මහා වාරිමාර්ග යටතේ දමන දකුණු ඉවුර සඳහා වී වගාව වෙනුවෙන් ඔක්තෝබර් මස 10 දින ජලය නිකුත් කිරීමට පෙරකන්න රැස්වීමේදී තීරණය කර ඇති බව දමන දකුණු ඉවුර ව්‍යාපාරයේ තිස්ස ගොවි සංවිධානයේ ලේකම් කරුණාරත්න ගනේගෙදර මහතා පැවසීය.

මේ අතර වම්ඉවුර සඳහා ඔක්තෝබර් 20 දින ජලය නිකුත් කිරීමට කටයුතු යොදා ඇති බව අම්පාර වාරිමාර්ග ඉංජිනේරු ඒ.ලියනගේ මහතා පැවසීය.

ජී .පී.ඒ.වීරසූරිය, බදුල්ල දකුණ සමූහ,

## බෞද්ධ සමිති ලියාපදිංචි කරවා ගන්න බෑ

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විවිධ ස්වෙච්ඡා සංවිධාන හා සමිති ලියා පදිංචි කිරීම සිදු කළත් බෞද්ධ සමිති ලියා පදිංචි නොකිරීම පිළිබඳව තමා බලවත්සේ කණගාටුවන බව හාලිඇළ සමාධි බෞද්ධ සමිතියේ සභාපති බන්දුසේන පෙරේරා මහතා පවසයි.

1994 වසරේ දී ආරම්භ කළ සමාධි බෞද්ධ සමිතිය බෞද්ධ පොත් හා පත්‍රිකා නොමිලයේ බෙදා දීම,විහාර හා පරිසර සංවර්ධන කාර්යයන් සිදු කිරීම,වැඩිහිටි සත්කාර හා දානමය කටයුතු කිරීම,සත්ත්ව අභයදාන සඳහා දායක වීම හා විවිධ සමාජ සේවාවන් රැසක් සිදුකර ඇතත් බෞද්ධ රටක් වූ අප රටෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙම සමිතිය ලියා පදිංචි කර ගැනීමට මෙතෙක් නොහැකි වීම පිළිබඳව තම සමිතියේ සාමාජික පිරිස ද දැඩි කලකිරීමකට පත්ව සිටින බව පවසන බන්දුසේන පෙරේරා මහතා මේ පිළිබඳව ජනාධිපතිතුමා ගේ හා අගමැතිතුමා ගේ අවධානය යොමා දිවයිනේ ඇති බොදු සමිති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ලියා පදිංචි කර ගැනීමට අවස්ථාව සළසා දෙන ලෙස ඉල්ලා සිටී.

දයාරත්න බණ්ඩාර - කෑගල්ල දිස්ත්‍රික් සමූහ

## ගඟවැරලිය අට්ටමලේ මහ කළුගලක් පෙරළීමේ අවදානමක්: ප්‍රදේශවාසීහු මරබියෙන්



කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගඟවැරලිය අට්ටමලේ ප්‍රදේශයේ විශාල කළු ගලක් පෙරළී යෑමේ අවධානමක් ඇති හෙයින් ඒ අසල ජීවත්වන ජනතාවට උන් හිටි තැන් අහිමිවන බව ප්‍රදේශවාසීහු පවසති.

දැනට පවතින අයහපත් කාලගුණය හේතුවෙන්මෙම ගල පෙරලුනහොත් දේදුගල පැලැම්පිටිය ප්‍රධාන මාර්ගයද මුළුමනින්ම වැසී ගොස් ගමනා ගමනයද නැවතීමට ඉඩ ඇත.

කළු ගල පෙරළීයෑමේ අවධානම මතුවී දැනට වසර දහයක පමණ කාලයක් ගතව ඇතත් එකී කාල සීමාවතුළ වග කිවයුතු රාජ්‍ය නිලධාරීන් වරින්වර පරීක්ෂාකර බලා ගියමුත් එයින් කිසිදු පළක් නොවූ බවත් ගම්වාසීහු පවසති.



නෙල්සන් කුමාර



පාලිත විජේසූරිය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන් හා බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් මෙම ස්ථානයට පැමිණ ගල කඩා ඉවත් කරදෙන බව පවසා ගොස් කාලයක් ගතව ගොස් ඇති බවත් මේවන විටත් කිසිම නිලධාරියකු නොපැමිණි බවත් ප්‍රදේශවාසීහු පවසති.

වැසි පවතින සමයන්හි තමන් ජීවිතයත් මරණයත් අතර හිඳිමින් අවධානම් සහිත නිවාසවල ජීවත් වන බවත් හැකි ඉක්මනින් මෙම කළුගල කඩා ඉවත් කර දෙන ලෙසට ගම්මුන් බළධාරින්ගෙන් ඉල්ලා සිටින බවත් ගම්වාසීහු පවසති.

මේ පිළිබඳව අදහස් දක්වන පාලිත විජේසූරිය මහතා-

අපි මේ පිළිබඳව වග කිවයුතු නිලධාරීන්ට පැවසූ විට අපට එම ස්ථානයෙන් ඉවත්වෙන්න කීවා අවුරුදු ගාණකට උඩදී තමයි මේ කළුගල අනතුරුදායකයි කියල අපි කීවෙ අපිට මෙහෙන් යන්න කීවා ඊට පස්සේ අපි අවතැන් කඳවුරුවලත් හිටියා ඒත් පලක් වුණේ නැහැ. වහින වෙලාවට අපි බයෙන් ඉන්නේ නිලධාරීන් ඇවිත් කියන්නේ එකම දේ තමයි අපිට මෙහෙන් යන්න කියලා අපට යන්න දිහාවක් නැති බවද පැවසීය.

නෙල්සන් කුමාර මහතා- නිලධාරින් කියනවා මේ ගල ඉවත් කරන්න විශාල මුදලක් යනවා කියල මුදල් නැති නිසාලු මේ ගල ඉවත් කරන්න ප්‍රමාද වෙන්නෙ. මේ රටේ බොරු සෝබන දේවල් වලට කෝටි ගණන් මුදල් වැය කරනවා.අපි දන්න විදිහට නම් මේ ගල කඩන්න ලොකු වියදමක් යන්නෙ නැහැ. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරින් හා බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සම්බන්ධව කටයුතු කරන නිලධාරීන්ට කිහිප වතාවක්ම කීවා ඒත් වැඩක් වුණේ නැහැ එනව බලනව සල්ලි නැහැ කියනව යනව. අපගේ ජීවිත නැති වුණ දවසක ද මේ ගල ඉවත් කරන්නෙ කියල අපි බලධාරීන්ගෙන් ප්‍රශ්න කරන බවත් පැවසීය.

නවරත්න සමරතුංග - දමන විශේෂ

## කහ වගාව මැරී යන්න කලින් ජල මුරයක් දෙන්නැයි අම්පාරේ කහ ගොවියෝ ඉල්ලති

අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩකළපුව දිස්ත්‍රික් මායිමෙහි පිහිටා ඇති ගලපිටගල සහ ගෝනගල යන ගම්මාන වල අක්කර හතළිහක පමණ කහ වගාවට වතුර නැතිව මැරීයන තත්ත්වයක් උදාවී ඇති බව අම්පාර ඵලදායිතා ගම්මාන සමුපකාර සමිතිය පවසයි.

එම සමිතියේ සභාපති දයාරත්න බණ්ඩාර මහතා මෙසේ පැවසීය.

කහ වගාවට අමතරව මෙම ගම්වල තවත් ගොවීන් පිරිසක් ගර්කින්(ගැට කැකිරි) වගාව පවත්වාගෙන ගියා. එම වගාව සඳහා දින හතරකට වරක් ජලය ලබාදී තිබුණා. ඒ නිසා කහ වගාවටද ජලය ලබාගෙන තිබුණා.

මේ වන විට එම ගර්කින් වගාව අස්වැන්න නෙළා අවසන්ව තියෙනවා. සේනානායක සමුද්‍රයේ සිට මහ ඇළ මාර්ගයේ ජලය නිකුත් කිරීම දැන් නතර කර තිබෙනවා. කහ වගාවට ජලය ඉල්ලාසිටි විට දින 15කට වරක් පසුගිය කාලයේ ජලය නිකුත් කළා.



ගෝනගල කහ වගාවක්

එහෙත් මෙවර මහකන්නය සඳහා කන්න රැස්වීමේදී ගත් තීරණ වලට අනුව ඔක්තොබර් මස 20 දින ජලය නිකුත් කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව තීරණය කර ඇති බැවින් කහවගාව වතුර නැතිව මැරියන බවද සභාපති වරයා කීය.

එම නිසා එය රැක ගැනීමට එක් වතුර මුරයක් හෝ ලබාදෙන ලෙසද කහ වගාකරන ගොවීන් වෙනුවෙන් ගොවි සමිතිය ඉල්ලා සිටී. උහන ප්‍රාදේශීය ලේකම් අජන්තා කුමාරි මෙනෙවියවී වගාවට ප්‍රමුඛත්වය දෙමින් කන්න රැසවීමේදී ගත් තීරණයට අමතරව ජල මුරයක් හෝ ලබාදීමේදී ඉඟිනියාගල සිට වම් ඉවුරේ අගාවත ගෝනගල දක්වා ජලය යැවීමට විශාල ජල ධාරිතාවක් නිකුත් කළ යුතු වීම ප්‍රායෝගික ගැටලුවක්. එම නිසා මෙම ගැටලුව ගැන අම්පාර දිසාපති තුමා සමග කතා කර විසඳුමක් ලබා ගැනීමට කටයුතු කරන බව ප්‍රාදේශීය ලේකම් වරිය සඳහන් කළාය.

## මේ අබලන් පාර හදා දෙනවාද?



හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් උස්මුදුලාව - මීටියාගොඩ මාර්ගයේ මහරුප්ප කොටස ගල් හා තාර ගැලවී විශාල වළවල් හැරී තිබේ. වර්ෂා කාලයේදී එම වළවල් වල ජලය පිරී පවතී. මෙම මාර්ගයේ අම්බලන්ගොඩ සිට මීටියාගොඩ, ගලගොඩ, අළුත්වල ආදී පළාත්වලට ලංගම හා පෞද්ගලික බස් රථ කීපයක් ගමන් වාර විසි පහක් පමණ එහාට මෙහාට ධාවනය කරයි.

ඡායාරූපයෙන් දැක්වෙන්නේ අබලන් තත්ත්වයට පත්ව තිබෙන මාර්ගයේ ඇති වළවල් ජලයෙන් පිරී පවතින අයුරුයි. මෙම මාර්ගය ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් ප්‍රදේශවාසීහු වගකිවයුත්තන්ගෙන් ඉල්ලා සිටිති.

**අම්බලන්ගොඩ සමූහ ආර්.ඥාණදාස**





සී .ගමගේ - සොරණාතොට සමූහ

## යතුරුපැදිය පාපැදියේ ගැටී පාපැදිකරුට බරපතළයි

මහියංගණ දෙහිඅත්තකණ්ඩිය මාර්ගයේ අලුත්තරම ප්‍රදේශයේ දී (14) යතුරුපැදියක් පාපැදියක ගැටීමෙන් පාපැදිකරු බරපතළ තුවාල ලබා මහියංගණ රෝහලට ඇතුළත් කළ බව ගිරාඳුරුකෝට්ට පොලිසිය පවසයි .

අනතුරින් තුවාල ලබා ඇත්තේ ගිරාඳුරුකෝට්ට අලුත්තරම ප්‍රදේශයේ පදිංචි පුද්ගලයකු යැයි පොලිසිය කීය .

මෙමෙ යතුරුපැදිය මහියංගණ දෙහිඅත්තකණ්ඩිය මාර්ගයේ ධාවනය වෙමින් තිබියදී මාර්ගයේ ගමන් ගත් පාපැදියේ ගැටී අනතුර සිදුව ඇතැයි පොලිසිය සඳහන් කළේය .

# 20 ගැන ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව අද මැතිසබයට

**ස්වර්ණා විජේකෝන්, නුවන් කොඩිකාර, සන්ධ්‍යා කරුණාරත්න**

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවට අද (20) ඉදිරිපත් කිරීමට නියමිත වේ. විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට අදාළ තීන්දුව පසුගිය 09 වැනිදා ජනාධිපතිවරයා හා කථානායකවරයා වෙත යොමු කර තිබිණ.

ඒ අනුව අදාළ තීන්දුව කථානායකවරයා විසින් අද (20) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත වේ.

අදාළ තීන්දුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසුව විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට අදාළ විවාදය හෙට (21) සහ අනිද්දා (22) පැවැත්වේ.

විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පෙරවරු 10.00 සිට රාත්‍රී 7.30 දක්වා පැවැත්වෙන අතර ඊට අදාළ ඡන්ද විමසීම 22 දා සිදුකිරීමට නියමිතය.

විවාදය පැවැත්වෙන හෙට සහ අනිද්දා වාචික පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න සඳහා කාලය වෙන් කිරීමක් සිදු නොවන අතර දිවා ආහාරය සඳහා වෙලාව වෙන්නොකිරීමටත් පසුගියදා පැවැති පක්ෂ නායක රැස්වීමේදී තීරණය කර ඇත.

# 20 විවාදය කල් දමන්නැයි විපක්ෂය උද්ඝෝෂණයක

කොරෝනා වයිරසය ව්‍යාප්ත වැළැක්වීම සඳහා රජය විසින් නිකුත් කර ඇති ගැසට් නිවේදනය උල්ලංඝනය කරමින් 20 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම නීති විරෝධී හෙයින් එම විවාදය වහාම කල් දමන්නැයි ඉල්ලමින් සමගි ජන බලවේගය ප්‍රමුඛ විපක්ෂය පාර්ලිමේන්තුව ඉදිරි පිට අද (20) උද්ඝෝෂණයක නියැළීමට සැලසුම් කර තිබේ. එහි එක් පියවරක් ලෙස විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විසින් කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාට ලිපියක් යොමු කරමින් විවාදය කල් දමන්නැයි ඉල්ලා සිටින අතර ගැසට් නිවේදනයට අනුව රැස්වීම් පැවැත්වීම සිදු නොකළ යුතු බවත් එලෙස රැස්වීම් පැවැත්වීම ගැසට් නිවේදනයේ සඳහන් රෙගුලාසි උල්ලංඝනය කිරීමත් බවත් කිරිඇල්ල මහතා එම ලිපියෙන් පෙන්වා දී තිබේ.

මෙහිදී රිෂාඩ් බදියුදීන් මහතා අත්අංගුවට ගැනීමට විරෝධය පෑමටද ඔවුන් සැලසුම් සකස්කර ඇතැයි සමගි ජන බලවේගයේ ප්‍රකාශකයකු පැවැසූ අතර කෙසේ හෝ විවාදය කල් දමාගනිමින් 20 වැනි සංශෝධනය සම්මත වීම වළක්වා ගැනීමට ගත හැකි සෑම පියවරක්ම ගන්නා බව හෙතෙම පැවසීය.

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් අසුන් ගන්නා අකාරය ද රජය විසින් හඳුන්වා දී ඇති රෙගුලාසිවලට පරස්පර බවත් රැස්වීම් සීමාකර ඇති අවස්ථාවක පාර්ලිමේන්තුව පැවැත්වීම එම නීති රීතිවලට පටහැණි බවද විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා සිය ලිපිය මඟින් සඳහන් කර තිබේ.

නීති සම්පාදනය කරන ස්ථානය විසින් එම නීති උල්ලංඝනය කරන්නේ නම් රටට දෙන ආදර්ශයක් ලෙස විවාදය කල් දැමීමට පියවර ගන්නා ලෙසද කථානායකවරයාගෙන් වැඩිදුරටත් ඉල්ලා තිබේ.

### ආණ්ඩුකාරවරයා ඇතුළු 40කට එරෙහි

# ඩල්ජිත් අලුවිහාරේගේ නඩුව ඉල්ලා අස්කර ගනී

**සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ**

මාතලේ මහ නගර සභාවේ හිටපු නගරාධිපති ඩල්ජිත් අලුවිහාරේ මහතා(එජප) පළාත් ආණ්ඩුකාරවරයා ඇතුළු 40 දෙනකුට එරෙහිව පවරා තිබූ නඩුව පැමිණිලිකාර

ඩල්ජිත් අලුවිහාරේ මහතා විසින් ඉල්ලා අස්කර ගැනීම නිසා එම නඩුව නිශ්ප්‍රභ කිරීමට මාතලේ මහාධිකරණ විනිසුරු සුමුදු ප්‍රේමචන්ද්‍ර මහතා ඊයේ (19)දින නියෝග කළේය.

නගරාධිපතිවරයාට එරෙහිව වැඩබලන නගරාධිපති සන්දනම් ප්‍රකාශ් නාගරික මන්ත්‍රී අමිල නිරෝෂන් මහතා ඇතුළු නාගරික මන්ත්‍රීවරුන් කණ්ඩායමක් සංශෝධිත මහ නගර

සභා ආඥා පනතේ ( 252 අධිකාරිය ) 277(1) වන්තිය යටතේ පරීක්ෂණයක් පවත්වන ලෙසට පළාත් ආණ්ඩුකාරවරයාට පැමිණිලි කිරීමත් සමඟ නගරාධිපති පදවිය තාවකාලිකව

අත්හිටුවීම වළක්වන ලෙසට ඉල්ලීමක් කරමින් නගරාධිපති ඩල්ජිත් අලුවිහාරේ මහතා විසින් මෙම නඩුව පවරා තිබුණි .

### ඇඳිරි නීතිය ඇති බල ප්‍රදේශවල

# වෙළඳසැල් අද විවෘතයි

**උපාලි කරුණාරත්න**

දැනට නිරෝධායන ඇඳිරි නීතිය බල පැවැත්වෙන ප්‍රදේශවල ආහාර ද්‍රව්‍ය අලෙවි කරන වෙළඳසැල් සහ ඖෂධහල් අද(20) පෙරවරු 8.00 සිට රාත්‍රී 10.00 දක්වා විවෘතව තැබෙන බව Covid-19 පැතිරීම වැලැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය නිවේදනය කරයි.

# කෝප්-කෝපා කමිටු රැස්වීම් තාවකාලිකව අත්හිටුවයි

**ස්වර්ණා විජේකෝන්**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව හා රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරි සතියේදී පැවැත්වීමට නියමිතව තිබූ කමිටු රැස්වීම් තාවකාලිකව අත්හිටුවා තිබේ.

රටේ පවතින වත්මන් කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මහජන ඒකරාශී වීම් වැළැක්වීම සහ සමාජ දුරස්ථ භාවය රඳවා ගැනීම යන සෞඛ්‍ය නිර්ණායක පදනම් කරගනිමින් අදාළ කමිටුවල සභාපතිවරුන් මෙම තීරණය ගෙන තිබේ. ඒ අනුව එළඹෙන 20 වැනිදා සිට 23 දා දක්වා පැවැත්වීමට නියමිතව තිබූ කෝප් සහා කෝපා කමිටු රැස්වීම් සියල්ල අත්හිටුවා ඇත.

# ඇඳිරි නීතිය කැඩූ 302ක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

නිරෝධායන ඇඳිරි නීතිය පැනවූ පසුගිය 04 වැනිදා සිට මේ දක්වා ඇඳිරි නීතිය කඩ කිරීම සම්බන්ධයෙන් පුද්ගලයන් 302ක් අත්අඩංගුවට ගෙන ඇති අතර වාහන 53ක් පොලිස් භාරයට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පවසයි.

නිරෝධායන ඇඳිරි නීතිය කඩ කිරීමට අදාළව ඊයේ (18) පුද්ගලයන් 37 දෙනෙකු සහ වාහන 05ක් පොලිස් භාරයට ගෙන තිබේ.

ගම්පහ දිස්ත්‍රික්කයේ පොලිස් වසම් 19ක් ආශ්‍රිතව තවදුරටත් නිරෝධායන ඇඳිරි නීතිය බලපැවැත්වෙන අතර, මතුගම ප්‍රදේශයේ ඕවිටිගල, බදුගම සහ බදුගම නව ජනපදය යන ග්‍රාමසේවා වසම් කොවිඩ් රෝගීන් කිහිප දෙනෙකු හමුවීම නිසා හුදෙකලා කර තිබෙන අතර එම ප්‍රදේශ වල ජනතාවද තම නිවෙස් වලටම වී රැඳී සිටින ලෙසත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ඉල්ලා සිටී.

සෞඛ්‍ය අංශ වෙත මෙන්ම ඒ සඳහා පැමිණෙන අනෙකුත් කාර්ය මණ්ඩල වෙත උපරිම සහය ලබාදෙන ලෙසත් නිරෝධායන ඇඳිරි නීතිය පවතින ප්‍රදේශවල මෙන්ම හුදෙකලා කර තිබෙන ප්‍රදේශවල සිට අපොස උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින සිසුන් සඳහා කිසිදු ආකාරයක නිරෝධායන ඇඳිරි නීති සීමාවන් බල නොපාන බවත් ඔවුන්ට සුපුරුදු පරිදි උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබාදී ඇති අතර ඒ සඳහා අවශ්‍ය සියලුම පහසුකම්ද සපයා ඇතැයි පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශ හරහා වාහන ගමනාගමනය කළ හැකි වුවත් එම ප්‍රදේශයේ පුද්ගලයන් නංවා ගැනීම හෝ බැස්සවීම සිදු නොකළ යුතු අතර එම සීමාවන්ද උසස් පෙළ සඳහා පෙනී සිටින සිසු සිසුවියන්ට බල නොපාන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

නිරෝධායන ඇඳිරි නීතිය බල පැවැත්වෙන ප්‍රදේශවල මෙන්ම බල නොපැවැත්වෙන ප්‍රදේශවලද ජනතාව නිරන්තරයෙන් සෞඛ්‍ය පුරුදු වලට අනුගත වෙමින් කටයුතු කරන ලෙසත් නිරන්තරයෙන් මුහුණු ආවරණ පළඳින ලෙසත්, දුරස්ථ භාවය තබා ගැනීම ආදිය තුළින් කොවිඩ් රෝගය මර්දනය සඳහා සහය ලබා දෙන ලෙසත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

# ‘හරක් කටා’ගේ ගෝලයෙක් සංගීතයක් දාගෙන ගම වටේ අයිස් විකුණලා

**ඩබ්ලිව්.පී.ධර්මසේන**

“ටියුෂන්“ බපල් එකකින් ගමට සංගිතය සපයමින් ඊසි කෑෂ් ක්‍රමයට අයිස් මත්ද්‍රව්‍ය බෙදූ සැකකරුවකු අයිස් මත්ද්‍රව්‍යය මිලිග්‍රෑම් 47200 සහ හඳුනා නොගත් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 1ක් සමග වැලිගම මුහුදු ගමුවේදී අත්අඩංගුවට ගෙන ඇත. පසුගිය 18 වන දින සවස අත්අඩංගුවට ගත් සැකකරු වැලිගම මහුදු ගමුව ප්‍රදේශයේ පදිංචි 45 හැවිරිදි තිදරු පියෙකි. සැකකරු ප්‍රසිද්ධ මත්ද්‍රව්‍ය ජාවාරම් කරුවකු වන “හරක්කටාගේ ‘ ගෝලයෙකි.

මෙම සැකකරු කාලයක් පටන් මෙම හෙරොයින් ජාවාරම සිදුකර ඇතත් පොලීසියට හසු නොවීමට සුක්ෂම ක්‍රම භාවිත කර ඇත. මොහු අතේ නිතරම ගෙනියන “ටියුෂන් බපල්“ එකක් අතුලේ මෙම මත්ද්‍රව්‍ය සඟවාගෙන ගමන් කර ඇත. එයින් සුමිහිරි සංගීත නාදයක් නිකුත් කරමින් ඊෂි කෑෂ් ක්‍රමයට හෙරොයින් මිලදීගන්නා අයට පණිවිඩයක් නිකුත් කර ඇත.

පොලීසිය උපාය දූතයකු යොදවා මොහු කොටු කර ගන්නා විට අතේ “බපල් එකේ “තිබී අයිස් මත්ද්‍රව්‍ය විකුණන විට පොලීසිය අත්අඩංගුවට ගෙන තිබුණි. මොහු සන්තකයේ තිබී දුඹුරු පාටෙන් යුක්ත හඳුනානොගත් හෙරොයින් ග්‍රෑම් 1ක පැකට් 1ක් අයිස් මත්ද්‍රව්‍ය මිලිග්‍රෑම් 47200ක්, ජාවාරමෙන් උපයාගත් රුපියල් 14000 ක මුදලක් පොලීසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

# ‘ජිනා මැඩම්’ට දස වසරක අත්හිටුවූ සිර දඬුවම්

**කුමුදු හෙට්ටිආරච්චි**

කාන්තාවන් පස්දෙනකු ගණිකා වෘත්තියේ යෙදවීම ඇතුළු චෝදනාවලට වරද පිළිගත් රෝස්මේරි ජූඩ් පෙරේරා හෙවත් ‘ජිනා මැඩම්’ නමැති විත්තිකාරියට කොළඹ මහාධිකරණ විනිසුරු ධම්මික ගණේපොළ මහතා දස වසරකට අත්හිටුවූ දෙවසරක බරපතළ වැඩසහිත සිර දඬුවමක් ඊයේ (19) නියම කළේය. ඊට අමතරව රුපියල් ලක්ෂ පහක දඩ මුදලක් ගෙවීමට ද විත්තිකාරියට නියම වුණි.

නඩුව ඊයේ (19) කැඳවූ අවස්ථාවේ විත්තිකාරිය වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥවරයා පවසා සිටියේ වයෝවෘද්ධව රෝගාතුරුව සිටින විත්තිකාරිය හට ලිහිල් දඬුවමක් නියම කරන ලෙසයි. විත්තිකාරිය වරද පිළිගැනීම හා විත්තිය ඉදිරිපත් කළ කරුණු සලකා බැලූ විනිසුරුවරයා විත්තිකාරිය හට එසේ ලිහිල් දඬුවමක් නියම කරන ලදී.කොල්ලුපිටිය ප්‍රදේශයේ පිහිටි සුපිරි සාප්පු සංකීර්ණයක් තුළ දැඩි ආරක්ෂිතව පවත්වන්ගිය මෙම ගණිකා නිවාසය වැටලූ පොලිසිය විත්තිකාරිය හා ගණිකා වෘත්තියේ යෙදවීමට රඳවා සිටි කාන්තාවන් පස්දෙනකු ද අත්අඩංගුවට ගෙන තිබුණි.

# බස්නාහිර එක්දින වැටලීමෙන් නීති විරෝධී ක්‍රියා කළ 297ක් දැලේ

**රක්ෂණ ශ්‍රියන්ත**

බස්නාහිර පළාතේ සිදු කළ විශේෂ වැටලීම්වලින් දිනක් ඇතුළත හෙරොයින්, ඇතුළු නීති විරෝධී මත්ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් මෙන්ම ගණිකා නිවාසයක් ඇතුළු නීති විරොධී කටයුතු රැසක නියළී සිටි සැකකරුවන් සහ සැකකාරියන් 297ක් අත්අඩංගුවට ගෙන තිබේ.

හෙරොයින් ග්‍රෑම් 94 මිලි ග්‍රෑම් 918ක් සමඟ සැකකරුවන් 108ක්, ගංජා ග්‍රෑම් 649ක් මිලි ග්‍රෑම් 167ක් සමඟ සැකකරුවන් 71ක්, නීති විරෝධී මත් පැන් බෝතල් 594ක් සමග සැකකරුවන් 79ක්, ගෝඩා බැරල් 22ක් සමග සැකකරුවන් 17ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලි ග්‍රෑම් 840ක් සමග සැකකරුවන් 13ක් අත්අඩංගුවට ගෙන ඇත.

එසේම මාවා මිලි ග්‍රෑම් 10000ක්, නීති විරෝධී සිගරට් 939ක්, බල පත්‍ර නොමැතිව ගවමස් විකිණීම, නීති විරෝධී රා මිලි ලීටර් 30000ක්, සමග සැකකරුවන් 09ක් මෙන්ම සම්බාහන මධ්‍යස්ථානයක් වටලා සැකකාරියන් 02ක්ද අත්අඩංගුවට ගෙන තිබේ.හෙරොයින් වැටලීම් අතර ගල්කිස්ස පොලිස් වසමේදී හෙරොයින් ග්‍රෑම් 15ක් සමග සැකකරුවකුද, වැලිපැන්න පොලිස් වසමේදී හෙරොයින් ග්‍රෑම් 14ක් මිලි ග්‍රෑම් 573ක් සමග සැකකරුවකු ද, පෑලියගොඩ පොලිස් වසමේ හෙරොයින් ග්‍රෑම් 10 මිලි ග්‍රෑම්125ක් සමග සැකකරුවකු ද අත්අඩංගුවට ගෙන තිබේ.

බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ උපදෙස් පිට පෙරේදා (18) දිනැදේ 6.00සිට ඊයේ (19)උදේ 5.00දක්වා කාලය තුළදී මෙම විශේෂ වැටලීම් සිදුකර තිබේ.

# බදියුදීන්ට සැඟව සිටීමට ආධාර දුන් අය ගැන වාර්තාවක් දෙන්න

## වැඩබලන පොලිස්පතිවරයා ට උපදෙස්

**කුමුදු හෙට්ටිආරච්චි**

පාර්ලිමේන්තු මන්ත්‍රී රිෂාඩ් බදියුදීන්ට සැඟව සිටීමට රැකවරණය හා ආධාර අනුබල දුන් පුද්ගලයන් සම්බන්ධයෙන් වහා විමර්ශනයක් කර අධිකරණයට කරුණු වාර්තා කරන ලෙස නීතිපතිවරයා ඊයේ(19) වැඩබලන පොලිස්පතිවරයා ට උපදෙස් ලබාදුන් බව නීතිපතිවරයාගේ සම්බන්ධීකරණ නිලධාරිණී රජයේ අධිනීතිඥ නිශාරා ජයරත්න මෙනෙවිය පැවසුවාය.

මාධ්‍ය සාකච්ඡා පවත්වා ඔහු සැඟව සිටි බව ප්‍රකාශ කළ පුද්ගලයන් සම්බන්ධයෙන් ද විමර්ශනයක් සිදුකරන ලෙස නීතිපතිවරයා වැඩබලන පොලිස්පතිවරයා ට උපදෙස් ලබාදී ඇත.

ලංකා දණ්ඩනීති සංග්‍රහයේ 209,220,වගන්ති යටතේ නීතියට අවශ්‍ය පුද්ගලයකුට සැඟව සිටීමට ආධාර අනුබල හා රැකවැණය දෙන අයට එරෙහිව පැහැදිළිවම චෝදනා ඉදිරිපත් කළ හැකි බවද නීතිපතිවරයා වැඩබලන පොලිස්පතිවරයා වෙත උපදෙස් දෙමින් දන්වා ඇත.

### කෝටි දෙකේ අල්ලස් නඩුව

# දැව සංස්ථාවේ සභාපති පියදාසගේ පෙත්සම විභාගය නොවැ: 26

**නෙල්කා මැදගෙදර**

ඉකුත් යහපාලන ආණ්ඩුව සමයේදී කන්තලේ සීනි සමාගම ඉන්දීය සමාගමකට පැවරීමේදී එහි යන්ත්‍ර උපකරණ ලබා දීම අනුමත කිරීම සඳහා එම සමාගමේ ප්‍රධානියාගෙන් රුපියල් කෝටි පහමාරක අල්ලස් මුදල් ඉල්ලා ඉන් රුපියල් කෝටි දෙකක් ලබා ගැනීම සම්බන්ධයෙන් වරදකරුවකු වී බරපතළ වැඩ සහිතව සිර දඬුවම් නියමව සිටින රාජ්‍ය දැව සංස්ථාවේ සභාපති පියදාස දිසානායක එම දඬුවම්වලට එරෙහිව ගොනු කළ අභියාචනාධිකරණ පෙත්සමෙහි විභාගය නොවැම්බර් මස 26 දින ඇරඹීමට ශ්‍රේෂ්ඨාධිකරණය ඊයේ (19) දින නියම කළේය. විජිත් මලල්ගොඩ, එල්. ටී. බී.දෙහිදෙනිය, ප්‍රීති පද්මන් සූරසේන, එස්.තුරෙයිරාජා, යසන්ත කෝදාගොඩ යන පංච පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල හමුවේ මෙම පෙත්සම් කැඳවනු ලැබිණි.

එහිදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘතියක් වශයෙන් සීනි නිෂ්පාදනය කිරීම සඳහා කන්තලේ සීනි සමාගම සතු ගොඩනැගිලි සහ යකඩ ඉන්දියානු සමාගමක් වූ එම්. ජී.ෂුගර් සමාගමේ ප්‍රධානියාගෙන් 2018.12.19.දින අල්ලස් ඉල්ලීම සහ ලබා ගැනීම ඇතුළු අධිචෝදනා 24ක් යටතේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම විසින් විත්තිකරුවන්ට එරෙහිව නඩු පවරා තිබුණි.

එම නඩුව විභාග කළ ස්ථිර ත්‍රිපුද්ගල මහාධිකරණයේ සම්පත් අබේකෝන්, සම්පත් විජේරත්න, චම්පා ජානකී රාජරත්න, යන විනිසුරු මඩුල්ල විසින් මෙම විත්තිකරුවන් අධිචෝදනාවන්ට වැරදිකරුවන් බවට තීරණය කළේය.

ඒ වෙනුවෙන් පළමුවන විත්තිකාර කුසුම්දාස මහානාමට වසර විස්සක සිර දඬුවම් සහ රුපියල් හැටපන්දහසක වන්දි මුදලක් ගෙවීමට නියම කෙරිණ.

දෙවන විත්තිකාර පියදාස දිසානායක වසර දොලහක සිර දඬුවම් සහ රුපියල් පනස්පන්දහසක දඩ මුදල් ගෙවීමට නියම කෙරිණ.

මෙකී මහාධිකරණ තීන්දුවට එරෙහිව විත්තිකාර අභියාචකයන් විසින් වෙන් වෙන්ව පෙත්සම් දෙකක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබේ.

# දඹුල්ල ආර්ථිකයේ වෙළෙඳෙකුගේ පියාටත් කොරෝනා

**පහන් විජේසේකර, රුවන්ත නිතුල්ගස්පිටිය**

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ එළවළු හා කරවල ව්‍යාපාරයක් පවත්වාගෙන යන වෙළෙන්දෙකුගේ පියෙකුට කොවිඩ් - 19 වයිරසය ආසාදනය වීම හේතුවෙන් ප්‍රතිකාර සඳහා රෝහල්ගත කර ඇති බව සෞඛ්‍ය අංශ විසින් තහවුරු කරයි.

අදාළ ආසාදිත පුද්ගලයා කුරුණෑගල, මල්ලවපිටිය, උයන්දන ප්‍රදේශයේ පදිංචි අයෙකු වන අතර, ඔහු බ්‍රැන්ඩික්ස් කොරෝනා පොකුරේ ආශ්‍රිතයකු සමග කතරගම සංචාරයකට එක්වීම නිසා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී තිබේ.

මේ හේතුවෙන් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙන්දාගේ සහ ඔහුගේ මවගේ (ආසාදිතයාගේ බිරිඳ) පී.සී.ආර්. පරීක්ෂණ කර ඇති අතර, එහිදී ඔවුනට වයිරසය ආසාදනය නොවූ බවට වාර්තා වී ඇතැයි ද සෞඛ්‍ය අංශ වැඩිදුරටත් තහවුරු කරයි.

# හිටපු අගමැති පිහිටු වූ දූෂණ විරෝධී ලේකම් කාර්යාලයට හිටපු ජනපතිගේ අනුදැනුමක් නැතිව මිලියන 7.5ක් වෙන් කරලා

## කොමිසම හමුවේ අනාවරණය වෙයි

**රෝෂන් තුෂාර**

යහපාලන ආණ්ඩු සමයේදී හිටපු අගමැතිවරයා පිහිටු වූ දූෂණ විරෝධී ලේකම් කාර්යාලයට හිටපු ජනාධිපතිවරයාගේ අනුදැනුමකින් තොරව රුපියල් මිලියන 7.5ක් ජනපති වැය ශීර්ෂයෙන් වෙන් කර ඇති බව දේශපාලන පළිගැනීම් විමර්ශන ජනාධිපති කොමිසම හමුවේ ඊයේ (19) අනාවරණය විය.

දූෂණ විරෝධී කමිටුව ජනපති කාර්යාලයෙන් මුදල් “පික් පොකට්” ගසා ඇති බවට කොමිසම මෙහිදී පැවැසීය.

ජනපති කාර්යාලයෙන් මුදල් වෙන් කළ බවක් තමන් නොදන්නා බවත්, දූෂණ විරෝධී කමිටුව අරලියගහ මැදුරේ ක්‍රියාත්මක වූවක් බවත්,හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා කොමිසම හමුවේ සාක්කි දීම තුළින් එම කරුණු අනාවරණය විය.

දූෂණ විරෝධී කමිටුව පත් කිරීමට යෝජනා කළ හිටපු අගමැතිවරයාගේ කැබිනට් සංදේශයේ සඳහන් “ජාතික විධායක සභාව” පිළිබඳ තමන් නොදන්නා බවත්, එවන් ජාතික විධායක සභාවක් ජනපතිවරණයට පෙර හෝ පසු ක්‍රියාත්මක නොවූ බවත් හිටපු ජනපතිවරයා පැවැසීය.

හිටපු අගමැතිවරයා කොමිසම හමුවේ සාක්කි ලබා දෙමින් ජාතික විධායක සභාව ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතා ජනපති වීමට පෙර ක්‍රියාත්මක වූවක් යැයි සඳහන් කර ඇත්නම් එය නිවැරදි දැයි කොමිසම නඟන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් හිටපු ජනාධිපතිවරයා එසේ පැවැසීය.

එවකට ක්‍රියාත්මක වූ පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසයේ නීත්‍යානුකූලභාවය හා ස්වාධීනත්වය පිළිබඳව ජනතාවගේ මෙන්ම තමන්ගේ ද විවේචනයක් තිබූ බව පැවැසූ හිටපු ජනාධිපතිවරයා, නීතිය හා සාමය අමාත්‍යාංශය තමන් අතට පත් වූ පසුව එෆ්. සී.අයි.ඩී.ක්‍රියාකාරිත්වය අඩපණ වූ බව ද පැවැසීය.

බොරු සාක්ෂි මත නඩු පවරමින් දේශපාලන පළිගැනීමක් කළේ යැයි සඳහන් කරමින් රුසියාවේ හිටපු තානාපති උදයංග වීරතුංග මහතා ඉදිරිපත් කළ පැමිණිල්ලකට අනුව සාක්කි දෙමින් හිටපු ජනාධිපතිවරයා එසේ සඳහන් කළේය.

ඒ.ටී.එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

# කන්තලේ ප්‍රා. සභාපති පරණ ටයර් 34ක් අතයට විකුණලා

## මන්ත්‍රීවරයකුගෙන් පොලීසියට පැමිණිල්ලක්

## මේක ද්වේෂ සහගත චෝදනාවක් - සභාපති



ප්‍රසම්පාදන පටිපාටියට පිටින් කන්තලේ ප්‍රාදේශීය සභා ගබඩාවේ තිබූ භාවිතයෙන් ඉවත්කරන ලද ටයර් 34ක් රුපියල් 15,000කට විකිණීම සම්බන්ධයෙන් ලද පැමිණිල්ලක් අනුව එම ටයර් තොගය පසගියද (17) පොලිස් භාරයට ගැනීමට කටයුතු කළේය.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට බලය හිමි කන්තලේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සභාවේ නිලධාරීන් සමග එක්ව මෙම ටයර් ප්‍රසම්පාදන පටිපාටියට පිටින් විකුණා ඇති බව එම ප්‍රාදේශීය සභාවේම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු මන්ත්‍රී වයි.එම්. චමින්ද බණ්ඩාර මහතා පොලීසියට කළ ප්‍රකාශයත් සමග වහාම ක්‍රියාත්මක වූ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්.පී.බී. විජේසිරි මහතා ඇතුළු පොලිස් කණ්ඩායමක් විකුණා තිබූ වෙළෙඳසලෙන් එම ටයර් තොගය පොලිස් භාරයට ගෙන තිබිණි.

අදාළ ටයර් තොගය විකුණා ඇති අන්දම විමර්ශනයක් කිරීම සඳහා පැමිණිල්ල අදාළ පළාත් පාලන ආයතනයේ විගණන අංශයට යොමු කිරීමට පොලීසිය කටයුතු කරගෙන යයි.

මේ සම්බන්ධතේ සිය ෆේස්බුක් ගිණුමේ සටහනක් තබමින් කන්තලේ ප්‍රාදේශීය සභාවේ සභාපති සමන් ඒකනායක මහතා පැවසුවේ අදාළ ටයර් තොගය ටෙන්ඩර් පටිපාටියට අලෙවි කර තියෙන්නේ. මෙය ව්‍යාජ පුවතක්. මෙය තම විරුද්ධවාදීන් ද්වේෂ සහගතව කරන චෝදනාවක්. මගේ කීර්තිනාමයට හානි කිරීමේ යෙදී සිටින අයට ඉදිරියේදී ඒ අයට නිසි පිළිතුරු ලබා දෙනවා යැයි කීය.

■ නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

## හම්බන්තොට හේනකින් තුවක්කුවක් සොයා ගනී

හම්බන්තොට නාගර්වැව ප්‍රදේශයේ හේනක පැලක තිබී මෙරට නිශ්පාදිත බෙහෙත් කොටන අර්ධ ස්වයංක්‍රීය ගිනි අවියක් සමඟ පුද්ගලයකු සූරියවැව පොලිස් විශේෂ කාර්ය බළකා නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මෙරට නිශ්පාදිත ගිනි අවියක් හම්බන්තොට නාගර්වැව ප්‍රදේශයේ පිහිටි හේනක වාඩියක ඇති බවට ලද තොරතුරකට අනුව මේ වැටලීම සිදුකර ඇති අතර එහිදි ගිනි අවිය සමඟ වාඩියේ රැඳී සිටි එම ප්‍රදේශයේම පදිංචි 60හැවිරිදි පුද්ගලයකුද අත්අඩංගුවට ගෙන තිබේ.සිය ගොවිතැන වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා මේ ගිනි අවිය ළඟ තබාගත් බව සැකකරු විශේෂ කාර්ය බළකා නිලධාරින්ට පවසා ඇත.සැකකරු වැඩිදුර විමර්ශන කටයුතු සඳහා හම්බන්තොට පොලීසියට බාර දී තිබේ. විශේෂ කාර්ය බළකායේ හම්බන්තොට කලාප අණදෙන නිලධාරී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී විදුරනාත දිසානායක, සූරියවැව විශේෂ කාර්ය බළකා කඳවුරේ කඳවුරු අණදෙන නිලධාරී ප්‍රධාන පොලිස් පරික්ෂක සංජීව ප්‍රනාන්දු යන මහත්වරුන්ගේ උපදෙස් පරිදි පොලිස් පරික්ෂක අනුර රණසිංහ,උප පොලිස් පරීක්ෂක මිහිරංග,පොලිස් සැරයන් (53841)රත්නායක, පොලිස් කොස්තාපල් (79986)අධිකාරි,(21317) ලක්ෂාන්,(7611)බංඩාර යන නිලධාරින් එක්ව සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

■ රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

## බසයක් මතට පළු ගහක් කඩා ගෙන වැටිලා



වවුනියාව සෙට්ටිකුලම බස් නැවතුම්පළේ නවතා තිබූ ලංගම බස් රථයක් මතට විශාල පළු ගසක් ඉදිරී වැටීම නිසා බස් රථයට රුපියල් ලක්ෂ තුනක පමණ අලාභයක් සිදුව තිබේ. මේ දිනවල වවුනියාව ඇතුළු උතුරු පළාතට බලපා ඇති අධික සුළං සහිත තත්ත්වය නිසා මේ පළු ගස මුලින්ම ගැලවී බස් රථයේ වහලය මතට ඇද වැටී බස් රථය ගසට යට වී තිබේ. වවුනියාව ඩිපෝවට අයත් මේ ලංගම බස් රථය සෙට්ටිකුලම දක්වා ගොස් ආපසු පැමිණීමට නියමිත වේලාව පැමිණෙන තුරු බස් නැවතුම් පළේ නතර කොට තිබියදී මේ ගස කඩා වැටී තිබේ. මේ අනතුරෙන් කිසිදු අයකුට තුවාල සිදුව නොමැත.

■ නවරත්න සමරතුංග - දමන විශේෂ

## අම්පාරේ බිත්තර වී නිෂ්පාදනය ඉහළ මට්ටමක

සෞභාග්‍යා වැඩ සටහන යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ මේ මාස් කන්නයේදී ලියාපදිංචි බිත්තරවී නිෂ්පාදනය වෙනත් කන්නවලට වඩා උසස් මට්ටමින් සිදුකර ඇති බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වී විෂය පිළිබඳ විෂයානුබද්ධ නිලධාරී එච්.ඇම්.සිරිවර්ධන මහතා පැවැසීය.සෞභාග්‍යයේ දැක්ම බලාත්මක කරමින් මේ කන්නයේදී 'සෞභාග්‍යා'වැඩ සටහන යටතේ බිත්තර වී නිෂ්පාදනය සඳහා ගොවීන් දැඩි ලෙස උනන්දුවකින් කටයුතු කළ බවද විෂයානුබද්ධ නිලධාරීවරයා පැවැසීය. ඒ අනුව මේ වගා කන්නය සඳහා 'මූලික බීජ - නිෂ්පාදන වැඩ සටහන යටතේ විශේෂ වැඩ සටහන් ක්‍රියාත්මක කළ අතර බිත්තර වී කිලෝ පහලොස් දහසක් (15000) ගොවීන්ට නිකුත් කර ඇති බවද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (බීජ හා රෝපණ) අධ්‍යක්ෂ තුෂාර පෙරේරා මහතා 'දිනමිණ' ට පැවැසීය.

■ එස්.ජී.විජේරත්න - කටුගස්තොට සමූහ



## පේරාදෙණිය සරසවියෙන් දිනකට පීසීආර් 350ක් කරන්න පුළුවන් - උපකුලපති

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය තුළ දිනකට පී.සී.ආර් පරික්ෂණ 300ත් 350ත් අතර ප්‍රමාණයක් සිදුකළ හැකි බව උපකුලපති මහාචාර්ය උපුල් බී.දිසානායක මහතා පවසයි.

ඒ මහතා වැඩිදුරටත් පවසා සිටියේ පී.සී.ආර් පරික්ෂණ සඳහා ඇවැසි රසායනාගාර පහසුකම්,උපකරණ හා විශේෂඥයන් සිටින බවත් ජෛව සාම්පල් හා රසායනික ද්‍රව්‍ය ලැබෙනවා නම් ඕනෑම අවස්ථාවක මේ පරීක්ෂණ සිදු කිරීමට සූදානමින් සිටින බවත්ය. පී.සී.ආර් පරික්ෂණ සිදු කිරීමට සහයෝගය ලබාදෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාවෙන් ඉල්ලීමක් කර ඇති අතර ඒ අනුව ප්‍රතිපාදන කොමිසන් සභාවෙන් ඒ සම්බන්ධව අප වෙත කළ ඉල්ලීමේ ලිපියද තමන්ට පසුගිය 15 වැනිදා ලැබුණු බවද කුලපතිවරයා පැවැසීය. පසුගිය කොරෝනා සමයේද මෙසේ පී.සී.ආර්.පරික්ෂණ සිදු කිරීමට ඉල්ලීම් කළ බවත් ඒ අනුව සූදානම්ව සිටියත් එම උවදුර ක්‍රමයෙන් පහව ගිය නිසා පී.සී.ආර් පරික්ෂණ එම අවස්ථාවේ සිදු නොකළ බවද කුලපතිවරයා වැඩිදුරටත් පැවැසීය.

■ ආර්. ඇම්. කරුණාතිලක - උඩුබද්දාව සමූහ

## උඩුබද්දාව පෙර පාසල් ගුරුවරියන් 30කට ණය ප්‍රදානයක්



පෙර පාසල් ගුරුවරියන් සඳහා වූ පෙර ගුරු සවිය ණය වැඩසටහන යටතේ උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පෙර පාසල් ගුරුවරියන් 30 දෙනෙකු සදහා එම ණය මුදල් ප්‍රදානය කිරීම උඩුබද්දාව විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති සුමිත් දේශප්‍රිය පෙරේරා මහතා අතින් පසුගියදා උඩුබද්දාව සමුපකාර සමිති පරිශ්‍රයේදී සිදු කෙරිණ. වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ මඟ පෙන්වීම හා වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් මේ ණය වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. කොවිඩ් 19 හේතුවෙන්, සිය ආර්ථික ශක්තිය තර කර ගැනීමට අත්වැලක් අවශ්‍යව සිටි පෙර පාසල් ගුරුවරියන් වෙනුවෙන් මේ ණය වැඩ සටහන නිර්මාණය කර තිබිණි. 5%පොලී පදනම මත ගුරුවරියන්30 කට පමණ මේ ණය ප්‍රදානය කෙරිණ. මේ අවස්ථාවට උඩුබද්දාව විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරි දීපාල් දිග්වැල්ල,අධ්‍යක්ෂවරුන් වන අයි.කේ.එම්. ආර්. නවරත්න අයි. ජී. ළහිරු මිනෝත්,බැංකු සේවා කළමනාකරු එම්. ජී.ගීතානි චන්ද්‍රිකා, කළමනාකාර සහකාර චතුමි ලක්ෂිකා යන මහත්ම මහත්මීහු ද එක්ව සිටියහ.

■ සී. එම්. ආරියපාල - තඹුත්තේගම

## මහ කන්නයට ජලය නිකුත් කිරීම 25වැනිදා

මහවැලි එච් කලාපයේ මහ කන්නය සඳහා කලා වැවෙන් ජලය නිකුත් කිරීම ලබන 25 වැනිදා යෝධ ඇළ කොටසට සහ මහවැලි වම් ඉවුර කොටසට ජලය නිකුත් කිරීමටත් නොවැම්බර් 01 වැනිදා දකුණ ඉවුර කොටසට ජලය නිකුත් කිරීමටත් පසුගියදා තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ පැවැති කන්න රැස්වීමේදී තීරණය කරන ලදි.

මේ ව්‍යාපාර කළමනාකරණ කමිටුව එච් කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකාර අයි එම්. උභය කල්‍යාණ කුමාර මහතාගේ ප්‍රධානත්වයෙන් නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් වන කෘෂිකර්ම, ඉඩම්, පාලන, සංවර්ධන සහ තාක්ෂණ සේවා අංශයන් හී නිලධාරීහුද සහභාගි වූහ.

මේ අවස්ථාවට සහභාගි වූ ව්‍යාපාර කළමනාකරන කමිටුවේ සභාපති නේවාසික ව්‍යාපාර කළමනාකාර අයි.එම්. උභය කල්‍යාණ කුමාර මහතා සියලු දෙනාගේම අදහස් විමසමින් ජලපාලක ලේකම් කාර්යාලයේ මතය අනුවත් එළැඹෙන මාස් කන්නයේ වර්ෂාව බලාපොරොත්තුවෙන් ඉහත දින වකවානු තුළ ජලය නිකුත් කිරීමටත් තීරණය විය.

## ගලෙන්බිදුණුවැව විභාග මධ්‍යස්ථානවලට විෂබීජහරණ ද්‍රව්‍ය නෑ

ගලෙන්බිදුණුවැව ප්‍රදේශයේ අ.පො.ස (උ පෙළ) විභාගය පැවැත්වෙන පාසල් සඳහා කිසිදු විෂබීජහරණ ද්‍රව්‍යයක් හෝ උපකරණයක් ලබාදී නොමැති බව එම විභාගය සඳහා පෙනී සිටින සිසුන්ගේ මවුපියෝ කියති.එම විභාග මධ්‍යස්ථාන සඳහා පැමිණෙන සිසුන්ගේ දෑත් සේදීම සඳහා අවශ්‍ය වන සබන් පවා එම විභාග මධ්‍යස්ථාන භාර නිලධාරින්ට ඔවුන්ගේ පෞද්ගලික මුදලෙන් රැගෙන ඒමට සිදුවී ඇති බවද වාර්තා වේ. මේ සම්බන්ධයෙන් සොයා බලා උසස්පෙළ විභාගය පැවැත්වෙන පාසල් සඳහා විෂබීජහරණ ද්‍රව්‍යයද ලබා දීමට කටයුතු කරන මෙන් මවුපියෝ බලධාරීන්ගෙන් ඉල්ලා සිටිති.

## දිනමිණ දසත පුවතට ඇමැති මොහාන්ගේ ක්ෂණික ඇස





හික්කඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් වේනමුල්ල රෝහල් මාවතේ ( සීලින් ද සිල්වා මාවත) මාදම්පේ කුමාර කාශ්‍යප විද්‍යාලය අසල කොටස සුළු වර්ෂාවකදී පවා වර්ෂා ජලයෙන් යටවන බවත් එනිසා එම විද්‍යාලයට හා මාදම්පා මධ්‍ය විද්‍යාලයට මෙන්ම මාදම්පේ ග්‍රාමීය රෝහල වෙත යන රෝගීන්ට වර්ෂා ජලයෙන් යටවන මෙම ස්ථානය පසුකර යෑම අපහසු කාර්යයක් බවත් දින කිහිපයකට පෙර පෙන්වා දුන්නේය.

එම පුවත පළවී සතියක් ගතවීමටත් පෙර එකී මාර්ගය ගැන සොයා බැලීම සඳහා පොහොර නිෂ්පාදන හා සැපයුම් රසායනික පොහොර හා කෘමි නාශක භාවිත නියාමක රාජ්‍ය ඇමැති මොහාන් පී.ද. සිල්වා මහතා නිලධාරීන් පිරිසක් සමග එම ස්ථානයට පැමිණ මෙම මාර්ගය ඉතා කඩිනමින් ප්‍රතිසංස්කරණය කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දුන්නේය. හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂිකා එච්. ශ්‍රියානි මහත්මිය, හික්කඩුව නගර සභාවේ උප සභාපති මිනල් සෙම්බකුට්ටි, නගර සභා මන්ත්‍රී ප්‍රියන්ත වඩුගේ, රත්ගම ප්‍රාදේශීය සභා මන්ත්‍රී පියල් රන්ජන් යන මහත්වරු ද මෙහි සිටිති.

**ආර්. ඤාණදාස - අම්බලන්ගොඩ සමූහ**

# CSN නඩුවට යෝෂිත ඈඳන්න FCIDය මට බලපෑම් කළා

## අගමැති ලේකම් රොහාන් වැලිවිට

**රෝෂන් තුෂාර**

සී.එස්.එන්. නාලිකාවට එරෙහිව යහපාලන රජය සමයේ පැවරූ ද්වේශ සහගත නඩුවට හිටපු ජනපති පුත් ලුතිනන් යෝෂිත රාජපක්ෂ මහතා සම්බන්ධ කරන ලෙසට පොලිස් මූල්‍ය අපරාධ කොට්ඨාසය තමාට බලපෑම් කළ බව අග්‍රාමාත්‍ය මාධ්‍ය ලේකම් රොහාන් වැලිවිට මහතා දේශපාලන පළිගැනීම් විමර්ශන ජනපති කොමිසම හමුවේ සාක්ෂි දෙමින් ඊයේ (19) පැවැසීය.

විවිධ චෝදනා එල්ල කරමින් සී.එස්.එන්. අධ්‍යක්ෂ මණ්ඩලය සිරගත කළ යහපාලන ආණ්ඩුව, ක්‍රීඩා නාලිකාව පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයට පත් කර යෝෂිත රාජපක්ෂ මහතාව ද දින 45ක් සිරගත කළ බව හෙතෙම අනාවරණය කළේය.

යෝෂිත රාජපක්ෂ මහතා හා සී.එස්. එන්. නාලිකාව අතර කිසිදු සම්බන්ධයක් නොමැති බවත්, අඩුම තරමේ ආරම්භක සාකච්ඡාවකට හෝ රාජපක්ෂ මහතා සම්බන්ධ වී නොමැති බවත් පෙන්වා දුන් වැලිවිට මහතා, සී.එස්.එන්. නාලිකාව රාජ්‍ය හා පුද්ගලික බැංකු ණය ලබා ගැනීමෙන් ආරම්භ කළ බව ද පැවැසීය.

අග්‍රාමාත්‍ය මාධ්‍ය ලේකම් රොහාන් වැලිවිට මහතා සාක්ෂි දෙමින් මෙසේ ද පැවසීය.

මට පසුගිය රජය සමයේදී බලවත් අසාධාරණයක් සිදු වුණා. මට එරෙහිව යහපාලන රජය තුළින් දේශපාලන පළිගැනීම් සිදු වූ බවට මා මේ කොමිසමට පැමිණිලි කළා.

2015 මාර්තු සහ අප්‍රේල් මාසයේ සී.එස්.එන්. ආයතනය පාදක කරගෙන මට චෝදනා එල්ල කළා.

2011 මාර්තු මෙම CSN ආයතනය ලියාපදිංචි කර තිබෙනවා. මා එහි අධ්‍යක්ෂවරයා ලෙස ක්‍රියා කළා. මාස 3ක් මම එහි සේවය කළා. රජයේ තනතුරක් දරමින් පුද්ගලික ආයතනයක තනතුරක් දරන්න බෑ කියලා හිටපු ජනපති ලේකම්වරයා පැවසූ නිසා මා එයින් ඉවත් වුණා.

කුලුනු හතකට වඩා වැඩියෙන් තිබෙන නාලිකාවලට රුපියල් බිලියනයක බද්දක් අයකරනවා කියලා හිටපු මුදල් ඇමැති රවි කරුණානායක මහතා අය වැය ලේඛනයේ දී සඳහන් කළා. එහෙම බද්දක් ගෙවන්න බැරි නිසා අපි සේවකයන්ට වන්දි ගෙවා ඉවත් කළා.

කොමිසම - CSN ක්‍රීඩා නාලිකාවක් වුණේ කොහොමද?

සාක්ෂිකරු - ලංකාවේ ක්‍රීඩා නාලිකාවක අඩුවක් තිබුණා. අපිට ඒ වන විට කුලුනු 9ක් තිබුණා.

කොමිසම - එතකොට CSN ලියාපදිංචි කළේ ක්‍රීඩා නාලිකාවක් ලෙස ද නැත්නම් සාමාන්‍ය පරිදි ද?

සාක්ෂිකරු - සාමාන්‍ය ලියාපදිංචිය යටතේ

කොමිසම - එහෙමනම් කොහොමද ක්‍රීඩා නාලිකාවක් කියලා අය වැයෙන් මුදල් අය කරන්නේ?

සාක්ෂිකරු - එලෙස යෝජනා කළාට එය ක්‍රියාත්මක වුණේ නැහැ. නමුත් අපිට නාලිකාව පවත්වාගෙන යන්න දිගින් දිගටම බාධා කළ නිසා පවත්වාගෙන යාමට නොහැකි වුණා. අපි වරින් වර මූල්‍ය අපරාධ කොට්ඨාසයට කැඳවූවා. අපිට පමණක් නෙවෙයි ආයතන සේවකයින් පවා FCIDයට කැඳවූවා. මේ නිසා ආයතනය පවත්වාගෙන යාමට නොහැකි වුණා.

කොමිසම - FCIDයට කැඳවූයේ කුමන කරුණු පදනම් කරගෙන ද?

සාක්ෂිකරු - CSN පටන් ගැනීමේ මුදල් පිළිබඳ පැහැදිලිතාවයක් නැහැ කියලා.

කොමිසම - රජයේ මුදල් අවභාවිතා කිරීම ද?

සාක්ෂිකරු - මුලින් ඒ ගැන ඇහුවේ නැහැ. අධිකරණයට කරුණු ඉදිරිපත් කර තිබුණා. මාව FCIDයට කැඳවූයේ ඉරිදා දවසක, සවස 2.30 විතර වෙනකම් ප්‍රශ්න කළා. පැය දෙක තුනකට පසුව මට බලපෑම් කරන්න පටන් ගත්තා. ප්‍රධාන පොලිස් පරීක්ෂක රණසිංහ කියන අය මට ලේඛන වගයක් පෙන්නලා මුදල් විශුද්ධිකරණය ගැන මට පැහැදිලි කළා. ශ්‍රී ලංකා රජය මුදල් විශුද්ධිකරණ ගිවිසුමට අත්සන් කරලා තිබෙනවා. වරදට අහුඋණොත් වසර 20 සිර දඬුවම් ලැබෙනවා. ගැලවිලා යන්න නම් ඔවුන්ට ඕනා දේ කියන්න කියලා බලපෑම් කළා.

හිටපු ජනපති පුත් යෝෂිත රාජපක්ෂ මහතාගේ අනුදැනුම මත මෙම CSN පටන් ගත්තා කියලා කියන්න කිවුවා. ඔහුගේ මුදල් යෙදෙවුවා කියලා කියන්න බලපෑම් කළා.

කොමිසම - ඔබ කිවුවද?

සාක්ෂිකරු - මේ නාලිකාව ආරම්භ කළේ වෘත්තිකයෙක් ලෙස මමයි. යෝෂිත රාජපක්ෂ මහතා මෙහි සාකච්ඡාවකටවත් සහභාගී වෙලා නැහැ. මම ඇත්ත කිවුවත් කිසි කරුණක් ඔවුන් සටහන් කර ගත්තේ නැහැ.

එහෙත් FCIDයේ රණසිංහ හා සුදන්ත කියන නිලධාරීන් අපට නොහොබිනා විදිහට බැන වදිමින් ප්‍රකාශ ගන්න තැත් කළා.

ජනක රණතුංග මහත්තයාගේ නම පෙන්නලා "එතුමා යෝෂිත ගැන කිවුවනම් ඇයි මට කියන්න බැරි බබා වෙන්න හදන්න එපා" කියලා මට බැන වැදුනා. නමුත් ඔවුන් ජනක රණතුංග මහතාගේ ප්‍රකාශයක් මට පෙන්නුවේ නැහැ.

කොමිසම - ඒ කියන්නේ ඔවුන් ඔබව පෙලඹවීමක් කළා.

සාක්ෂිකරු - ඔව් ස්වාමීනි. මට බොරු සාක්ෂි දෙන්න බලපෑම් කළා.

2016 දී FCIDය මඟින් මාව අත්අඩංගුවට ගත්තා. එදින කවිශාන් දිසානායක මහතාව ද අත්අඩංගුවට ගෙන රැගෙන ආවා. නිශාන්ත රණතුංග, රවිනාත් ප්‍රනාන්දු යන අයත් අත්අඩංගුවට ගත්තා.

ඒ අවස්ථාව වන විට යෝෂිත රාජපක්ෂ මහතාගෙන් කට උත්තර ගන්නවා කියලා දැන ගත්තා.

කාල්ටන් ස්පෝට්ස් නෙට්වර්ක් ආයතනය ආරම්භයට මුදල් ලැබුණේ කොහොමද කියලා අනාවරණය නොවන නිසා අත්අඩංගුවට ගන්නවා කිවුවා.

කොමිසම - මුදල් ලැබුණේ කොහොමද?

සාක්ෂිකරු - රජයේ හා පුද්ගලික බැංකුවලින් ණය ලබාගෙන තිබුණා.

කොමිසම - CSN ආරම්භ කිරීමට මූල්‍ය පහසුකම් සපයාගත් ආකාරය දැක්වෙන බැංකු සටහන් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිනවා.

වැඩිදුර විභාගය ලබන 22 දිනට නියම කෙරිණි.

■ පී. සෝමරත්න - මීගහතැන්න සමූහ

# බේරුවල දහම් පහන ගමේ පවස නිවන්නටයි මේ සූදානම





බේරුවල දහම් පහන ගම ජල ව්‍යාපෘතියට රුපියල් මිලියන 33 ක් වෙන්කර වැඩ ආරම්භ කිරීමට කාන්තා ළමා සංවර්ධන, පෙර පාසල් ප්‍රාථමික අධ්‍යාපන පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහතා කටයුතු කළේය.

බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවුල් 5000 කට වඩා වැඩි පිරිසකට පානීය ජලය ලබාදෙන මෙම ජල ව්‍යාපෘතිය පසුගිය රජයන් දෙකක් යටතේ මුල් ගල් තබා , උත්සව පවත්වා ජනතාවට පොරොන්දු දී තිබුණද ප්‍රදේශයේ ජනතාව තවමත් පානීය ජලය සොයා සැතපුම් ගණන් දුර ගෙවා යති. බේරුවල ප්‍රදේශිය සභාවෙන් ලබාදී ඇති තාවකාලික ජල ටැංකි කීපයක් සහ එකම නළ ළිඳ ප්‍රදේශයේ ජනතාවගේ ජල ගැටළුවට තාවකාලික විසඳුම් බවට පත්ව ඇත.

කෙත්හේන ජල පවිත්‍රාගාරයේ සිට කොලොව්මෝදර දක්වා වූ ජල ව්‍යාපෘතියේ ගාලු පාරේ ප්‍රධාන බෙදුම් මාර්ගයේ 2009 වසරේදි වෙන් කරන ලද බෙදුම් මධ්‍යස්ථානයෙන් දහම් පහනගම උස් භූමියක ජල බෙදුම් ඒකකයක් ඉදිකර එමගින් අවට ගම්මානවල ජනතාවට ජලය බෙදාදීමට සැලසුම් කර ඇත.

■ එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක


## විදෙස් ගිනිඅවියක් සමඟ සැකකරු අසු වේ

විදේශ රටක නිෂ්පාදිත ගිනිඅවියක් සමග සැකකරුවකු හියාරේ කදුරුගස්හේන ප්‍රදේශයේ කැළෑවකදී ගාල්ල කොට්ඨාස දූෂණ මර්දන අංශය විසින් අත්අඩංගුවට ගෙන ඇත. සැකකරු කදුරුගස්හේනේ කැළෑවක සතුන් දඩයමට ගොස් සිටියදී මෙසේ අත්අඩංගුවට පත්ව තිබේ. 41 හැවිරිදි සැකකරු කදුරුගස්හේන ප්‍රදේශයේ පදිංචිකරුවකු බව අනාවරණයවී ඇත. සැකකරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

ගාල්ල කොට්ඨාස දූෂණ මර්දන අංශයේ ස්ථානධිපති දිනේෂ් නිශාන්තද සිල්වා මහතාගේ මෙහෙයවීම මත පොලිස් පරික්ෂක ජනක, උප පොලිස් පරික්ෂක වික්‍රමනායක, සැරයන්වරුන්වන- වික්‍රමසිංහ ( 33336) විජිත් ( 35163) කොස්තාපල්වරුන්වන ජීවන් ( 71351), අරුණ ( 73009) ,ගීතප්‍රිය ( 78728) ,පියබන්දු ( 81738) යන නිලධාරින් විසින් මෙම වැටලිම සිදු කොට ගිනිඅවිය සමග සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

■ සමන් එස්. රත්නායක - යටියන්තොට විශේෂ

## වහලෙ උඩින් හඳට ගිහින්



යටියන්තොට කබුළුමුල්ල ප්‍රදේශයේ නිවෙසක සරුවට වගා කර තිබූ ගංජා ගසක් සමග එම නිවසේ සිටි කාන්තාවක් සැකපිට අත්අඩංගුවට ගත් බව යටියන්තොට පොලීසිය පවසයි.

රහසිගතව වහලයේ වතුර ටැංකිය අසල වගා කර තිබූ මෙම ගංජා ගස අඩි 04 යි අගල් 02 ක් උස වූ බව පොලීසිය කියයි.

අත්අඩංගුවට ගත් වයස 39 ක් වූ සැකකාර කාන්තාව රුවන්වැල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. යටියන්තොට පොලීසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක එච්.ජී.එස්.පී.කේ. චන්ද්‍රසිරි මහතාගේ උපදෙස් පරිදි පොලිස් පරික්ෂක කුමාරසිංහ, පොලිස් සැරයන් (24110) රත්නප්‍රිය , ප්‍රජා සම්බන්ධීකරණ නිලධාරී සෙනරත් පුංචිහේවා යන නිලධාරීහු මෙම වැටලිමට සහභාගි වූහ.

■ එස්.ජී.විජේරත්න කටුගස්තොට සමූහ

## හෙරොයින් සමග දෙදෙනෙක් කොටු වෙයි

ලැබුණු තොරතුරක් මත සිදුකළ වැටලීමකින් පසුගියදා කටුගස්තොට 5 කණුව හා කුඩුගල අඹතැන්න ප්‍රදේශවලදී හෙරොයින් සමග පුද්ගලයන් දෙදෙනකු අත්අඩංගුවට ගෙන තිබේ. මෙසේ අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙදෙනා ගෙන් මුලින්ම අත්අඩංගුවට ගත් පුද්ගලයා සතුව හෙරොයින් මිලිග්‍රෑම් 85 ක් තිබී ඇත. අත්අඩංගුවට ගත් එම සැකකරුගෙන් පොලිසිය සිදුකළ ප්‍රශ්න කිරීම් වලින් පසු එම පුද්ගලයාට හෙරොයින් අලෙවි කළ බව පැවසෙන ජාවාරම්කරුවා අත්අඩංගුවට ගැනීමට හැකිව තිබේ. අත්අඩංගුවට ගත් ජාවාරම්කරුවා සතුව හෙරොයින් ග්‍රෑම් 01ක් තිබුණු බව පොලීසිය පවසයි.

■ බී.එම්.විජේසුරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

# අනුරපුර භික්ෂු සරසවියේ හිමිනමකට ගංජා පොවන්න හදලා

## 34 හැවිරිදි ජාවාරම්කරු අල්ලයි

අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලය ආසන්නයේ කේරළ ගංජා අලෙවි කිරීමේ ජාවාරමක නිරතවූ තරුණයකු කේරළ ගංජා කිලෝග්‍රෑම් දෙකකයි ග්‍රෑම් 66ක ප්‍රමාණයක් සමග අනුරාධපුර මූලස්ථාන පොලිසියේ මෙහෙයුම් අංශයේ නිලධාරින් විසින් සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ. අනුරාධපුර මූලස්ථාන පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක ඊ.එම් සංජීව මහනාම මහතාට ලැබුණු රහසිගත තොරතුරකට අනුව මෙහෙයුම් අංශයේ නිලධාරීන් පිරිසක් අනුරාධපුර මානමුනාවත්ත ඇනිකට් පාර අසල නිවසක් පරික්ෂා කිරීමේදී සැකකරු සමග ඉන්දියාවේ සිට නීතිවිරෝධීව මෙරටට රැගෙනා කේරළ ගංජා තොගය පොලිසියට හමුවී තිබිණි.

සැකකරුගේ බාල සහෝදරයකු මීට සති කීපයකට ඉහතදී අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍ය හිමිනමකට කේරළ ගංජා පැකට්ටුවක් අලෙවි කිරීමට උත්සහ කරද්දි පොලිස් අත්අඩංගුවට පත්වී මේවනවිට මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධයෙන් රක්ෂිත බන්ධනාගාර ගතව පසුවන බව පොලිසිය පවසයි. සැකකරුවන් ඉතා සූක්ෂමව ගංජා ගෙනවිත් නවක ශිෂ්‍ය භික්ෂූන් මතට හුරුකරවා ගැනීමට ගංජා පානය කිරීමට සලස්වමින් සිය ජාවාරම මෙහෙයවන බවත් අසල්වැසියන් ජාවාරම සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම පොලිසියට තොරතුරු ලබාදී ඇති බවත් පොලිසිය පවසයි.

■ කේ.ප්‍රියංකර කළුපහන - වනාතවිල්ලුව සමූහ

## තහනම් වල් නාශක තොගයක් නොරෝච්චෝලයෙන් අල්ලයි



නීති විරෝධී අයුරින් ඉන්දියාවේ සිට මුහුදු මාර්ගයෙන් රැගෙනවිත් ස්ථාන කීපයක සඟවා තිබූ ලක්ෂ හතරකට ආසන්න තහනම් ග්ලයිපෝසයිඩ් ඇමෝනියා පැකට් තොගයක් නාවික හමුදා බුද්ධි තොරතුරකට නොරෝච්චෝල පොලිසිය සිදුකළ වැටලීමකදී අත්අඩංගුවට ගෙන තිබුණි.

මෙම තහනම් නීති විරෝධී ග්ලයිෆොසෙට් ඇමෝනියා අඩංගු කරන ලද තහනම් වල් නාශකය මෙරට තුළ අලෙවිය හා භාවිතය තහනම් කර ඇති බව කියයි. පුත්තලම තම්බපණ්නී නාවික හමුදා කඳවුරේ බුද්ධි අංශයට ලැබුණ තොරතුරකට අනුව නොරෝච්චෝල පොලිසිය ආලංකුඩාව, නාවක්කාඩු හා පනිඅඩිය ප්‍රදේශ වල සිදු කළ වැටලිමකදී ග්‍රෑම් 100 බැගින් අඩංගු පැකට් 800 කට ආසන්න ප්‍රමාණයක් අත්අඩංගුවට ගෙන තිබු බව පොලිසිය කියයි. තහනම් වල් නාශකය කල්පිටිය ප්‍රදේශයේ වගා බිම් වල වල් නාශකයක් ලෙස භාවිතා කරන බවත් එක් පැකට්ටුවක් රුපියල් 400 කට අධික මිලකට අලෙවි කරන බව ද වැටලිමේදී අත්අඩංගුවට ගත් සැකකාර ව්‍යාපාරිකයෝ පවසති.

අත්අඩංගුවට ගත් අදාළ උග්‍ර විෂ සහිත වල් නාශක පැකට් මුහුදු මාර්ගයෙන් රහසේ රැගෙන එන බවද කියයි. මෙසේ මුහුදු මාර්ගයෙන් රැගෙන එන නීති විරෝධි දෑ අත්අඩංගුවට ගැනීමට නාවික හමුදාව බුද්ධි ඒකකයේ නිපධාරින් දැඩි කැපවීමක් කර තිබේ.

අත්අඩංගුවට ගත් ග්ලයිෆෝසෙට් ඇමෝනියා අඩංගු වල් නාශක පැකට් තොගය හා සැකකරුවන් තිදෙනා පුත්තලම අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිත බව පොලිසිය කියයි.

වැටලීම සඳහා නොරෝච්චෝල පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරික්ෂක සමග දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති එම්.එච්.එම්.එස් උෂාන්ත මහතා සමග පොලිස් සැරයන්වරුවන 47893 සුනිල්, 49545 විජේරත්න, පොලිස් කොස්තාපල්වරුන් වන 35395 රත්නායක , 76488 රස්මික, යන නිලධාරීන් වැටලිමට එක්ව තිබුණි.

■ විජිත සල්ගාදු - අකුරැස්ස මධ්‍යම විශේෂ

## වැසී ගිය දේශීය කර්මාන්ත යළි නංවන්න පියවර



මාතර දිස්ත්‍රික්කයේ වැසී ගිය දේශීය කර්මාන්ත යළි නගා සිටුවීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සාකච්ඡාවක් පාර්ලිමේන්තු මන්ත්‍රී හා මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති නිපුණ රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරයේදී සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් මෙම විශේෂ සාකච්ඡාව පැවැති අතර සමුපකාරය යටතේ පවතින දේශීය අත්යන්ත්‍ර රෙදි පිළි කර්මාන්තය සහ වැසී ගිය අනෙකුත් කර්මාන්ත නගාසිටුවිය යුතු අන්දම පිළිබඳ සහ මාතර දිස්ත්‍රික්කය තුළ නව කර්මාන්ත ආරම්භ කිරීම කෙරෙහිද අවධානය යොමු කෙරිණි.

මාතර අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) නිශාන් පතිරණ මහතා ඇතුළු ආයතන ප්‍රධානීන් රැසක් මෙම අවස්ථාවට එක්වූහ. මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ක්‍රම සම්පාදන අංශය සාකච්ඡාව සංවිධානය කර තිබිණි.

■ ප්‍රියදර්ශනී කහවල - ඉංගිරිය මධ්‍යම සමූහ

## ඉංගිරිය රෝහලත් කොරෝනා මධ්‍යස්ථානයක්

කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් වශයෙන් වැඩිදියුණු කර ඇති ඉංගිරිය රෝහලට ප්‍රතිකාර සඳහා කොරෝනා රෝගීන් 20ක් ඇතුළත් කර ඇති බවත්, ඒ සම්බන්ධයෙන් ඉංගිරිය ප්‍රදේශවාසීන් කිසිදු අනියත බියක් ඇති කරගත යුතු නැති බවත් ඉංගිරිය පොලීසිය පවසා සිටී.

ඇතුළත් කර ඇති සියලු රෝගීන් පිරිමි අය වන අතර, ඔවුන්ගෙන් අසාධ්‍ය තත්ත්වයේ සිටි අයෙක් අයි.ඩී.එච්. රෝහල වෙත යවා ඇත. කාන්තා රෝගීන්ද ඇතුළත් කිරීම සඳහා මේ වනවිට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතින අතර, රෝහලේ කටයුතු සාමාන්‍ය පරිදි සිදුකෙරන බවත්, බාහිර රෝගී අංශය වෙත පැමිණෙන රෝගීන් රෝගී තත්ත්වයේ අවශ්‍යතාවය අනුව සළකා බලා හොරණ සහ පාදුක්ක රෝහල් වෙත යැවීමට කටයුතු කරන බවත් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් රෝහල් ප්‍රකාශකයෙක් පැවසීය.

■ පී.එස්.තැලිගම - කිරිඳිවැල සමූහ

## හදිසි වැටලීමකින් මත් සැකකරු අල්ලයි



දොම්පෙ පොලිස් වසමේ ගුරුවල ප්‍රදේශයේ කසිප්පු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යන බවට දොම්පෙ පොලීසියට ලැබුණු තොරතුරක් අනුව කරන ලද හදිසි වැටලීමකදී එක් සැකකරුවකු සමග පොළව යට සඟවා තිබූ කසිප්පු බෝතල් 120 ක් සහ කසිප්පු පෙරීමට උපයෝගී කර ගන්නා ලද උපකරණ අත්අඩංගුවට ගැනීමට හැකි වී ඇත.

ඒ අතර ගෝඩා බැරල් 10 ක්, ගෑස් ලිප් 02 ක්, තඹ දගර 02 ක්, ගෑස් සිලින්ඩර 03 ක් අත්අඩංගුවට ගෙන තිබේ.

දොම්පෙ පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පො.ප. පී.ජී.එච්. ආර්.සංජීව මහතා ඇතුළු උප පො.ප.එදිරිසිංහ, උ.පො.ප.කරුණාරත්න, පො.සැ.9571 නන්දසේන, පො.කො.94466 තරිඳු, පො.කො.95953 ගුණවර්ධන, පො.කො.රි.20163 චන්ද්‍රසේන යන පොලිස් කණ්ඩායම් මෙම වැටලීම සිදු කර ඇත.

■ බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## හඳට ගිහින් ගණ දෙවියෝත් බලන්න ගිහින්

අනුරාධපුර පොලිස් නිල නිවාස ඉදිරිපිට පිහිටි ගණදෙවි පිළිමගෙය කඩා නිරුවතින් ඒ තුළ උමතුවෙන් හැසිරීමේ චෝදනාවට අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ අවිවාහක තරුණයාට ඇප දෙන ලෙස අධිකරණයෙන් කළ ඉල්ලීම තරයේ ප්‍රතික්ෂේප කරමින් ඔහු රක්ෂිත බන්ධනාගාර ගතකරන ලෙස අනුරාධපුර අතිරේක මහේස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු එන්. ටී.හේමන්ත පුෂ්පකුමාර මහතා නියෝග කළේය.

කිසියම් පුද්ගලයකු නිරුවතින් පැමිණ ගණදෙවි පිළිමගෙයට හානි පමුණුවන බවට පොලිස් හදිසි ඇමතුම් අංශයට ලැබුණු ඇමතුමකට අනුව අනුරාධපුර මූලස්ථාන පොලිසියේ නිලධාරීන් එහි ගොස් සැකකරු අත්අඩංගුවට ගෙන තිබුණි. ඔහු උමතුව දොඩවමින් කලහකාරීව හැසිරීම නිසා මත්ද්‍රව්‍ය නොමැතිව උමතුවූවකු බවට පොලිසිය ඒ අවස්ථාවේ සැකපහළ කළත් ඔහු මානසික වෛද්‍ය ප්‍රතිකාර ලබාගන්න තරුණයකු බව පොලිසිය පසුව තහවුරු කරගෙන ඇත.

සැකකරු නිරුවතින් පිළිමගෙයට ඇතුළු වී එහි පිළිමය පිටතින් තබා ඒතුළටවී උමතුවෙන් දොඩවමින් පොලිස් නිලධාරින්ට වීදුරු කැබලි වලින් පහරදී තිබුණු අතර වීදුරු කැබල්ලක් හිසේ වැදුණු එක් පොලිස් කොස්තාපල්වරයෙක් සුළු තුවාල ලබා තිබුණි. සැකකරුගේ පෙම්වතිය කියන තරුණියක එම ස්ථානයට පැමිණ ඔහු පිළිමගෙයින් පිටතට ගැනීමට දැඩි උත්සාහයක නිරතවූවත් එම උත්සාහය අසාර්ථකවු අතර ඇයත් පොලිස් නිලධාරින්ට ප්‍රතිරෝධය දැක්වීම නිසා අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත.

■ ඒ.පි.දයාචන්ද්‍ර උඟුරුබොක්ක විශේෂ

## දුම් කොළ 2කට වසරක සිර දඬුවම්

මාතර මහේස්ත්‍රාත් අධිකරණය පැවැත්වෙමින් තිබියදී නීති විරෝධී ලෙස විත්ති කූඩුවේ සිටී සිරකරුවකුට පිටතින් පැමිණි පුද්ගලයකු විසින් පාර්සලයක් ලබාදීමේදී බන්ධනාගාර නිලධාරීන් විසින් එම පුද්ගලයා අත්අඩංගුවට ගෙන විත්ති කූඩුවේ සිටි සිරකරුට ලබාදීමට උත්සාහ කළ පාර්සලය පරික්ෂා කිරීමේදී එම පාර්සලයේ දුම්කොළ දෙකක් තිබී සොයාගෙන ඇති අතර බන්ධනාගාර නිලධාරින් විසින් අත්අඩංගුවට ගත් සැකකරු අධිකරණ පොලිස් නිලධාරින්ට භාර දීමෙන් අනතුරුව අධිකරණ පොලිස් නිලධාරින් විසින් සැකකරුට විරුද්ධව චෝදනා ගොනුකර පසුගියදා මාතර ප්‍රධාන මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු ඉසුරු නෙත්ති කුමාර මහතා වෙත ඉදිරිපත් කළ අවස්ථාවේ දුම්කොළ දෙකක් ලබාදුන් සැකකරුට වසර එකක බරපතළ වැඩ ඇතිව සිර දඬුවමක් නියම කෙරිණි.

■ හැටන් මධ්‍යම වීශේෂ

## වල් ඌරකු සමඟ තිදෙනකු අල්ලයි

හැටන් දික්ඔය ප්‍රදේශයේදී හක්ක පටස් යොදා මරා ත්‍රිරෝද රථයකින් රැගෙන යමින් සිටි වල් ඌරෙක් සමඟ පුද්ගලයන් තිදෙනකු හැටන් පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

මේ පිළිබඳ කරන ලද විමසීමකදී අදහස් දැක්වූ හැටන් මූලස්ථාන ප්‍රධාන පොලිස් පරික්ෂක පි. ඩබ්ලිව්. එස්. බී. පලිපාන මහතා පවසන ලද්දේ දික්ඔය වනරාජ ප්‍රදේශයේ කරන ලද රථ වාහන පරික්ෂාවකදී ත්‍රිරෝද රථයකින් රැගෙන යමින් සිටි මරණ ලද වල් ඌරකු සමග පුද්ගලයන් තිදෙනකු අත්අඩංගුවට ගත් බවත්ය. මෙසේ අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන් අතරින් ත්‍රිරෝද රථයේ රියදුරු බීමත්ව සිටි බවත් එමෙන්ම මේ පිළිබඳ කරන ලද පරික්ෂණ වලදි මෙම පුද්ගලයන් හක්ක පටස් යොදා මෙම වල් ඌරා මරා ඇති බවට කරුණු අනාවරණය වු බවද ඔහු පැවසීය. මෙසේ අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හැටන් දිසා හා මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට පියවර ගන්නා බවත් මෙයට සම්බන්ධ අදාළ ත්‍රිරෝද රථ රියදුරුට බීමත්ව රිය පැදවීම යටතේ වෙනම චෝදනාවක්ද ඉදිරිපත් කරන බවත් පලිපාන මහතා වැඩිදුරටත් පැවසීය.

■ නවරත්න සමරතුංග - දමන විශේෂ

# සංස්කෘතික ගොඩනැගිල්ල කැලෑවෙන් එළියට ගනිමු ද?



අම්පාර උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උහන නාගරික ප්‍රාදේශයේ දැනට වසර හතරකට පමණ පෙර ඉදිකිරීම් ආරම්භ කළ සංස්කෘතික ගොඩනැගිල්ලක් මේ වන විට ලඳු කැලෑවකින් වැසීගොස් ඇති බව ප්‍රදේශවාසීහු පවසති. මේ සම්බන්ධව උහන ප්‍රාදේශීය ලේකම් අජන්තා කුමාරි මහත්මියගෙන් 'දිනමිණ' කළ විමසීමේදී පැවසුවේ මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම සඳහා විවිධ බාධක මැද මෙම ඉඩම ලබාගෙන 2016 වසරේදී ඉදිකිරීම් ආරම්භ කළ බවය. මේසඳහා මිලියන හැටක පමණ ප්‍රතිපාදන යෙදවීමෙන් පසුව ආණ්ඩු මාරුවීමත් සමග ඉදිකිරීම් නතරවී තිබෙන බවත් ඒසඳහා තවත් මිලියන හතළිහක් අවශ්‍ය බවද ප්‍රාදේශීය ලේකම්වරිය සඳහන් කළාය.

අම්පාර දිසපති තුමාගේ අධීක්ෂණය මත අම්පාර කච්චේරියේ ඉංජිනේරු අංශය මඟින් මෙහි ඉදිකිරීම් ආරම්භ කළ අතර අවශ්‍ය ප්‍රතිපාදන ඉදිරි කාලයේදී සංස්කෘතික අමාත්‍යාංශයෙන් ලබාදෙනු ඇති බවද ඇය පැවසුවාය.

# බදියුදීන්ට ඇති බරපතළ චෝදනා ගැන විමර්ශනය කරන්න

## ජානිපෙ ජාතික සංවිධායක ජයන්ත සමරවීර

**චන්දිමා කරුණාරත්න**

රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීවරයාට එරෙහි මුදල් අවභාවිත චෝදනාවට සීමා නොවී පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයට අදාළව ඔහුට එරෙහි බරපතළ චෝදනා පිළිබඳ විමර්ශන වහාම ඇරඹිය යුතු බව ජාතික නිදහස් පෙරමුණේ ජාතික සංවිධායක, රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර මහතා ඊයේ (19) පැවසීය.

රිෂාඩ් බදියුදීන් මහතාට මරාගෙන මැරෙන ත්‍රස්තවාදීන්ට අනුබල දීම ඇතුළු බරපතළ චෝදනා තිබිය දී ඡන්දදායකයන් ප්‍රවාහනයට රාජ්‍ය මුදල් අවභාවිත කිරීම වැනි චෝදනාවකට අද අත්අඩංගුවට ගෙන ඇති බවත් එය හරියට 'ස්ත්‍රියක් දූෂණයක් සිදු කොට ඇය මරා දමා නිදැල්ලේ සිටින චූදිතයකු කෙසෙල් කැනක් සොරකම් කිරීමට අත්අඩංගුවට ගැනීම' වැන්නක් බවත් සමරවීර මහතා පෙන්වා දුන්නේය.

ජාතික නිදහස් පෙරමුණ කාර්යාලයේදී ඊයේ (19) පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින් රාජ්‍ය ඇමැතිවරයා මේ බව ප්‍රකාශ කළේය.

අවතැන්වූවන් නැවත පදිංචි කිරීමට අදාළ අරමුදලක් අවභාවිත කරමින් පුත්තලමේ සිට මන්නාරමට ඡන්දදායකයන් ප්‍රවාහනය කිරීමට අදාළ චෝදනාවකට අද දිනයේ රිෂාඩ් බදියුදීන් හිටපු අමාත්‍යවරයා අත්අඩංගුවට ගෙන ඇතත් පාස්කු ඉරිදා මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාරයට අදාළව සහ ඉස්ලාම් අන්තවාදය ව්‍යාප්ත කිරීමට අදාළව බරපතළ චෝදනා ඔහුට එරෙහිව ඇති බව ජයන්ත සමරවීර අමාත්‍යවරයා සිහිපත් කළේය.

පාස්කු ඉරිදා මරාගෙන මැරෙන ත්‍රස්තවාදී ප්‍රහාරයට සම්බන්ධ අයකු නිදහස් කරගැනීමට හිටපු යුද හමුදාපති මහේෂ් සේනානායක මහතාට බලපෑම් සිදු කිරීම, සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ මරාගෙන මැරුණු බෝම්බකරු - ඉන්ෂාෆ් අහමඩ් නැමැත්තාට අයත් බෝම්බ නිපද වූ තඹ කර්මාන්ත ශාලාවට තම විෂය පථය යටතේ පැවැති ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය හරහා විශාල වට්ටම් සහිතව තඹ අබලි ද්‍රව්‍ය ලබා දීමට එම ආයතනයේ අලෙවි අධ්‍යක්ෂට බලපෑම් කිරීම ආදිය මේ වන විට රිෂාඩ් බදියුදීන් අමාත්‍යවරයාට එරෙහි සාක්ෂි ලෙස 'පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් පිහිටුවා ඇති ජනාධිපති විමර්ශන කොමිසම' හමුවේ ඉදිරිපත්ව ඇති බවත් ඉහත කරුණු 2020 ජූනි මාසයේ දී පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා විසින් රට හමුවේ තැබූ රිෂාඩ් බදියුදීන්ට එරෙහි සාක්ෂි බවත් ඒ මහතා වැඩිදුරටත් සිහිපත් කළේය.

එසේම රිෂාඩ් බදියුදීන්ගේ සොයුරු රියාජ් බදියුදීන් විසින් සහරාන් නැමැති ත්‍රස්තවාදියා ඉන්දියාවට යැවීම, මරාගෙන මැරෙන ත්‍රස්තවාදීන්ට ප්‍රවාහන පහසුකම් සැපයීම යන පාස්කු දින ත්‍රස්ත ප්‍රහාරය පිළිබඳව සොයා බලන ජනාධිපති කොමිසම හමුවේ අනාවරණය වී ඇති අපරාධ සිදු කොට ඇත්තේ තම සොයුරාගේ එනම් එවකට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන්ගේ පෞද්ගලික ලේකම් ලෙස සිය බලය අයුතු ලෙස යොදා ගෙන බව ද මෙහි දී ජානිපෙ ජාතික සංවිධායකවරයා අනාවරණය කළේය.

මෙවැනි බරපතළ ත්‍රස්තවාදී ක්‍රියා හා ඒවාට අනුබල දීම පිළිබඳව සාධාරණ පරීක්ෂණයක් සිදු නොවුණු හෙයින් යහපාලන ආණ්ඩුව ගෙදර යවා, මෙරට 69 ලක්ෂයක ජනතාවක් ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් ජනාධිපති ධුරයට පත් කළ බවත් ඉන් නොනැවතී තුනෙන් දෙකක බලය සහිත ආණ්ඩුවක් නිර්මාණය කර දුන් බවත් පැවසූ ජයන්ත සමරවීර මහතා ඒ බව අමතක කිරීමට වත්මන් ආණ්ඩුවට කිසිසේත්ම නොහැකි බව ද වැඩිදුරටත් සඳහන් කළේය.

රිෂාඩ් බදියුදීන්, රවුෆ් හකීම්, හිස්බුල්ලා වැනි මුස්ලිම් නායකයන් බලයට පත්වන සෑම ආණ්ඩුවකම ඇමති ධුර දරමින් සිදු කළේ සාමාන්‍ය මුස්ලිම් ජනතාව උගසට තබමින් රාජ්‍ය බලය යොදා ගනිමින් ඉස්ලාම් අන්තවාදය පෝෂණය කිරීම බව ද ඒ මහතා පෙන්වා දුන්නේය. ඒ නිසා ඉස්ලාම් අන්තවාදය, දෙමළ බෙදුම්වාදී අන්තවාදය මෙන් බාහිරව නොවැඩී රාජ්‍ය අනුග්‍රහය යටතේ ශක්තිමත් වූවක් බව සිහියේ තබා ගත යුතු බවත් අද රිෂාඩ් හා හකීම්ලා තම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 'ස්වාධීන' කරවා ආණ්ඩුව තුළට එවීමට හදන්නේ ඉහත කී අන්දමින් තම අන්තවාදී උවමනාවට රාජ්‍ය අනුග්‍රහය ලබා ගැනීමට බවත් රාජ්‍ය අමාත්‍යවරයා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

ඒ නිසා දෙමළ බෙදුම්වාදී අන්තවාදයට සහ ඉස්ලාම් අන්තවාදයට එරෙහිව ලැබී ඇති ජනවරමට පිටු නොපා කටයුතු කිරීම වත්මන් ආණ්ඩුවේ පරම වගකීමක් බව ද ජයන්ත සමරවීර මහතා වැඩිදුරටත් අවධාරණය කළේය.

මෙම මාධ්‍ය හමුවට ජානිපෙ දේශපාලන මණ්ඩල සභික, නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නිමල් පියතිස්ස මහතා ද එක්ව සිටියේය.

# 20 විවාදයට අතිරේක පැය 10ක්

## ඇමැති, මහාචාර්ය ජී එල් පීරිස්

**චන්දිමා කරුණාරත්න**



20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන විවාදය සඳහා අතිරේක පැය දහයක් ලබාදීමට ආණ්ඩුව එකඟවී තිබෙන බව පොදුජන පෙරමුණේ සභාපති, අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී එල් පීරිස් මහතා ඊයේ (19) ප්‍රකාශ කළේය.

ඒ මහතා මෙම අදහස් පළ කළේ පොදුජන පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේ ඊයේ (19) පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

20 වන ව්‍යවස්ථා සංශෝධනය විවාද කිරීම සඳහා පාර්ලිමේන්තුවේ 21 හා 22 දෙදින පුරා පැවැත්වීමට ආණ්ඩු පක්ෂය කටයුතු යොදා ඇති අතර ආහාර විවේකය ද අහෝසිකර පාර්ලිමේන්තු විවාදය සවස 7.30 දක්වා පැවැත්වීමට තීරණය කර තිබෙන බව ද පීරිස් මහතා අනාවරණය කළේය.

බ්‍රහස්පතින්දා සවස 7.30 වන විට අවසන් ඡන්දය ලබාගැනීමට බලාපොරොත්තු වන බව ද අධ්‍යාපන ඇමැතිවරයා ප්‍රකාශ කළේය.

19 වන සංශෝධනය සඳහා එදා යහපාලන රජය ලබාදුන්නේ දවස් දෙකක විවාදයක් බවත් ඒ ක්‍රමවේදයම අනුගමනය කරමින් , ඉතාම සාධාරණ ආකාරයට 20 වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් දවස් දෙකක විවාදයක් පැවැත්වීමට රජය තීරණය කළ බවත් හෙතෙම කීවේය.

20වන ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් දෙවැනි වර කියැවීමේදී තුනෙන් දෙකක බහුතරයක් ගන්න පුළුවන් කියා රජය දැඩි ලෙස විශ්වාස කරන බවත්, කමිටු අදියරෙන් පසුව , තුන්වැනි වර කියැවීමේදී ද තුනෙන් දෙකක බලයක් රජයට පැහැදිලිවම ලැබෙනු ඇතැයි ද පීරිස් මහතා විශ්වාසය පළ කළේය.

ශ්‍රේෂ්ඨාධිකරණය යම් කිසි සංශෝධනයක් යෝජනා කර තිබේ නම් ඒ සංශෝධනවලට රජය එකඟවන බවත් ජනමත විචාරණයට යන කිසිදු කරුණක් එකතු කර නොමැති බවත් ඇමැතිවරයා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

# ගාල්ල බූස්ස බන්ධනාගාරය අධිආරක්ෂිත වෙයි

**කරන්දෙණිය සමූහ**
**අනුරාධ ප්‍රියදර්ශන**

ගාල්ල බූස්ස බන්ධනාගාරය ශ්‍රී ලංකාවේ ප්‍රථම අධිආරක්ෂිත බන්ධනාගාරය ලෙස නිල වශයෙන් ආරම්භ කිරීම බන්ධනාගාර කොමසාරිස් ජෙනරාල් තුෂාර උපුල්දෙණිය මහතා විසින් පසුගිය 18 වැනි දින නාම පුවරුව නිරාවරණය කිරීමෙන් සිදු කරන ලදී. මෙහිදී කොමසාරිස්වරයා විසින් බන්ධනාගාර නිලධාරීන් සඳහා නේවාසිකාගාරයක් ද විවෘත කරන ලදී.

ලංකාවේ සංවිධානාත්මක අපරාධකරුවන් බහුතරයක් රඳවා සිටින මෙම බූස්ස බන්ධනාගාරය අධිආරක්ෂිත බන්ධනාගාරයක් බවට පත්කිරීමෙන් අනතුරුව එහි ආරක්ෂාව පොලිස් විශේෂ කාර්ය බළකාය වෙත ලබාදී ඇත. මෙම බන්ධනාගාරයට පිවිසෙන සියලුම නිලධාරීන් හා මහජනයා විශේෂ පරීක්ෂාවට ලක් කරන බව විශේෂ කාර්ය බළකාය පවසයි.

# පාරම්පරික කලා ශිල්පීන් ගැන අසේලගේ කෘතිය අනාගත පරපුරට ඉතා වැදගත්

## ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ නිලංග දැල



**ඉන්ද්‍රාණී තෝරදෙනිය**

මේ රට ලෝකයේ ඉහළට ඔසවා තැබීමට පාරම්පරික කලා ශිලපීන්ගෙන් ඉතා විශාල සේවාවක් ඉටුවන බවත්, ඔවුන් වෙනුවෙන් මාධ්‍යවේදී අසේල කුරුළුවංශ විසින් රචිත 'දිව්දොස්ගල උරුමක්කාරයෝ' කෘතිය අනාගත පරපුරට ඉතා වැදගත් කෘතියක් බවත් ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ නිලංග දැල මහතා 'දෙව්දොස්ගල උරුමක්කාරයෝ' නමැති කෘතිය දොරට වැඩීම නිමිත්තෙන් පැවති උත්සවයේදී පැවසීය.

එම උත්සවය පසුගියදා (17) පස්වරුවේ ශ්‍රී දළදා මාලිගාවේ බහුකාර්ය ගොඩනැගිලි ශ්‍රවනාගාරයේදී පැවත්විණි. එහිදී දියවඩන නිලමේවරයා මෙසේද පැවසීය.

අපේ පාරම්පරික නැටුම් ශිල්පීන් ඇතුළු කලාකරුවන් ඉතා ඈත අතීතයේ පටන් මේ රට වෙනුවෙන් සුවිශාල සේවාවක් ඉටු කර තිබෙනවා. මේ තුළින් අප රටට මහත් ගෞරවයක් අභිමානයක් ගෙන දි තිබෙනවා. ශ්‍රී දළදා පෙරහර එදා සිට අද දක්වා අඩුවක් නැතුව සම්පුර්ණ වී ලෝකය බබලවන උත්සවයක් බවට පත් වීමේ ගෞරවය මේ ශිල්පීන්ට හිමිවිය යුතුයි. දැඩි ගෞරව අභිමානයෙන් යුතුව තම ජිවිත කාලයම කැප කරමින් ඒ සේවාව ඉටු කරනු ලබනවා. පරම්පරාවෙන් පරම්පරාවට මෙම ශිල්පීය ඥානය රැගෙන ඒමට තම දරුපරපුර ඒ සඳහා යොමු කිරීම ද අපි අගේ කළ යුතුයි. එසේ නොවන්නට අද අපිට මේ කලාකරුවන්ගේ ශිල්පයේ රසාස්වාදය විඳින්න ලැබෙන්නේ නෑ.

දියුණුවන ලෝකයත් සමඟ තරුණ පරපුර නොයෙක් ක්ෂේත්‍ර කරා යොමු වෙනවා. වැඩි ආදායමක් කරා යොමු වෙනවා. සමාජය තුළ එවැනි තත්ත්වයක් තිබියදී මෙම කලා ශිල්පීන් දු දරුවන් රට වෙනුවෙන් මෙම කාර්යයට යොමුකර තිබීම ඉතාම වැදගත්. අපි ඒ සඳහා අපේ ගෞරවය ඔවුන්ට පුද කළ යුතුයි.

පරම්පරාවෙන් පරම් පරාවට පැවත එන මෙම කලාකරුවන් ගැන වදනක් ලියා තැබීම ඉතා වැදගත්. තරුණ මාධ්‍යවේදියෙක් වන අසේල කුරුළුවංශ මහතා තම පෑන් තුඩ ඔවුන් වෙනුවෙන් යොමුකර ඉතා වටිනා කෘතියක් රචනා කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම මෙය කාලෝචිත මෙන්ම ඉතාම වැදගත් කටයුත්තක්. මේ කෘතිය සඳහා සුසන්ත සූරසේන මහතා ලබා දී ඇති සුවිශේෂී දායකත්වය මෙම කලාකරුවන් වෙනුවෙන් කරන ලද සුවිශේෂ ඇගයීමක්. මේ දෙදෙනාටම අපේ ගෞරව ආදරය හිමිවිය යුතුයි.

අනාගත පරපුරට මෙම ශිල්පීය පරම්පරාවන් ගැන අවබෝධයක් ලබා ගැනීමට මේ කෘතිය ඉතා වැදගත් වෙනවා. ඉගෙනුම ලබන දු දරුවන්ටද ඉතා වැදගත් වු කෘතියක්. මට අද ඉතාම කාර්ය බහුල දිනයක් වුවත් ඒ සියල්ල පසෙකලා මම මේ අවස්ථාවට සහභාගි වුයේ මෙම කෘතියේ ඇති වටිනාකමත්, මේ ශිල්පීන්ට කරන මගේ ගෞරවයක් සහ යුතුකමක් හැටියට යැයිද දියවඩන නිලමේ නිලංග දැල මහතා පැවැසීය.

මෙහිදි පාරම්පරික නැටුම් ශිල්පීන් දහ අට දෙනකුට සමරු උපහාර තිලින පිරිනැමීමද නිලමේවරයා අතින් සිදු කෙරිණි.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තිලක් ඒකනායක, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනි මාධවී හේරත්, රාජ්‍ය නිලධාරීන්, මාධ්‍යවේදීන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගි වුහ.

# මහේස්ත්‍රාත් නිල මැදිරිය ආසන්නයට බදියුදීන් වාහනයකින් රැගෙන ඒම ගැන පරීක්ෂණයක් කරන්න

**සුභාෂිණී සේනානායක**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමට රැගෙන පැමිණි සැකකාර රිෂාඩ් බදියුදීන් මහතා අධිකරණයට ගෙන ආ අවස්ථාවේ මහේස්ත්‍රාත්වරයාගේ නිල මැදිරිය ආසන්නයට ඔහු රැගෙන පැමිණි වාහනය රැගෙන ඒම සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කර අධිකරණයට වාර්තා කරන ලෙසට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති වරයාට කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (19) නියෝග කළේය.

එසේම එම විශේෂ ආවරණය ලබා දුන් නිලධාරියා හෝ නිලධාරීන් කවුද යන්න ඉදිරි දින අධිකරණයට වාර්තාවක් මඟින් ඉදිරිපත් කරන ලෙසට ද මහේස්ත්‍රාත්වරයා නියෝග කර සිටියේය.

මහේස්ත්‍රාත්වරයා මෙම නියෝගය සිදු කළේ සැකකරු රැගෙන පැමිණි වාහනය නිල වාහනය තිබෙන ස්ථානයට ගෙනැවිත් ආවරණ සහිතව අධිකරණයට ඉදිරිපත් කළ බවට අධිකරණයට දැනුම් දීමෙන් අනතුරුවය.

එක් අයකුට එක් සැලකිල්ලක් යම් අයකු කරනවා නම් එයට විරුද්ධ විය යුතුයි. මෙම කරුණ සැළ කර සිටින්නේ සැක කරුට එරෙහිව නෙවෙයි.

# විස්සේ කරුණු කිහිපයක් නැවත සලකා බලන්න

## මන්ත්‍රී නීතිඥ ප්‍රේමනාත් සී. දොළවත්තගෙන් අගමැතිට ලිපියක්

**පහන් විජේසේකර**

විසි වැනි ව්‍යවස්ථා සංශෝධනය තුළ අමාත්‍ය ධුර සංඛ්‍යාව වැඩි කිරීම,විගණනය සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන ඉවත් කිරීම, හදිසි පනත් කෙටුම්පත් ගෙන ඒම යනාදී කරුණු සම්බන්ධයෙන් නැවත සලකා බලන්නැයි පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ ප්‍රේමනාත් සී. දොළවත්ත මහතා විසින් ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයා වෙත ලිපියක් යොමු කරමින් පවසයි.

ජනතා නියෝජිතයෙකු ලෙස 20 වැනි ව්‍යවස්ථා සංශෝධනයට අදාළව තමන් ඉදිරිපත් කළ අදහස්වලට ගරු කරමින් අවශ්‍ය සංශෝධන සඳහා අවධානය යොමු කිරීම ජනතා අභිලාෂය ඉටුකිරීමක් බවත්, 53 වන ව්‍යවස්ථාවේ 7 වන උපලේඛණයේ රටේ ඒකීයභාවයට විරුද්ධව කටයුතු නොකරන්නේය යන දිවුරුම හා ජනාධිපති කාර්යාලය සහ අග්‍රාමාත්‍ය කාර්යාලය විගණනයෙන් ඉවත් නොකිරීමට ගෙන ඇති තීන්දුව කැපී පෙනෙන බවත් පාර්ලිමේන්තු මන්ත්‍රී දොළවත්ත මහතා යොමු කළ ලිපියෙහි සඳහන් වේ.

19 වන ව්‍යවස්ථා සංශෝධනයේ අඩුපාඩු නිවැරදි කෙරෙන නව සංශෝධනයට රටේ ජනතාව තුනෙන් දෙකක ජනවරමක් දුන් නමුත් එය නැවත 18 වන ව්‍යවස්ථා සංශෝධනය වෙත යාමට දුන් ජනවරමක් නොවන බවට වටහා ගත යුතු යැයි ද එම ලිපියෙහි වැඩිදුරටත් දැක්වේ.

# නැඟෙනහිර ජනතා ගැටලු 026-2222102ට කියන්න

**නුවන් හෙට්ටිආරච්චි**

පළාතේ ජනතාවගේ ගැටලු දුරකතන මාර්ගයෙන් සහ ඊමේල් මාර්ගයෙන් ලබාගෙන ඒවාට කඩිනම් විසදුම් දීමේ ක්‍රියාමාර්ගයක් ගැනීමට නැගෙනහිර පළාත් ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය අද (19) තීරණය කළාය.

කොවිඩ් - 19 වයිරසය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා විශේෂ සෞඛ්‍ය උපදෙස් මත දිවයිනේ බොහෝ රාජ්‍ය ආයතන මහජන කටයුතු සීමා කර ඇති බැවින් ආණ්ඩුකාරවරිය මෙම තිරණය ගෙන තිබේ. මෙම වෛරසය නිසා ජනතාවගේ දැවෙන ප්‍රශ්න නිරාකරණය කිරීම තවදුරටත් කල්දැමීම සාධාරණ නොවන බැවින් ආණ්ඩුකාරවරිය මෙම ක්‍රියාමාර්ගය ගැනීම විශේෂත්වයකි.

දුරකතන සහ ඊමේල් පණිවිඩවලට අමතරව තැපැල් මගින් ද ජනතාවට සිය ඉල්ලීම් සහ ගැටලු ඉදිරිපත් කිරීමේ අවස්ථාවන් සලසා දී තිබේ.

කොවිඩ් - 19 වයිරසය ව්‍යාප්ත වීම පාලනය කිරීම මෙන්ම විවිධ ඒජන්තවරුන් හරහා ජනතාව මුලා වීමේ අවස්ථාද මෙමගින් නතරවනු ඇත.

ඒ අනුව, ආණ්ඩුකාර කාර්යාලය, ඕස්හිල්, ත්‍රිකුණාමලය යන ලිපිනයටද 026-2222102 යන දුරකතන අංකය හරහා ද governorep@gmail.com යන ඊමේල් ලිපිනය හරහා ද ජනතාවට ගැටලු ඉදිරිපත් කළ හැක.

# පිල්ලයාන්ට එරෙහිව නඩුව කල් යයි

**මඩකලපුව වාර්තාකරු**
**ටී එල් ජව්ෆර්කාන්**

නැගෙනහිර පළාත් හිටපු ප්‍රධාන අමාත්‍ය හා පාර්ලිමේන්තු මන්ත්‍රී දෙමළ ජනතා විමුක්ති පක්ෂයේ නායක සිවනේසතුරයි චන්ද්‍රකාන්තන්ට (පිල්ලයාන්) එරෙහිව නඩු විභාගය කල් දමන ලදි.

කොරෝනා ආසාදනයේ බිය හේතුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන් සහභාගි නොවීමෙන් ලබන නොවැම්බර් මස විභාගය සඳහා කල් දමන ලදී.

දෙමළ ජාතික සංධානයේ හිටපු පාර්ලිමෙන්තු මන්ත්‍රී ජෝසප් පරරාජසිංගම් ඝාතන නඩුවේ අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධානාගාර ගත කර සිටින චන්ද්‍රකාන්තන්ට එරෙහිව නඩු විභාගය අද පැවැත්වුණි. දැඩි ආරක්ෂක රැකවල් මැද චන්ද්‍රකාන්තන් ඇතුළු 6 දෙනා අධිකරණයට ගෙන එන ලදී. මහාධිකරණ විනිසුරු ඩී සුෂයිදාසන් ඉදිරියේ විභාගයට ගෙන ලබන නොවැම්බර් 2 දක්වා නඩුව කල් දමන ලදී.

# ළමා රෝහලේ දරුවකුට දෙයියන්දර තිදරු පියකුට කොරෝනා

**නුවන් කොඩිකාර**

බොරැල්ල ළමා රෝහලේ ප්‍රතිකාර ලැබීම සඳහා ඇතුළත් කෙරුණු වයස අවුරුදු 2යි මාස 06ක් වයසැති දරුවකුට සහ දෙයියන්දර නෙරලම්පිටියේ පදිංචි 52 හැවිරිදි තිදරු පියෙකුට ද කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වී ඇතැයි සෞඛ්‍ය අංශ පවසයි.

මෙම දරුවා සහ මව බොරැල්ල, වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වන බවත් ඔවුන්ට ඇතිව තිබු රෝග ලක්ෂණ සම්බන්ධයෙන් සැක සිති රෝහල් කාර්ය මණ්ඩලය ඔවුන්ව වෙන් කොට තබා සිදුකළ පී. සී. ආර්. පරීක්ෂණයකින් ඔවුන් දෙදෙනාටම කොරෝනා වයිරසය ආසාදනය වී ඇති බවට තහවුරු වූ බව රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය ජී. විජේසූරිය සඳහන් කළේය.

මේ හේතුවෙන් රෝහල් කාර්ය මණ්ඩලය ආසාදිතයින්ට නිරාවරණය වීමක් සිදුවී නොමැති බවයි රෝහල් අධ්‍යක්ෂකවරයා සඳහන් කළේය.

දෙයියන්දර ප්‍රදේශයෙන් හමු වූ එම ආසාදිතයා කඹුරුපිටිය ආදපාන රජයේ රෝහලේ කොරෝනා ප්‍රතිකාර ඒකකයේ නේවාසික ප්‍රතිකාර ලබන අතර ඔහුගේ තත්ත්වය බරපතල නොවන බව රෝහල් ආරංචි මාර්ග පවසයි.

කොළඹ වරායේ පෞද්ගලික සමාගමක සේවය කරන ඔහු ඉකුත් 11 වැනි කොළඹ සිට අධිවේගී මාර්ගයේ ලංගම බසයකින් මාතර ප්‍රධාන බස් නැවතුම්පොල වෙත පැමිණ ඇත. පසුව මාතර සිට දෙයියන්දර බලා ධාවනය වන ලංගම බසයකින් දෙයියන්දර නගරයට ළඟා වී එතැන් සිට සිය පුතු සමග යතුරු පැදියෙන් නිවසට ගොස් ඇති අතර පසු දින ඔහුගේ නිවසේ දානමය පින්කමක් පවත්වා තිබේ.

ඔහුගේ මෝටර් රථයෙන් ස්වාමීන් වහන්සේලා තුන් නමක් වැඩම කර දානය පිරි නමා ඇති අතර එම දානමය පින්කම සඳහා 30දෙනෙකු පමණ සම්බන්ධ වී තිබෙන බවට ආරක්ෂක අංශ තොරතුරු අනාවරණය කර ගෙන තිබේ.

ඔහුගේ දියණිය දෙයියන්දර රෙදිපිලි වෙළෙඳසලක සේවය කරන අතර එම වෙළෙඳසල ද තාවකාලිකව වසා විෂබීජහරණය කිරීමට සෞඛ්‍ය අංශ සැලසුම් කර ඇත.

කොළඹ සිට නිවසට පැමිණි පසු අසනීප තත්වයට ප්‍රතිකාර ගැනීමට එම පුද්ගලයා දෙයියන්දර නගරයේ පුද්ගලික බෙහෙත් ශාලාවකට ගොස් ඇති අතර, ඉන් සුවයක් නොලැබුණු විට දෙදිනකට පසු මුලටියන බෙහෙත් ශාලාවකට ගොස් වෛද්‍යවරයෙකුගෙන් පුද්ගලිකව බෙහෙත් ලබා ගෙන තිබේ. පසුව අසනීප තත්වය උත්සන්න වීම මත වෛද්‍ය උපදෙස් මත ආදපාන රජයේ රෝහල වෙත ඇතුළත් වී කළ පී.සී. ආර්.පරීක්ෂණයේ දී කොරෝනා ආසාදිත බව තහවුරු වී තිබෙන බව පොලීසිය සඳහන් කරයි. ඔහු ආ ගිය තැන් වෙලාවන් හා ආශ්‍රිතයන් ගැන බුද්ධි අංශ තව දුරටත් තොරතුරු එක්රැස් කරමින් පවතින අතර සෞඛ්‍ය අංශ හා ආරක්ෂක අංශ මේ පිළිබඳව වැඩි දුර පරීක්ෂණ මෙහෙයවති.

# කියුබා - ශ්‍රී ලංකා සබඳතා පුළුල් කරනවා

## කියුබාවේ ශ්‍රී ලංකා තානාපති ලක්ෂිත රත්නායක

**මහින්ද අලුත්ගෙදර**

කියුබාව හා ශ්‍රී ලංකා රජය අතර ආර්ථික සංස්කෘතික, සෞඛ්‍යය අංශයන්හි ද්වීපාර්ශ්වීය සබඳතා පුළුල් කිරීම සඳහා ගතහැකි සියලු ක්‍රියාමාර්ගයන් අනුගමනය කරන බව කියුබාවේ ශ්‍රී ලංකා තානාපති ලක්ෂිත රත්නායක මහතා පවසයි.

දෙරට අතර සබඳතා තවදුරටත් සහතික කරමින් එම සබඳතා තවදුරටත් ශක්තිමත් කරගත යුතු බවට ශ්‍රී ලංකා තානාපතිවරයා කියුබානු ජනාධිපති එම්.එම්.ඩී. කැනෙල් බර්මුඩෙස් මහතාට සහතික වී තිබේ.

කියුබාවේ නව ශ්‍රී ලංකා තාතනාපති ලෙස පත් වූ රත්නායක මහතා ඒ සම්බන්ධයෙන් අක්ත පත්‍ර බාර දීම සඳහා කියුබානු ජනාධිපතිවරයා හමු වූ අවස්ථාවේ මේ බව සඳහන් කළ බව විදේශ අමාත්‍යාංශය පවසයි.

ශ්‍රී ලංකා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ මහත්වරුන්ගේ සුබ පැතුම් පණිවිඩ ද කියුබානු ජනාධිපතිවරයාට බාර දී තිබෙන තානාපතිවරයා කොවිඩ්-19 වසංගත සමයේ දී හයිටිහි සිටින ශ්‍රී ලංකික ශ්‍රමිකයින්ගේ සෞඛ්‍යය ආරක්ෂාව වෙනුවෙන් කියුබානු වෛද්‍ය කණ්ඩායමක් යෙදවීම පිළිබඳව ශ්‍රී ලංකා රජයේ කෘතඥතාව පිරිනවා තිබේ.

හාවානා හි පලාසියෝ ඩි ලා රෙවොලූෂන්හි දී පැවැති මෙම අක්තපත්‍ර බාර දීමේ අවස්ථාවේ දී එරට ජනාධිපති අරක්ෂක බල ඇණියේ චාරිත්‍රානුකූල පිළිගැනීමක් ද සිදුව ඇත.

මෙම අවස්ථාවට කියුබානු රජයේ විදේශ ඇමැති බෲනෝ රොද්‍රිගුයේස් පර්රිල්ලා මහතා ද සහභාගී විය. ලක්ෂිත රත්නායක මහතා හාවානාහි තානාපතිවරයා වීමට පෙර විදේශ අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණ හා සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කර තිබේ.

In conversation with...

# කළු වලා අතරේත් රිදී රේඛා දකින රක්ෂණ කර්මාන්තය



ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපති, ජනාධිපති නීතිඥ රාසික් සරුක්

පසුගිය සැප්තැම්බර් මාසයේ සමරනු ලැබූ රක්ෂණ මාසය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපති, ජනාධිපති නීතිඥ රාසික් සරුක්, දේශීය හා ගෝලීය යන දෙඅංශයේම රක්ෂණ කර්මාන්තය විකාශනය වන ආකාරය පිළිබඳ සිය අදහස් ගොනු කළේ මෙසේයි.

**● ඔබ ලෝකයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ දැනට ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ක්‍රමය දකින්නේ කොහොම ද?**

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අනෙකුත් සියලු කර්මාන්ත මෙන්ම රක්ෂණ කර්මාන්තයත් 2020 ඉතිරි කාලය සඳහා පහත වැටීමක් පෙන්නුම් කරනවා. ගෝලීය වශයෙන් ජීවිත රක්ෂණ වාරික ගෙවීම 6%කින් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරනවා. ඒ අතර ඉතිරි කිරීම්ද පහත වැටේවි. සාමාන්‍ය රක්ෂණයේදී සංචාරක සහ වෙළෙඳාම සම්බන්ධ වර්ධනය බොහෝ දුරට අඩුවීමක් අපේක්ෂා කරන අතර, එය 0.1%කින් පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර තිබෙනවා. අඩු පොලී අනුපාත, ඉහළ නොයන වර්ධනය සහ ගෝලීය අවපාතය වැඩි වීමේ ඉඩකඩ වැඩි වීම හේතුවෙන් රක්ෂණකරුවන්ට ඉතා අභියෝගාත්මක ආර්ථික වාතාවරණයක් ඉදිරියේදී ඇති වෙනවා. කෙසේ වෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා වන ප්‍රතිරක්ෂණ මිල අවම වශයෙන් 5%කින්වත් ඉහළ යාවි යැයි පුරෝකථනය කර තිබෙනවා.

ලොව පුරා තාවකාලික සීමාව තිබියදීත් ජනතාවගේ හැසිරීම් රක්ෂණ සමාගම් සඳහා අවදානම් සහ අවස්ථා යන දෙකම නිර්මාණය කරනවා. ඒ අතරම, පාරිභෝගික අපේක්ෂාව, විශේෂයෙන් ඩිජිටල් නාලිකා සහ මිනිසුන් ලැබූ අත්දැකීම් එය තවදුරටත් ඉහළ දමනු ඇති. මෙයට ප්‍රතිචාරයක් ලෙස තාක්ෂණික ආක්‍රමණය සමස්ත වටිනාකම් දාමය හරහා සිදු වෙමින් පවතිනවා.

කොවිඩ්-19හි බලපෑම දේශීය කර්මාන්තය තුළද කෙටිකාලීන අර්බුද ඇති කර තිබෙනවා. ව්‍යාපාර කෙරෙහි වන සෘණාත්මක බලපෑම හේතුවෙන් රක්ෂණය කළ නොහැකි අවස්ථා අඩු කරනවා. සෞඛ්‍ය, සංචාරක අවලංගු කිරීම්, ව්‍යාපාර බාධා කිරීම්, සේවා යෝජකයාගේ වගකීම්, ආදායම් ආරක්ෂාව වැනි විවිධ ආවරණ කෙරෙහි අහිතකර බලපෑම් හේතුවෙන් ඇති වන සැලකිය යුතු මූල්‍යමය අලාභ සඳහා රක්ෂණ කර්මාන්තය සූදානම් විය යුතුයි. දේශීය රක්ෂණ කර්මාන්තයට මරණ සහ සෞඛ්‍ය වියදම් නොමැති වුවද කොවිඩ් -19 වෙත, වාහන ආනයනය වැනි මෑත කාලීන ආනයන පාලනයන් ඉතා දැඩි ලෙස බලපානවා. ඊට ප්‍රධානම හේතුව සාමාන්‍ය රක්ෂණය සඳහා විශාලම දායකත්වය සපයන කොටස මෝටර් රථ අංශය වන නිසයි. කෙසේ වෙතත් බලාපොරොත්තු වූවාට වඩා වේගයෙන් දේශීය කර්මාන්ත යථා තත්ත්වයට පත් වන ලකුණු අපට පෙනෙන්නට තිබෙනවා.

**● කොවිඩ්වලින් පසු ඔබ කර්මාන්තයේ දකින ප්‍රවණතා මොනවා ද?**

ඩිජිටල් තාක්ෂණ නිෂ්පාදන සහ සේවා සඳහා ආයෝජනය කර ඇති රක්ෂණ සමාගම්වලට අනිවාර්යයෙන්ම වාසියක් තිබෙනවා. නිවෙසේ සිට වැඩ කිරීම, සේවක මෙහෙයුම් ආකෘතිවල කොටසක් බවට පත් වී තිබෙන බැවින් ශ්‍රම බළකායේ ප්‍රතිපාදන වර්තමාන තත්ත්වයට ගැළපෙන පරිදි පෙළ ගැස්විය යුතු වෙනවා. ඊට අමතරව, සයිබර් අවදානම් රක්ෂණය වැනි නව ක්ෂේත්‍ර වඩාත් ජනප්‍රිය විය හැකියි. එමෙන්ම නව අදහස් සහ නිෂ්පාදන ඇති කිරීමට පෙළඹවීම සහ සාම්ප්‍රදායික නිෂ්පාදන වර්ගවලින් බැහැර වීම මේ මොහොතේ ඉතා අවශ්‍ය යැයි මට හැඟෙනවා.

එපමණක් නොව කල් ඉකුත් වූ ප්‍රතිපත්ති ගැන මෙන්ම රක්ෂණ ඔප්පුවල අනාගතය සහ ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් පිළිබඳ ද සැලකිලිමත් විය යුතුයි. වංචා කිරීමේ අවදානම වළක්වා ගැනීම සඳහා ඩිජිටල්කරණයට අවශ්‍ය චෙක්පත් හා ශේෂයන් තිබිය යුතුයි. එබැවින් ව්‍යාපාර අඛණ්ඩව සැලසුම් කිරීම අප ඉතා බරපතළ ලෙස සැලකිල්ලට ගත යුතුයි.

**● වසංගත රෝගයක් තිබියදී රක්ෂණ දැනුම්වත් කිරීමේ මාසයක් ප්‍රකාශයට පත් කිරීම රක්ෂණ කර්මාන්තයේ ක්‍රියාකාරීත්වයට උපකාරී වේ යැයි ඔබ සිතනව ද?**

රෝගී තත්ත්වය සුව කිරීම සඳහා නිසි එන්නතක් සොයා ගන්නා තෙක් මිනිසුන් කොවිඩ් - 19 සමඟ සමපාත වන පරිසරයකට හුරු වීමට සිදු වෙනවා. මේ නිසා අනාගතයේ පෙර නොවූ විරූ වෙනසක් ඇති වේ යැයි අපි අපේක්ෂා කරනවා. කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් රක්ෂණය, සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ජනතාව වැඩි වැඩියෙන් දැනුවත්ව සිටින හෙයින්, නරකම කාල සඳහා සුදුසුම මූල්‍ය මෙවලම්වලින් එකක් බවට රක්ෂණය පත් වී තිබෙනවා. මේ අවස්ථාවේ ද රක්ෂණය පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා හොඳම වේදිකාව වන්නේ 'රක්ෂණ දැනුවත් කිරීමේ මාසය' ප්‍රකාශයට පත් කිරීමයි. අපි කර්මාන්ත අභියෝග භාර ගන්න නිරන්තරයෙන්ම සූදානම්.

**● ඔබ පත් වූ දා සිට රක්ෂණ ක්ෂේත්‍රයේ නියාමනය සම්බන්ධයෙන් වර්ධනයක් සිදු වෙලා තිබෙනවා ද?**

මෑතකදී IRCSL විසින් නියෝග කිහිපයක් නිකුත් කර තිබෙනවා. වෙනස් කිරීමේ නියෝජිත කේත සම්බන්ධයෙන් නියෝග අංක 21 නිකුත් කළා. ඊට අමතරව ජාතික භාෂා ප්‍රතිපත්තියට අනුකූලව අදාළ රක්ෂණ ඔප්පු හිමියා විසින් ප්‍රතිපත්ති නියමයන් සහ කොන්දේසි අවබෝධ කර ගැනීම සහතික කිරීම සඳහා රක්ෂණ ප්‍රතිපත්ති සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම ලබා ගත යුතු යැයි චක්‍රලේඛ අංක 43 මගින් නියම කළා. චක්‍රලේඛ අංක 42 එකතු කරන ලද්දේ රක්ෂණ සමාගම්වලට බලපත්‍ර රහිත ගැළපුම්කරුවන්ගෙන් සේවා ලබා ගැනීමෙන් වළකින්නයි. කොවිඩ් - 19 වසංගතය සැලකිල්ලට ගනිමින් වාරික ගෙවීමේ කාලය දීර්ඝ කරන රක්ෂණ ඔප්පු හිමියන්ට සහන ක්‍රියාමාර්ග ලබා දීම සඳහා IRCSL විශේෂ නිවේදනයක් අප නිකුත් කළා. වාරික ආදායම අහිමි වීම සහ ඔවුන්ගේ ව්‍යාපාරවලට එමගින් සිදුවන බාධා කිරීම් හේතුවෙන් රක්ෂණ සමාගම්වල ප්‍රාග්ධනයට වන බලපෑම අවම කිරීම සඳහා රක්ෂණ සමාගම්වල කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීම අත්හිටුවන ලෙසත් අපි ඉල්ලා සිටියා.

**● ඔබේ මතය අනුව, රක්ෂණ පාරිභෝගිකයා සේවා සහ වෙළෙඳපොළ තුළ ප්‍රතිලාභ ලබා ඇත්තේ කොහොම ද?**

නවීන සමාජයේ සහ ආර්ථිකයේ බොහෝ අංශවලට රක්ෂණයකින් තොරව ක්‍රියාත්මක විය නොහැකි බැවින් රක්ෂණය අනපේක්ෂිත සිදුවීම්වලට වඩාත් ආරක්ෂිත ආවරණයක් සපයනවා. එමගින් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට සුපුරුදු පරිදි ඔවුන්ගේ දෛනික කටයුතු කරගෙන යෑමට ඉඩ සලසනවා. කුඩා වාරිකයක් සඳහා රක්ෂණ ඔප්පුවක් මිලට ගැනීම විශාල ලාභයක් විතරක් නොවෙයි සිතට සැනසිල්ල සහ ආරක්ෂාව ගෙන ඒම සඳහා ආරක්ෂිත දැලක් සේ ක්‍රියා කරනවා. ගනුදෙනුකරුවන්ට ප්‍රතිලාභ ලැබෙනවා. ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලනු තරමට එහි විශ්වසනීය මට්ටම ඉහළ නැංවේවි. අප රක්ෂණකරුවන්ට ප්‍රතිලාභ ගෙවීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කර තිබෙනවා.

# HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් අලුත් තැනක



HNB ඇෂුවරන්ස් PLC (HNBA) හි පූර්ණ අනුබද්ධිත සමාගමක් වන HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් (HNBGI) මෑතකදී තම සේවාලාභී සම්බන්ධතා මධ්‍යස්ථානය කොළඹ 03 පිහිටි HNBA සේවා සම්බන්ධතා මධ්‍යස්ථාන පරිශ්‍රය කරා රැගෙන යන ලදි. එක් පරිශ්‍රයක් තුළ මෙසේ HNBA සහ HNBGI සම්බන්ධතා මධ්‍යස්ථාන පවත්වා ගෙන යෑම තුළින් සමාගමේ ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ සේවාලාභී දෙපාර්ශ්වයටම වඩාත් පූර්ණ සේවාවක් ලබාගැනීමේ හැකියාව මෙමඟින් සැලසෙනු ඇත. HNBA සහ HNBGI හි ප්‍රධාන විධායක නිලධාරි වන ප්‍රසන්ත ප්‍රනාන්දු මහතා සිය අදහස් දක්වමින් පැවසුවේ, ඉහළ ගණයේ සේවාලාභී පහසුකම් සලසා දීම සෑම විටම අප සමූහයේ මෙහෙයුම් හා ව්‍යාපාර දර්ශනයන්හි කේන්ද්‍රස්ථානයක් වන බවය.

# ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස් වෙතින් සුවිශේෂ ප්‍රතිලාභ



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෝටර් ප්ලස්, ලෝයල්ටි රිවෝර්ඩ්ස් වැඩසටහන යටතේ සිය පූර්ණ රක්ෂණ ඔප්පු හිමියන්ට සුවිශේෂ ප්‍රතිලාභ ලබා දීම සඳහා ප්‍රමුඛ පෙළේ සෞඛ්‍ය සහ ගෘහස්ථ හෙද සේවා සැපයුම්කරුවකු වන ස්ර්ටිස් ලංකා හෝම් නර්සින් ඇන්ඩ් ස්විෆ්ට් කෙයා සමඟ අත්වැල් බැඳගෙන තිබේ. මේ සුවිශේෂ ප්‍රතිලාභ ඔස්සේ රු.3000ක වාර්ෂික සාමාජිකත්වය ලබාගැනීමේදී හදිසි අවස්ථාවන් සඳහා වෛද්‍යවරයකු කැඳවීම, හෙද සහායිකාවන් කැඳවීම, ගිලන් රථ සේවාව ලබාගැනීම, පැය 24 පුරා ක්‍රියාත්මක පාරිභෝගික සේවාව, ආරක්ෂණ උපකරණ සඳහා 5% වට්ටම්, ජංගම භෞත චිකිත්සාව, කථන චිකිත්සාව, වෛද්‍යවරුන්, රසායනාගාර පරීක්ෂාවන් සඳහා 5-10% වට්ටම් (ආසිරි රෝහල හැර), රෝහල් බාහිර රෝගී අංශය සහ නේවාසික රෝගීන් සඳහා සහන මිල ගණන් යටතේ ප්‍රතිකාර, ආසිරි රෝහලේ සාමාන්‍ය කාමර සඳහා 10% වට්ටම්, සුඛෝපභෝගී කාමර සඳහා 20% වට්ටම් යන ප්‍රතිලාභ ලබාගත හැක. මෙයට අමතරව නේවාසික හෙද සහායක සේවාවන් සඳහා අවශ්‍යතාව ඇත්නම් දෛනික හා මාසික ගාස්තු ගෙවීමෙන් ලබාගත හැකිය.

# ශ්‍රීලන්කන් කේටරින් කල් තබා ගත හැකි ආහාර හඳුන්වා දෙයි

මහින්ද අලුත්ගෙදර

ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ශ්‍රීලන්කන් කේටරින් අංශය ශ්‍රී ලාංකික සහ අන්තර්ජාතික ආහාර රටාවන් සමඟින් කල් තබා ගත හැකි ශීත කළ ආහාර හඳුන්වාදීමට පියවර ගෙන තිබේ. ආරම්භයේදී එම ආහාර ශ්‍රී ලංකාවේදීත් පසුව අන්තර්ජාතික වශයෙනුත් හඳුන්වා දීමට සැලසුම් කර තිබෙන අතර, ඒ අනුව ඉදිරියේදී මේ ආහාර ශ්‍රීලන්කන් කේටරින් වෙළෙඳ නාමය යටතේ ලොව පුරා විසිරී සිටින ශ්‍රී ලාංකිකයන් වෙත ගෙන යනු ඇත. හොඳම තත්ත්වයේ, ශීත කළ ආහාර සඳහා වන ඉහළ ඉල්ලුමට විසඳුමක් ලෙස ශ්‍රී ලංකන් කේටරින් 'Cuisine Gastronome'යන නමින් මේ ආහාර රටාවන් සකසා ඇති අතර, එය නැවුම් අමුද්‍රව්‍යවලින් සහ කල් තබා ගන්නා ද්‍රව්‍යවලින් සාදා ඇත. 'Cuisine astronome' ප්‍රණීත ආහාර රසයන් සහ දේශීය හා විදේශීය ප්‍රියතම රසවත් ආහාර රැසක් පිරිනමන අතර ඒවා මිනිත්තු කිහිපයකින් විශිෂ්ට ආහාර වේලක් සඳහා පහසු මෙන්ම ඉක්මන් විසඳුමක් ලබා දෙයි.




Cuisine Gastronome's වෙතින් පුළුල් පරාසයක විහිදුණු දේශීය ප්‍රියතම ආහාර වන කළු පොල් පොළොස් ඇඹුල සමඟ දේශීය රතු සහල්, කුකුළු මස් ව්‍යංජන සහිත ශ්‍රී ලාංකික කහ බත් පිළිගන්වනු ලැබේ. එසේම අන්තර්ජාතික විශේෂිත ආහාර වන Penne Pasta in Rich Sundried Tomato Sauce, තායි ස්වීට් චිලී සමඟ වොක් ෆ්‍රයිඩ් නූඩ්ල්ස්, Cannelloni Stuffed with Rich Creamy Chicken, Polo Cacciatore Italiano with Penne Pasta, English Country Lamb & Mint Pie, and a variety of other delectable meals සහ තවත් රසවත් ආහාර වර්ග රැසක්ම නිවෙසේ සිට සුවපහසුවෙන් භුක්ති විඳීම වෙනුවෙන්ම සකසා ඇත.

# ඩීමෝ කෘෂි සංචාරක ක්ෂේත්‍රයට පිවිසෙයි

ඩීමෝහි කෘෂි ව්‍යාපාර සඳහා වූ අංශය වන, DIMO Agribusinesses ඔවුන් සතු දඹුල්ල කෘෂි උද්‍යානය හරහා කෘෂි සංචාරක ක්ෂේත්‍රයට ප්‍රවිෂ්ට වෙයි. DIMO Agribusinesses සතු කෘෂි තාක්ෂණික උද්‍යාන තුනක් ශ්‍රී ලංකාවේ දඹුල්ල ප්‍රදේශයේත්, පහත රට නිකවැරටිය ප්‍රදේශයේ හා කඳුරට තෙත් කලාපයේ ලිඳුල ප්‍රදේශයේත් පිහිටා තිබේ. සෑම ප්‍රදේශයකම මේ කෘෂි තාක්ෂණික උද්‍යාන ආදර්ශ ගොවිපොළ වශයෙන් පවත්වාගෙන යන අතරතුර, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා යොදා ගනිමින්, බීජ නිෂ්පාදනය, ගොවීන් දැනුවත් කිරීම හා පුහුණු ක්‍රියාකාරකම්ද එමඟින් සිදු කරනු ලැබේ. මේ කෘෂි තාක්ෂණික උද්‍යාන මඟින්, ගොවිතැන් පිළිබඳ උනන්දුවක් දක්වන සංචාරකයන් ඉලක්ක කර කෘෂි සංචාරක ක්ෂේත්‍රයට යොමුවීමට සමාගම අපේක්ෂා කරයි. ඒ අනුව, සංචාරකයන් හට කෘෂි තාක්ෂණික උද්‍යානයන්හි පිහිටා ඇති සුඛෝපභෝගී කබානාවල හෝ නිවාඩු නිකේතනවල රැඳී සිටින අතරතුර, රටේ කෘෂිකාර්මික ජීවන රටාව පිළිබඳ දැනුමක් හා අත්දැකීමක් ගැනීමට අවස්ථාව සලසමින් කෘෂි උද්‍යාන පවත්වාගෙන යෑමට අදහස් කර තිබේ. සමාගම මෑතකදී, දඹුල්ලේ පිහිටි කෘෂි තාක්ෂණික උද්‍යානය තුළ සුඛෝපභෝගී සංචාරක කුටි දෙකක් නිල වශයෙන් විවෘත කළ අතර, එහි කටයුතු නොබෝ දිනකින්ම ආරම්භ කිරීමට අපේක්ෂා කරයි.



# ලංකා හොස්පිටල්ස් හදවත් සැත්කම් 9,000ක් සිදු කර ලෝක හදවත් දිනය සමරයි







අන්තර්ජාතිකව පිළිගත්, සම්මාන රැසකින් පිදුම් ලබා ඇති සෞඛ්‍ය සේවා සැපයුම්කරුවකු වන ලංකා හොස්පිටල්ස් පසුගිය මස 29 වැනි දා ලෝක හදවත් දිනය සැමරුවේය. රෝහලේ හෘදය රෝග මධ්‍යස්ථානයේ හෘදය සැත්කම් 9,000ක් සාර්ථකව සිදු කිරීමද එදින සටහන් කරනු ලැබිණි. මේ අවස්ථාවට ලංකා හොස්පිටල්ස් සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී දීප්ති ලොකුආරච්චි, වෛද්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය විමල් කරඳගොඩ මහත්වරු, ලංකා හොස්පිටල්ස් අනිකුත් ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්, හෘද රෝග විශේෂඥයන් සහ රෝහලේ හෘද රෝග මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සහභාගී වූහ. හෘද සෞඛ්‍යය හා හදවත් රෝග වැළැක්වීමේ වැදගත්කම පිළිබඳ ජ්‍යෙෂ්ඨ නේවාසික හෘදය රෝග විශේෂඥයන් තිදෙනකුගේ සහභාගීත්වයෙන් විද්වත් මණ්ඩල සාකච්ඡාවක් ද මෙහිදී පැවැත්විණි. එම විද්වත් මඩුල්ලේ සාමාජිකයන් වූයේ නේවාසික උපදේශක හෘද රෝග විශේෂඥ වෛද්‍ය එම්. මුබාරක්, ප්‍රධාන නේවාසික උපදේශක/හෘද සැත්කම් විශේෂඥ වෛද්‍ය ජී. ගාන්ධිජි මහත්වරු සහ නේවාසික උපදේශක හෘද නිර්වින්දන විශේෂඥ වෛද්‍ය ලුෂාන්ත පද්මසිරි යන මහත්වරුන්ය. ලංකා හොස්පිටල්ස් හෘදය රෝග මධ්‍යස්ථානය දශක දෙකකට ආසන්න කාලයක් තිස්සේ හෘද ය සෞඛ්‍යය පිළිබඳ පුරෝගාමී මෙහෙවරක් සිදු කරයි. මේ මධ්‍යස්ථානය හරහා සම්පූර්ණ හෘදය හා හෘද රෝග සැත්කම් මාලාවක් සිදු කර ගැනීමේ පහසුකම් සලසා ඇති අතර, එය ගුණාත්මක සෞඛ්‍ය සේවයේ පුරෝගාමියකු ලෙස තහවුරු වී ඇත. සෞඛ්‍ය සේවා අංශයේ අතිශය කීර්තිමත් ජාත්‍යන්තර සම්මාන රැසක් දිනූ ප්‍රථම ශ්‍රී ලාංකික රෝහල වන ලංකා හොස්පිටල්ස් ජාත්‍යන්තර තත්ත්ව සහතිකයේ 6 වන අදියර මෙන්ම වෛද්‍ය සංචාරක තත්ත්ව සන්ධානයේ (Medical Travel Quality Alliance - MTQUA) World Respected Medical Tourism) සහතිකය ද දිනා ගත් රෝහලකි. එමෙන්ම අමෙරිකානු ව්‍යාධිවේදීන්ගේ විද්‍යාලයේ (CAP) පිළිගැනීමට ලක්වූ ශ්‍රී ලංකාවේ එකම රසායනාගාරය වන්නේද ලංකා හොස්පිටල්ස් ඩයග්නොස්ටික් රසායනාගාරයයි.

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ



# මනෝරත්නගේ විචාර භූමිකාව

ආචාර්ය ජයලත් මනෝරත්නට ආචාර්ය උපාධි දෙකක් සතුය, පළමුවැන්න ඔහු තම ප්‍රථම උපධිය ලැබූ පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයෙනි. ඔහු විසින් ශ්‍රී ලාංකේය සමාජයට සම්ප්‍රදානය කරන ලද කලාත්මක හා නිර්මාණාත්මක කාර්ය භාරය අගයමින් පුදන ලද සාහිත්‍යසූරි ගෞරව උපාධිය ඉන් පළමුවැන්නයි. (D.Litt) දෙවැන්න ඔහු විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කරන ලද ශාස්ත්‍රීය නිබන්ධය, සිංහල නාට්‍යයේ ප්‍රාසංගික කලාත්මක වර්ධනය වෙනුවෙන් ඔහු ලබා ගත් දර්ශනසූරි ( Ph.D)උපාධියයි. මනෝට පිරිනැමුණු හා මනෝ විසින් දීර්ඝ පරයේෂණ ව්‍යායාමයකින් පසු ලබාගත් උපාධි පිළිබඳ එකවර මා මතකයට නැගුණේ අහම්බෙන් මෙන් මීට වසර හතළිස් හයකට පමණ පෙර දවසක මගේ දෙවන කාව්‍ය සංග්‍රහය වූ 'පාර වසා ඇත' (1974) කෘතිය කියවා ලිපියක් මගින් මා වෙත එවන ලද විචාරය මා අතට පත් වූ බැවිනි. අප දන්නා මනෝරත්නගේ රංගන, ගායන, නිරූපණ කුසලතා අතර, සාහිත්‍ය විචාරකයාගේ භූමිකාවෙහි ආරම්භක ලකුණු ද, එකී ලිපියෙහි ඇතුළත්ව තිබිණැයි අද දවසේ මට හැඟුණු බැවිනි.

මිතුරකුගේ නිර්මාණ කාර්යයක් පිළිබඳ වුව, ඔහු එදා පැවසූ කරුණු කාරණා දෙස උපේක්ෂාවෙන් ආවර්ජනය කරන කල, අපගේ මිතුරු සමාගමය තුළ පැවති එකිනෙකා පිළිබඳ අවබෝධය, මිත්‍රත්වය අමතක කොට නිර්මාණයෙහි අඩුපාඩු දැක්වීම, එම අඩුපාඩු මිත්‍රශීලීව භාරගැනීම වැනි ගුණාංග අප සතුව පැවතුණා නොවේදැයි කල්පනා වේ. 1971 දී මනෝ සුනිල් සමග 'දොළොස් මහේ පහන' සමූහ කවි පොත පළ කිරීමෙන් අනතුරුව, මගේ පළමු කාව්‍ය සංග්‍රහය 'කැටපත් පවුර' 1972 දී පළ විය. 'පාර වසා ඇත' දෙවන කවි එකතුවයි. එදවස අප නුගේගොඩ හයිලෙවල් පාරේ 221 කුලී නිවෙසෙහි සිටි අතර, මනෝ හා ඔහුගේ සරසවි හා නාට්‍ය සගයා වූ දිගා (නිශ්ශංක දිද්දෙණිය) ගේ බෝඩිම තිබුණේ නුගේගොඩ ජම්බුගස්මුල්ල පාරේය. මනෝ ඒ දිනවල වරාය කොමිෂන් සභාවේ රැකියාව කළ අතර, මා රැකියාව කළේ ජාතික ලුණු සංස්ථාවේය. ඔවුන්ට අපේ නිවෙස ඔවුන්ගේ නිවෙසක් බවට පත් වූයේත්, බෝඩිම මගේ ද බෝඩිමක් බවට පත් වූයේත් අප තිදෙනාම සම්බන්ධ වී සිටි නාට්‍ය කිහිපයකම කටයුතු කළ බැවිනි. මනමේ, සිංහබාහු, මහාසාර, රතු හැට්ටකාරී ඉන් ප්‍රධාන වේ. මේ ලිපියේ පසුබිම එසේය. මනෝගේ අත් අකුරින් තීරු හයක් පුරා ලියූ සටහන මා ළඟ සුරැකිව තිබුණේ කෙසේදැයි නොදන්නා මුත් අද දින එය කියවන කල ශෝකය මුසු සතුටක් දැනෙන බව සටහන් කළ යුතුය. ලිපිය එලෙසින්ම පහත ඉදිරිපත් කරන්නේ එදවස තවත් සොඳුරු මතකයකට ඔබ ද කැඳවමිනි.

උද්ධෘතය

දයාබර බුද්ධිට

1974 සැප්.11 දා උදේ

ඒ තරම් සැර අව්වක් තිබුණු උදෑසනක් නෙවි අද. වැහි මන්දාරම. අහස ටිකක් කළුවෙලා. උදේ පාන්දරින්ම කන්තෝරු දුවන ගමන් බුද්ධිලගෙ ගෙට ගොඩ වුණේ මොකක්දෝ පණිවිඩයකට.

පාර වසා ඇත

මොහොතකින් මගෙ දෑතට.

අද ජීවිතේ තවත් සුභ - වැදගත් දවසක් කියල මට හිතුණෙ ඒ වෙලාවෙදියි. පරිත්‍යාගයට බුද්ධිට පිං. ඒත් මේක අපි හැමෝගෙම ජයග්‍රහණයක් කියල මට හිතෙනව. අපි හිතවත් කොල්ලො කෙල්ලො ටික යන්නේ එකම ගමනක්. ගමන් කරන මාර්ග වෙනස් වෙන්න පුළුවන්. ඒත් අපි පතන අවසානය එකම විදියයි. හැමෝම එතැනදි එකතු වෙනව. ඒ යන ගමනෙදි 'පාර වසා ඇතත්' බුද්ධි කීව වගේ ඒ කඩුළු වැට ඉබේම සුනුවිසුනු වෙලා අපට ඉඩ පාදාවි.

බුද්ධිගේ 'පාර වසා ඇත' කියෙව්වෙ උතුරා යන සතුටකින්. මමම මහන්සි වෙලා නෙළා ගත්තු එලයක් වගේ. ඒ සතුට විස්තර කරන්න මම පෝසත් නෑ. පාළු රැයක අහස දිහා බලන කොට නෙත ගැටෙන ලස්සන හඳ තීරුවක් වගේ. බුද්ධිගෙ කැටපත් පවුර මට ලැබුණෙ නුවරඑළියෙ ඉන්දෙද්දි. මට මතකයි එය කියැවූ දිනත් ඔබට ලිපියක් එවුවා. දැන් පාර වසා ඇත.

මුල් වටය මම කියෙව්වෙ 113 බස් එකේදි. කොතරම් තදින් හා සතුටින් මගේ හිත, ඒ කවි බැඳ ගත්තද කියල ඔබට කියන්නට ඕනෑ නෑ. නුගේගොඩත්, කොටුවත් අතර මම වෙනදා දකින සෙනඟ, බස් නවතුම්, පෝස්ටර්ස්, රථවාහන, ගෙවල් දොරවල් කිසිම දෙයක් අද ඒ මොහොතෙ දි දැක්කෙ නැති බවත්, කොහේදෝ අපූරු ලෝකයක මා පාවුනු බවත් පමණක් ඔබට කියන්නම්.

දෙවන වටය කියෙව්වෙ කාර්යාලයේදි.


ඒ ඉවරවුණු ගමන්මයි මේ ලියන්න ගත්තෙ.

එකපාරටම හිතට ආපු අදහස් පහු වෙන කොට වෙනස් වෙයි කියල බය හිතෙන නිසයි දාහක් ෆයිල්ස් ඈතට වීසි කරල 'පාර වසා ඇත' ගැන පමණක් මේ හිත හිතා ලියන්නෙ. ඉස්සර වෙලාම කිවයුතු කරුණ, කැටපත් පවුරට වඩා දීර්ඝ පියවරක් පාර වසා ඇත මගින් ඔබ තබා ඇති බවයි. දීර්ඝ කියන වචනයෙන් ඔබට මොනව හිතේවිදැයි මට හිතන්ට බෑ. ඒත් කැටපත් පවුරට වඩා සිය දහස් ගුණයකින් මසිත බැඳ ගත් කවි සංකල්පනා මේ පොතේ අඩංගු වී තිබෙන බව කියන්ට ඕනෑ. කැටපත් පවුර ඔබේ ධෛර්යවන්ත එක් පියවරක් වුණත් දොළොස් මහේ පහන තරම් සාර්ථක වුණේ නෑ. ඒ හිතෙන්නෙ මටයි. කොහොමටත් කැටපත් පවුර තරු පායපු රැයක් වගේ. පාර වසා ඇත හඳ පායපු රැයක් වගේ. මං දන්නෙ නෑ ඊට වඩා.

සිතුවිලි රසවත්ව කවියක විදියට දෙන්න පුළුවන් ලස්සන භාෂා රටාව කවදත් පුරුදු විදියට මේකෙත් තියෙනව. හැම කවියක්ම එකින් එක කම්මැළි නැතුව ආසාවෙන් කියවන්න පුළුවන්. හොඳ පින්තූරයක් පැය දෙකක් ප්‍රේක්ෂකයා බැඳ තබාගන්නව වගේ. කවි පොතක පිටු හුඟක් අඩු වුණත් කම්මැළි නැතුව ඒ ටිකවත් කියවගෙන යන්න ඒව හොඳ රසවත් භාෂාවකින් සරසන්න ඕනෑ. ඒ වගේම විවිධත්වයක් තියෙන්නත් ඕනෑ. විෂය වෙනස් වෙන්නත් ඕනෑ. එක පුද්ගලයෙක් ලියන කවි සමහරවිට එකම විදියෙ අත්දැකීම් නිසා එකම රටාවක් ආරක් ගන්න පුළුවන්. ඒත් පාර වසා ඇත ඊට වඩා ගැඹුරු විදියට හිතල විවිධ රස ඉස්මතුවෙන විදියට කවිපේළි යොදාගෙන තියෙනව.

ඉස්සොරෝම මට පෙනෙන අසාර්ථකම දෙය ප්‍රේමයට ආදරයට තැනක් දීමට දැරූ වෑයමයි. වරදවා හිතන්න එපා, අපි කොච්චර අත් දුටුවත් කාල්පනික ලෝකයේ සැරිසැරුවත් ආදරය ගැන ප්‍රේමය ගැන අපි ලියන දේ ටික කලකින්ම අපිට එපා වෙනව. අද අපි ආදරය ගැන ලියන දේ ගැන හෙට අපි ලජ්ජා හිතනව. ඉතිං ආදර කවි ගැන බුද්ධදාස ගලප්පත්ති වැනි කවියෙක්, තරුණයෙක්, ආදරවන්තයෙක් හුඟක් පරිස්සමින් ලියන්න ඕනෑ. මිනිස්සු ඔබෙන් බලාපොරොත්තු වෙන දේ ඔබ තේරුම් ගන්න ඕනෑ. ආදරය ගැන, විවිධ අර්ථකථන දීම ගැන නොවෙයි මම මේ කියන්නෙ.

## ඒ දවස සොඳුරුමය




මා අගයකරන, සිත්ගත්, සාර්ථකම උසස්තම රසවත්ම නිර්මාණය 'පාර නොවසන්න' කවි පෙළයි. ඔබේ පමණක් නොව අප හැම දෙනාගේම මුළු ජීවිතයටම ජීර්ණ වුණු උත්තරීතර විමුක්තිය සොයාගෙන යන ගමනෙදි, සිත් තුළ නැංවෙන දෝංකාරය ඔබේ ඒ කවි පෙළින් ධ්වනිත වෙනවා. කවදා හෝ මේ අනතුරු ඇඟවීම අපි කළ යුතුයි. අපි නැති වුණත් අපේ තැන ගන්න උතුම් විප්ලවවාදීන් මේ කාර්යය සාර්ථකව ඉටු කරනු ඇත. ඔවුන්ගේ හඬත් ඔබේ කවි පෙළින් ඉස්මතු වී ඇත. සමකාලීන තරුණ විප්ලවවාදී විඥාණය ඔබේ මේ කවි පෙළේ හුඟක් සාර්ථකව සංක්ෂිප්තව රසවත්ව අඩංගු වෙලා තියෙනව

'සහෝදරයකුගෙන් අසම්' මම තේරූ දෙවන උසස්තම නිර්මාණයයි. වර්තමාන දූෂිත අසාධාරණ අත්තනෝමතික පාලනය අපට අණ කරන ඊනියා සංවර්ධනය, ඔබේ උපහාසාත්මක හා ශෝචනීය කවි සිතුවිලිවලට හසු වුණු අයුරු ප්‍රශංසනීයයි. තරුණ පෙළ ගැන උපන් දයාව ඔබ විඳි අයුරින්ම පාඨකයා ද විඳගන්නා බව සක් සුදක් සේ පැහැදිලියි.

තුන්වන තේරීම 'දියණියකගේ ආයාචනයයි.' සුලබ සිද්ධියක් දුලබ අත්දැකීමකට හසුකරවා, කාව්‍යාත්මකව ඉදිරිපත් කිරීම සාර්ථකයි. කාව්‍ය මාධ්‍යයෙන් මෙවන් පුවතක් සාර්ථකව පළමුවරට මා දුටුවේ ඔබේ පොතෙන්. 'කුසුමලතා' කවිපෙළ ආසාවෙන් කියවාගෙන ගියත් අවසාන වුණේ හිතේ තෙරපෙන බරකින්. ඊට හේතුව සමකාලීන දවන ප්‍රශ්නයක් මනා ලෙස කවි සිතුවිල්ලකට හරවා අවසානය අනපේක්ෂිත අයුරකින් ප්‍රශ්නයෙන් පලා යෑමට තැත් කිරීමයි. 'කවියා සමාජ ප්‍රශ්නවලට පිළිතුරු දිය යුතුමය.'යි නීතියක් නැතත් මෙවැනි හද සසල කරවන පුවතක අවසානය පාඨකයාගේත් හද සසල කරවීම ඇත්තටම වරදක්.

මේ අවස්ථාව ගැන වඩා විස්තර වශයෙන් කියනව නම් 'පුතුනි සමා වුව මැන' කවි පෙළ එක්ක කුසුමලතා සංසන්දනය කරන්න ඕනෑ. ඒ අතින් පුතුනි.... කවි පෙළ සාර්ථකයි ඉහළින්ම. ඊට හේතුව එහි දැක්වෙන මව, එම තත්වයට පත් වූ අයුරු ගැනත් දැන් ඒ ජීවිතය ගත කිරීමේ හේතු ගැනත් හොඳින් විග්‍රහ වෙන එකයි. එහි දැක්වෙන්නේ ඒ හේතුවත් හේතුව නිසා උද්ගත වූ තත්වයත් පමණයි. ඒත් කුසුමලතාහි අවසානයේ දී කවියා නඟන ප්‍රශ්නය එම කවි පෙළට හානි වී තිබෙනවා.

කවියාගේ සොඳුරියට, අශෝකමාලාගෙන් ලියුමක්, පාපොච්චාරණය, සරසවිය පුනරුත්ථාපනය, පෙම්වත ආදී කවි ඉතාම උසස් ගණයේ ඒවා විදියටයි මම සලකන්නෙ. පෙම්වත කවි පෙළ ඉතා හොඳ දහසක් සාර්ථකව කවියට නැඟූ අවස්තාවක්. ඒත් එහි අවසානයටත් මම කැමති නෑ. ඊට වඩා සමාජ යථාර්ථී පිළිතුරක් දෙන්නෙ නැත්තේ ඇයි? 'තොටියාගේ ගීතය' අලුත්ම අත්දැකීමක්. මාතෘකාවක් නැති කවිය, රවිශන්කර්, රත්නපුර නගර ශාලාවේ දී ආදී කවි මා සිත් ගත් අනෙක් රචනා.

දැන් නම් වෙලාව 11.30 යි. උදේ වරුවෙම අද කාර්යාලයේ වැඩ මේක තමයි. ඒත් කවදාවත් නැති තෘප්තියකින් ගත කළ උදෑසනක්. කවදත් බුද්ධිගේ වැඩවලට අවංකව අත හිත දෙන නිසයි ඒ කාලය උදාර විදියට ගත කළේ. මා හොඳ නරක ලිව්වේ මට හිතෙන විදියටයි. රස විඳීම එකින් එක්කෙනාට වෙනස් වෙනව නේ? කොහොමටත් 'හරිම ටොප් පොත' කියල සයිලන්ස් නොවී, ඇහැට හිතට හසුවෙන වැරදිත් මම කීවෙ, බුද්ධිටත් බුද්ධිගේ කවිවලටත් තියෙන ආදරය නිසයි.


කොයි හැටි වුණත් පාර වසා ඇත ධෛර්යවන්ත උසස් නිමැවුමක්. කාලය අනුව බලන කොටත් ඒක දැඩි පියවරක්. බුද්ධිගෙ සාහිත්‍ය කලා කටයුතු දිනෙන් දිනම වැඩි දියුවෙන්නට පැතුම් මනෝගෙන්.

ආයිත් හවසක හමුවෙලා මේ ගැන කතා කරමු, බීර බිබී (වැරදුණා ගල් ... බිබී)

සොම්යෙ
හඳ එළියෙ
එතකොට තව අදහස් එළි වෙයි.
ඔබේ පොතේ නම
පාර වසා ඇත
වුණත්
ඔබේ ඉදිරි ගමනට
පාර වසා නැත.

මනෝ 74.09.11

(උද්ධෘතය අවසන්)




බුද්ධදාස ගලප්පත්ති
bgalaps@gmail.com

# නොබෙල් කිවිඳියට පැමිණිල්ලක්

## උඩුපෙළ සහ යටිපෙළ



2020 නොබෙල් සාහිත්‍ය ත්‍යාගය පිරිනැමුණේ අමරිකානු කිවිඳියක වන ලුයිස් ග්ලුක්ට ය. ලොව පුරා විසිර සිටින, විවිධ ජාතීන්ට අයත් සාහිත්‍යය රසිකයන්ගෙන් බොහෝ දෙනා එතෙක් ඇය ගැන අසා නොතිබූ බවට සැකයක් නැත. ලෝකයට 'ආගන්තුක' ගත් කතුවරුන්ට නොබෙල් ත්‍යාගය පිරිනැමුණු ප්‍රථම අවස්ථාවද මෙය නොවේ. ඒ පිළිබඳ නොයෙක් විවේචන ඇත.

1974 වසරේ දී නොබෙල් සාහිත්‍ය ත්‍යාගය පිරිනැමුණේ, ලෝකය තුළ එතරම් ප්‍රකට නොවූ ගත් කතුවරුන් දෙදෙනකු වන ස්වීඩන් ජාතික එයිවින්ඩ් ජොන්සන් සහ හැරී මාටින්සන්ට ය. එහෙත් සාහිත්‍ය සමාජයේ බලාපොරොත්තුව වූයේ. ලොව පුරා කීර්තියක් ඉසිලූ ග්‍රෙහැම් ග්‍රීන්, සෝල් බෙලෝ හෝ හෝ ව්ලැදිමීර් නැබකෝව්ට ඒ වසරේ ත්‍යාගය හිමි වනු ඇත ඇති බවය. 2004 දී නොබෙල් සාහිත්‍ය ත්‍යාගය පිරිනැමුණේ ජර්මන් සාහිත්‍යයෙන් පිටස්තරව 'නමක්' නොතිබූ ඔස්ට්‍රියානු ජාතික එල්ෆ්‍රීඩ් ජෙලිනෙක්ට ය. එම තීරණයට විරුද්ධත්වය ප්‍රකාශ කරමින්, නොබෙල් ඇකඩමි සාමාජික 'නූට් අනුලන්ඩ්' ඉන් ඉවත් වූයේ ය. 2011 දී 'බොබ් ඩිලාන්' නමැති පොප් ගායකයා, කවියකු ලෙස සලකමින් ඔහුට ලබා දුන් නොබෙල් සාහිත්‍ය ත්‍යාගය බොහෝ දෙනකු දුටුවේ විහිළුවක් ලෙසිනි. 2017 දී, ජපානය ප්‍රමුඛ ආසියානු රටවල බලාපොරොත්තුව වූයේ, 'හරුකි මුරකාමි' ය. එහෙත් ත්‍යාගය පිරිනැමුණේ ජපන් ජාතිකයකුම වූ, 'කසුඕ ඉෂිගුරෝ' ට ය.

නොබෙල් සාහිත්‍යය ත්‍යාගය (1901-2020) 113 වතාවක් තුළ, සමව බෙදී ගිය අවස්ථා ද සමඟ, 117 දෙනකුට පිරිනමා ඇත. ඒ නාමාවලිය දෙස බලන කල, අප වැනි ආසියානුවන්ට හුරුපුරුදු, අප කියවා ඇති නම් සේම, නාඳුනන නම් ද හමු වේ.

එය එසේ වීමට ප්‍රධාන හේතුව ලෙස මා දකින්නේ භාෂාවය. අප විදෙස් කෘතීන් කියවන්නේ ඉංග්‍රීසියෙනි. නොඑසේ නම්, සිංහල පරිවර්තන මගිනි. නොබෙල් සම්මාන දිනූ ඇතැම් කතුවරුන් ඔවුන්ගේ භාෂාවන්ගෙන් ලියූ කෘති බොහොමයක් ඉංග්‍රීසියට ද පරිවර්තනය වී නැත. ඔවුන්ගෙන් බොහෝ දෙනකු ලෝකයට දැනගන්නට ලැබෙන්නේ, නොබෙල් ත්‍යාග ප්‍රදානයෙන් පසු, ලහිලහියේ කෙරෙන පරිවර්තන මගිනි. අන්තර්ජාලය නිසා දැන් එමගින් ද, ඔවුන් කියවන්නට ලැබේ. කෙසේ වෙතත් නොබෙල් ත්‍යාගලාභී සාහිත්‍යධරයන්ගේ කෘතීන්ගෙන් සිංහලට පරිවර්තනය වී ඇත්තේ සුළු ගණනක් පමණි.

ඇතැම් ලේඛකයන්ගේ කෘතීන් එකක් හෝ සිංහලෙන් කියැවීමේ භාග්‍යය උදා වී නැත. ලුයිස් ග්ලුක්ට නොබෙල් ත්‍යාගය ප්‍රදානය කෙරුණු බව ප්‍රචාරය වීමත් සමගම, මුහුණු පොතට සටහනක් එක් කළ විශ්‍රාමික අද්මිරාල් 'ලක්ෂ්මන් ඉලංගකෝන්' මෙසේ සඳහන් කළේය. 'ලුයිස් ග්ලුක්ට නොබෙල් ත්‍යාගය හිමි වූ බව දැනගත් පසු, මා ඇගේ කවි සොයා කියැවීමට උත්සාහ කළා. එහෙත් මට නම්, මෙලෝ හසරක් තේරුණේ නැහැ. සමහර විට නොබෙල් තෑග්ග දීමට හේතුව ඒක වෙන්න ඇති.'

ඉලංගකෝනුන්ගේ කියුමෙහි ඇති උපහාසය බැහැර කළ හැකි නමුදු, ගත් කතුවරයකු හා පරිවර්තකයකු ලෙස සලකන කල, ඔහුගේ ප්‍රකාශය ආවට ගියාට කළ දෙයක් නොවන බව ද හැගේ. උසස් ඉංග්‍රීසි දැනුමක් ඇත්තකු වන ඉලංගකෝන් ට, ග්ලුක් ගේ කවි දුරස්ථ වනුයේ මන්ද? අමෙරිකානු කවියකු වන රොබට් ෆ්‍රොස්ට් වැන්නකුගේ කවි නම් ඉතා පහසුවෙන් රසවිඳිය හැකි බව ද ඔහු පවසයි. 77 හැවිරිදි ග්ලුක් කිවිඳිය, ජීවිත කාලය පුරාම කවිය සමඟ ජීවත් වූ, කාව්‍ය කෘති ගණනාවක් ප්‍රකාශයට පත් කළ කෙනෙකි. නොබෙල් ත්‍යාගයට පෙර, පුලිට්සර් ඇතුළු විශිෂ්ට සම්මාන හිමි කරගෙන ඇත. ඇයට නොබෙල් සාහිත්‍ය සම්මානය පිරිනැමීම ගැන අමෙරිකා, බ්‍රිතාන්‍ය, කැනඩා ආදී ඉංග්‍රීසි සාහිත්‍ය ලෝකයෙන් මෙතෙක් කිසිදු විරෝධතාවක් ද මතු වී නැත.

ග්ලුක් කිවිඳිය ලියන්නේ අමෙරිකානු ඉංග්‍රීසියෙනි. කවිය බිහි වන්නේ එහි නිර්මාතෘ ගේ සංස්කෘතික ජාන සමඟිනි. එසේම භාෂාත්මක හා කලාපීය අනන්‍යතාවද කවියට අනන්‍යතාවක් ලබාදෙයි. විදෙස් කවියක් වටහා ගැනීමේදී, වඩාත් නිවැරදිව කියන්නේ නම් රස විඳීමේ දී ඉහත කී අනන්‍යතාව පිළිබඳ කිසියම් අවබෝධයක් හෝ හැදෑරීමක් රසිකයා තුළ තිබිය යුතුය.

කවියේ හැඩරුව හෝ සිංහල පාඨකයාට වටහා දෙනු පිණිස කළ යුත්තේ එම කවි සිංහල බසට නැඟීම ය. එහෙත් ඉංග්‍රීසිය මෙන්ම, අමෙරිකාව ද දත් ඉලංගකෝන් වැනි ආසියානුවකුට ග්ලුක්ගේ ඇමෙරිකානු කවිය දුෂ්කර බන්ධනයක් වන්නේ නම්, එය සිංහල හෝ වෙනත් ආසියානු බසකට නැඟීමද දුෂ්කර කටයුත්තක්ම වනු ඇත.

සාහිත්‍ය කෘති පරිවර්තනය, පහසු කටයුත්තක් නොවේ. විශේෂයෙන්ම කවි පරිවර්තනයේ දී මුල් කවිය අසරණ වෙයි. පරිවර්තිත කෘති කියවීම යනු, වීදුරු භාජනයක් තුළ දැමූ රෝසමලක් පිටතින් සිප ගැනීමක් බඳු යැයි කියමනක් ඇත්තේ එහෙයිනි. නිදසුනක් වශයෙන් මෙරට කවි සමාජයෙහි ඉතා ජනප්‍රිය හයිකු කවියක්, මුල් ජපන් බසින් කියවන්නකුට ලැබෙන ශබ්ද රසය සිංහල පරිවර්තනයේ දී නොලැබෙයි. එහිදී අප උත්සහ කරනුයේ අරුත තුළ ඇති ගැඹුර දැකීමටය.

කාව්‍ය කෘතීන් දොළොසක් හැරුණු විට, ග්ලුක් කිවිඳිය proofs and theories (1994) සහ american originality (2017) යනුවෙන්, කවිය පිළිබඳ නිබන්ධන සංග්‍රහ දෙකක් ද පළ කර ඇත. ඇය යේල් විශ්වවිද්‍යාලයට සම්බන්ධ සහකාර මහාචාර්යවරියකි.

ග්ලුක්ගේ කවියට බොහෝ විට තේමා වූයේ යුද්ධය, සොබාදහම, මිනිසාගේ ආත්මීය හුදෙකලාව, මරණය සහ ශූන්‍යතාව වැනි කරුණුය.


නොබෙල් ත්‍යාගයට ලුයිස් ග්ලුක් නම් කිරීමෙන් පසු, සුපුරුදු පරිදිම මාධ්‍යවේදීහු ඇය පසුපස එන්නට වූහ. ඇගේ පොදු පිළිතුර වූයේ "ඒ ගැන කියන්න තාම ඉක්මන් වැඩියි." යන්න ය. එහෙත් මාධ්‍යවේදියෙක් දුරකතන ඇමතුමකින් ඇය හා සංවාදයට මිනිත්තු දෙකක් ඉල්ලා ගත්තේය. ප්‍රශ්න දෙකකට පිළිතුරු දෙන ඇය තෙවැනි ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් පවසන්නේ, "මිනිත්තු දෙක අවසන්." යනුවෙනි. තවත් අවස්ථාවක ග්ලුක් වට කර ගත් ඡායාරූප ශිල්පීන්ට ඇය මුහුණ දෙන්නේ, මුහුණින් අඩක් පමණ වැසෙන සේ පැලඳගත් මුව වැස්මකින් (mask) යුතුවය.

රියැදුරා බලා සිටිනවා යැයි කියමින්, ඇය තම රථය වෙත දිවයයි. ලුයිස් ග්ලුක් ගේ ජීවිතය එතරම් කාර්යබහුලය. ඇගේ කවිය සංකීර්ණ කෙරෙන්නේ එබඳු ජීවන රටාවක රිද්මය හා අත්දැකීම් විසින් නොවේ ද? නොබෙල් හේතු පාඨයෙන් නම් කියවෙන්නේ ඇගේ කවිබස ලොවම අමතන සෞන්දර්යයකින් පිරි බවය.

තමන්ගේ කලාපයට හා සංස්කෘතියට අයත්, ලෝකයටම පොදු නොවූ කවි කිවිඳියන්, ගත් කරුවනට නොබෙල් සාහිත්‍ය ත්‍යාගය ප්‍රදානය කිරීමට පසුබට නොවන නොබෙල් ඇකඩමිය, ආසියානු, අප්‍රිකානු සාහිත්‍ය කෘති නොහඳුනති. එම රටවල ගත්කරුවන් දෙස ඔවුන් බලන්නේ වපර ඇසිනි.

1913 දී, මහා කවි රබීන්ද්‍රනාත් තාගෝරයන්ට නොබෙල් සාහිත්‍ය ත්‍යාගය දීමෙන් පසු ඔවුන්ට යළි ආසියාතිකයකු හමුවන්නේ 1968 දීය. ඒ ජපන් ජාතික යසුනරි කවබතා ය. මේ වන විට කවබතා ද ඇතුළුව ජපන් ජාතික ගත්කරුවෝ තිදෙනෙක්ම, (කන්සුබුරෝ ඕයි - 1994, කසුඕ දුෂිගුරෝ - 2017) වෙති. සෙසු ආසියාතික නොබෙල් ජයග්‍රාහකයන් වනුයේ තුර්කියේ ඕර්හාන් පර්මුක්, චීනයේ ගා ඕ ෂිං ජියැං (ප්‍රංශ පුරවැසි), ඉන්දීය සම්භවයකින් යුත් වී. එස්. නායිපෝල් (ට්‍රිනිඩෑඩය) හා චීනයේ මා ඕ යැං ය.

නොබෙල් ත්‍යාගය පිරිනමන ස්වීඩන හා නෝර්වීජියානු ආයතනය ද (විශේෂයෙන් එහි සාහිත්‍යය කමිටුව) භාෂාමය අධිරාජ්‍යයකට අයත්, එක් බළකොටුවක් බඳු ය. එහෙයින්, ලුයිස් ග්ලුක් නමැති වියපත් කිවිඳියට එරෙහිව පැමිණිලි කිරීම එතරම් සාධාරණ නැතැයි හැගේ.



කපිල කුමාර කාලිංග

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ



# පිය සෙනෙහසක අරුමය රැගත් HOMEWARD

COME AND SEE

යුක්රේනයේ අගනුවර වන කිව් නගරයෙහි රෝහලක මෘත ශරීරාගාරය ඉදිරිපිට බලා සිටින තාත්තෙක් සහ පුතෙකි. තාත්තා මුස්තාපා ය. පුතා අලීම් ය.
මේ තාත්තා බලා සිටින්නේ තම වැඩිමහල් පුත්‍රයා නැත හොත් අලීම්ගේ වැඩිමහල් සොහොයුරා වූ නාසිම්ගේ දේහය ලැබෙන තුරුය. සොහොයුරාගේ දේහය දකින අලීම්ට එය ඉවසිය නොහැකිය. ඔහුට එය පිළිකුල්ය. වෙඩි වැදී ඉදිමී ගිය සිරුර දකින බාල සොහොයුරාට අයියාගේ සිරුර පිළිබඳ දැනෙන්නේ පිළිකුලකි.

එහෙත් තාත්තාට නම් එසේ නොවේ. ඒ ඔහු තවත් පුතකු බැවිනි. පුතු යුද්ධයට ගොස් ඇත්තේ ස්වේච්ඡාවෙනි. වැඩිමහල් පුතුගේ වෙඩිවැදී ඉදිමුණු ශරීරය දකින තාත්තාගේ මුහුණ කිසිවක් ප්‍රකාශ නොකරන හැඟුම් විරහිත එකකි. පුතකු පිළිබඳ සෙනෙහස තම ඇට මිදුළු කරාගොස්, පියකුගේ සිත තුළ කිඳා බසින බව අමුතුවෙන් කිව යුතු නැත. පවුලේ සිරිත පරිදි මෙම පුතුගේ දේහය තම නිජබිම නැත හොත් තම ඥාති වර්ගයාගේ සොහොන් බිම වෙත ගෙනයාම තාත්තගේ එකම අපේක්ෂාව ය.

මේ පුද්ගලයෝ පැරණි සෝවියට් සමූහාණ්ඩුවේ කොටසක් වූ යුක්රේනයේ ජීවත් වන තුර්කි සම්භවයක් ඇති ටාටර් මුස්ලිම්වරු ය. ඔවුන් වෙසෙනුයේ ක්‍රිමියාවේය. යුක්රේනය පැරණි සෝවියට් රුසියාවෙන් වෙන්ව ගියේ ජීවිත දහස් ගණනකින් වන්දි ගෙවීමෙන් පසුවය මුස්තාපා ගේ වැඩිමල් පුතු, මේ යුද්ධයෙන් මියගිය නාසිම් ද එයින් එක් කෙනෙකි.



යුක්රේනයේ සිට යළි සිය නිජ බිමට යන්නට අකැමැති අලීම් තාත්තා සමඟ මෙම ගමනට සහභාගි වන්නේ අකමැත්තෙනි. ඔහු අගනුවර අධ්‍යාපනය හැදෑරුවෙකි. සිය වැඩිමහල් පුතුගේ දේහය නිජබිම වෙත ගෙනයාමට මුස්තාපා බාලපුතු හවුල් කර ගත්තේ බලහත්කාරයෙනි. මේ පිය පුතු දෙදෙනා එකිනෙකාට නොපෑහෙන බව අපට චිත්‍රපටය ආරම්භයේ දී ම දැනෙයි. මේ Homeward නමැති යුක්රේනය චිත්‍රපටයයි. චිත්‍රපටය නිර්මාණය කරනු ලබන්නේ Nariman Aliev නමැති විසිහත් හැවිරිදි චිත්‍රපට කරුවා ය. ඔහු විසින් මීට පෙර 'ක්‍රිමියානු ත්‍රිත්වය' නමින් කෙටි චිත්‍රපට තුනක් නිර්මාණය කරන ලදී. homeward පසුගිය වසරේ කාන්ස් සිනමා උලෙළේ තිරගත කළ අතර academy සිනමා උලෙළේ හොඳම අන්තර්ජාතික චිත්‍රපටය සඳහා යුක්‍රේනයේ නියෝජනය විය.

එහි භාෂාව 'ටාටර්' භාෂාවයි. එය යුක්රේනයේ තුර්කි සම්භවයක් සහිත පැරණි ක්‍රිමියාවට අයත් ජනතාවගේ භාෂාවයි.

මුස්තාපා හා සිය වැඩිමහල් පුත්‍රයාගේ දේහය රෝහලින් භාරගනු ලබන්නේ රුසියානු වෛද්‍යවරයාට පගාවක් දීමෙන් අනතුරුවය. එහෙත් පුතුගෙ දේහය ගමට ගෙන යෑම හිතන තරම් පහසු කාර්යයක් නොවේ. එක් පැත්තකින් ආපස්සට අදින බාලපුතු ය. අනෙක් පැත්තෙන් කොයිවෙලාවෙ මග නතර වේ දැයි නොදන්නා තමාගේ රථය ය. නාසිම් දේහය ගෙන යා යුත්තේ එහි ය.

අලීම්ට තම අධ්‍යාපන ආයතනය අතරමග හමු වේ. එය පියාට පෙන්වන නමුත් තාත්තාට එය එතරම් වැදගත් නොවේ. ඔහුගේ එකම අරමුණ වැඩිමහල් පුතුගේ දේහය සිය පැරණි නෑයන්ගේ සොහොන් බිම වෙත රැගෙන යෑමය. මේ යන මඟ ඔහුට නුහුරු ය. ඒ මදිවාට මුස්තාපා හෘද රෝගියෙකි. මේ අතර නාසිම් යුක්‍රේනියානු බිරිය කතෝලික පොලෝසියා තම පුතුගේ අවමංගල්‍යයට පැමිණෙතැයි යන්න මුස්තාපා ගේ බලවත් සිත් තැවුලට හේතුවකි. මේ සියලු කරදරවලට හේතුව පොලෝසියා බව මුස්තාපා ගේ කල්පනාවයි. ඇය නොසිටින්නට නාසිම් කිසි කලෙක යුක්රේනයේ නතර වන්නේ නැත. එසේ නතර නොවුණා නම් ඔහු යුද්ධයට එකතු වන්නේ ද නැත.

මෙම රථය අතරමඟ නතර කරන පොලීසිය රථය අලුත්වැඩියා නොකර දුර ගමනක් නොයා යුතු බව දන්වා සිටී. කෙසේ වෙතත් ඒ අතරමග ගරාජයක් හමුවන අතර, ගරාජයේ මිනිපිරිය සමඟ අලීම් නාන්නට යාම තවත් අකරතැබ්බයකට මුල පුරයි. මේ අකරතැබ්බ සියල්ල තාත්තා සහ බාල පුතා අතර අලුත් සම්බන්ධතාවක් ගොඩ නඟන්නට ඉඩ සලස්වයි. මේ සිනමාකරු විසින් චිත්‍රපටයට එක් කරන අපූර්ව අවස්ථාවකි.

යුක්රේන දේශ සීමාවේ වෙසෙන ඥාතියකුගේ නිවහනට යෑමට ඔවුන් සමත් වෙති. එහි යන අතරමග දුර විවිධ ජන කොටස් ද විවිධ භාෂාවන් ද සිනමාකරු අපට කියා සිටී.
සමහර විට මේ තාත්තා පැරණි සෝවියට් දේශයේ පාලනයේ යටතේ හැදුණු කෙනකු වන අතර අලීම් එම පාලන තන්ත්‍රය ගැන දන්නේ නැත. මෙම යුද්ධය ද ඔහුට අදාළ නොවේ.

ක්‍රිමියාව යනු අපේ ජෙරුසෙලමයි' යනුවෙන් මුස්තාපා ලවා කියවන සිනමාකරු, ඒ හරහා යුක්රේන වැසියා තමන්ගේම ජන කොටසක් යැයි හඟවන්නට සමත් වෙයි.
සිනමාකරු තම නිර්මාණයේ චරිත අතර ඇති පරස්පරය ඉස්මතු කරනුයේ පරම්පරා අරගලයකින් නම් නොවේ. එහි එන සාමාන්‍ය සමාජීය සහ සංස්කෘතික බැඳීම් අතර ඇති වෙනස්කම් ද, දේශපාලන වෙනස්කම්ද සිනමාකරුගේ විමර්ශනයට ලක් වේ.

මුස්තාපාගේ වෑයම සිය ඥාතීන් ළඟට යෑම පමණක් නොවේ එයින් එහා තරණය කළ යුතු ගංගාවක් ද ඇත. අලීම් ට තවත් වගකීමක් මේ ගංගාව තරණයේදී පැටවෙයි. සිය වැඩිමහල් සොහොයුරාගේ දේහයට අමතරව ඒ වන තෙක් වැර වෑයමෙන් පණ නල රඳවාගත් තාත්තාගේ මෘත දේහය ද එයින් එතෙරට ගෙන යා යුතු බැවින් ය.

'road movie' නැතහොත් මාර්ග සිනමාවක් යනු, ඉතා වැර වෑයමෙන් ගොඩනැගිය යුතු සිනමාවකි. මේ සිනමා නිර්මාණ විවිධ චරිත හා සිදුවීම් ඔස්සේ ගොඩ නැගිය යුතු බැවිනි. එමෙන්ම එය රූපමය චාරිකාවක් විය යුතුය. නැතහොත් චරිත අතර අරගලය හුදු සාම්ප්‍රදායික සිදුවීම් මාලාවක් පමණක් වනු ඇත.


පැරණි ස්ටාලින් සෝවියට් පාලනය යටතේ ටාටර් මුස්ලිම්වරු සමූල ඝාතනයට ලක්වූ අතර ඉතිරි පිරිස රටේ එක් තැනක හුදෙකලා විය. වර්තමාන යුක්රේනයේ ද සිටින මේ කුඩා ජන කොට්ඨාසයට වරප්‍රසාද අහිමි ය. එසේනම් නාසිම් කොහේවත් නැති යුද්ධයකට පැටලෙන්නේ සිය කතෝලික පෙම්වතිය නිසා ද යන තාත්තගේ ගැටලුව සිනමාකරු අප වෙත ගෙන එයි.



Nariman Aliev විශිෂ්ට සිනමාකරුවකු බවට පත් වනුයේ සිනමාපටය තුළ ඇති පරම්පරාගත ගැටුම පමණක් නොව යුක්‍රේන දේශපාලනය ද කිසිවකුට නොබිඳිය හැකි මානව සම්බන්ධතා ද එකවර සිය තිරනාටකය හරහා ඉස්මතු කරවීමෙනි.


විශිෂ්ට රංග කුසලතා මෙන්ම සිනමාපටය පුරා ගැන යන කැමරාකරණය ද සිනමාකරුගේ ආධිපත්‍යය විදහා දක්වයි.

චිත්‍රපටය අවසානයේ බෝට්ටුවක නැගී සිය නිජබිම කරා ඇදෙන අලීම් අවසානයේ යුක්රේනයේ අගනුවර වෙත යළි හැරී යනු ඇති ද, එසේත් නැත්නම් තම නිජබිමෙහි ජීවත් වනු ඇතිද? යන ගැටලුව සිනමාකරු අපට ඉතිරි කරයි. එපමණක් නොව මේ නන්නාඳුනන රටක තාත්තා ගැන ආදරයක් අපට ඉස්මතු කරයි. ඒ ලොව පුරා තාත්තලා එක වාගේ යයි සිනමාකරු නොකියා කියන හින්දාය.
පුතු සෙනේ පිතු හද තුළම මිස
නැත පුතුන් හද තුළ රඳන්නේ



**අරුණ ගුණරත්න**

# බණ කතා



ලෝකෙ විවිධාකාර ආගම් හාරදහස් තුන්සියයක් විතර තියෙනවා. ඒ ආගම්වල විවිධාකාර දේවල් උගන්වනවා. සමහර ආගම්වල හැටියට 'ලෝකය දෙවියන්වහන්සේ විසින් මැව්වා'ය කියැවෙන අතරෙ, තවත් සමහර ආගම්වල උදවිය නිරුවතින් ගංගාවල නාලා මෝක්ෂය හොයනවා.

මේ හැම ආගමක්ම ඒ ආගම් අදහන උදවියගෙ හිත් නිවනවා.

උපතින් බුද්ධාගමේ වෙච්ච මට නිතරෝම බණ ඇහෙනවා. දැනුම් තේරුම් ඇති කාලෙ ආවහම ආගමක් විදිහට වඩා දර්ශනයක් විදිහට බුදු දහම කොයිතරම් අර්ථාන්විතද කියලා තේරෙන හන්දා නිවන්මග ගැන දේශනා කරන ස්වාමීන් වහන්සේලාගේ බණ අහන්නෙ හිතේ කැමැත්තෙන්මයි.

පුංචිම කාලෙ ඇහිච්ච බණ කතා ඇහෙන විදිහ ටිකෙන් ටික ලොකු වෙද්දි වෙනස් වෙනවා.
ලෝකෝත්තර බණවලට වැඩියෙන් ලෞකික ජීවිතේ ගැන කියවෙන බණ ඇහෙන්න පටන්ගන්නවා. බුදු හාමුදුරුවො බණ දේශනා කරලා තියෙන්නෙ නිවන අරමුණු කරගෙන විතරක්ම නෙවෙයි කියලා මම දන්නවා. ලෞකික ජීවිතය සාර්ථකව ගත කරන විදිහ ගැන කියවෙන බණ කතාත් ජීවිතයට ආලෝකයක් එකතු කරනවා. ඒත්, අවාසනාවන්ත විදිහට ලෞකික ජීවිතේ ගැන කියවෙන බණ කාලෙත් එක්ක අලුත් හැඩතල මවන්න පටන් ගන්නවා.

කාලෙත් එක්ක බණ කතාවල හැඩතල විතරක් නෙමෙයි, නිවැරදි බුද්ධ දේශනා සියල්ලමත් සම්පූර්ණයෙන් විකෘති වෙලා, දවසක ලෝකෙන් තුරන් වෙලා යනවය කියලා බුදු හාමුදුරුවන්ම දේශනා කරලා තියෙනවා. ඒත් කහ නූලක් අතේ බැඳගෙන මහණදම් පුරන අවසාන පුද්ගලයාටත් එක විදිහටම ගෞරව කරන්නය කියලත් බුදු හාමුදුරුවො වදාරලා තියෙනවා.

ගෞරව කිරීමත්, උපදෙස් පිළිපැදීමත් කියන්නෙ දෙකක් හන්දා, "කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුය." කියන පුරාතන උපහැරණය මට මතක් වෙනවා.

එක්තරා රහතන් වහන්සේ යයි කියාගන්නා උතුමෙක් අක්කර ගණනාවක ගොවිතැන් බත් කරනවා. ඒ ආරාමයේ භික්ෂු භික්ෂුණීන් දිවා රෑ නොමැතිව වගා කටයුතු කරනවා. නිල් කටරොලු පාට කිරිබත් උන්වහන්සේගේ දානෙට පිළිගැන්වෙනවා. පාට පාට ඇඳුම් ඇඳපු උපාසිකාවොත් එක්ක උන්වහන්සේ උපන්දින සමරනවා. "අපි වැව්වොත් අපි කනවා" කියලා උන්වහන්සේ රූපවාහිනී සාකච්ඡාවකදී හිනාවෙලා කියනවා. ධර්ම ඥානය උපරිම හන්දා ආගම ධර්මය ගැන කියවෙන ඕනෑම තර්කයක් උන්වහන්සේ තර්ක කරලා පරද්දනවා. උන්වහන්සේටම කැපවෙච්ච සල්ලි හුගාරියක් තියෙන උපාසක උපාසිකා පිරිවරක් ඉන්නවා. බුදු හාමුදුරුවන්ගේ කාලෙත් තමන් වහන්සේත් බුදුවෙලාය කියලා දේවදත්ත කියනවා. දේවදත්ත හාමුදුරුවන්ටම වෙන් වෙච්ච උපාසක උපාසිකා පිරිසක් ඉන්නවා. බුදු හාමුදුරුවන්ගේ කාලෙත් තවත් බුදුවරු පහළ වෙලා හිටි හන්දා "අනේ කාලේ වනේ වාසේ" කියලා හිතින් දුක් වෙන්න තරම් කාරණාවක් නැතිය කියලා මට හිතෙනවා.

සුදු පාට පිච්ච මල් වැල් පසුපසින් එල්ලෙන, උස ධර්මාසනයක ඉඳගෙන තවත් ස්වාමීන් වහන්සේ නමක් නිවුනු හඬකින් බණ කියනවා. සුදු ඇඳගෙන මැදිවයසට ළං වෙච්ච උපාසිකාවො දෑත් නළලෙ තියාගෙන බණ අහනවා. කසාද බඳින්න කලින්,

## නෙළුම් කතන්දර

කසාද බඳින්න ඉන්න ගෑනු ළමයගෙ අතින් අල්ලන පිරිමි ළමයි ආත්ම ගණනාවක් නිරයේ පැහෙනවාය, කියලා මේ හාමුදුරුවො දේශනා කරනවා. ඒ වගේ උදවිය පෝරුවේ නැංගාම උඩ ඉන්න දෙවිවරු "තූ" ගාලා පොළොවට කෙළ ගහලා යනවය කියලත්, ඒ වගේ උදවියට කසාද බැන්දට පස්සේ දරුවෝ ලැබෙන්නේ නැතිය කියලාත් මේ හාමුදුරුවෝ දේශනා කරනවා. බණ අහන උපාසිකාවො දෑත් තවත් නළල මුදුනට අරගෙන "සාදු...සාදු...." කියනවා. කසාද බඳින්න කලින් එකට ජීවත් වුණු, දරුමල්ලො තුන් හතර දෙනා ඉන්න පිටරට වගේම ලංකාවෙ උදවියත් මට මතක් වෙනවා. අතින් වත් අල්ලන්නෙ නැතුව කසාද බැඳලා, ප්‍රබල ලිංගික නොගැළපීම් හින්දා වෙන්වෙන්න සිද්ධ වුණ ජෝඩු ගැන කතන්දර ආයෙ ආයෙත් ඇහෙනවා වගේ මට දැනෙනවා.


ගැහැනු කියන්නේ පව් කරපු උදවියය, ඒ නිසා ඒ පව් ගෙවන්න නම් තමන්ගේ ස්වාමියාට දෙවි කෙනෙකුට වාගේ සලකන්න ඕනෑය, කියලා තවත් ස්වාමීන් වහන්සේ නමක් දේශනා කරනවා. ඒ සවාමීන් වහන්සේ කියන විදිහට තම සැමියා විසින් සාදන ලද තේ කෝප්පයක් තොලගාපු හැම කාන්තාවක්ම අපායෙ දොරටු තමුන්ගෙ කැමැත්තෙන්ම විවෘත කර ගන්නවා. දුරාතීතේ ගැහැනු උදවිය කෙසේ වෙතත්, දැනට අවුරුදු විසි තිස් ගනන්වල ගැහැනු උදවිය මිය ගියාට පස්සෙ අපායෙ දොරටුව ළඟ පෝලිමේ හිටගෙන ඉන්නවා මට මැවිලා පේනවා.

හිටි හැටියේම ලංකාවෙ කොරෝනා තත්ත්වයේ හදිසි වර්ධනයක් පෙන්වනවා. ඇඳිරිනීතිය කොයි වෙලාවේ කොයි දිස්ත්‍රික්කයට බලපාන විදිහට ක්‍රියාත්මක වෙයිද කියලා නොදන්න හින්දා වැඩිපුර කෑම ටිකක් ගෙනත් තියාගන්න වෙයි නේද කියලා ඉස්කෝලෙ යන වයසෙ පුතා අම්මට කිට්ටු කරලා අහනවා. "ඇහුනා නේද දැන් හාමුදුරුවෝ කියාපු බණ?" අම්මා අහනවා. හාමුදුරුවන්ගේ බණ ඇඳිරිනීතියට ගළපා ගන්න බැරුව පුතා අම්මා දිහා බලනවා. "ඇයි අර හාමුදුරුවෝ කිවුවේ, ලොකු මහත්තුරු ට්‍රොලි පිටින් බඩු ගෙදර ගෙනියනවාය, එහෙම නැතුව එන හැටියකට ජීවිතේට මූණ දෙන්න අපි පුරුදු වෙන්න ඕනෑය, කියලා" අම්මා පුතාට කියනවා. හාමුදුරුවෝ කෙසේ කීවත් ඇඳිරිනීතිය වෙලේ ගෙදර කෑම අහවර වුණොත් ඉන්න වෙන්නේ බඩගින්නේය. කියලා පුතා කල්පනා කරනවා.

මේ අතරතුර කවදාවත්ම ධර්ම දේශනා නොකරන ආරණ්‍යගතව භාවනා කරලා මගපල ලබන පැවිදි උතුමන් ඉන්නවා. ජීවත් වෙද්දිම ඇස් ඉස් මස් ලේ දන් දෙන ශ්‍රමණ උතුමන් ඉන්නවා. උන්වහන්සේලා ගේ කැපකිරීම් සහ නිවැරදි බුදු දහම මිනිස් ඇස්වලට නොපෙනීම හැංගිලා යනවා.

හුගක් උපාසක අම්මලා සමහර පැවිදි උතුමන් දේශනා කරන නිවන් මග අරමුණු කර ගත්තු ගැඹුරු බණ "අපෝ ඒ බණ හරි බරයි" කියලා අහන්නෙ නැතුව ඉන්නවා. ඒ වෙනුවට කලිසම් ඇඳපු ගැහැනු ළමයින්ව නැගිට්ටවලා බනින, හැම බණකටම නිශ්චිත මුදලක් අයකරන හාමුදුරුවන්ගේ බණ අහනවා. අහලා ඒ බණ ජීවිතේට ගළපගන්නත් උත්සාහ කරනවා.

නිවන් මග කියන්නේ "මල් පාරක්" නෙමෙයිය, කටු ඉතිං, ගල් බොරලු පිරිච්ච ඒ පාරෙ ඇවිදගෙන යන්න නම් ශ්‍රද්ධාව වගේම බුද්ධියත් යහමින් වුවමනා වෙනවය කියලා, අද කාලෙ බණ අහන උදවිය තේරුම් ගන්නවා නම් බොහොම වටිනවා.



**දසුනි හෙට්ටිආරච්චි**

# බද්දරමල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ



## ටොම්සන් මහත්තයා

# දැළිපිහි සටහන්

"ඇම්බන් මහත්තයා අහලා තියෙනවාද වඳුරෝ සහ දැළිපිහි ගැන." කියා ටොම්සන් මහත්තයා ඇසුවේ සාලයේ හිඳ ගෙන තේ බොමින් සිටි ගමන්ය.
"නැතුව නැතුව ටොම්සන් මහත්තයා.... හැබැයි ඔය කතාව තියෙන්නේ කළු වඳුරා ගැනද? සුදු වඳුරා ගැනද?" කියා ඇම්බන් මහත්තයා සිනාසෙමින් ඇසුවේය.
"දන්නෙ නෑ ඇම්බන් මහත්තයා... මං හිතන්නේ කළු වඳුරා ගැන වෙන්න ඇති. දැළි පිහි හම්බ වෙන්නේ ඒ වගේ කළු වඳුරන්ටම තමයි..." කියා ටොම්සන් මහත්තයා කීවේය.
"හරි ඉතින් ඔය කළු වඳුරු කතාව මොකද මේ උදේ පාන්දරම ඇද ගත්තේ...? කොහේ හරි කළු වඳුරෙක්වත් දැක්කද? කොහොම වුණත් දැළි පිහිය නම් බොහොම භයානකයි. ඒකෙන් කොහෙන් කොහෙන් කැපෙයිද දන්නේ නෑ... හැබැයි දැන් කාලේ දැළි පිහි නෑ නේද? අලුත් විදිහට නේ දැන් රවුළු බාන්නේ... ඒකෙන් වැඩක් නෑ... ටොම්සන් මහත්තයා ඔය වහෙන් ඔරෝ විදිහට කියා ගෙන එන්නේ මොකක්ද? මට නම් ඒක තේරෙන්නේ නෑ..." කියා ඇම්බන් මහත්තයා හිස් කෝප්පය මේසය මතින් තැබුවේය.
"ඒක උදාහරණයක් විතරයි ඇම්බන් මහත්තයා... දැන් මේ සමාජ මාධ්‍ය පරිහරණය කරන උදවිය ඉන්නවානේ... ඒ අය සමාජ මාධ්‍ය පාවිච්චි කරන්නේ වඳුරන්ට දැළි පිහි හම්බ වුණා වගේ තමා... හැරිච්චි හැරිච්චි අතට කොටනවා. කිසිම නිනව්වක් නෑ... කිසිම අවබෝධයක් නෑ... තමන්ගේ මෝඩකම් සමාජ මාධ්‍ය ඔස්සේ ජනසතු කරන්න හදනවා..." කියා ටොම්සන් මහත්තයා කියන විට උන්නැහේද එතැනට ආවේය.
"ටොම්සන් මහත්තයා කියන දේට මාත් එකඟයි. මොකක් වුණත් පාවිච්චි කරන්න ශික්ෂණයක් - විනයක් තියෙන්න ඕනෑ... දැන් වෙලා තියෙන්නේ ඇත්තටම වඳුරන්ට දැළි පිහි හම්බ වුණා වගේ තමයි. මොන විනයක්ද? මොන ශික්ෂණයක්ද? දැන් අර බලන්න අර රාජ්‍ය ඇමතිතුමියට අවමාන කරන්න සමාජ මාධ්‍ය යොදා ගෙන තියෙන හැටි... රටේ ලෝකේ හැටි දන්නෙ නෑ... ආයතනවල වැඩ කරන හැටි දන්නේ නෑ... කාට හරි මඩ ගහන්න ඕනෑ වුණාම තමන්ගේ ඔළුවට එන අමන ගොන් අදහස් කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැතුව සමාජ මාධ්‍යවලට දානවා.... අනේ මේ රටේ තරුණ පරපුරට ගිය කලක්..."
ටොම්සන් මහත්තයා සුසුමක් හෙළුවේය.
"හැබැයි සමාජ මාධ්‍ය මේක කරේ තියා ගෙන යන්න හැදුවට ප්‍රධාන ධාරාවේ මාධ්‍ය කවුරුවත් මේක අල්ලා ගත්තේ නෑ..." කියා ටොම්සන් මහත්තයා කීවේය.
"නැත්තේ මොකද? මං දැක්කා මොකක් හරි පත්තරයක ඕක ගැන කාටුන් එකකුත් ඇඳලා තිබුණා. තව ඉංග්‍රීසි පත්තරයකත් ඔය ගැන ලියලා තිබුණා... හැබැයි අනික් කිසිම මාධ්‍යයක් මේක කරේ තියා ගත්තේ නෑ..." කියා කීවේ උන්නැහේය.
"ඒක එහෙම තමයි... ඒ මාධ්‍ය කවුරුත් දන්නවා ඒකේ එහෙම සදාචාරය ගැනවත්, නීතියට අනුවවත් කිසිම ප්‍රශ්නයක් නෑ කියලා... ඒකයි ඒ මාධ්‍ය නිහඬ වුණේ... මට මතක් වෙනවා උන්නැහේ දැන් ඔය කාර්යාලවල වැඩ කරන අයට බෑග් දෙනවා නේද? ඒ මොකටද ඒවා දෙන්නේ...? මොකද කාර්යාලේ වැඩ ගෙදර ගිහින් කර ගෙන එන්නද? නෑ නේ... ඒවායේ දා ගෙන එන්නේ බත් එක විතරයි... හවසට ගෙදර යන ගමන් එළවළු ටිකයි, පාන් රාත්තලයි දා ගෙන යන්නෙත් ඒ කාර්යාල බෑග් එකේ තමයි..." කියා ටොම්සන් මහත්තයා කීවේය.
"ඒකටත් වඩා වෙනස් දෙයක් මට මතක් වෙනවා... දැන් ඔය පහුගිය ශතවර්ෂයේ අග භාගයේදී ඔය කාර්යාලවල ලිපිකරුවන්ගේ මේස උඩ තිබුණා නේද අළු බඳුනක්..." කියා උන්නැහේ ඇසුවේය.
"ඒ කියන්නේ අර අළු බඳුන කියන ක්‍රිකට් තරගය ගැනද?" කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.
"නෑ... නෑ... එහෙම නෙවෙයි.. .ලිපිකරුවන්ට සිගරට් බීලා අළු ටික දාන්න තමයි ඒ අළු බඳුන දුන්නේ. ඒක දුන්නේ ආණ්ඩුවේ සල්ලිවලින්. සිගරට් බොන එක එහෙම පිටින්ම පෞද්ගලික වැඩක් නේ. මොකටද ඒකට මහජන මුදලින් අළු බඳුන් අරන් දුන්නේ... මං අහන්නේ එහෙම සිගරට් බීපු අයගේ දරුවෝ නේද අද මේ සමාජ මාධ්‍යවල දැළිපිහි සටහන් තියන්නේ..."
"උන්නැහේ කියාපු උදාහරණේ නම් හරිම අපූරුයි... ඒකටත් වඩා මට වෙන දෙයක් මතක් වුණා... දැන් අර පත්තරේකට මේ ගැන ලිපියක් ලිව්වා කිව්වා නේද? එතකොට ඒක ලියන්න පෑන ගෙදරින් ගෙනාවද? එහෙම නැතිනම් කන්තෝරුවෙන් දුන්නු පෑනකින් ලිව්වාද? එතනත් වැරදියි නේ... ලියලා දෙනවාට තමයි පඩියක් ගෙවන්නේ... ලියන්න පෑනක් ඒ පඩියෙන් ගන්න ඕනෑ නේද? ඒ ගැන මොකද කියන්නේ...?" කියා ඇම්බන් මහත්තයා ඇසුවේය.
"මොනවා කියන්නද? සමාජ අධ්‍යාපනයක් නැති රටක ඔයිට වැඩිය වෙන දෙයක් වෙන්නේ නෑ... අර ගමේ කතාවක් තියෙන්නේ බල්ලො බිරුවාට කඳු පාත් වෙන්නේ නෑ කියලා. ඒ විදිහට වැඩ කර ගෙන යන එක තමයි තියෙන්නේ... වඳුරන්ට දැළි පිහි දීලා ඉවර හින්දා උනුත් දැළි පිහි වනයි. ඒකට මොකද කරන්නේ.. කනගාටු වෙනවා ඇර... " කියා ටොම්සන් මහත්තයා කීවේය.



**බන්දුල පී. දයාරත්න**



# අද දවස අඳුරුය

## මතක පොතෙන්

අවුරුදු නවයේදී දහයේදී විතර සිළුමිණ කමලා ළමා සමාජයට වාසනාව කියන පුංචි කතාව ලිව්වා. ඉන් පස්සෙ ජනතාවෙ කුමාර මණ්ඩපය, ලංකාදීපෙ බින්දුගේ ළපටි පෙළ මං අත්අකුරු අමුණපු තැන්. බාල කාලේ මං ජීවත් වුණේ මහනුවර. දැන් මං දිවි ගෙවන්නේ උපන් ගමෙන් ඈත, ගම්පහ දිස්ත්‍රික්කයේ අග්නිදිග ආසියාවටම තියෙන මහා දැවැන්තම නිවාස සංකීර්ණයේ.
දැන් මේ නිවාස සංකීර්ණය සුපිරි පන්තියේ මහ සද්දන්ත වාණිජ පුරවරයක්. හිතට නිවනක් හිසට සෙවණක් දුන්නු එතැන, දැවැන්ත වෙළඳ ප්‍රජාවකගේ අණසකට හිරවෙච්ච කොන්ක්‍රීට් වනාන්තරයක්. එදා ගෙවල් 2226 යි. අද ඒ ගෙවල් පැටව් ගහලා.
මගෙ අකුරු නවාතැන් ගත්ත පත්තර, නවයුගය, ජනතා, සිළුමිණ වගේම ඉරිදා ලංකාදීප, දිවයින, සිරිකත, තරුණී තව කොච්චරක් කියලද?
දිනමිණ වෙසක් කලාපයකට තිලකරත්න කුරුවිට බණ්ඩාර අයියාගේ ඇරියුමෙන් ලියූ කෙටිකතාව, පස්සෙන් පහු බෞද්ධ මහා සම්මේලනය මෙහෙයවන බෞද්ධ සඟරාවකත් තිබුණා. ජාතික අධ්‍යාපන ආයතනයේ දවස් දෙකක සම්මන්ත්‍රණයේදී ගුරු ලේඛක සහ චිත්‍ර ශිල්පීන් තුනකගේ සමවායෙන් තෝරගත්තු 'අපෙ අම්මා කිරට ගියා' තේමාවෙන් ලියැවුණු කතාවත් මගේ.
පුංචිම බාල කාලෙදී අපි එකතු වුණේ ගුවන් විදුලිය ළඟ. ටික කලක් යද්දි අපේ ගෙදරට ලැබුණා ලොකු වයර්ලස් එකක්. ඒකෙන් අහපු සරස්වතී මණ්ඩපය, මිණිකිංකිණි, ගුවනේ මිතුරෝ, පද්‍යාවලිය හිත බැඳගත්ත අපූරු වැඩසටහන්.
යොවුන් විය එක්ක 'මඩවල එස් රත්නායක' මෙහෙයවූ යෞවන සමාජයටයි මුලින්ම ආවේ. 'සරස්වතී මණ්ඩපයෙ' බුද්ධදාස බෝධිනායක, සුනිල් සරත් පෙරේරා, අජන්තා රණසිංහ, මොනිකා රුවන් පතිරණ, සුධර්මා සුභාෂිණී ෆොන්සේකා අපි එතෙක් නොදුටු ආදරණීය අයියලයි අක්කලයි. පසුව අපිත් එකතු වුණා ළමා මණ්ඩපයට. පුෂ්පා මෙලනි රත්නායක, ශිරාණි ගුණතිලක, විජයලක්ෂ්මී මොහොට්ටි, සමන් පනාගොඩ, අපි ඔක්කොම ගුවන්විදුලියට කරු අයියාගේ කටහඬ දිගේ ඇදිලා ගියා. සුධර්මා සුභාෂිණී අක්කා තරුණ වියේදීම අකාලයේ මිය ගියා.
යෞවන සමාජයෙන් ප්‍රචාරය වුණු, ගුවන් ගත වුණු, හුගක් ලිපි, කවි, නාට්‍ය ඒ දවස්වල ගුවන් විදුලි සඟරාවක මුද්‍රණය වුණා. ලිඛිත මාධ්‍යයෙන් සිදුවණ එවැනි කටයුත්තක් ගුවන්විදුලියෙන් කිරීම, අපේ ලේඛන දිවියට



ලොකු අත් වැලකුත් වුණා කියලා කියන්න ඕනෑ.
යෞවන සමාජයේ දී අපි හුඟ දෙනෙක් මුණ ගැහුණා රංජිත් කුමාර, ජයම්පති රූපසිංහ, කුලරත්න ආරියවංශ, ගීත් ගුණරත්න, සුනිල් සමරසේකර, බුද්ධදාස ගලප්පත්ති, ජයලත් මනෝරත්න විතරක් නෙවෙයි, අගනුවර කේ නන්දදාස, ඇරැව්වල නන්දිමිත්‍ර, උලපනේ ගුණසේකර වැනි යොවුන් ලේඛකයෝ විශේෂයි.
මතක විදිහට රෝහණ සිරිවර්ධන විතරක් නෙවෙයි පුන්සිරි සොයිසාත් දොරට වැඩියෙ ළමා මණ්ඩපයෙන් හෝ යෞවන සමාජයෙන්.
දයා ද අල්විස් අක්කා මුලින් දයා රණතුංග වුණා. රත්නා ලංකා අබේවික්‍රම, සුමනා නෙල්ලම්පිටිය, බණ්ඩාර විජේතුංග, එල්මෝ ප්‍රනාන්දු මේ අය ඔක්කොම බිහිවුණේ ගුවන්විදුලියෙන්. ප්‍රේමකීර්ති ද අල්විස් ඒ අතරින් සුවිශේෂයි. මේ සියල්ලම වාගේ අතීත වංහුං. අතීත වංශ කතාවේ අපේ පරම්පරාවේ ලූෂන් බුලත්සිංහල අයියාගේ වැඩසටහන්වලටත් අපි එදා අනේක වත් දායක වුණා. කටහඬින් චිත්‍රා කුමාරි කළුබෝවිල, ධර්ම ශ්‍රී වික්‍රමසිංහ. ඒක සුන්දර යෞවන කාලයක්. ගුවන්විදුලිය කියන මහා සද්දන්ත ඇත් පවුරක් වටා තමයි අපි ඔක්කොම එක්රොක් වුණේ. දැන් ඉතින් මෙච්චා කාටද කියන්නේ. ගුණරත්න අබේසේකර ගුවනේ මිතුරෝ මෙහෙයවූවා. ඔහු ඉක්මනට අප අතරින් සමුගත්තා. සැඳෑ යාමය ඉක්මනින්ම ගෙවීගෙන යනවා. ආයෙ යළි අරුණලු දකින්න බැහැ. අපේ හිත් තුළ තියෙන්නේ ඒ යෞවනයේ චමත්කාර ජනක බලාපොරොත්තු රැල්ලයි. ඒ හින්දම ද කොහෙද දිවංගත වෙන එක තව චුට්ටකට හරි කල් යාවි කියලා මට හිතනවා.


**ලක්ෂ්මී බෝඹුවල**

# අපි අපි



## කැඩැල්ලක නෙත

ගොදුරක් ගිල දමන විශාල සත්ත්වයකු පරිද්දෙන් මඟීන් පටවාගත් බසය මහ හඬ නගමින් ඉදිරියට ඇදෙයි. ශ්‍රියා පුංචි අම්මාත් මාත් පාරේ අනෙක් පසට යා යුතු ය. එහෙත් පාර හරහා මාරු වීම පහසු නැත. එක පෙළට ගමන් ගන්නා වාහන කන්දරාව මඳකට නවතාලන බලයක් හිමි, මාර්ග සංඥා ආලෝක පුවරුවේ පිහිට වුවමනාය.
පාර තරණයට ඉවසිල්ලෙන් බලා හුන් කාන්තාව සමග සසඳා බලන කල අපේ නොඉවසිල්ල කැපී පෙනිණ. හිස නගා කොතෙක් බැලුවද අර කුඩා මිනිස් රුවේ රත් පැහැය වියැකී කොළ පැහැය මතු නොවේ. පාරේ අනෙක් පස එකී වර්ණ විපර්යාසය උදෙසා පාරේ මේ පස පදිකයා බොත්තමක් එබිය යුතු බව මට සිහිපත් විය.
"කෝ තාම නෑනෙ. ඔයා බට්න් එක එබුවද?" මම නාඳුනන කාන්තාවගෙන් ප්‍රශ්න කළෙමි.
"අප්පේ... මට බෑ. ඔච්චා ඔබන්න ගිහින් කරන්ට් එක වැදුණාම."
මම අන්දමන්ද වීමි
"කරන්ට් එක වදින්නෙ නෑ. බට්න් එක ඔබන්නෙ නැතුව කොච්චර වෙලා බලා හිටියත් පාර මාරු වෙන්න බෑනේ." යි මම පහදා දුනිමි.
"ඉතින් මට කියන්නෙ, ඔයා ඔබන්නකො. ඔච්චා ඔබල මට කරන්ට් එක වැදුනාම මගේ ළමයින්ට කන්න දෙන්නෙ ඔයා ද?" යි ඇය මා වෙත කඩා පැන්නේ මා කිසිසේත් අපේක්ෂා නොකළ අන්දමිනි.
"ඇත්තටම මම හිතුවේ ඔයා ඔබන්න ඇති කියලා. අපි එනකොටත් ඔයා මෙතන හිටිය නේ."
අපේ වාදය නොතැකූ තවත් පදිකයෙක් ඇය බියපත් වූ කර්තව්‍යය ඉතා පහසුවෙන් හා නොපමාව සිදු කළේය.
ඔහු ඇය වෙත හෙළුවේ 'ඔන්න දැක්කද මං එබුවා මට කරන්ට් එක වැදුන නෑ නෙ' කියන්නාක් බඳු ජයග්‍රාහී බැල්මකි.
මාර්ගයේ දෙපස නවතා ගත් වාහන නිහඬව කියා පාන්නේ පදිකයන්ට අනලස්ව මාර්ගය තරණය කළ යුතු බව ය. ඒ සඳහා ගත වූ සුළු කාලයේදීද ඇය නො නවත්වා දෝෂාරෝපණය කළාය.
"කියන්න නං ඉන්නවා කට්ටිය. අණ දෙන්න තමා හැම එකාම බලන් ඉන්නේ. අනුන්ට කිය කියා ඉන්න වෙලාවේ තමුන්ම කරා නං ඉවරයි නේ. කොහොමද හරියටම කියන්නේ කරන්ට් එක වදින්නෙ නෑ කියලා. මෝල් ගහත් පත්තුවෙන අබුද්දස්ස කාලේ..."
ඇයගේ කෝපය මට සිනාවට කරුණකි. මා සිනාව මැඬ ගත්තේ ආයාසයෙනි. එහෙත් මෙය හාස්‍යයට ලක් කොට අමතක කර දැමිය හැකි සරල සිදුවීමක් නොවන බව මා දෙවනුව කල්පනා කළේ කනස්සල්ලෙනි.
විද්‍යාව හා තාක්ෂණය පිළිබඳව කොතෙක් වාගාඩම්බර කතා කළ ද අපේ සමාජය තුළ අතිශයින් අවිද්‍යාත්මක මත දරන්නවුන් ද කොතෙකුත් සිටිති. සාක්ෂරතාවය පිළිබඳ



උදම් අනනවා වෙනුවට අප මේ පවතින යථාර්ථය අවබෝධ කර ගත යුතුව තිබේ.
අපේ අනවබෝධයේ තරම පසක් කරගන්නට කලකට පෙර ඒඩ්ස් වැලඳි මවකගේ දරුවාට එරෙහිව පාසලේ මව්පියවරුන් කළ උද්ඝෝෂණය ඉවහල් නොවේ ද?
ඒඩ්ස් රෝගීන් සිප වැලඳ ගනිමින් ජනකාන්ත කුමරිය ඩයනා ලොවට විදහා පෑ දයාබරත්වය පවා අපේ මතකයේ නැතුවා වගෙයි.
බොහෝ කරුණු කාරණා සම්බන්ධයෙන් අපි විශේෂඥයෝ වෙමු. එහෙත් වග විභාග කර බැලූ කල ඒ සියල්ලම පාහේ අරුතක් රහිත රොඩු බොඩු විනා පදනමක් සහිත ආකල්ප නොවේ.
අවිද්‍යා අන්ධකාරය පමණක් නොව ඉතා සුළු කරුණකින් තදබල ලෙස කෝපයට පත්වීම ද අපේ තවත් දුර්වල කමක් නොවේ ද? ජීවන බර හැරුණු කොට ඒ සඳහා බලපාන අනෙක් කරුණ ලෙස මා දකින්නේ අප අතරේ ආදරය සහ ගරුත්වය තදබල ලෙස බිඳ වැටීමය. අනෙකාට ආදරය කරන්නට මෙන්ම ගරු කරන්නට ද අප අපොහොසත් වෙමු. ආදරය ඉවතලා දණ්ඩනය තෝරාගත් රටක ප්‍රීතිමත් පුරවැසියකු අපේක්ෂා කළ හැකිද ? පව් කළොත් අපායේ යන බවට බියවද්දා අපායෙ දෙතිස් වධය විස්තර කරනවා වෙනුවට, තමා උපමා කොට අනිකා දකින, හඟින ලෙස බුදු හිමි දෙසූ වග සිහි කරන්නේ නම් අපේ කෲරත්වය යම් තරමකින් හෝ අව ප්‍රමාණ කර ගත හැකි වනවා නිසැකය. මුදු වදනකට එක් හසරැල්ලකට තවත් පුද්ගලයකු තුළ බලවත් විපර්යාසයක් සිදු කළ හැකි වග අප වටහා ගන්නා තෙක් මේ නොරුස්නා සහගත බව ද, ප්‍රචණ්ඩත්වය ද තුරන් නොවනවා ඇත.
ජීවිතය මහා සංග්‍රාමයක් වූ කල සෙසු සියල්ල නොවැදගත් වන බව සැබෑය. එහෙත් අපේ දරුවා හෝ කලාවට නැඹුරු කිරීමෙන් උපේක්ෂාව වර්ධනය වන අතරම, මෘදු මොළොක් බව ද අත්පත් කර ගන්නා වග නිසැකය. විද්‍යාවත්, කලාවත් නොපෑහෙන වග කියතත්; විද්‍යාවත්, කලාවත් එක්තැන් වූ කල සුපසන් මිනිසෙක් බිහි නොවන්නේ ද? අපේ අධික කෝපයට වගකිව යුත්තා අහසේ දිලෙන හිරු පමණක් නොවේ. සමකාසන්නයේ රටක් වීම හැරුණු කොට ඒ සඳහා බලපාන අනෙකුත් හේතු කාරණාද අප අමතක කළ යුතු නැත.
"ඒ ගෑනිට පිස්සුද මන්දා." ශ්‍රියා පුංචි අම්මා හෙළා දකින කල මම අනුකම්පා සහගත සිනාවක් පෑවෙමි.
"නොදන්නා කමත් එක්කම ජීවිතේ උහුලා ගන්න බැරි තරම් බරක් දුකක් හින්දම වෙන්න ඇති එයාට ඔය තරම් තරහ ගියේ. පව් පුංචි අම්මේ."
ඇයට මා සමඟ වාද කරන්නට ඉඩක් නොලැබුණේ අප ගමනාන්තය සඳහා අප යා යුතු බසය පැමිණි බැවිනි. පොරයට අකැමැති නිසාම ඉවසීමෙන් බලා හුන් මට අන්තිමේ දී සිදු වූයේ ධාවනය වන බසයේ එල්ලෙන්නට ය.



**ශාන්ති දිසානායක**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

## අහම්බෙන් පොලොන්නරුව සොයාගත්
# ලුතිනන් ෆේගන්

"අහම්බෙන් පොලොන්නරුව සොයාගත් ලුතිනන් ෆේගන්" යන ශීර්ෂය ඇතැම් විට ඔබේ කුතූහලයට හේතු විය හැක. 'පුරාණියේ පටන් පැවති පොලොන්නරුව සුද්දකු විසින් කෙසේ නම් සොයාගනු ලබන්න ද?' ඔබ විමතියෙන් ප්‍රශ්න කරනු ඇත.

පොලොන්නරුව සියවස් දෙකකට අධික කාලයක් ලංකාවේ කීර්තිමත් අගනුවරක්ව පැවතිය ද කාලිංග මාඝගේ ආක්‍රමණයත් සමඟ එම කීර්තිමත් නගරය විනාශයට ගියේ ය. දඹදෙණි රාජධානිය ස්ථාපිත වීමෙන් පසු එහි අවසාන රජු වූ තෙවන පරාක්‍රමබාහු (සතරවන විජයබාහුගේ පුත්) ඉතා මඳ කලක් පොලොන්නරුවේ රජ කළ බව සඳහන් ය. එහෙත් ඔහුගේ ඥාති සොහොයුරු දෙවන බුවනෙකබාහු (පළමුවන බුවනෙකබාහුගේ පුත්) පොලොන්නරුව ආක්‍රමණය කොට දළදාව හා පාදාව රැගෙන විත් කුරුණෑගල සිය රාජධානිය පිහිටුවා ගත්තේ ය. (පසුගියදා කඩා බිඳ දමන ලද කුරුණෑගල බුවනෙකබාහු රාජ සභා මණ්ඩපය ඉදි කළේ යයි සඳහන් වූයේ මෙම රජු ය.) ඉන් අනතුරුව පොලොන්නරුවේ විසල් ගොඩනැගිලි වසා දමමින් මහ වනය පැතිරිණි. ඉතිහාසයේ සඳහන් වුවද පොලොන්නරුව කොතනදැයි දන්නෙක් නොවී ය.

ක්‍රි. ව. 1820 දී මඩකලපුවේ සිට පැමිණෙමින් සිටි 'ලුතිනන් ෆේගන්' (Lieut. Fagan) 'තෝපරේ' නම් ගමක රැය ගත කළේ ය. ඔහු 1820 අගෝස්තු 1 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කළ ලිපිය (මෙම ලිපිය පසුව 1885 ද ඔරියන්ටලිස්ට් (The Orientalist) හි දෙවන කාණ්ඩයේ පළ විය.) පොලොන්නරුව පිළිබඳ ගැටලු නිරාකරණය කළේ ය. ෆේගන් තෝපරේ දී ඔහු දුටු දෑ මෙසේ අනාවරණය කරයි.

"ඒ 27 වනදා උදෑසනයි. තෝපාරේ ආසන්නයේ දී පාරෙන් එහා පැත්තේ වනාන්තරය තුළ තිබුණු ශෛලමය කුලුනු සමූහයක් මගේ අවධානය දිනාගත්තේ ය. කඩිනමින් ආසන්නයට ම සමීප වී නිරීක්ෂණය කරන්නට ගිය මම රත්පැහැ ගඩොළින් සැදුණු වක්‍රාකාර දර්ශනීය ගොඩනැගිල්ලක නටබුන් හමුවේ මවිතයට පත්වීමි. කෙටි දුරකින් දකුණු දෙසට තවත් අතිවිශාල ප්‍රමාණයකින් යුත් සමාන උපකරණවලින් සමන්විත ගොඩනැගිල්ලක් කුලුනු, ගඩොළු, ඇද වැටුණු ආධාරක හා ඇද වැටුණු බිත්ති ආදී නටබුන් රැසකින් යුතුව කැලෑව තුළ එම දිසාවට ම දර්ශනය විය."

ඔබ පොලොන්නරුව බලා ගමන් කරන විට පාරට මඳක් එපිටින් දිස් වන වටදාගෙයි නටබුන් සිහිපත් කරගනු මැනවි. අදින් අවුරුදු දෙසීයකට පෙර ෆේගන් වනගහනය අතුරින් දුටුවේ ද වනගත වටදාගෙයි නටබුන් බව ඔහු ඉදිරිපත් කරන විස්තරය අනුව සිතාගත හැකිය. එදවස කුඩා පාරක් ගමන් කරන්නට ඇත්තේ ද වර්තමාන පාර අසලින් ම විය යුතු ය.

"වක්‍රාකාර ගොඩනැගිල්ල මට සිතෙන ආකාරයට කලෙක ආවරණය නොවූ විහාරයක් විය යුතු ය. මම අඩි 15ක් පළල හා 5ක් උස ශෛලමය පඩිපෙළ සයකින් යුතු වේදිකාවකට නැගුණෙමි. වේදිකාව වටකුරු ය. මුදුනත ගඩොළු බිත්තියකි. බිත්තියේ ශීර්ෂය සහ මුදුනේ ලීස්තරය යොදා ඇත්තේ කපන ලද ගල්වලිනි. බිත්ති බොහොමයක් තවමත් නැගී ගත්වනම ය."





පසු කලෙක හඳුනාගත් වටදාගෙයි දිග, පළල මනින ලුතිනන් ෆේගන් වටදාගෙය පිළිබඳ අපූරු සටහන් පෙළක් ඉදිරිපත් කරන්නේ මේ නටබුන් පොලොන්නරුවට අයත් බව දැනගෙන නොවේ.

වටදාගෙයින් පසු ඔහු ඊට දකුණු පසින් ඇති නටඹුන් ගොඩනැගිල්ල (ථූපාරාමය) පිළිබඳව ද අපූරු විස්තරයක් ඉදිරිපත් කරයි. ගම්මුලාදෑනියා ද ෆේගන් අගය කරමින් කතා කරයි. ඔහු විසින් දකිනු ලැබිය යුතු අපූරු නටබුන් ඇතැයි පවසන ගම්මුලාදෑනියා ඔහුට මග පෙන්වන්නට වියපත් වැසියකු එවන බව පවසයි. සවස හතරට පමණ පිටත් වී වනාන්තරයේ සැතපුමක් පමණ ඇවිද ගිය ෆේගන් දකින නිර්මාණයෙන් විස්මයට පත්වෙයි.

"ආශ්චර්ය සම්පන්න ගඩොළින් කරන ලද ගොඩනැගිල්ල උඩරට රජුන්ගේ සුසානඝරයක් සේ මගේ මනසට හැඟෙයි. ගොඩනැගිල්ලේ උස අඩි 80 සිට 160 දක්වා ය. එය අලංකාර වටකුරු ක්‍රමයෙන් සිහින් වන ශිලා ස්තම්භයක් මත ආරක්ෂිතව පිහිටි උල් වූ කොතකි. අඩි 25ක් පමණ උස් වූ විශිෂ්ට කොත අවට පිහිටි සමබිම් හා වනයට ඉහළින් දිස්වෙයි. ප්‍රථම දර්ශනයෙන් මගේ කණ්ඩායමේ සිටි උඩරටියෝ සිය හිස් නිරාවරණය කරගෙන මුනින් වැටී උත්තරීතර නමස්කාර කළහ."

## සංහිඳ
### පාමුල



ෆේගන් දකින්නේ පොළොන්නරුවේ මහසෙන් රජ දවසින් පසු තනන ලද විශාලතම දාගැබ සේ සැලකෙන රන්කොත් වෙහෙරයි. ඔහු මෙසේ සඳහන් කරයි.

" මුළුමනින් ම රත් ගඩොලින් තැනූ මෙම පිරමීඩය හුණු බදාම ආලේපිත ය. පළුදු වීම් හා විශාල ගස් මුල් බැස ගැනීමෙන් එහි වටකුරු බව අඩු වී ඇත. ගඩොළු වැඩ කළ අතිවිශාල ජනතාවගේ පරිහානිය හේතුවෙන් ලංකා ගෘහ නිර්මාණ ශිල්පයේ ස්වාභාවික විනාශ කරන්නා විසින් බල කරන ලදුව නිර්මාණයේ පරිධියේ හා මුහුණතේ ක්‍රමවත් ස්තරයේ ගැඹුරු පැල්ම ඉන්දීය වනස්පතීන් වවන්නට විය. නිත්‍ය ස්තරය දැකීමෙන් මෙම අතිවිශාල ගොඩනැගිල්ල මුහුණත ගඩොළු තාප්ප සහිත පස් ගොඩැල්ලක් නොවන බව මට තීරණය කළ හැකිය. සමස්ත නිර්මාණය ම ගඩොළු පෙදරේරු කර්මාන්තයේ ශ්‍රේෂ්ඨ වැඩ කොටසකි. මම ද මෙහි අභ්‍යන්තරයේ ඊජිප්තු පිරමිඩයක මෙන් ගර්භයක් (කුටියක්) ඇතැයි සිතන්නට නැඹුරු වෙමි."

ෆේගන් ඔහුට හමු වූ පිරමිඩය (රන්කොත් වෙහෙර) අසල පිහිටි සමාන දුරකින් පිහිටි ගඩොළු ගොඩනැගිලි දහසයක් පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි. ඔහු ඒවා කුඩා දේවස්ථාන යනුවෙන් හඳුන්වයි. ඒ රන්කොත් වෙහෙර වටා ඇති ප්‍රතිමා ගෘහයන් ය. ඔහු රන්කොත් වෙහෙරේ මළුව පියවර ගණිනින් ද ප්‍රතිමා ගෘහ ඇතුළු සියලු තන්හි ප්‍රමාණයන් අඩිවලින් ද මැන දක්වයි.

සැන්දෑව කෙමෙන් ගෙවී යයි. ෆේගන්ට ඔහුගේ සිත් බැඳගත් වස්තූන් හැර යන්නට සිදුව තිබිණි. එහෙත් එක් මග පෙන්වන්නකු කියන්නේ තවත් සැතපුම් භාගයක් පමණ ගමන් කළොත් ෆේගන් මෙතෙක් දුටු සියල්ල අබිබවන තැනක් දැකිය හැකි බවයි. ඔහු ඉදිරියට යයි. ඒ ගල් විහාරයට ය. ඔහු මග පෙන්වන්නන් වෙතින් දැනගත් තොරතුරු අනුව එය 'ගලේ විහාරය' නමින් හඳුන්වයි.

"පළමුවෙන් දර්ශනය වූයේ අඩි 80ක් පමණ දිග, මධ්‍යයේ දී අඩි 30ක් පමණ උස් කෙළවර දක්වා ඇල වන විශාල කළු ගල් කුළකි. තව දුරටත් ඉදිරියට පියවර කීපයක් ගිය විට මා සිටියේ අඩි 25ක් වත් උස ශෛලමය යෝධ මානව ප්‍රතිමාවකට යටිනි. ඒ මොහොතේ මා තුළ ඇති වූ හැඟීම් මට විස්තර කළ නොහැක. පරීක්ෂා කිරීමෙන් පසු මෙම ප්‍රතිමාව බුදුන් වහන්සේගේ ඍජු ඉරියව්වක පිළිමයක් (හිටි පිළිමය) බව මට වැටහිණි. බුදුන්ගේ අත් අසාමාන්‍ය ලෙස සුන්දරව පපුව හරහා වැතිර තිබෙයි. උන්වහන්සේගේ සිවුර වමත හරහා වැටී තිබෙයි."

ෆේගන් හිටි පිළිමයට දකුණු දෙසින් විහාරයේ ඇති හිඳි පිළිම සහ ඒ ඇති මැදිරිය ද පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි. ඔහු සැතපෙන පිළිමයේ විස්තර ගෙන හැර පාන්නේ මෙසේ ය.

"හිටි පිළිමයට වම්පසින් පූජනීය උත්තම ප්‍රතිමාවක් සැතපුණු ඉරියව්වෙකින් වැතිර සිටී. මම වඩා සියුම්ව නිරීක්ෂණය කිරීමේ අටියෙන් පිළිමය අසලින් ඉහළට නැගුණෙමි. පිළිමයේ දෙනෙත් අතර පරතරය අඩියකි. නාසය අඩි 2 අඟල් 4 කි. හිසට යටින් ඇති අතේ සුළැඟිල්ල අඩි 2කි."

ඉක්මනින් ඇඳිරි වැටෙයි. ෆේගන්ට සිදුවන්නේ ඉක්මනින් තෝපරේ වෙත ආපසු යන්නට ය. තෝපරේ යනුවෙන් එදා හැඳින්වූයේ වර්තමාන තෝපා වැවයි. 'මෙහි පදිංචිකරුවන්ට ජලය සැපයිය හැකි ළිඳක හෝ ජලාශයක නටබුන් වත් නැත.' යන ෆේගන්ගේ සඳහනින් පෙනෙන්නේ ආසන්නයේ ම ඇති තෝපාවැව ෆේගන් නුදුටු බව ය.

පොලොන්නරුව යයි නොදැන ලියැවෙන 'තෝපරේ ආසන්නයේ ඇති නටබුන්' යන හිසින් ඇති ලියැවිල්ල කියවන විට නටබුන් පිළිබඳ අවබෝධයක් ඇති කුතූහලයෙන් යුත් නිලධරයකු දෛවය විසින් මේ වනරොදට එවන ලදැයි අපට සිතෙයි.



**මහානාම දුනුමාල**

## මේ තමයි ජීවිතේ පාඩම්



ගඟක් වුව නිසසලව තාලෙන් නංවමින් මුදු සුමුදු සරලිති
ඔහේ හෙමිහිට ගලා යනකොට සොඳුරු බව හෙමි හෙමින් වියැකෙති
ජීවිතය ගඟකට සමානය කම්කටොලු එහි ගල් බොරලු වෙති
හැපෙන පෙරළෙන රිදෙන තරමට පෙරට යන්නට සවි ලැබෙයි නිති

තවත් ගන්නට යමක් නැත්නම් රැඳුණු තැන ඇති දැනුම අතරේ
පිපාසය දැනි දැනිම සොයමින් නොයා යුතු ඇයි රසය වතුරේ
නැවතුණා නම් මුලින් හමු වූ දහම් පහදන ගුරුන් ඇසුරේ
නිවන සොයමින් බෝසතාණන් තවත් ඇවිදියි සසර කතරේ


පිරුණු කළයක නොසෙල්වෙයි දිය, නිශ්චලව ඇති විටෙක මුව විට
අඩු කළේ දිය සැලී සැලී මඩ කරයි කිලුටෙහි දමා වට පිට
පොත පත ද මතු නොවේ ලෝකෙන් ජීවිතය හැක ඉගෙන ගැනුමට
පිරුණු මිනිසුන් කිසි විටෙක බැහැ තළා පොඩිකර අහක දමනට

පලක් නැති කල ඉවත දැමූ දඬු වටොත් සරු බිම් කඩක් මත්තේ
නොයයි වියැළී වැඩෙයි දලුලා දිනෙක මල් පල දරනු ඇත්තේ
කොතෙක් බිඳුණත් තිබෙයි නම් ශක්තියක් කාගෙත් ඇතුළු චිත්තේ
පෙරට යන්නට නඟිනු කිම වෙන කාගෙවත් උරහිසක් මත්තේ


දුවන ගමනකි කවුරු කවුරුත් ජීවිතේ මත එකට හැපි හැපි
නතර වන තැන කවුරු දන්නෙ ද මාරයාගෙන් ලැබුණු පසු ලිපි
පැහැය සුවඳද ඉතිරි නොමවෙයි පරව යද්දි කුසුම් මත පිපි
මැරෙන මොහොතක සිහි කරන්නට මිනිස්කම් රැක ගත යුතුය අපි

ලියන කියවන ඕනෑ පොතකට තබන්නට පුළුවනි තිතක්
අකුරුවල විතරක්ම රඳවා පලක් හිමි වේවිද නෙතක්
දැනුම් සයුරක ගිලී කිමිදී පිහින යා යුතු වෙයි සිතක්
සමාජය කියවන්න හැකි නම් එය නිමා නොවෙනා පොතක්

කුර රකින්නට අසුන් හට පාවහන් පල නැත, මිසෙක ලාඩම්
දරා ගත යුතු බොහෝ තැන්වල දැමිය යුතු වෙයි මුඛයෙ වාඩම්
සිනා සෙන්නට මහා සවියක් අවැසි වෙයි දුක ළඟත් නාඩම්
සියල්ලම එක තැනට ගත් කල මේ තමයි ජීවිතේ පාඩම්



**දිල්රූ ජයසේකර**



# ඇටකටු සහ දත් - කරගනිමු සවිමත්

වෛද්‍ය නැණ



කැල්සියම් කියන්නෙ ගර්භණී අම්මලාට ගොඩක් වැදගත් ඛනිජ ලවණයක්. බබාගේ ඇටකටු හොඳට හයියට හැදෙන්න වගේම බබා ලැබුණට පස්සෙ අම්මගෙ ඇටකටු දත් නීරෝගීව තියාගන්නත් කැල්සියම් වුවමනා වෙනවා. බබාගේ කිරි දත් වගේම ස්ථිර දත් හොඳින් හැදෙන්නත් අම්ම ගන්න කැල්සියම් ගොඩක් වැදගත්." මිඩ් වයිෆ් මිස් කියාගෙන ගියා.

සායනය ඉවර වෙලා දීපිකා දොස්තර මහත්තයා ගාවට ආවෙ එයාට කැල්සියම් ගැන ආපු ප්‍රශ්නයක් විසඳගන්න.

"ඩොක්ටර්, බබාගෙ දත් එන්නෙ ඉපදුනාට පස්සෙ නෙ. ඉතින් කොහොමද අම්මා කන කැල්සියම් එයාගෙ දත්වලට බලපාන්නෙ?"

වැඩිහිටියකුගෙ වගේම බබෙක්ගෙත් ඇටකටුවල වගේම දත්වල වැඩියෙන්ම තියෙන දෙයක් තමයි කැල්සියම් කියන්නේ. ඇටකටු ශක්තිමත්ව තියාගන්න වගේම දත් හොඳින් තියාගන්න නම් කැල්සියම් ගොඩක් වුවමනා වෙනවා. පොඩි බබෙක් ඉපදෙනකොට එයාගෙ මුළු ඇටසැකිල්ලම ගොඩක් දුරට හැදිලා ඉවරයි. ඒ කියන්නේ එයගෙ ඇගේ කැල්සියම් ගොඩක් තියෙනවා. මේ කැල්සියම් සේරම එයාට ගියේ අම්මගේ ඇගේ ඉඳලා. බබා ලැබෙන්න ඉන්න කාලෙ අම්මා ගත්ත කැල්සියම්වලින්.

"එතකොට දත්?" අපි දැනගන්න ඕන තවත් දෙයක් තමයි දත් එනවා කියන්නේ අලුතෙන් දත් හැදෙනවා කියන එක නෙවෙයි. බබාගෙ දත් සේරම ඒ කියන්නෙ කිරි දත් විතරක් නෙවෙයි ස්ථිර දතුත් බබා ඉපදෙනකොටම හැදිලා විදුරුමස් අස්සේ තියෙනවා. අපි බබාගේ දත් එනවා කියන්නේ එහෙම කලින්ම හැදිල තියෙන දත් ටික මතුවෙන එකට මිසක් අලුතින් දත් හැදෙනවා කියන එකට නෙවෙයි.

අන්න ඒ නිසා බබෙකුගේ ගේ කිරි දත් හොඳින් තියාගත්තේ නැත්නම් ඊට යටින් තියෙන ස්ථිර දත් ටිකත් නරක් වෙන්න පුළුවනි. මොකද සමහර අම්මලා හිතනවා 'කිරි දත් පණුවො කෑවට කමක් නෑ. පස්සෙ ස්ථිර දත් එනවනෙ' කියලා. ඒත් ඒක වැරදි මතයක්.

අනිත් කාරණය තමයි බබා ලැබෙන්න ඉන්න කාලෙ බබාට කැල්සියම් ඕන වුණාම අම්ම කරන්නෙ එයාගෙ ඇගේ ඇටකටුවල තියෙන කැල්සියම්වලින් ටික ටික බබාට දෙන එක. ඊට පස්සෙ අම්මා කැල්සියම් ගත්තම ඒ කැල්සියම්වලින් වෙන්නේ අර කලින් ගත්ත තැන්වල අඩුව පුරවන එක. එහෙම වෙන්නෙ අම්මා ඇතිවෙන්න කැල්සියම් ගත්තත් නැතත් බබාට හරියට අඩුවක් නැතුව කැල්සියම් ටික ලැබෙන්න ඕන නිසා.

හැබැයි අම්මා හරියට කැල්සියම් ගත්තේ නැත්නම් අම්මගේ ඇටකටු වගේම දත් දුර්වල වෙන්න පුළුවන්. මෙන්න මේ කාරණාව හරියට නොදන්නා නිසා තමයි මව්කිරි දුන්නාම අම්මගේ ඇටකටු දත් දුර්වල වෙනවා කියලා සමහරු කියන්න පටන් ගත්තේ. ඇත්තටම ඒකත් වැරදි මතයක්.

අම්මා හරියට කැල්සියම් තියෙන කෑම ජාති ගන්නවා නම් දරුවෙක් ලැබුණා, මව් කිරි දුන්නා කියලා අම්මා ගේ ඇටකටු එහෙමත් නැත්නම් දත් දුර්වල වෙන්න විදිහක් නෑ.

එහෙම නම් අන්තිමට අපි දැනගන්න ඕන අපිට ලොකු වියදමක් නැතුව ගන්න පුළුවන් කැල්සියම් තියෙන කෑම ජාති මොනවද කියලා.

කැල්සියම් යහමින් තියෙන කෑම වර්ග තමයි කිරි. ඒ වගේම කිරිවලින් හදන යෝගට්, මුදවපු කිරි, පොඩි මාලු, කජු, රටකජු වගේ ඇට වර්ග. ඒ වගේම කව්පි, සෝයා, මෑ වගේ ඇට වර්ගවලත් කැල්සියම් තියෙනවා.

කැල්සියම් ගැන කතා කරනකොට අපි බොහෝ දෙනා වැරදියට තේරුම් අරන් තියන දෙයක් තමයි කැල්සියම් තියෙන්නෙ පොඩි මාළුන්ගෙ කියන කාරණය. ඇත්තටම අපේ ඇගේ කැල්සියම් තියෙන්නෙ අපේ ඇටකටුවල වගේම තමයි මාළුන්ගෙත් කැල්සියම් තියෙන්නෙ ඇටකටුවල. ඒ නිසා මාළුන්ගේ තියෙන කැල්සියම් ගන්න නම් අපට වෙනවා උන්ගේ ඇටකටු ටික කෑමට ගන්න. ඉතින් අපට කන්න පුළුවන් පොඩි මාළුන් ගෙ ඇටකටු විතරක් නිසා අපට ගන්න පුළුවන් පොඩි මාළුන්ගේ කැල්සියම් විතරයි. මේක නොදන්න අපේ සමහර අම්මලා කැසියම් තියෙන්නෙ පොඩි මාළුන්ගෙ විතරයි කියලා වැරදියට හිතාගෙන පොඩි මාළුන්ගෙ ඇටකටු ටික අයින් කරලා කෑමට ගන්නවා. අන්න එතකොට නම් අපිට කැල්සියම් පොඩ්ඩක් වත් ලැබෙන්නේ නෑ. කටු ටික අයින් කරනවා කියන්නේ, කැල්සියම් ටික වීසි කරනවා කියන එක.



**වෛද්‍ය නුවන් තොටවත්ත**

බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ
සංස්කරණය - දිල්රූ ජයසේකර

'බද්දර මල්ල' ගැන ඔබේ අදහස් අපට කියන්න

'බද්දර මල්ල', දිනමිණ, අංක 35, ලේක් හවුස්, ඩී. ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.

baddaramalla@lakehouse.lk

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට 2021 වර්ෂය තුළ පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සඳහා වෙළඳ ආයතන පුද්ගලයින් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. භාණ්ඩ හා සේවා කාණ්ඩ 27 ක් යටතේ ලියාපදිංචිය සිදුකරන අතර www.pdn.ac.lk යන වෙබ් අඩවිය මගින්ද මෙම විස්තර පත් ලබාගත හැකිය.

එක් කාණ්ඩයකට වඩා වැඩි කාණ්ඩ සංඛ්‍යාවකට ලියාපදිංචි වන්නේ නම් එම කාණ්ඩ පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර, ලියාපදිංචි වීමට අයදුම් කරන සෑම කාණ්ඩයක් සඳහාම රු. 2000/- ක ආපසු නොගෙවන තැන්පතුවක් තැබිය යුතුය. මෙම තැන්පතු මුදල අයදුම් කරනු ලබන කාණ්ඩ ප්‍රමාණය සඳහා වන වටිනාකමට සමාන වනසේ **මූල්‍යාධිකාරී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය,** නමින් ලබාගත් දින 90 ක් වලංගු බැංකු අණකරයක් මගින් හෝ විශ්ව විද්‍යාලයේ සරප් වෙත අදාළ මුදල වැඩකරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ගෙවීම් කිරීම මගින්, පමණක් කළ යුතු අතර, බැංකු අණකරය හෝ විශ්වවිද්‍යාලයේ සරප්වරයා විසින් නිකුත් කරන ලද රිසිට්පතෙහි පිටපත අයදුම්පත සමග එවිය යුතුය. ඉහත තැන්පතු මුදල සඳහා **චෙක්පත් මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.** අනුකූල නොවන අයදුම්පත් ලියාපදිංචිය සඳහා සලකා බලනු නොලැබේ. ඕනෑම අයදුම්පතක් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වන අතර, දැනටමත් ලියාපදිංචි සැපයුම්කරුවන් සම්බන්ධව ඔවුන්ගේ අතීත ප්‍රගතිය සලකා බැලීම සිදුකරයි. විශ්වවිද්‍යාල සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂිත නව භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හට නිරන්තරයෙන් ලියාපදිංචිය සඳහා ආරාධනා කර සිටියි. භාණ්ඩ සහ සේවා සඳහා මිල කැඳවීම් සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් සිදු කරනු ලැබුවද, තරගකාරී මිලක් ලබා ගැනීමට අවශ්‍ය වූ විට හා ලියාපදිංචි වූ ප්‍රමාණවත් සැපයුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති විට රේන්බෝ සහ යෙලෝ පේජස් (Rainbo & Yellw Pagers) වැනි මාධ්‍යයන්හි දැන්වීම් පළකර ඇති සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ලබා ගැනීමේ අයිතිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුය.

2021 වසර සඳහා ලියාපදිංචි වන සැපයුම්කරුවන් අවම වශයෙන් දින 30 ක කාලයක් සඳහා ණය පහසුකම් මත භාණ්ඩ සැපයුම් කිරීමට එකග විය යුතුය. මෙහි පහතින් දැක්වෙන ආකෘතිය අනුව සකස් කළ අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර ලිපි කවරයක බහා **"2021 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කර **"නියෝජ්‍ය මූල්‍යාධිකාරී / දේශීය සැපයීම් අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2020 නොවැම්බර් 20 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය.

අයදුම්පත සමග ව්‍යාපාරයේ ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතුය.

| කාණ්ඩ අංකය | සැපයුම් හා සේවාවන් කාණ්ඩ / අනු කාණ්ඩ |
|---|---|
| **කාණ්ඩ 01 - ලිපි ද්‍රව්‍ය** | |
| 1.1 | තීන්ත, තීන්ත පෑඩ්, අල්පෙනෙත්ති, ඇමුණුම් කටු. ස්ටේප්ලර්, ස්ටෙප්ලර් කටු, බෝල්පොයින්ට් පෑන්, පැන්සල්, ගණක යන්ත්‍ර |
| 1.2 | ටෝනර් වර්ග |
| 1.3 | ඡායා පිටපත් කඩදාසි, අනු පිටපත් කඩදාසි, පරිගණක කඩදාසි, යතුරු ලියන කඩදාසි, මුද්‍රණ කඩදාසි සහ තර්මල් කඩදාසි යනාදිය. |
| 1.4 | ෆයිල් ටැග්ස්, ස්පයිලර් බයින්ඩර්ස් සහ අනෙකුත් ලිපි ද්‍රව්‍ය |
| **කාණ්ඩ 02 - කාර්යාලීය උපකරණ හා තොරතුරු තාක්ෂණ උපකරණ** | |
| 2.1 | ෆැක්ස් යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ලැමිනේටින් යන්ත්‍ර, යතුරු ලියන (ඉංග්‍රීසි, සිංහල, දෙමළ) |
| 2.2 | පරිගණක යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ U.P.S. |
| 2.3 | පරිගණක උපාංග |
| 2.4 | පරිගණක මෘදුකාංග |
| 2.5 | Multimedia Projectors, Overhead Projectors , Screens |
| **කාණ්ඩ 03 - වානේ ගෘහ භාණ්ඩ, කාර්යාලීය උපකරණ** | |
| 3.1 | ලිපිගොනු කැබිනට්, ලිපිගොනු කබඩ්, රාක්ක |
| 3.2 | මේස සහ පුටු |
| 3.3 | ඇඳන්, තට්ටු ඇඳන් |
| **කාණ්ඩ 04 - ලී බඩු** | |
| 4.1 | කාර්යාලීය ලී බඩු |
| 4.2 | පන්ති කාමර ලී බඩු |
| 4.3 | ඇඳන්, තට්ටු ඇඳන්, සෝෆා කට්ටල යනාදිය |
| 4.4 | කාර්යාලීය ඇතුළත අලංකරණය |
| 4.5 | රබර් හා කොහු මිශ්‍රිත මෙට්ට, කොට්ට යනාදිය |
| **කාණ්ඩ 05 - විදුලි උපකරණ** | |
| 5.1 | විදුලි පංකා |
| 5.2 | විදුලි උඳුන් |
| 5.3 | වැකුම් ක්ලීනර්, පොලිෂර් |
| 5.4 | වායුසමීකරණ |
| 5.5 | ශීතකරණ, අධිශීතකරණ |
| 5.6 | ආහාර උණුසුම්ව තබන උපකරණ (Hot Cupboard) |
| 5.7 | විදුලි උත්පාදක යන්ත්‍ර |
| 6.8 | වෝටර් කූලර් |
| 6.9 | විදුලි කේතල හා ජල පෙරණයන් |
| **කාණ්ඩ 06 - සංනිවේදන උපකරණ** | |
| 6.1 | රූපවාහිනී යන්ත්‍ර, වීඩියෝ රෙකෝඩර්ස්, වොයිස් රෙකෝඩර්ස්, ශ්‍රව්‍ය යන්ත්‍ර |
| 6.2 | සන්නිවේදන යන්ත්‍ර, දුරකථන උපකරණ |
| 6.3 | ආරක්ෂක කැමරා පද්ධති (CCTV) |
| 6.4 | PABX සහ අන්තර් සන්නිවේදන පද්ධති (Intercom System) |
| 6.5 | විදුලි රැහැන් ජාලා (Network Cables) සහ අමතර කොටස් |
| 6.6 | මෘදුකාංග සහ පරිගණක තාක්ෂණික ද්‍රව්‍ය |
| **කාණ්ඩ 07 - විදුලි භාණ්ඩ හා උපාංග** | |
| 7.1 | විදුලි බුබුලු, විදුලි රැහැන්, කේබල්, ස්විච් වර්ග, ප්ලග් බේසස්, ප්ලග් ටොප්ස්, හෝල්ඩර්ස් |
| 7.2 | MCB |
| 7.3 | විදුලි මීටර් |
| 7.4 | කන්ඩියුට් පයිප්ප හා අනෙකුත් විදුලි උපාංග |
| **කාණ්ඩ 08 - උපකරණ** | |
| 8.1 | ඉංජිනේරු සහ වඩු කර්මාන්ත උපකරණ |
| 8.2 | කෘෂි උපකරණ සහ යන්ත්‍රෝපකරණ |
| 8.3 | ජල සම්පාදන හා ජල ප්‍රවාහන උපකරණ සහ අමතර කොටස් |
| **කාණ්ඩ 09 - ඡායාරූප** | |
| 9.1 | කැමරා, කැමරා උපකරණ යනාදිය |
| 9.2 | අඳුරු කාමර උපකරණ |
| 9.3 | වීඩියෝ හා ඡායාරූපකරණය |
| 9.4 | ඡායාරූප මුද්‍රණය |
| **කාණ්ඩ 10 - ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ලෝහ භාණ්ඩ** | |
| 10.1 | සිමෙන්ති, ගඩොල්, ගඟේ වැලි, කළුගල්, මැටල් ABC සහ හුණු යනාදිය |
| 10.2 | යකඩ, ජී.අයි. පයිප්ප, ජී.අයි. ෂීට්, ඇණ, කටුකම්බි, උදලු, ගල් කටු, ඉතිමං, විල් බැරැක්ක, ඇස්බැස්ටස් ෂීට්ස්, වීදුරු ෂීට්, තීන්ත, පොලිෂ්, ඉටි වර්ග, වාර්නිෂ්, තිනර්, ටර්පන්ටයින්. |
| 10.3 | ජී.අයි. කසළ බඳුන් |
| 10.4 | කොසු, ඉදල්, බුරුසු (ප්ලාස්ටික් හා කොහු) සහ කොහු පාපිසි යනාදිය |
| 10.5 | සිමෙන්ති හා කොන්ක්‍රීට් නිෂ්පාදන (වළලු, කණු යනාදිය) |
| **කාණ්ඩ 11 - පී.වී.සී. භාණ්ඩ සහ නාන කාමර උපාංග** | |
| 11.1 | ජල ටැංකි |
| 11.2 | බෝල් වැල්ව්, පී.වී.සී. පයිප්ප සහ උපකරණ යනාදිය |
| 11.3 | බිත්ති උළු, බිම් උළු, සෞඛ්‍යාරක්ෂක භාණ්ඩ හා නාන කාමර උපාංග / අමතර කොටස් |
| 11.4 | නිෂ්පාදනය කරන ලද දොරවල් (ප්ලයිවුඩ් පී.වී.සී. දොරවල්) යනාදිය |
| **කාණ්ඩ 12 - ඉරන ලද දැව සහ ලී** | |
| **කාණ්ඩ 13 - වෛද්‍ය හා විද්‍යාගාර උපකරණ** | |
| 13.1 | අන්වීක්ෂ, හිමටොලොජි, ජෛව රසායන විද්‍යා විශ්ලේෂක උපකරණ, පීඩනතාපකය, කේද්‍රපසාරකය යනාදිය |
| 13.2 | වෛද්‍ය, දන්ත වෛද්‍ය හා පශු වෛද්‍ය උපකරණ යනාදිය |
| 13.3 | ඖෂධ වර්ග, බෙහෙත් සහ එන්නත් යනාදිය |
| 13.4 | සත්ව ඖෂධ සහ එන්නත් |
| 13.5 | විද්‍යාගාර රසායනික ද්‍රව්‍ය |
| 13.6 | විද්‍යාගාර වීදුරු භාණ්ඩ |
| 13.7 | ඔක්සිජන්, එල්පී ගෑස්, මීතෙන්, $Co_2$, $No_2$, $N_2$, he යනාදිය |
| 13.8 | භෞතචිකිත්සක සහ පුනරුත්ථාපන උපකරණ |
| **කාණ්ඩ 14 - කෘෂිකාර්මික** | |
| 14.1 | කෘෂිරසායන ද්‍රව්‍ය |
| 14.2 | කුකුළු පැටවුන් (මස් හා බිත්තර සඳහා) - මිලදී ගැනීම / විකිණීම |
| 14.3 | කෘතිම පොහොර |
| 14.4 | ගොම පොහොර |
| 14.5 | ගොවිපල කම්කරු |
| 14.6 | තණකොළ සහ පිඩලි සැපයීම |
| **කාණ්ඩ 15 - සත්ත්ව ආහාර ද්‍රව්‍ය** | |
| 15.1 | සත්ත්ව ආහාර |
| 15.2 | සත්ත්ව විෂබීජ නාශක |
| **කාණ්ඩ 16 - පිරිසිදු කරන ද්‍රව්‍ය** | |
| 16.1 | විෂබීජ නාශක. සබන් කර්මාන්ත ශාලා සඳහා භාවිතා කරන සබන්, එයාර් ප්‍රෙෂ්නස්, සේදුම් දියර හා කුඩු වර්ග යනාදිය |
| **කාණ්ඩ 17 - ආරක්ෂක උපකරණ** | |
| 17.1 | ගිනි නිවීමේ ආරක්ෂක උපාංග, සපත්තු, අත්වැසුම්, මුහුණු ආවරණ, ආරක්ෂක හිස් වැසුම් යනාදිය |
| **කාණ්ඩ 18 - මෝටර් වාහන අමතර කොටස්** | |
| 18.1 | වාහන අමතර කොටස් |
| 18.2 | ටයර්, ටියුබ් සහ වාහන සඳහා බැටරි ආදිය |
| 18.3 | වාහන උපාංග |
| **කාණ්ඩ 19 - ක්‍රීඩා** | |
| 19.1 | ක්‍රීඩා භාණ්ඩ සහ සංගීත භාණ්ඩ |
| 19.2 | කායවර්ධන උපකරණ (Fitness Machines) |
| **කාණ්ඩ 20 - රෙදිපිළි සහ හම් නිෂ්පාදිත භාණ්ඩ** | |
| 20.1 | නිල ඇඳුම් සඳහා රෙදිපිළි සහ තිර රෙදි වර්ග |
| 20.2 | ඇඳ ආවරණ හා උපාංග (ඇඳ ඇතිරිලි, මෙට්ට කවර, කොට්ට උර ආදිය) |
| 20.3 | ජාතික කොඩි සහ වෙනත් කොඩි, බැනර් |
| 20.4 | වැහි කබා, ඉනේ බඳින පටි, තොප්පි යනාදිය (ආරක්ෂක අංශය සඳහා) |
| 20.5 | කුඩ |
| 20.6 | මදුරු දැල් |
| 20.7 | බුමුතුරුණු |
| 20.8 | සපත්තු |
| 20.9 | ලෙදර් පේපර්, කැන්වස් නිෂ්පාදිත ද්‍රව්‍ය නූල් |
| **කාණ්ඩ 21 - ආහාර පාන හා සේවාවන්** | |
| **කාණ්ඩ 22 - මුද්‍රණ කටයුතු සහ පොත් බැඳීම** | |
| 22.1 | ලිපිගොනු කවර, ලිපි කවර, ලිපි ශීර්ෂ, පොත් සහ වාර සඟරා මුද්‍රණය කිරීම යනාදිය |
| 22.2 | ලැමිනේටින්, පොත් බැඳීම් |
| **කාණ්ඩ 23 - සිහිවටන, පිත්තල, ලෝකඩ, විදුරු, දැව, මැටි, සටහන්මලු ආදියෙන් සාදන ලද** | |
| 23.1 | සිහිවටන - පිත්තල, ලෝකඩ, වීදුරු, දැව, මැටි සටහන් මලු ආදියෙන් සාදන ලද |
| **කාණ්ඩ 24 - උපකරණ අලුත්වැඩියාව** | |
| 24.1 | විද්‍යාගාර උපකරණ අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හා නඩත්තු කිරීම (වෛද්‍ය, දන්ත වෛද්‍ය, සත්ත්ව විද්‍යා, කෘෂිකර්ම සහ ඉංජිනේරු උපකරණ) |
| 24.2 | ශීතකරණ, අධි ශීතකරණ හා වායු සමන යන්ත්‍ර සහ අනෙකුත් විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හා නඩත්තු කිරීම |
| 24.3 | පරිගණක යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ස්කැනර් යන්ත්‍ර සහ අනෙකුත් පරිගණක උපාංග යනාදිය අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හා නඩත්තු කිරීම |
| 24.4 | උපකරණ අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හා නඩත්තු කිරීම (යතුරු ලියන ගණක යන්ත්‍ර, ඡායා පිටපත් සහ අනෙකුත් උපකරණ) |
| 24.5 | ගෘහස්ථ විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම, සේවා කිරීම හා නඩත්තු කිරීම |
| **කාණ්ඩ 25 - වාහන අලුත්වැඩියා කිරීම** | |
| 25.1 | වාහන අලුත්වැඩියා කිරීම (පෙට්රල් / ඩීසල්) - කාර්, ලොරි, බස්, ත්‍රීවිලර්, යනාදිය |
| 25.2 | වාහන කාලීන සේවා කිරීම සහ අභ්‍යන්තර පිරිසිදු කිරීම |
| 25.3 | වාහන සඳහා ආවරණ (වහල), කුෂන් සහ කවර, බුමුතුරුණු යනාදිය |
| **කාණ්ඩ 26 - කුලී පදනම මත වාහන උපකරණ සැපයීම සහ වෙනත් සේවා** | |
| 26.1 | ගොඩනැගිලි ඉදිකිරීම් හා බිම් සැකසුම් උපකරණ කුලී පදනම මත සැපයීම (උදා : JCB යන්ත්‍ර, බිම් කැනීම් යන්ත්‍ර, සම්පීඩක යන්ත්‍ර) මහනුවර අවට |
| 26.2 | කුලී පදනම මත වාහන සැපයීම (බස් / ලොරි / වෑන් / කාර් / ගලි ආදිය) මහනුවර අවට |
| 26.3 | කුලී පදනම මත ඡායාරූප හා වීඩියෝ උපකරණ සැපයීම |
| 26.4 | කුලී පදනම මත පුටු (වානේ / ප්ලාස්ටික්) සහ කූඩාරම් සැපයීම |
| 26.5 | පුහුණු හා නුපුහුණු ශ්‍රමය සැපයීම, වතු පිරිසිදු කිරීම් සහ නඩත්තු කිරීම් |
| 26.6 | කුලී පදනම මත වායුසමන උපකරණ සැපයීම |
| 26.7 | මිනින්දෝරු සේවා සැපයීම |
| **කාණ්ඩ 27 - යකඩ, වානේ වැඩ** | |

## සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වීම - 2021 පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## ආදර්ශ අයදුම්පත්‍රය

01. ව්‍යාපාර ආයතනයේ නම : ..............................

02. ව්‍යාපාර ආයතනයේ ලිපිනය : ..............................

03. ඇමතුම් අංක : දුරකථන අංක : ..............................
ෆැක්ස් අංකය : ..............................
ඊමේල් : ..............................

04. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය : ..............................

05. ලියාපදිංචි ව්‍යාපාරයේ ස්වභාවය : ..............................

06. ව්‍යාපාරයේ ස්වභාවය : ..............................
(රාජ්‍ය ආයතනයක්ද, සංස්ථාවක් ද, ..............................
තනි අයිතිකරු ද, හවුල් ව්‍යාපාරයක්ද, සීමිත සමාගමක්ද යන බව : ..............................

07. අයිතිකරුගේ නම : ..............................

08. නිෂ්පාදක ද, එකම අලෙවි නියෝජිත ද, එකම ආනයනකරු ද, එකම බෙදාහරින්නා ද, තොග රැස්කරන්නා ද, යනාදී විස්තර : ..............................

09. ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකුව/ බැංකු හා ගිණුම් අංක : ..............................
(බැංකු ගිණුමක් නොමැති සැපයුම්කරුවන් ලියාපදිංචි කරනු නොලැබේ)

10. පිරිවැටුම් බදු ලිපිගොනු අංකය : ..............................

11. එකතු කළ අගය මත බදු අංකය : ..............................

12. ලියාපදිංචි වීමට අපේක්ෂා කරන භාණ්ඩ / සැපයුම් කාණ්ඩ අංකය / අනු කාණ්ඩ අංකය : ..............................

13. අවම වශයෙන් දින 30 ක කාලයකට ණය පහසුකම් මත සැපයීම් කිරීමට එකග වන්නේ ද යන වග : ..............................

14. වෙනත් පහසුකම්, ප්‍රවාහන, ගබඩා පහසුකම් ආදිය : ..............................

භාණ්ඩ සහ සේවා සඳහා මිල කැඳවීම සාමාන්‍යයෙන් ලියාපදිංචි වූ සැපයුම්කරුවන්ගෙන් කරනු ලැබුවද තරගකාරී මිලක් ලබා ගැනීමට අවශ්‍ය වූ විට වෙනත් සැපයුම්කරුවන්ගෙන් ද මිල ගණන් ලබා ගැනීමේ අයිතිය පේරාදෙණිය විශ්වවිද්‍යාලය සතුය.

ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් හා රු. .............................. සඳහා වන අංක .............................. දරන බැංකු අණකරය අමුණා ඇත.

දිනය : ..............................

..............................
අයදුම්කරුගේ අත්සන

## සෞඛ්‍ය අමාත්‍යාංශය

# මහරෝහල (ශික්ෂණ), පේරාදෙණිය

## 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, ගරාජ් හා සේවා ස්ථාන ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා පේරාදෙණිය මහ රෝහලට භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන්, නිෂ්පාදකයින්ගෙන්, බෙදාහරින්නන්ගෙන්, රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය ආයතන වලින්, ලියාපදිංචි කරන ලද වෙළඳ සමාගම්වලින් හා සමුපකාර සමිතිවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සැපයුම්**

01. සියලුම වර්ගවල ලිපිද්‍රව්‍ය.
02. ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ (ලී/වානේ/ප්ලාස්ටික්)
03. කොහු මෙට්ට / රබර් මිශ්‍රිත කොහු මෙට්ට හා කොට්ට.
04. පැදුරු / කොහු / ඉදල් සහ සියලුම වර්ගවල බුරුසු / පොල් කටු හැඳි / කොහු නිෂ්පාදන.
05. සියලුම වර්ගයේ කාබොලික් සබන් / රෙදි සේදීමේ දියර හා කුඩු / බාර් සබන් / පිරිසිදු කිරීමේ දියර හා කුඩු.
06. සියලුම වර්ගයේ රෙදිපිළි, මදුරු දැල් හා නිමි ඇඳුම් (ඇඳ ඇතිරිලි / කොට්ට උර / කොටු රෙදි හා සර්ජන් කමිස / පිජාමා කමිස).
07. ඇලුමිනියම් භාණ්ඩ / පිඟන් භාණ්ඩ / වීදුරු භාණ්ඩ / ප්ලාස්ටික් භාණ්ඩ.
08. සියලුම වර්ගවල පොලිතීන් හා පොලිතීන් බෑග්. (පරිසර හිතකාමී)
09. ටයර්, ටියුබ්, වාහන බැටරි හා වාහන අමතර කොටස්.
10. ඉරන ලද ලෑලි හා වෙනත් දැව වර්ග.
11. පාවහන් (වෛද්‍ය / හෙදි / කම්කරු).
12. සියලුම හාඩ්වෙයාර් බඩු (ලෝහ භාණ්ඩ / ට්‍රොලි රෝද / ඇණ / සරනේරු / රබර් ග්ලවුස් / සම්භාණ්ඩ හා රබර් පාපිසි).
13. නාම පුවරු, රබර් මුද්‍රා/ දින මුද්‍රා
14. මුද්‍රණ කටයුතු (ඖෂධ බහාලන කවර/ විකිරණ පටල බහාලන කවර/ සහතික පත්‍ර යනාදිය)
15. සියලුම විදුලි උපකරණ (රූපවාහිනී/ ශීතකරණ/ වායුසමීකරණ යන්ත්‍ර / රෙදි සේදීමේ යන්ත්‍ර යනාදිය).
16. සියලුම විදුලි උපාංග (ටෝච් බැටරි වර්ග/ විදුලි බුබුළු/ වයර් යනාදිය)
17. ගිලන් මැසි / ට්‍රොලි / රෝද පුටු ආදිය.
18. කාර්යාල උපකරණ හා සන්නිවේදන උපකරණ (ෆැක්ස්/ රෝනියෝ/ ඡායාපිටපත්/ දුරකථන/ අනු පිටපත් යන්ත්‍ර යනාදිය)
19. පරිගණක, ප්‍රින්ටර් හා එම උපාංග.
20. වෛද්‍ය හා ශල්‍ය උපකරණ .
21. රසායනාගාර උපකරණ.
22. විකලාංග ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය.
23. විකලාංග නොවන අනෙකුත් ශල්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා අමතර කොටස්
24. රසායනාගාර පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය
25. විකිරණ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය හා රසායනික ද්‍රව්‍ය.
26. දන්ත ශල්‍ය උපකරණ, අමතර කොටස්, උපාංග හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය.
27. ඖෂධ.
28. කෘමි මර්දනයට අවශ්‍ය කෘමිනාශක
29. සංග්‍රහ කටයුතු සඳහා පිසින ලද ආහාර සහ අනෙකුත් ද්‍රව්‍ය.
30. වෙනත් විවිධ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය (ගිනි පෙට්ටි/ බ්ලේඩ්/ ඉදිකටු/ නූල් වර්ග ආදිය)

**02. කොන්ත්‍රාත්කරුවන් (ගොඩනැගිලි නඩත්තු හා ඉදිකිරීම්)**

ජල නළ අලුත්වැඩියා/ විදුලි කාර්යයන්/ පල්දෝරු කාර්යයන්/ පින්තාරු කාර්යයන්/ කොන්ක්‍රීට්, ගඩොල්, ඇලුමිනියම්, ඉදිකිරීමේ කාර්යයන්/ ජල කාන්දු පිළිසකර කිරීම ආදිය.

**03. සේවාවන්**

01. රසායනාගාර පරීක්ෂණ
02. මහන මැෂින් අලුත්වැඩියාවන්.
03. ඇඳුම් මැසීම (තිර රෙදි / ඇඳ ඇතිරිලි / පිජාමා කමිස.... ආදිය).
04. හිමිකම් නොපෑ මළ සිරුරු / අවයව කොටස් භූමදානය කිරීම.
05. සියලුම වාහන සේවා කිරීම.
06. සියලුම විදුලි උපකරණ, ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව හා සේවා කිරීම.
07. වාහන අලුත්වැඩියා කිරීම (මේ සඳහා මෙම ආයතනයෙන් ලබාදෙන විශේෂ අයදුම්පතට අනුව අයදුම් කළ යුතුයි.)
08. වාහන විදුලිය / වායු සමීකරණ අලුත්වැඩියා කිරීම.
09. වෛද්‍ය හා ශල්‍ය උපකරණ / රසායනාගාර උපකරණ/ දන්ත වෛද්‍ය උපකරණ හා දන්ත ශල්‍ය උපකරණ අලුත්වැඩියාව හා සේවා කිරීම.
10. වෛද්‍ය වායු සැපයීම හා අලුත්වැඩියා කිරීම.
11. ගිනි නිවීමේ උපකරණ නැවත පිරවීම හා අලුත්වැඩියා කිරීම.
12. ගෘහ භාණ්ඩවල අලුත්වැඩියාවන් (වේවැල් පුටු විවීම / කාර්යාල පුටු අලුත්වැඩියාව යනාදිය.)
13. කුෂන් වැඩ / අලුත්වැඩියා කිරීම්.
14. කාර්යාල උපකරණ අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම (පරිගණක යන්ත්‍ර / ෆැක්ස් යන්ත්‍ර / ඡායා පිටපත් යන්ත්‍ර / රෝනියෝ පිටපත් යන්ත්‍ර / අනු පිටපත් යන්ත්‍ර, ප්‍රින්ටර්).
15. කාර්ය මණ්ඩල හැඳුනුම්පත් සකස් කිරීම.
16. වාෂ්ප බොයිලේරු යන්ත්‍ර අලුත්වැඩියා කිරීම.

**04. මිලදී ගැනීම්.**

1. ඉවතලන ද්‍රව්‍ය මිලදී ගැනීම (වීදුරු බෝතල් / ප්ලාස්ටික් බෝතල් / සේලයින් බෝතල් / එක්ස්රේ කාඩ්පත් සෝදා ඉවතලන දියර / පොල්කටු/ කාඩ්බෝඩ් / කඩදාසි).

**05. උපදෙස් හා කොන්දේසි**

I. එක් අයිතමයකට වැඩි සංඛ්‍යාවක් සඳහා සැපයුම්කරුවන් හට ලියාපදිංචි විය හැකිය.

II. අයිතම අංක 02 සඳහා මෙම ආයතනයෙන් ලබාදෙන විශේෂ අයදුම්පතට අනුව අයදුම් කළ යුතුයි. ICTAD C-9 හෝ ඉහළ ශ්‍රේණිගත වීම අවශ්‍ය වන අතර, මධ්‍යම පළාතේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදේ.

III. පහත දැක්වෙන ආදර්ශ අයදුම්පතට අනුව සකස් කර ගන්නා ලද අයදුම්පත්, ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සත්‍ය පිටපතක් සහ මුදල් ගෙවූ ලදුපත/ රිසිට්පත ද සමග 2020.11.30 වන දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ **"සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය, මහරෝහල, පේරාදෙණිය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් අතින් ගෙනැවිත් මෙම ආයතනයේ ගණකාධිකාරී කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට ද හැක. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු විටෙක භාරගනු නොලැබේ.

IV. එක් එක් අයිතමය සඳහා **රු. 1,000.00 ක** ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුවක් මෙම රෝහලේ සරප් අංශයට සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 2.30 දක්වා** ගෙවිය හැකි අතර, එසේ මුදල් ගෙවූ ලදුපත/ රිසිට්පත අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. නැතහොත් රෝහලේ ගිණුම් අංක 057100129025207 මහජන බැංකුව, පේරාදෙණිය ශාඛාව වෙත මුදල් බැර කර අදාළ රිසිට්පතේ පිටපත අයදුම්පත සමග ඉදිරිපත් කළ හැකිය. මෙහිදී ආයතනයේ නම සහ අයිතම අංක පැහැදිලිව රිසිට්පතේ සඳහන් කළ යුතුය. (ATM යන්ත්‍ර මගින් මුදල් තැන්පත් කිරීම නොකළ යුතුයි) චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ. රාජ්‍ය ආයතන ලියාපදිංචි ගාස්තුවෙන් නිදහස් කෙරේ.

V. අයිතම කිහිපයක් සඳහා ලියාපදිංචි වන්නේ නම් එක් එක් අයිතමය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එක් එක් අයදුම්පත සමග ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සත්‍ය පිටපතක් හා ලියාපදිංචි ගාස්තුව ගෙවන ලද ලදුපතෙහි පිටපතක් අමුණා තිබිය යුතුය. අයදුම්පත් සියල්ලම එකම ලිපි කවරයක බහා එවිය යුතුය. එකම අයදුම්පතෙහි අයිතම කිහිපයක් සඳහා ලියාපදිංචිය ඉල්ලුම් කර තිබුණහොත් එහි මුලින්ම ඇති අයිතමය සඳහා පමණක් ලියාපදිංචිය සිදු කරනු ලැබේ.

VI. මේ සඳහා අවශ්‍ය අයදුම්පත්‍රය පේරාදෙණිය මහ රෝහලේ **www.peradeniya-hospital.health.gov.lk** වෙබ් අඩවියෙන් බාගත (download) කළ හැකිය.

VII. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම – 2021**" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

VIII. භාණ්ඩ හා සේවාවන් අවම වශයෙන් සති 08 ක කාලයකට ණය පදනම මත සැපයීමට එකඟ විය යුතුය.

IX. සැපයුම් හා සේවාවන් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවුවද ලියාපදිංචි නොවූ බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවීමේ අයිතිය මෙම රෝහලේ අධ්‍යක්ෂ සතුවේ.

X. මෙහි කොන්දේසි හා අයදුම්පතෙහි සඳහන් වන කරුණු සනාථ කළ නොහැකි අවස්ථාවලදී කිසිදු පෙර දැන්වීමකින් තොරව ලියාපදිංචිය සඳහා වන ඕනෑම අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ද රෝහලේ අධ්‍යක්ෂ සතුවේ.

XI. ඇණවුම් කරන සියලුම ද්‍රව්‍යයන් නිසි පරිදි ගබඩාව වෙත සැපයීමෙන් පසුව සහ සේවාවන් නිසි පරිදි ඉටු කිරීමෙන් පසුව පමණක් ගෙවීම් කරනු ලැබේ.

XII. අය කිරීමකින් තොරව ප්‍රවාහන පහසුකම් සැපයිය යුතුය.

XIII. මිල ගණන් ඉල්ලා යැවූ විට මිල ගණන් ඉදිරිපත් නොකරන හා ඉදිරිපත් කළ මිල ගණන්වලට භාණ්ඩ නොසපයන ආයතන අපලේඛනගත (Black List) කිරීමට සිදුවේ.

XIV. ඔබගේ ඊමේල් ලිපිනය සහ ෆැක්ස් අංකය නිවැරදිව සටහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

XV. ඉහත සඳහන් කරන ලද සැපයීම් සහ සේවාවන් ලබාගැනීමේදී මෑතකදී නිකුත් කරන ලද ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ උපදෙස් සහ මග පෙන්වීම් කෙරෙහිද අවධානය යොමු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය,**
**මහරෝහල, පේරාදෙණිය.**

**විමසීම් : 081-2388001 / දිගුව 208/209**

### ආදර්ශ අයදුම්පත

### සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021 වර්ෂය

### මහරෝහල (ශික්ෂණ) - පේරාදෙණිය

1. නිෂ්පාදන ආයතනයේ / වෙළඳ ව්‍යාපාරයේ / සැපයුම්කරුගේ නම :
2. ලිපිනය :
3. (i) දුරකථන අංකය
   (ii) ෆැක්ස් අංකය
   (iii) විද්‍යුත් තැපැල් ලිපිනය
4. ව්‍යාපාරයේ ස්වභාවය (තනි අයිතිකරු / සීමාසහිත සමාගමක්ද යන වග) : ..................
5. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය
6. VAT ලියාපදිංචි අංකය :
7. ප්‍රධාන ව්‍යාපාරික කාර්යය : ..................
   (කිනම් සැපයීමක්/ නිෂ්පාදනයක් සඳහා ලියාපදිංචි කර ඇත්ද යන්න සඳහන් කරන්න)
8. ලියාපදිංචි වීමට කැමති සැපයුම/ සේවාව : .................. අංකය : ..................
9. ලියාපදිංචි ගාස්තුව ගෙවන ලද ලදුපත් අංකය
   සැපයුම් අංක : .................. සේවා අංක : .................. මිලදී ගැනීම් අංක : .................. සඳහා

ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිමි. රු. .................. ක් වටිනා මුදල් ගෙවූ ලදුපත මේ සමග එවා ඇත.

ඉහත සඳහන් විස්තර සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. කිසියම් සාවද්‍ය තොරතුරක් සපයා ඇත්නම් ලියාපදිංචිය ප්‍රතික්ෂේප කොට අවලංගු කිරීමට ලක් වන බවද මම දනිමි. මේ සමග ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ සත්‍ය පිටපතක් සහ VAT ලියාපදිංචි සහතිකයේ පිටපතක්ද අමුණා ඇත.

..................
**දිනය :**

..................
**අයදුම්කරුගේ අත්සන**
**නිල මුද්‍රාව :**

---

## රාජ්‍ය දැව සංස්ථාව

**වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය**

# ලංසු කැඳවීම සඳහා ආරාධනය

**ප්‍රසම්පාදන අංක : එස්ටීසී/පීඑස්එම්/2020/ප්‍ර.අ.-14**

## Brand New High Reach Log Loader 01 ක් (Wheel Excavator Machine)

## මිලදී ගැනීම සඳහා ලංසු කැඳවීම

සභාපති, ප්‍රසම්පාදන කමිටුව, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල විසින් ඉහත මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන්ගෙන්, නිෂ්පාදකයන්ගෙන් සහ ආනයනකරුවන්ගෙන් මුද්‍රා තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

01. ජාතික තරගකාරී මිල ක්‍රමය යටතේ මිල ගණන් කැඳවනු ලැබේ.
02. සැපයුම්කරුවන් විසින් ලංසු ලියවිලි කළමනාකාර (මිලදී ගැනීම් හා නාවික) මගින් ඉහත ලිපිනයෙන් මිලදී ගත හැකිය.
03. සැපයුම්කරු අසාධුගත ලේඛනගත නොවී සිටිය යුතුයි.
04. කොන්දේසි හා ලංසු ලියවිලි ඉහත ලිපිනයේ කළමනාකාර (මිලදී ගැනීම් හා නාවික) වෙතින් පරීක්ෂා කර බැලිය හැකි අතර, අංක 011-2866601-04 දුරකථන ඔස්සේ වැඩි විස්තර ලබාගත හැකිය.
05. ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කළ ලංසු පත්‍රිකා අවශ්‍ය සැපයුම්කරුවන්හට කළමනාකාර (මිලදී ගැනීම් හා නාවික) වෙතින් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සතියේ වැඩකරන දිනයන්හිදී **ආපසු නොගෙවන ලංසු පත්‍රිකා ගාස්තු එක් ලංසු පත්‍රිකාවක් සඳහා රු.3,500/= ක්** ගෙවා 2020.11.09 දින දක්වා ඉහත ලිපිනයෙන් මිලදී ගත හැකිය.
06. ලංසු පත්‍රිකා **සභාපති, ප්‍රසම්පාදන කමිටුව, රාජ්‍ය දැව සංස්ථාව, අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල** වෙත 2020.11.10 දින පෙ.ව. 10.30 පෙර ලැබිය යුතුය. සැපයුම්කරුවන් හට ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට සහභාගි විය හැකිය.
07. ලංසු පත්‍රිකා ඉදිරිපත් කිරීමේදී, සෑම ලංසුවක් සඳහාම රු. 500,000/= ක බැඳුම්කරයක් ලබාදිය යුතු අතර, වලංගු කාලය දින 118 ක් විය යුතුයි.

**සභාපති,**
**රාජ්‍ය දැව සංස්ථාව.**

---

# ලංසු සඳහා ආරාධනයයි

## පොළොන්නරුව ප්‍රාදේශීය සභාව

1. පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ විස්තර කර ඇති ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.
2. ජාතික තරගකාරී ලංසු පටිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. එනමුත් පළාත් සභා චක්‍රලේඛ 2016/13(11) මගින් පළාත් සීමාව තුළ ලියාපදිංචි ලංසුකරුවන් සඳහා සීමා කොට ඇත.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත වගුවේ සඳහන් ක්ෂේත්‍රයේ සහ ශ්‍රේණිය සඳහා CIDA ආයතනයේ ලියාපදිංචි වී සිටිය යුතුය.
4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ ලේකම් මගින් ලබාගත හැකිය. (දු.ක.අ. 027- 2555575)
5. ව්‍යාපෘතිය සඳහා ආපසු නොගෙවනු ලබන රු. 2,000.00 ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2020.10.21 දින සිට 2020.11.02 දින දක්වා පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පැය අතරේ පොළොන්නරුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ ගරු සභාපති වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, මේ සඳහා ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපි ලේඛන කට්ටලයක් ලබාගත හැක.
6. ලංසුපත් 2020.11.03 වෙනි දින පෙ.ව. 10.00 ට විවෘත කරන බැවින් එම වේලාවට පෙර ලැබෙන පරිදි "**සභාපති හා ප්‍රසම්පාදන කමිටු සභාපති, පොළොන්නරුව ප්‍රාදේශීය සභාව**" යන ලිපිනයට ගෙනැවිත් භාරදීම හෝ කාර්යාලය තුළ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ගැනීම අවසන් වූ වහාම පැමිණ සිටින ලංසුකරුවන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
7. ලංසු ලිපි ලේඛනයේ සඳහන් දිනය දක්වා ලංසු වලංගු විය යුතුය.
8. ඇගයීමේ හා තෝරා ගැනීමේ ක්‍රමය ලංසු ප්‍රදානය සඳහා ප්‍රමාණවත් ලෙස ප්‍රතිචාර දක්වා ඇතැයි පිළිගත හැකි අවම ලංසුව ලෙස ඇගයීමට ලක්වන ලංසුකරු තෝරාගනු ලැබේ. ප්‍රසම්පාදන කමිටුව විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

| අංකය | විස්තරය | ඇස්තමේන්තු පිරිවැය | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | අවශ්‍ය ලංසු ඇපකරයේ වටිනාකම |
|---|---|---|---|---|---|
| 01 | කඩවල වැව, මා ඔය ප්‍රධාන මාර්ගයේ බෝක්කු ඉදිකිරීම | 2.25 මිලියන | දින 84 | C8 සහ C7 | 30,000.00 |

**සභාපති හා ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**පොළොන්නරුව ප්‍රාදේශීය සභාව,**
**පොළොන්නරුව.**

---

# බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව

## බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව මගින් එකතු කරනු ලබන දිරන කසළ බැහැර කිරීම සඳහා මිල ගණන් කැඳවීම

බණ්ඩාරගම ප්‍රාදේශීය සභාවේ දිරන කසළ බැහැර කිරීම සඳහා 2020.11.06 දින පෙ.ව.10.00 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ. එදිනම පෙ.ව.10.05ට ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ආපසු ගෙවනු ලබන රු. 20,000/- ක තැන්පත් මුදලක් හා ආපසු නොගෙවනු ලබන රු. 5,000/-ක් ලබා ගන්නා ආකෘති පත්‍රවල පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝරම 2020.10.15 වන දින සිට 2020.11.05 දින ප.ව.3.00 දක්වා කාර්යාල වේලාවන් තුළ බණ්ඩාරගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක.

ටෙන්ඩපත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගී විය හැක. බල ප්‍රදේශය තුළ එකතු කරනු ලබන කසළ අප විසින් එක් ස්ථානයකට එක් රැස් කළ පසු එදිනම ඔබ විසින් බැහැරට ගෙන යා යුතුය. බැහැර කරනු ලබන කසළ කියුබ් තුනක ධාරිතාවයෙන් ලෝඩ් එකකට අය කරනු ලබන ගාස්තු වශයෙන් අදාළව මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. කසළ බැහැර කරනු ලබන ස්ථානයට හෝ අංගනයට අදාළව මධ්‍යම පරිසර අධිකාරියෙන් හා අදාළ ආයතනවලින් ලබාගත් පරිසර නිර්දේශ හා ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතුය. කසළ ප්‍රවාහනය කරනු ලබන ටිපර් රථවල අවම ධාරිතාව කියුබ් 03ට වඩා වැඩි විය යුතු අතර, ප්‍රවාහනයට අදාළව ලබාගත් ප්‍රවාහන බලපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා පිටපත් දෙකකින් යුතුව සකස් කර එක් එක් කවරයේ දකුණු පස ඉහළ කෙළවරේ "**මුල් පිටපත**" හා "**අනු පිටපත**" ලෙස නම් කර එම කවර දෙක එක් කවරයක බහා වම්පස ඉහළ කෙළවරේ "**දිරන කසළ බැහැර කිරීම සඳහා මිල ගණන්**" යනුවෙන් සඳහන් කර **සභාපති, බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව, බණ්ඩාරගම** යන ලිපිනයට 2020.11.06 දින පෙ.ව.10.00ට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙන විත් බහාලිය හැක. මේ සම්බන්ධයෙන් වන වැඩි විස්තර හා අදාළ කොන්දේසි ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයට පැමිණ හෝ පහත දුරකථන අංකයට ඇමතීමෙන් ලබා ගත හැක. ලබා දෙනු ලබන සියලුම කොන්දේසි හා අනෙකුත් ලියකියවිලි මෙම දැන්වීමේ කොටසක් වශයෙන් සැලකිය යුතුය. ටෙන්ඩරය සම්බන්ධයෙන් ගන්නා වූ අවසාන තීරණය බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව සතුවේ.

**එච්.ඒ.එච්. දේවේන්ද්‍ර පෙරේරා,**
**සභාපති,**
**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව.**

**2020.10.15**

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගම්පහ දිස්ත්‍රික්කයේ රාගම, ඇලපිටිවල, ධර්මදාස මාවත, අංක 04 දරන ස්ථානයේ පදිංචි කන්ගාර මුදියන්සේලාගේ පාලිත චන්ද්‍රලාල් කරුණාරත්න වන මම ශ්‍රී ලංකා ජනරජය ද සියලු මහජනතාව වෙත දන්වා සිටින්නේ ඉතාලි නපෝලි නිතී නිලධාරි වෙන් පනත් ගල්ස් වෙබරා ගනානා විසින් සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය යටතේ රාගම, ඇලපිටිවල, ධර්මදාස මාවත, අංක 04 දරන ස්ථානයේ පදිංචි හේවා තන්ත්‍රීගේ දීපා නිශාන්ති පීරිස් වෙත දෙන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව දන්වා සිටිමි.

**කේ.එම්.පී.සී. කරුණාරත්න**

---

## පුවත්පත් දැන්වීම

මගේ යොමු අංකය : 6/3/7/15/8/2

ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය : LD/05/2007/MV/155

### 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කරගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන) පරිච්ඡේදය

## 7 වන වගන්තිය යටතේ දැන්වීමයි

මෙහි පහත විස්තර කරන ඉඩම් මොරගහකන්ද/ කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රජයට අත්පත් කර ගැනීමට බලාපොරොත්තු වේ. වැඩි විස්තර සඳහා අංක 2194/61 දරන 2020.09.24 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය බලන්න.

### උපලේඛනය

| | | |
|---|---|---|
| දිස්ත්‍රික්කය | : | මාතලේ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | නාඋල |
| ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසය | : | රජාවෙල |
| ගමේ නම | : | රජාවෙල |
| ඉඩමේ නම | : | අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි |
| ප්‍රමාණය | : | අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් පරිදි |
| කැබලි අංක | : | 311 |
| සැලසුම් අංකය | : | අ.ග.පි. 532, අතිරේක අංක 09, පත්‍රය 09 |
| ලිපිනය | : | ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය, නාඋල. |

**චින්තක ඉලංගසිංහ,**
**අත්පත්කර ගැනීමේ නිලධාරී/ නාඋල ප්‍රාදේශීය ලේකම්.**
**දිනය : 2020/10/14**

---

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# ප්‍රසම්පාදන දැන්වීම

## ආහාර ද්‍රව්‍ය සැපයීම

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට 2021 වර්ෂය සඳහා ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා 2020 නොවැම්බර් මස 05 වන දින ප.ව. 2.00 දක්වා පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් පහත සඳහන් කාණ්ඩ යටතේ මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

- ★ **එළවළු**
- ★ **පළතුරු**
- ★ **බේකරි නිෂ්පාදන**
- ★ **කිතුල් හකුරු සහ කිතුල් පැණි**
- ★ **රසකැවිලි**
- ★ **විශේෂිත වියලි ආහාර ද්‍රව්‍ය**

ලංසු ලේඛන පාර්ලිමේන්තු වෙබ් අඩවියේ "https://www.parliament.lk /si/secretariat/tenders" හරහා 2020.11.02 වන දින ප.ව. 3.00 දක්වා බාගත කර ගත හැකි අතර, ලංසු භාර දීමේදී ආපසු නොගෙවනු ලබන රු. 1000/- ක ගාස්තුවක් එක් එක් කාණ්ඩයන් සඳහා වෙන වෙනම ගෙවිය යුතු වේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 011-2777358 ඔස්සේ සහකාර අධ්‍යක්ෂ - පරිපාලන (සැපයුම් හා සේවා) අමතා දැනගත හැක.

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**
**2020.10.20 දින**

---

## ටෙන්ඩර් දැන්වීයි

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

### (පිරිපහදු අංශය)

## 59 ටැංකියේ වහල පින්තාරු කිරීම

## Painting of Tank 59 RooF

**ටෙන්ඩර් අංකය C-36 - 2020**

ශ්‍රී ලංකාව, සපුගස්කන්ද, 59 ටැංකියේ වහල පින්තාරු කිරීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (සුළු) කමිටුව විසින් පෙර පළපුරුද්ද සහිත දේශීය සමාගම වෙතින් ලංසු කැඳවනු ලැබේ.

රුපියල් මිලියන 5 ට නොඅඩු (බදු රහිතව) වටිනාකමැති ඛනිජ තෙල් පිරිපහදුව මගින් ප්‍රදානය කළ, වානේ ඛනිජ තෙල් ගබඩා ටැංකි සෑන්ඩ් බ්ලාස්ටින් හා පිංතාරු කිරීමේ කොන්ත්‍රාත් ඉටුකොට පෙර පළපුරුද්ද සහිත දේශීය ලංසුකරුවන් ලංසුකරණ ලිපි ලේඛන ලබාගැනීමට සුදුස්සෝ වෙති.

ලංසු ලිපිලේඛන ලබාගන්නා අවස්ථාවේදී පිරිපහදු මුදල් දෙපාර්තමේන්තුවට ආපසු නොගෙවන රු. 1500/= ( සියලු බදු සමග) තැන්පතුවක් ගෙවිය යුතුය. ඒ සඳහා ලබාගන්නා ලදුපතේ පිටපතක් ඇගැයීම සඳහා සලකා බැලීමට **මිල ගණන් පතට අමුණා එවිය යුතුය.** කෙසේ වෙතත් ඉහත ලංසුකරණ ලිපිලේඛන **www.ceypetco.gov.lk** සහ **www.news.lk** වෙබ් අඩවි වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

පූර්ව ලංසු රැස්වීම හා ස්ථානීය පරීක්ෂාව 2020 නොවැම්බර් 05 වන දින 10.00 පැයට කැලණිය, සපුගස්කන්ද, ලං.ඛ.නී. සංස්ථා පිරිපහදුවේ නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු හා ව්‍යාපෘති) කාර්යාලයේදී පැවැත්වීමට නියමිත අතර, සියලුම ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එයට සහභාගි විය හැකිය.

ලංසුකරණ ලිපිලේඛන නිකුත් කිරීමේ අවසාන දිනය හා වේලාව 2020 නොවැම්බර් 05 වැනිද 1500 පැය වේ. මුද්‍රා තැබූ ලංසු භාර ගැනීම 2020 නොවැම්බර් 19 දින 14.30 පැයට අවසාන වන අතර. එදින එම වේලාවටම ලංසු විවෘත කෙරේ.

ලංසුකරණ ලිපිලේඛන සහ වෙනත් විස්තර ශ්‍රී ලංකාව, සපුගස්කන්ද, පිරිපහදු අංශයේ සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පිරිපහදු කළමනාකරු (නඩත්තු හා ව්‍යාපෘති) වෙතින් ලබාගත හැකිය.

**ෆැක්ස් : 94-112400436**

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන (සුළු) කමිටුව,**
**පිරිපහදු අංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**
**සපුගස්කන්, ශ්‍රී ලංකාව.**

# මහජන බැංකුව
## රන් භාණ්ඩ උකස් වෙන්දේසිය

මහජන බැංකුවේ, කොළඹ උතුර ප්‍රාදේශිකයට අයත් පහත සඳහන් ශාඛාවන් සහ සේවා මධ්‍යස්ථානවල 2019.06.30 වන දින දක්වා වසරක කාලයකින් බේරාගැනීමට උකස් තබන ලදුව පහත සඳහන් දිනයන් දක්වා බේරා නොගත් උකස් රන් භාණ්ඩ පහත උපලේඛනයේ දැක්වෙන දිනයන්හි දී හා එහි සඳහන් ස්ථානයන්හි දී පෙ.ව. 9.00 ට ආරම්භ කර ප්‍රසිද්ධියේ වෙන්දේසි කරනු ලබන බව මෙයින් දැනුම් දෙමු.

| ශාඛාව | සේවා මධ්‍යස්ථානය | පහත දින දක්වා බේරානොගත් | වෙන්දේසි දිනය | වෙන්දේසි ස්ථානය |
|---|---|---|---|---|
| මැද පාර<br>ග්‍රෑන්ඩ්පාස්<br>කෙහෙල්වත්ත | ග්‍රෑන්ඩ්පාස්<br>ශාන්ත ජෝශප් වීදිය | 2020.11.13 | 2020.11.15 | ග්‍රෑන්ඩ්පාස් ශාඛාව |
| කොටහේන<br>වේල්ලවීදිය<br>නගර මධ්‍ය | ජම්පටා වීදිය<br>බ්ලූමැන්ඩල්<br>මිහිඳු මාවත | 2020.11.13 | 2020.11.15 | කොටහේන ශාඛාව |
| සමුද්‍රවීදිය<br>පිටකොටුව<br>දෙමටගොඩ<br>මල්වත්ත පාර<br>ආදිපාද වීදිය<br>ඔල්කට් මාවත<br>සංඝරාජ මාවත | දෙමටගොඩ<br>මාලිගාවත්ත | 2020.11.20 | 2020.11.21 | දෙමටගොඩ ශාඛාව |
| මෝදර<br>පළමු නගර | නාගලගම්විදිය<br>මුතුවැල්ල<br>වරාය | 2020.11.20 | 2020.11.21 | මෝදර ශාඛාව |

වෙන්දේසියට සහභාගිවන්නන් තම පුද්ගලික හැඳුනුම්පත ද රැගෙන ආ යුතුය. වෙනත් ප්‍රසිද්ධ දැනුම් දීමකින් තොරව මෙම වෙන්දේසිය අවලංගු කිරීම, ඒකාබද්ධ කිරීම හෝ කල්දැමීම පිළිබඳ අයිතම මහජන බැංකුව සතුවේ.

**මහජන බැංකුව**
**ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ උතුර)**
**අංක 11, අදිපාද වීදිය, කොළඹ 01.**
**දුරකථන අංක : 0112-344982 / 0112-430148**

**ප්‍රාදේශීය කළමනාකාර - (කොළඹ උතුර)**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

# බදුල්ල මහා නගර සභාව
## 2021 වර්ෂය සඳහා සභා දේපළ බදුදීම සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවීම

බදුල්ල මහා නගර සභාවට අයත් පහත උපලේඛනයේ සඳහන් සභා දේපළ සඳහා පහත පරිදි ජාතික තරගකාරී ලංසු කැඳවනු ලැබේ.

**බදු කාලය** : **2021.01.01 දින සිට 2021.12.31 දක්වා**

**ලංසු ලේඛන නිකුත් කිරීම** : **2020.10.20 දින සිට 2020.11.10 දින දක්වා කාර්යාල දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා බදුල්ල මහා නගර සභා කාර්යාලයේදී**

**ලංසුපත් භාරගන්නා අවසාන දිනය** : **2020.11.11 වන දින පෙ. ව. 10.15**

**ලංසු විවෘත කිරීම** : **2020.11.11 වන දින පෙ.ව. 10.30 ට බදුල්ල මහා නගර සභා කාර්යාලයේදී**

වැඩි විස්තර කාර්යාල දිනයන්හි දී පෙ. ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා නාගරික ගණකාධිකාරී / ආදායම් අංශයෙන් විමසා දැන ගත හැකිය. (දුරකථන අංක 055-2224277 / 055-2229262)

ප්‍රසම්පාදන ලංසු විවෘත කරන අවස්ථාවේදී ප්‍රසම්පාදන ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

**සැලකිය යුතුයි**

01. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 18 ට වැඩි ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.

02. බදුල්ල මහා නගර සභාව සමග ඕනෑම ගරු අධිකරණයක කිසිදු ආකාරයක නීතිමය කටයුතු පැවති හා පවතින සහ මහා නගර සභාවට හිඟ කුලී ගෙවීමට ඇති හා මීට පෙර ප්‍රසම්පාදන නීති රීති උල්ලංඝනය කර ඇති කිසිවෙකුට හෝ ආයතනවලට මේ සඳහා ඉල්ලුම් කළ නොහැකිය. යම් හෙයකින් එවැනි ප්‍රසම්පාදන ලංසු ඉදිරිපත් කර ඒ බව බදුල්ල මහා නගර සභාවට තහවුරු වූ අවස්ථාවේදීම ලංසුව අවලංගු කර තැන්පත් කර ඇති හා ගෙවා ඇති මුදල් සභා සන්තක කිරීමටත්, ලංසුව අවලංගු කර අදාළ සභා දේපළ සභාවට පවරා ගැනීමටත් කටයුතු කර එවැනි ප්‍රසම්පාදන ලංසුකරුවන් අසාධු ලේඛන ගත කිරීමටත් කටයුතු කරනු ලැබේ.

03. ඉදිරිපත් කරනු ලබන ප්‍රසම්පාදන ලංසු පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

04 මෙම උපලේඛනයේ සඳහන් පරිදි අවම ප්‍රසම්පාදන ලංසුවට වඩා අඩුවෙන් ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප වන අතර, ලංසු පෝරම ගාස්තු හා ලංසු තැන්පත් මුදල් සභා සන්තක වනු ඇත.

05. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව ලංසුකරුවන් විසින් ලංසුපත් 02 ක් ඉදිරිපත් කළ යුතු අතර, එම ලංසුපත් වෙන වෙනම කවරවල බහාලමින් එම කවරවල 1 මුල් පිටපත හා 2 වන පිටපත වශයෙන් සඳහන් කර කවර දෙකම එකම කවරයක බහා මුද්‍ර තබා නියමිත දිනයේ නියමිත වේලාවට පෙර "**සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය /මහා නගර සභාව, බදුල්ල**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ නගර සභාවේ නාගරික ගණකාධිකාරී නිල කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

### උපලේඛනය

| | දේපළෙහි නම | අවම ප්‍රසම්පාදන ලංසුව බදු රහිත (රු. ශත) | ප්‍රසම්පාදන තැන්පත් මුදල - ආපසු ගෙවන තැන්පතුව රු. | ප්‍රසම්පාදන තැන්පත් මුදල - ආපසු නොගෙවන ලංසු පෝරම ගාස්තු රු. |
|---|---|---|---|---|
| 1 | මධ්‍යම නව වෙළඳ සංකීර්ණය - F 01 ගව මස් කඩය | 3,600,000.00 | 72,000.00 | 1500.00 |
| 2 | මධ්‍යම නව වෙළඳ සංකීර්ණය - F 02 කුකුල් මස් කඩය | 240,000.00 | 5,000.00 | 1500.00 |
| 3 | මධ්‍යම නව වෙළඳ සංකීර්ණය - F 03 එළු මස් කඩය | 800,000.00 | 16,000.00 | 1500.00 |
| 4 | වෙලේ කඩේ වෙළඳ සංකීර්ණය - C 01 ගව මස් කඩය | 2,400,000.00 | 48,000.00 | 1500.00 |
| 5 | මයිලගස්තැන්න - D01 - ගවමස් කඩය | 1,800,000.00 | 36,000.00 | 1500.00 |
| 6 | මයිලගස්තැන්න සති පොළ භූමියේ පොදු වැසිකිළිය සමග | 3,387,500.00 | 68,000.00 | 1500.00 |
| 7 | බස් නැවතුම්පොළ භූමියේ පොදු වැසිකිළිය | 6,000,000.00 | 120,000.00 | 1500.00 |
| 8 | දකුණු පටුමග පොදු වැසිකිළිය | 1,740,000.00 | 35,000.00 | 1500.00 |
| 9 | සේනානායකපිටිය පොදු වැසිකිළිය | 325,000.00 | 6,500.00 | 1500.00 |
| 10 | සේනානායකපිටිය භූගත රථ ගාල | 432,000.00 | 8,650.00 | 1500.00 |

**නාගරික කොමසාරිස්,**
**මහා නගර සභාව,**
**බදුල්ල.**

**2020.10.17 දින**

# මහජන බැංකුව
## ටෙන්ඩර් දැන්වීමයි

පහත සඳහන් අයිතම සැපයීම, සවි කර භාරදීම, නඩත්තු කිරීම හා සේවා කිරීම පිළිබඳව පිළිගත් දේශීය සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | ටෙන්ඩරය පිළිබඳ විස්තරය | ලංසු ඇපකරයේ වටිනාකම (රු.) | ටෙන්ඩර් පත් නිකුත් කරන අවසාන දිනය හා වේලාව | ටෙන්ඩරය වසනු ලබන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| P/090/2020 | Document Scanners 150 ක් | 500,000/- | 2020.11.10 දින ප.ව. 2.00 ට | 2020.11.11 දින ප.ව. 2.00 ට |
| P/091/2020 | Wi-Fi Laser Printers 175 ක් | 500,000/- | 2020.11.10 දින ප.ව. 2.00 ට | 2020.11.11 දින ප.ව. 2.00 ට |
| P/092/2020 | Tablets 600 ක් | 500,000/- | 2020.11.10 දින ප.ව. 2.00 ට | 2020.11.11 දින ප.ව. 2.00 ට |

01. ටෙන්ඩර් අයදුම්පත් 2020.10.21 දින සිට 2020.11.10 දින දක්වා බැංකු වැඩ කරන දිනයන්හිදී පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කොළඹ 02, කිව් පාර, 30/101, පිහිටි මහජන බැංකුවේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි අතර, ඒ සඳහා එක් ටෙන්ඩර් අයදුම් පතක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු. 1,500/- ක ගාස්තුවක් සැපයුම් දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යන මහජන බැංකු ගිණුම් අංක 204100120011913 ට දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවක තැන්පත් කොට එහි අනුපිටපත, අදාළ ආයතනයේ අයදුම් ලිපියක් සමග සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

02. නිසි පරිදි සකස් කරන ලද ටෙන්ඩර්පත් සමග ඉහත සඳහන් වටිනාකම් වලට අදාළව පිළිගත් වාණිජ බැංකුවකින් (මහජන බැංකුව හැර) ලබාගත් බැංකු අණකරයක් / බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතු අතර, එය ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. මේ සඳහා බැංකු ගෙවීම් ඇණවුම් හෝ බැංකු අණකර ඉදිරිපත් කළ හැකි අතර, එයද ටෙන්ඩරය විවෘත කරන දින සිට දින 180 කට වලංගු විය යුතුය. ටෙන්ඩර්කරුවන්ගේ චෙක්පත් භාර ගනු නොලැබේ.

03. 2020.11.11 දින ප.ව. 2.00 ට ටෙන්ඩර් විවෘත කරනු ලබන අතර, ඊට පෙර ලැබෙන පරිදි මුද්‍රා සහිතව සකසන ලද ටෙන්ඩර් පත් මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු අතර, නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. එම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් විවෘත නොකරම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. සියලුම හෝ ඕනෑම ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩරයක ඕනෑම කොටසක් හෝ පිළිගැනීමේ අයිතිය මහජන බැංකුව සතුවේ.

05. මේ සම්බන්ධව වැඩි විස්තර ප්‍රධාන කළමනාකාර (සැපයීම්) මහජන බැංකුව, සැපයීම් දෙපාර්තමේන්තුව වෙතින් පහත සඳහන් දුරකථන අංක මගින් ලබාගත හැක.

**ප්‍රධාන කළමනාකාර (සැපයීම්),**
**මහජන බැංකුව,**
**සැපයීම් දෙපාර්තමේන්තුව,**
**30/101, කිව් පාර, කොළඹ 02.**

**දුරකථන අංක - 2439577, 2439578**
**ෆැක්ස් අංක - 2439576**
**වෙබ් අඩවිය - www.peoplesbank.lk**

මහජන බැංකුව PEOPLE'S BANK
www.peoplesbank.lk
AA+ (lka) Fitch Rating, AA - Brand Finance Rating

# වැවිලි අමාත්‍යාංශය
## ශ්‍රී ලංකා තේ මණ්ඩලය

### (2021 / 2022 / 2023) වසර 03 (තුනක) කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට තේ පැකට් ඇසුරුම්කර සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු පත් කිරීම

**ලංසු අංකය : PROC/SOLE/PACK/20**

කොළඹ 03, ගාලු පාරේ, අංක 574 හි පිහිටි ශ්‍රී ලංකා තේ මණ්ඩලය හි, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් 2020 නොවැම්බර් මස 09 වන දින ප.ව. 2.00 දක්වා ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා තේ පැකට් ඇසුරුම් ගත කර සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවකු පත් කිරීම සඳහා වසර 03 කාලසීමාවකට (එනම් වර්ෂ 2021, 2022 හා 2023) මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

**ලංසුකරු සපුරාලිය යුතු සුදුසුකම් අවශ්‍යතා**

01. ලංසුකරු ශ්‍රී ලංකා තේ මණ්ඩලය (SLTB) යටතේ "සිලෝන් ටී" සන්නාමය යටතේ (ශ්‍රී ලංකා තේ) අපනයනය කරන සමාගමක් ලෙස පසුගිය වසර 10 ක කාලයක් තුළ ලියාපදිංචි වී සිටිය යුතුය.

02. ලංසුකරු සතුව නවතම මාදිලියේ ඇසුරුම් යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ පහසුකම්, SLTB හි (ශ්‍රී ලංකා තේ මණ්ඩලය) ඇසුරුම්ගත කරන අවශ්‍යතා සපුරාලීම සඳහා තිබිය යුතු වන අතර මෙය කොන්ත්‍රාත් ඇසුම්කරුවන්ට අදාළ නොවනු ඇත.

03. ලංසුකරු සතුව නවීන ගුදම් / ගබඩාකරණ පහසුකම්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (SLTB) හි ඇසුරුම් ද්‍රව්‍ය හා නිමි භාණ්ඩ යන අවශ්‍යතා දිත්වය සඳහාම ගබඩා කිරීමේ අවශ්‍යතා සපුරාලීම සඳහා තිබිය යුතුය.

04. ලංසුකරු අගය එකතුකරනු ලබන අපනයනකරුවෙකු ලෙස වසර 05 කට (පහක) ට වැඩි කාලයක් පුරා කාර්ය කටයුතු සිද්ධ කර තිබිය යුතුය.

05. ලංසුකරු GMP සහ HACCP සහතික ලාභීන් විය යුතු වන අතර, සිය නිෂ්පාදන කර්මාන්තශාලා තුළ ප්‍රමාණවත් සෞඛ්‍ය හා සනීපාරක්ෂක පරිචයන් භාවිතාවන් අනුගමනය කර තිබිය යුතුය.

06. ලංසුකරුගේ ඇසුරුම් යන්ත්‍රාගාරයේ පිහිටි ස්ථානය, කොළඹ තදාසන්නයට පහසු ප්‍රවේශයක් ලෙස පිහිටා තිබිය යුතුය.

07. පිළිගැනීම / ත්‍යාග ප්‍රදාන ලැබීම් දිනාගත් අස්ථිත්වයන් හා ආයතනවලට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

අභිලාෂී ලංසුකරුවන්ට, එක් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා ආපසු ගෙවනු නොලබන රු. 2,000/- ක ගාස්තුවක් ගෙවීමෙන් හා ස්වකීය නිල ව්‍යාපාරික ලිපි ශීර්ෂයක් මත ලිඛිත අයදුම්පතක් සමග තැන්පතු ලදුපත ද ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කොළඹ 03, ගාලු පාරේ, අංක 574 හි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රසම්පාදන අංශය වෙතින් 2020 ඔක්තෝබර් මස 19 වන දින සිට මිලදී ලබා ගත හැකිය. සියලුම ගෙවීම් 2020 නොවැම්බර් මස 6 වන දින දක්වා ලංකා බැංකුවේ කොල්ලුපිටිය, 2 වන ශාඛාවේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය නමට ඇති ගිණුම් අංක 1633709 දරන ගිණුමට බැර කර එම තැන්පතු ලදුපත ලංසු ලිපිලේඛන නිකුත් කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙතින් මිලදී ලබා ගනු ලබන ලංසු ලිපි ලේඛන (ආකෘතිය) මත පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුය. ලංසු ලිපිලේඛන ඉහත ලිපිනයේදී ගාස්තු ගෙවීමකින් තොරව ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

පූර්ව ලංසු හමුවක් 2020 ඔක්තෝබර් මස 29 වන දින පෙ.ව. 10.00 ට ආරම්භව ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

ලංසු, අනුපිටපතකින් යුක්තව (පිටපත් 2) කොළඹ 3, ගාලු පාරේ, අංක 574 හි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රසම්පාදන කමිටුවහි, සභාපති වෙත යොමු කර ලංසු ලිපිලේඛන වල ඉල්ලා ඇති අවශ්‍යතා පරිදි ලංසු විවෘත කරනු ලබන දින සිට දින 148 ක් දක්වා වලංගු තේ මණ්ඩලයට තේ පැකට් පෙළක් සපයා ඇසුරුම් කර සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති පිළිගත්, කීර්තිමත් බැංකුවකින් ලබාගත් රුපියල් 750,000/- ක් වන (හත් ලක්ෂ පනස් දහසක්) වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණ ඇපකරයක්ද ලංසු සමග ලේඛනගත (ලියාපදිංචි) තැපෑලෙන් එවිය යුතුය.

ලැබී ඇති ලංසු, එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම කොළඹ 03, ගාලු පාරේ, අංක 574 හි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රසම්පාදන අංශයේදී විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටීමට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට අවසර දෙනු ලැබේ.

සියලුම අවශ්‍ය පැහැදිලි කරගැනීම් සඳහා කොළඹ 03, ගාලු පාරේ අංක 574 හි ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක (ප්‍රවර්ධන - තරංග අබේසේකර මහතා වෙතින් (දුරකථන අංක 011-2587814) මගින් විමසා දැන කියා ගත හැකිය.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා තේ මණ්ඩලය,**
**අංක 574, ගාලු පාර, කොළඹ 03.**

# ප්‍රසම්පාදන කැඳවීම

## කොළොන්න ප්‍රාදේශීය සභාව

කොලොන්න ප්‍රාදේශීය සභාවේ කොලොන්න සතිපොළ ඉඩ පහසුකම් පුළුල්වන ලෙස නවීකරණය කිරීම ව්‍යාපෘතිය සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් කොන්ත්‍රාත්කරුවන් වෙතින් ජාතික තරගකාරී ලංසු කැඳවීම යටතේ මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| ලංසු අංකය | ව්‍යාපෘතියේ නම | ඇස්තමේන්තු ගත පිරිවැය වැට් බදු රහිත (රු. මි.) | අවම සුදුසුකම් ශ්‍රේණිය CIDA | ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තු රු. | ආපසු ගෙවන ලංසු බැඳුම්කරය රු. |
|---|---|---|---|---|---|
| KPS/C/02 | කොලොන්න සති පොළ නවීකරණය කිරීම | 13.2 මිලියන | C-05<br>C-06 | 7500.00 | 133,000.00 |

02. මේ සඳහා ලංසු ඉදිරිපත් කිරීමට 2020.10.21. සිට 2020.11.03 දින දක්වා සාමාන්‍ය කාර්යාල වැඩ කරන දිනයන්හි පෙ.ව 9.00 සිට පස්වරු 3.00 දක්වා කොලොන්න ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පරීක්ෂා කර බලා ඉහත සඳහන් ගාස්තු ගෙවා මිලදී ගත හැක.

03. සම්පූර්ණ කරන ලද ලංසු පත් මුල් පිටපත් හා අනු පිටපත් ලෙස වෙන වෙනම කවරවල බහා මුද්‍රා තබා 2020.11.04 දින පෙරවරු 10.00 ට හෝ ඊට පෙර සභාපති, කොලොන්න ප්‍රාදේශීය සභාව, කොලොන්න යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීම සිදු කළ හැකිය. ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ලංසුපත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ව්‍යාපෘතියේ නම සඳහන් කළ යුතුය. ලංසුපත් ඉදිරිපත් කිරීමේදී CIDA ලියාපදිංචිය තහවුරු කිරීම සඳහා එහි සහතික කළ පිටපතක් ද මුදලින් ලංසු ඇප තැන්පත් කරන්නේ නම් එහි ලදුපත හෝ පිළිගත් මූල්‍ය බැංකුවකින් ලබාගත් ඇප බැඳුම්කරය හෝ ලංසු සමග ඉදිරිපත් කළ යුතුය.

05. 2020.11.04 දින පෙරවරු 10.15 ට ප්‍රධාන කාර්යාලයේදී ලංසු විවෘත කරන අතර, එම අවස්ථාවට ඔබ හෝ ඔබගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක. ලංසු සම්බන්ධයෙන් අවසාන තීරණ ගැනීමේ අයිතිය කොලොන්න ප්‍රාදේශීය සභාව සතුය.

**විමසීම් - දුරකථන 045-2260275**

**ටී. රූපසේන,**
**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**කොළොන්න ප්‍රාදේශීය සභාව**

# ප්‍රසම්පාදන දැන්වීමයි

## උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

## රෝහල් සඳහා පිසූ ආහාර සැපයීම - 2021

2021 වර්ෂයට අදාළව රෝහල්වලට පිසූ ආහාර සැපයීම සඳහා 2020.11.09 දින ප.ව. 3.00 දක්වා උතුරුමැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසුපත් කැඳවනු ලැබේ.

**02. පිසූ ආහාර සැපයීම**

අනුරාධපුර ශික්ෂණ රෝහල හා පොළොන්නරුව මහ රෝහල හැර උතුරුමැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් රෝහල්වල නේවාසික රෝගීන් සඳහා

| සේවාව | රෝහල් කාණ්ඩය | ගාස්තු හා ඉදිරිපත් කළ යුතු ලියවිලි | | |
|---|---|---|---|---|
| | | එක් ටෙන්ඩර් පෝරමයක් සඳහා ආපසු නොගෙවන ලංසු පත් ගාස්තු (රු.) | 2021.02.01 දක්වා වලංගු බැංකු ඇපකරය (රු.) | වත්කම් සහතිකය පොදු (රු.) |
| පිසූ ආහාර සැපයීම | A | 2,000/- | 85,000/- | 150,000/- |
| | B | 2,000/- | 75,000/- | 125,000/- |
| | C | 2,000/- | 60,000/- | 85,000/- |
| | D | 2,000/- | 40,000/- | 65,000/- |
| | E | 1,000/- | 15,000/- | 40,000/- |

03. පොදු 170 මගින් වත්කම් සහතිකයක් ඉදිරිපත් නොකරන්නේ නම් ඒ හා සමාන වටිනාකමකින් යුත් මුදලක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

04. ඉහත සේවා සැපයීම සඳහා

i සෑම සැපයුම්කරුවෙක්ම උතුරුමැද පළාතේ පදිංචි හා උතුරු මැද පළාත් සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවකු විය යුතුයි.

ii සෑම සැපයුම්කරුවෙක්ම උතුරුමැද පළාතේ පදිංචිය තහවුරු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සනකින් යුත් පදිංචි සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

iii සැපයීම්වලට අදාළ ඇපකර හා වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

05. සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට ආපසු නොගෙවන ලංසුපත් ගාස්තුව උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමට මුදලින් ගෙවා අදාළ ලංසු ලියවිලි ලබා ගත හැක. ලංසු ලියවිලි නිකුත් කිරීම **2020.10.20 දින සිට 2020.11.09 දින ප.ව. 3.00 දක්වා** රාජකාරී වේලාවන් තුළදී සිදු කෙරේ.

06. සම්පූර්ණ කරන ලද ලංසු ලියවිලි ආයතනය අනුව එක් එක් සැපයුම හා සේවාවන් සඳහා වෙන වෙනම සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම මුද්‍රා තබා **2020.11.10 දින පෙ.ව. 10.00** ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් **පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, උතුරුමැද පළාත, අනුරාධපුර** යන ලිපිනයට එවීම හෝ එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලීම කල යුතුය. **ලිපි කවරවල වම් කෙළවරේ සේවාව හා සේවාවට අදාළ ආයතනයද, මුල් පිටපතද අනු පිටපතද යන්නත් පැහැදිලිව සඳහන් කළ යුතුය.**

07. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු පත් විවෘත කිරීම සිදු කරන අතර, එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට හෝ සහභාගි විය හැකිය.

08. ලංසු ඇප බැඳුම්කරය මහ බැංකුවේ ලියාපදිංචි පිළිගත් වාණිජ බැංකුවකින් උතුරුමැද පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් ලබාගත් **2020.11.10 දින සිට දින 91 ක්** වලංගු (2020.11.10 සිට 2021.02.11දක්වා) බැංකු ඇපකරයක් මගින් හෝ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ අදාළ මුදල තැන්පත්කර ලබාගත් රිසිට්පතක් මගින් ඉදිරිපත් කළ යුතුය.

09. මෙම ටෙන්ඩරය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

**වෛද්‍ය ඩබ්ලිව්. එම්. පාලිත බණ්ඩාර**
**පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ / සභාපති,**
**පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන කමිටුව.**
**දුරකථන 025-2050718/025-2223790.**

## afc රන් ණය සේවාව
## රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පීඑල්සී පහත සඳහන් ස්ථානවල උකස් තබන ලද 2019-03-31 / 2019-04-30 / 2019-05-31 සහ 2019-06-30 දිනයන් වලදී කල්පිරුණු, මෙතෙක් බේරා නොගත් රන් භාන්ඩ 2020-10-27 වන දින පෙ.ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**රන් ණය මධ්‍යස්ථාන**

**අළුත්ගම, අම්බලන්ගොඩ, අම්පාර, අනුරාධපුර, අතුරුගිරිය, අවිස්සාවේල්ල, බදුල්ල, බලංගොඩ, මඩකලපුව, චන්කනෛයි, චාවකච්චේරි, හලාවත, චුන්නක්කම්, දඹුල්ල, ගලේවෙල, මොණරාගල, හැටන්, හෝමාගම, හොරණ, ජා-ඇල, යාපනය, කඩවත, කදුරුවෙල, කඩුවෙල, කලවංචිකුඩි, කල්පිටිය, කිලිනොච්චි, කිරිබත්ගොඩ, කිරිඳිවැල, මාලබේ, මාතර, මීගමුව, නිට්ටඹුව, පානදුර, පිළියන්දල, පේදුරු තුඩුව, පූගොඩ, රත්නපුර, රිකිල්ලගස්කඩ, තිරුනවේලි, ත්‍රිකුණාමළය, වව්නියාව, වැලිමඩ, දෙහිඅත්තකණ්ඩිය, ගල්ගමුව, කළුතර, කෑගල්ල, කැලණිය, කුරුණෑගල, නාවලපිටිය, රාගල, රාජගිරිය, වැලල්ලවාය**

**වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය සහ දිනය**
**නො 722, කෝට්ටේ පාර, රාජගිරිය**
**2020-10-27**

වෙන්දේසිය සඳහා පැමිණෙන සියලුම දෙනා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. දැනුම්දීමකින් තොරව වෙන්දේසිය අවලංගු කිරීමේ, කල් දැමීමේ හා ඒකාබද්ධ කිරීමේ බලය එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී එල් සී සතුය.

ආරම්භය 1956
එලායන්ස් ෆිනෑන්ස්
කොම්පැනි පී එල් සී
සෞභාග්‍යයට විශ්වාසනීය අඩිතාලමක්

ප්‍රධානි - රන් ණය
**එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී**
නො.722, කෝට්ටේ පාර, රාජගිරිය.
දුරකථන - 0115 573600

## ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

## 2021 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

ඉහත විෂයට අදාළව **2020.10.09** වන දින **දිණමින** පුවත්පතේ දැන්වීම හා බැඳේ.

ඉහත විෂයට අදාල අයදුම් පත්‍රය සංස්ථාවේ නිල වෙබ් අඩවියෙන් (www.cfhc.gov.lk) බාගත හැක. තැන්පතු මුදල සංස්ථාවේ නමින් ඇති ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ගිණුම් අංක 1446 ගිණුමට තැන්පත් කර එහි පිටපත, නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත **2020.12.10** දින හෝ ඊට ප්‍රථම පෙර දැන්වීමේ සඳහන් පරිදි එවීමට කටයුතු කරන්න.

**සභාපති**
**ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව**
**අංක 15, රොක් හවුස් පටුමග,**
**කොළඹ 15**

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම :
**මුසාඅදා (පීවීටී) එල්ටීඩී**
ලියාපදිංචි අංකය :
පීවී 00228660
සංස්ථාගත කළ දිනය :
2020 ඔක්තෝබර් 08 දින
ලියාපදිංචි ලිපිනය :
බරකාත් පාර, ඔඩ්ඩමාවඩි 03.
**සමාගම් ලේකම්**

# ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව

## සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

පහත සඳහන් භාණ්ඩ හා සේවා 2021 වර්ෂය තුළදී සැපයීම සඳහා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම පිණිස පිළිගත් නිෂ්පාදකයින්ගෙන්, සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

❖ **භාණ්ඩ හා සේවා සැපයුම.**

01. සියලුම කාර්යාලීය ලිපි ද්‍රව්‍ය මුද්‍රිත ලිපි ද්‍රව්‍ය, පෝරම හා ලේඛන සැපයීම.
02. සියලුම මුද්‍රණ කටයුතු.
03. කාර්යාලීය උපකරණ ලී බඩු වානේ ගෘහ භාණ්ඩ සැපයීම.
04. පරිගණක / පරිගණක දෘඩාංග සහ ටෝනර් වර්ග සැපයීම.
05. ඩිජිටල් දැන්වීම් මුද්‍රණය කරන්නන්.
06. සියලුම සෞඛ්‍ය හා සනීපාරක්ෂණ උපකරණ.
07. විදුලි උපකරණ හා වීථි පහන් උපකරණ.
08. කෘෂි නාශක, වල් නාශක සහ පොහොර වර්ග.
09. සියලුම වර්ගවල ගියුම් පයිප්ප, කම්බි කණු සැපයීම.
10. සියලුම වර්ගයේ තීන්ත.
11. නිල ඇඳුම් සඳහා රෙදි සැපයීම.
12. ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ.
13. පෙර පාසල් උපකරණ.
14. තාර (මාර්ග සංවර්ධනය සඳහා).
15. වාහන හා යන්ත්‍රෝපකරණ සැපයීම.
16. සියලුම වර්ගයේ ටයර් ටියුබ් සහ බැටරි / ටයර් නැවත පිරවීම.
17. වාහන අමතර කොටස් සැපයීම.
18. සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම.

❖ **වෙනත් සේවාවන්.**

22. වාහන අලුත්වැඩියා කිරීම.
23. වාහන සේවා කිරීම.
24. පරිගණක / යතුරු ලියන / ෆැක්ස් යන්ත්‍ර / අනු පිටපත් යන්ත්‍ර අලුත්වැඩියාව.
25. පැස්සුම්කරුවන්.
26. ඉඩම් මැනුම් කටයුතු.
27. නාම පුවරු / බැනර් ඇඳීම / සමරු ඵලක සැකසීම.
28. පාවිච්චි කළ පුවත්පත්, හිස් වීදුරු / ප්ලාස්ටික් බෝතල්, පරණ යකඩ, ප්ලාස්ටික් හා පොලිතීන් මිල දී ගැනීම.
29. අනතුරුදායක ගස් කපා හෙළීමේ කටයුතු.
30. කාර්යාලීය උපකරණ අලුත්වැඩියා කිරීම.
31. කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබා දීම.
32. නීති කටයුතු සඳහා නීති උපදේශකයන් / භාෂා පරිවර්තකයින්.
33. කැති උදලු ආදී ආයුධ අලුත්වැඩියා කිරීම හා මිලදී ගැනීම.

**උපලේඛනය - 01**

✷ ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුවන්.

| කොන්ත්‍රාත්කරුවෝ | ලියාපදිංචි ගාස්තු |
|---|---|
| 1. රු. 100,000.00 ට අඩු කර්මාන්ත | 1000.00 |
| 2. රු. 100,000.00 සිට 250,000.00 දක්වා | 2000.00 |
| 3. රු. 250,000.00 සිට 500,000.00 දක්වා | 2500.00 |
| 4. රු. 500,000.00 සිට 1,000,000.00 දක්වා | 3000.00 |
| 5. රු. 1,000,000.00 ට වැඩි | 3500.00 |

සැපයුම් හා සේවාවන් වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, ලියාපදිංචි වීමට අවශ්‍ය අයදුම්පත්‍රය www.facebook.com/Arachchikattuwa Pradeshiya Sabha යන ෆේස්බුක් ගිණුමෙන් බාගත කළ හැකිය. අංක 1 සිට 33 දක්වා වූ අයිතමයන් සඳහා එක් අයිතමයක් වෙනුවෙන් ලියාපදිංචි ගාස්තු වශයෙන් රු. 1000/- ගෙවිය යුතුය.

භාණ්ඩ හා සේවාවන් සැපයීම හා කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වීමට අදහස් කරන ආයතන හා පුද්ගලයන් අයදුම්පත, තමන් ලබා ඇති සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන ලියකියවිලි හා ලියාපදිංචි ගාස්තු සඳහා ලේකම්, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව නමින් චෙක්පතක් හෝ මුදල් ඇණවුමක් සමග **2020.12.31 දින ප.ව. 12.00 ට පෙර ලේකම්, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව, ආරච්චිකට්ටුව** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ **සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021** යනුවෙන් සඳහන් කර එවන්න.

ලියාපදිංචි වූ සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා සුදුස්සන් තෝරාගෙන අදාළ සැපයුම් සේවා හා වැඩ ඉටු කර ගැනීමට ක්‍රියා කරන අතර, අවශ්‍ය වූ විටෙක ඉන් පරිබාහිරවද කටයුතු කිරීමේ අයිතිය ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව සතු වේ. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී පහත දුරකථන ඇමතුම් මගින් සැපයුම් නිලධාරී විසින් විමසා දැනගත හැකිය.

**කේ. තෙච්චනාමූර්ති,**
**සභාපති,**
**ප්‍රාදේශීය සභාව,**
**ආරච්චිකට්ටුව.**

**කාර්යාලය- 032 2259783**
**සැපයුම් නිලධාරී- 077 3564110, 071 7464110**
**2020.10.20**

1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.

පුස්තකාලයාධිපති
දුරකථන
(011)2 242 9491

LAKE HOUSE

සත වෙත සිරිසෙත සලසන සතිපත
දෝ සතර
වෙද සතර
දත් නොදත්
කාටත්
මහඟු මිණකි
සුබසෙත
සත වෙත සිරිසෙත සලසන සතිපත

2020 ඔක්තෝබර් 20 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.